# වාර්ෂික වාර්තාව

# 2018

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

*පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය වාර්ෂික වාර්තාව තුළින් විශ්වවිද්‍යාලය අදාළ වර්ෂයේදී අත්කර ගත් ජයග්‍රහණයන්ගේ ආයතනික දළ විශ්ලේෂණයේ සාරාංශයක් ඉදිරිපත් කෙරේ. උසස් අධ්‍යාපන අමාත්‍යංශය විසින් නිර්දේශිත පිළිගත් ආකෘතියකට අනුව මෙම වාර්ෂික වාර්තාව සකස් කරනු ලබයි. අදාළ ආයතන විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු මෙහි අන්තර්ගත වන අතර එම තොරතුරු කැටි කොට සංඛ්‍යාලේඛන හා තොරතුරු අංශය විසින් සම්පාදනය කරන ලදී.*


*සම්පාදක : ඒ.ඒ.කේ.යු. අතපත්තු මිය*
*සංඛ්‍යාලේඛන නිළධාරී*
*පේරාදෙණිය විශ්වවිද්‍යාලය*

*ඉංග්‍රීසි පිටපතෙහි සංස්කාරක : සුභාග්‍යා ලියනගේ මිය*
*ඉංග්‍රීසි අධ්‍යයන අංශය*
*ශාස්ත්‍ර පීඨය*

*ISSN No: 2478-108*

## දැක්ම

ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමක්
ඇති කලාපයේ ප්‍රමුඛපෙළේ විශ්වවිද්‍යාලයක්
බවට පත්වීම පේරාදෙණිය
විශ්වවිද්‍යාලයේ දැක්ම වනු ඇත.

## මෙහෙවර

සමාජීය වශයෙන් සංවේදීවූත්, සදාචාරාත්මක
හා සුසංවර බවින් පිරිපුන්වූත්, අධ්‍යාපනය
හරහා ආර්ථිකමය වශයෙන්
සෞභාග්‍යමත්වූත් සහ පර්යේෂණ, දැනුම
ව්‍යාප්ත කිරීම, ජාතික ප්‍රතිපත්ති සම්පාදනය
හා  කාර්යක්ෂමව සැලසුම් කරනු ලැබූ
සංවර්ධනය යන කර්තව්‍යයන් කෙරෙහි
ක්‍රියාශීලි ලෙස සහභාගී විය හැකිවූත්,
බුද්ධිමය වශයෙන් ප්‍රබෝධමත් හා වාදභේද
රහිතවූත්, විශ්වවිද්‍යාල පරිසරයක්
තුළින් දැනුම පාදක කරගත්
සමාජ වටපිටාවක් ගොඩනැගීම
සඳහා උරදීම විශ්වවිද්‍යාලයේ
කාර්ය භාරය වනු ඇත.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකාව

## උපකුලපතිතුමාගේ පණිවිඩය



පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2018 වසර සඳහා වන වාර්ෂික වාර්තාව ඉමහත් සොම්නසින් යුතුව ඉදිරිපත් කරමි. අධ්‍යයන හා අනධ්‍යයන ක්‍රියාකාරකම්වලට අදාළ පීඨ නවය විසින් අත්කරගත් සාර්ථකත්වයන් මෙම වාර්තාව තුළින් ඉස්මතුකොට දක්වයි. එපමණක් නොව අප විශ්වවිද්‍යාලයේ මධ්‍යස්ථාන, ඒකක සහ එම අංශ වෙනත් විශ්වවිද්‍යාල හා බාහිර සංවිධාන සමඟ අනුබද්ධව අත්කරගත් ජයග්‍රහණයන්ද මෙහි අන්තර්ගත වේ.

විශ්වවිද්‍යාලයට ජයග්‍රහණ රාශියක් අත්කරදුන් වසරක් ලෙස 2018 හැඳින්විය හැකි අතර එම ජයග්‍රහණ අතුරින් සුවිශේෂී වූ කිහිපයක් පමණක් මෙහි පහතින් සාරාංශ කොට දක්වමි.

- රුපියල් මිලියන 129.64ක වටිනාකමින් යුතු පර්යේෂණ ප්‍රදාන හැත්තෑ පහක් (75) බාහිර පර්යේෂණ ආයතනවලින් ලබාගැනීම
- විදෙස් රටවල සංවිධාන සමඟ අවබෝධතා ගිවිසුම් 33ක් අත්සන් තැබීම
- ජාත්‍යන්තර සමුළු 20ක් පැවැත්වීම
- ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන විශාල ප්‍රමාණයක් 2016 වසරේදී දිනාගැනීම
- ශිෂ්‍ය ගහනයෙන් 55%කට පමණ නේවාසික පහසුකම් සැපයෙන නව ශිෂ්‍ය නේවාසිකාගාර තුනක් ඉදිකිරීම
- වසර කිහිපයක් තිස්සේ හිඟයක්ව පැවති නව නිවාස අධ්‍යයන කාර්යමණ්ඩල නිවාස සංඛ්‍යාවට එකතු කිරීම
- වසර 30ක් හෝ ඊට අධික කාලයක් තිස්සේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුනොවු ශාස්ත්‍ර පීඨයේ පෞරාණිකත්වයෙන් යුතු ගොඩනැගිලි ඒවායේ මූලික ස්වරූපයෙන් දිස්වන ආකාරයට ප්‍රතිසංස්කරණය කිරීම ඇරඹීම

අප විශ්වවිද්‍යාලයේ විද්වතුන් හා සිසුන් විසින් අත්කරගත් විශිෂ්ටතා හා සම්මාන පිළිබඳ වැඩි විස්තර මෙම වාර්ෂික වාර්තාවේ අදාළ කොටස්වලට ඇතුළත් කොට ඇත. අප විසින් අත්කරගත් ජයග්‍රහණයන් තක්සේරු කොට බැලීම පිණිස පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මෙම වාර්ෂික වාර්තාව අධ්‍යයන කරන ලෙස ඉමහත් ප්‍රීතියෙන් යුතුව මම ඔබ සැමට ආරාධනා කොට සිටිමි.

අවසාන වශයෙන් 2018 වසර වඩාත් ඵලදායි හා සම්මානනීය වසරක් කරගනු පිණිස මහත් කැපවීමෙන් හා වෙහෙස මහන්සිවී කටයුතු කළ සියලු දෙනාටම මාගේ කෘතඥතාවය පළකර සිටිමි. එක් එක් පීඨවල ආයතන හා මධ්‍යස්ථානවල වාර්තා ගෙන මෙම වාර්ෂික වාර්තාව සංගෘහිත කිරීම වෙනුවෙන් සංඛ්‍යාලේඛන නිලධාරිනී, ඒ.ඒ.කේ.යු. අතපත්තු මහත්මිය විසින් සිදුකළ කාර්යභාරය විශේෂයෙන් ඇගයීමට ලක්කරමි.

**මහාචාර්ය උපුල් බී දිසානායක**

# පටුන


1. හැඳින්වීම
- 1.1 උපකුලපතිතුමාගේ සමාලෝචනය ....1
- 1.2 පාලක සභාව ....5
- 1.3 සනාතන සභාව ....6
- 1.4 සමස්ත කාර්ය සාධනය ....13
- 1.5 බාධක සහ පිළියම් ....30
- 1.6 අනාගත සැලසුම් ....31

2. සිසුන් හා කාර්ය මණ්ඩල කටයුතු ....32
- 2.1 සිසුන්
  - 2.1.1 සම්පත් සහ සිසුන් ....33
  - 2.1.2 ප්‍රථම උපාධි අපේක්ෂක උපාධි වැඩසටහන්වල දේශීය සිසුන් ....34
  - 2.1.3 ප්‍රථම උපාධි අපේක්ෂක උපාධි වැඩසටහන්වල විදේශීය සිසුන් ....35
  - 2.1.4 නවක විදෙස් සිසුන් හා පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වීම ....35
  - 2.1.5 බාහිර ශිෂ්‍ය ලියාපදිංචිය ....36
- 2.2 කාර්ය මණ්ඩලය
  - 2.2.1 අ) අනුමත සේවක තනතුරු හා වත්මන් කාර්ය මණ්ඩලය ....36
  - 2.2.1 ආ) අධ්‍යයන කාර්ය මණ්ඩලය ....38
  - 2.2.1 ඇ) අනුමත තනතුරු හා වත්මන් අධ්‍යයන කාර්ය මණ්ඩලය ....42
  - 2.2.2 අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය ....43
  - 2.2.3 අනධ්‍යයන කාර්ය මණ්ඩලය ....43
  - 2.2.4 නව බඳවාගැනීම් - අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය 2009-2018 ....44
  - 2.2.5 ප්‍රථම උපාධි ඉගැන්වීම්/පශ්චාත් උපාධි ඉගැන්වීම්/පර්යේෂණ/සම්මන්ත්‍රණ/වැඩමුළු සඳහා පැමිණි විදේශ අමුත්තන් ....45
  - 2.2.6 පශ්චාත් උපාධි සඳහා ලියාපදිංචි වූ අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලය (දෙස්/විදෙස්) ....46
- 2.3 හඳුන්වාදුන් නව පාඨමාලා ....48
- 2.4 අ) දේශීය සංවිධාන සමඟ අත්සන් කළ අවබෝධතා ගිවිසුම් ....49
- 2.4 ආ) ජාත්‍යන්තර සංවිධාන සමඟ අත්සන් කළ අවබෝධතා ගිවිසුම් ....50
- 2.5 වෘත්තිය සංවර්ධනය උදෙසා ලද දේශීය සහෘදත්ව/ශිෂ්‍යත්ව/සම්මාන ....53
- 2.6 වෘත්තීය සංවර්ධනය උදෙසා ලද විදෙස් සහෘදත්ව/ශිෂ්‍යත්ව/සම්මාන ....55
- 2.7 විශ්වවිද්‍යාලය විසින් පවත්වන ලද ජාත්‍යන්තර සමුළු/වැඩමුළු ....57
- 2.8 පවත්වන ලද වැඩමුළු/සම්මන්ත්‍රණ/පුහුණු වැඩසටහන් ....58
- 2.9 ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය මුදල්) ....60
- 2.10 ව්‍යාපෘති පිළිබඳ විස්තර (විදෙස් මුදල්) ....72
- 2.11 ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය/විදේශීය මුදල්) ....73

3. පීඨ/පශ්චාත් උපාධි ආයතන හා පුස්තකාල ජාලය
- 3.1 කෘෂි විද්‍යා පීඨය ....84
- 3.2 සම සෞඛ්‍ය විද්‍යා පීඨය ....89
- 3.3 ශාස්ත්‍ර පීඨය ....95
- 3.4 දන්ත වෛද්‍ය පීඨය ....98
- 3.5 ඉංජිනේරු විද්‍යා පීඨය ....104
- 3.6 කළමනාකරණ පීඨය ....106
- 3.7 වෛද්‍ය පීඨය ....109
- 3.8 විද්‍යා පීඨය ....110
- 3.9 පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය ....112
- 3.10 පශ්චාත් උපාධි ආයතනය
  - 3.10.1 කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ....114
  - 3.10.2 මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ....117
  - 3.10.3 විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ....119
- 3.11 පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල ජාලය ....122

4. ප්‍රධාන මධ්‍යස්ථාන හා ඒකක

4.1 තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය ........ 124
4.2 ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය ........ 125
4.3 වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය ........ 126
4.4 දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය ........ 128
4.5 පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය ........ 130
4.6 අභ්‍යන්තර තත්වාරක්ෂණ ඒකකය ........ 132
4.7 ජාත්‍යන්තර කටයුතු කාර්යාලය ........ 136
4.8 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය ........ 138

5. උපස්ථම්භක සේවාවන්

5.1 වෛද්‍ය මධ්‍යස්ථානය හා සෞඛ්‍ය සේවාවන් ........ 140
5.2 උද්‍යාන අංශය ........ 142
5.3 විනයාරක්ෂක අංශය ........ 144
5.4 ශාරීරික අධ්‍යාපන අංශය ........ 146
5.5 ආරක්ෂක සේවාවන් ........ 148
5.6 ශිෂ්‍ය නේවාසික අංශය ........ 149
5.7 ශිෂ්‍ය සේවා අංශය ........ 151

6. පර්යේෂණ ප්‍රකාශන හා සම්මාන

6.1 විද්‍යා හා තාක්ෂණ සංවර්ධන ප්‍රතිඵල ........ 153
6.2 පේටන්ට් බලපත්‍ර ........ 153
6.3 සාමාන්‍ය ජනතාව උදෙසා දැනුම ව්‍යාප්ත කිරීමේ වැඩසටහන් ........ 154
6.4 ජාතික හා ජාත්‍යන්තර සම්මාන ........ 158

7. යටිතල පහසුකම් පිළිබඳ විස්තර

7.1 කෙරීගෙන යන සියලු මූලධන ව්‍යාපෘති ........ 162
7.2 කෙරීගෙන යන සියලු පුනරුත්ථාපන ව්‍යපෘති ........ 163
7.3 නව පුනරුත්ථාපන ව්‍යාපෘති ........ 164
7.4 නව මූලධන ව්‍යාපෘති ........ 167

8. මුදල් වාර්තාව
8.1 මුදල් වාර්තාව - 2018 ........ 168
8.2 විගණන කමිටු වාර්තාව ........ 170
8.3 2017 හා 2018 වසරවල මුළු අදායම ........ 172
8.4 2017 හා 2018 වසරවල මූලධන වියදම ........ 173
8.5 පුනරාවර්ථන වියදම ........ 174
8.6 මුදල් ප්‍රගතිය (වියදම) ........ 176
8.7 මුදල් ප්‍රගතිය (සාමාන්‍ය ආදායම) ........ 176
8.8 මුදල් කාර්ය සාධන විශ්ලේෂණය ........ 176
8.9 මුදල් තත්ත්ව ප්‍රකාශනය ........ 177
8.10 මුදල් කාර්ය සාධන ප්‍රකාශනය ........ 179
8.11 වර්ෂයේ මුදල් ගලන ප්‍රකාශනය ........ 180
8.12 වර්ෂයේ විසර්ජන ගිණුම් ........ 181
8.13 වර්ෂයේ සාමාන්‍ය අගය වෙනස්වීමේ ප්‍රකාශනය ........ 182
8.14 මුදල් ප්‍රකාශනයට අදාළ සටහන් ........ 183
8.15 2018,2019 වසරවලදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ක්‍රියාත්මක කරන ලද චිරස්ථායී සංවර්ධන වැඩසටහන් ........ 189
8.16 විගණන වාර්තාව - 2018 ........ 191
8.17 පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුර ........ 206



# 1. හැඳින්වීම

## 1.1 උපකුලපතිතුමාගේ සංක්ෂිප්ත හැඳින්වීම

(මහාචාර්ය උපුල් බී. දිසානායක)

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයට පසුව 1942 වසරේ ජූලි මස පළමුවැනි දින කොළඹදී ස්ථාපිත කරන ලද පේරාදෙණිය විශ්වවිද්‍යාලය මෙරට අනෙකුත් විශ්වවිද්‍යාල අතරින් පැරණිම හා විශාලතම විශ්වවිද්‍යාලයයි. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය 1952 වසරේ ඔක්තොම්බර් මස 6වැනි දින පේරාදෙණියට ගෙන ඒමත් සමගම ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය පේරාදෙණියේ ස්ථාපිත කිරීම නියමාකාරයෙන් සනිටුහන් කරන ලදී. මධ්‍යම පළාතේ මහනුවර නගරයේ සිට කිලෝමීටර් අටකට (08) පමණ ඈත ස්වභාවික සෞන්දර්යයෙන් හෙබි ප්‍රදේශයක පිහිටි විශ්වවිද්‍යාලය හෙක්ටයාර් 775ක් පුරා පැතිර යන භූමි ප්‍රමාණයකින් යුතු, අධ්‍යාපන, නේවාසික පහසුකම්, ක්‍රීඩා, සංස්කෘතික හා ස්වාභාවිකත්වය යන කුමන කරුණකින් වුවත්, ශ්‍රී ලංකාවේ අනෙකුත් විශ්වවිද්‍යාලයන් අතරින් අද්විතීය අත්දැකීමක් දායාද කරනු ලබන්නේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙනි.

පසුගිය වසර 76 කාලය පුරාවට විශිෂ්ට ගණයේ ඉගෙනුම් මධ්‍යස්ථානයක් ලෙස ව්‍යාප්ත වී ඇති පේරාදෙණිය විශ්වවිද්‍යාලය ජාත්‍යන්තර පිළිගැනීමට ලක්ව පවතින අතරම, මෙරට එකම කීර්තිමත් විශ්වවිද්‍යාලය ද වෙයි. කෘෂි

විද්‍යා, සම සෞඛ්‍ය, ශාස්ත්‍ර, දන්ත වෛද්‍ය, ඉංජිනේරු, වෛද්‍ය, විද්‍යා, පශු වෛද්‍ය විද්‍යා සහ කළමනාකරණ යන පීඨ ඒ අතර වේ. ආරම්භයේදී හතරක්ව පැවති පීඨ සංඛ්‍යාව වර්තමානය වන විට පීඨ 9ක්ව පවතී. කෘෂි විද්‍යා පශ්චාත් උපාධි හා විද්‍යා පශ්චාත් උපාධි ආයතන සහ සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර උපාධි ආයතනය යන පශ්චාත් උපාධි ආයතන තුනකින් ද මෙම විශ්වවිද්‍යාලය සමන්විත වේ. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයක් ආරම්භ කිරීමේ කටයුතු සිදුවෙමින් පවතී.

අභ්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාවෙන් බහුතරයකටත් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයටත් නේවාසික පහසුකම් සපයන විශ්වවිද්‍යාලයක් ලෙස පේරාදෙණිය විශ්වවිද්‍යාලය සැලසුම් කරන ලදී. අභ්‍යන්තර ප්‍රථම උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 55%කට වැඩි පිරිසකට නේවාසික පහසුකම් සපයන නේවාසිකාගාර 21ක්, වෛද්‍ය මධ්‍යස්ථානයක්, විශ්වවිද්‍යාලයේ විවිධ ජන කොටස්වල අභිරුචීන් පිරිමසාලන සිද්ධස්ථාන, සංගම් රාශියකින් ඉටු කෙරෙන ක්‍රීඩා හා සංස්කෘතික පහසුකම්වලින් යුතු ජාතියේ උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා වන වඩාත් ආකර්ෂණීය විශ්විද්‍යාලය පේරාදෙණිය විශ්වවිද්‍යාලයයි.

ප්‍රථම උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාව 12,750ක් පමණ වන අතර, අධ්‍යාපන පරිපාලන හා සේවා අංශ හරහා පැතිර යන මුළු කාර්ය මණ්ඩල සංඛ්‍යාව ආසන්න වශයෙන් 3500කි. පේරාදෙණිය විශ්වවිද්‍යාලය කලා, නීතිය හා මානව ශාස්ත්‍ර යන ක්ෂේත්‍රවල සිට භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, ඉංජිනේරු හා පරිගණක විද්‍යාව, කෘෂි විද්‍යාව, දන්ත වෛද්‍ය, සම සෞඛ්‍ය විද්‍යාව, පශු වෛද්‍ය හා සත්ව විද්‍යාව යන ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි ප්‍රථම උපාධි වැඩසටහන් 21ක් ප්‍රදානය කරනු ලබයි. දන්ත වෛද්‍ය, පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨයක් හා භූගර්භ විද්‍යා අධ්‍යයන අංශයක් පවතින මෙරට එකම විශ්වවිද්‍යාලය පේරාදෙණිය විශ්වවිද්‍යාලයයි.

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ සමාජ විද්‍යා, මානව ශාස්ත්‍ර උපාධි ආයතනවල ලියාපදිංචි සිසුන් ද ඇතුලුව පශ්චාත් උපාධි පාඨමාලා හදාරන ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 8500කි. දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය පැරණි හා මාර්ගගත (Online) යන ක්‍රමයන් භාවිතා කරගනිමින් විවිධ ක්ෂේත්‍රයන්ට අදාළ සහතික පත්‍ර, ඩිප්ලෝමා හා උපාධි සුදුසුකම් ලබා දෙන බාහිර පුහුණු අවස්ථාවන් සැලසුම් කොට පිරිනැමීමේ කාර්යභාරය උසුලයි. දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ කලා විෂයධාරාවෙන් බාහිර උපාධි පාඨමාලා හදාරන සිසුන් සංඛ්‍යාව 2500ක් පමණ වන අතර සිසුන් 500ක් පමණ වෙනත් අඛණ්ඩ පාඨමාලා හදාරති.

විශ්වවිද්‍යාල මධ්‍යම පරිපාලනය පරිපාලන අංශ අටකින්, මුදල් අංශය, අභ්‍යන්තර විගණන අංශය සේවා අංශ නවයකින් හා මධ්‍යස්ථාන/ඒකක 08කින් යුක්ත වේ. මධ්‍යම පරිපාලන සැකැස්ම පිටු අංක 03හි දක්වේ.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය අධ්‍යයන අංශවල වැඩසටහන්වලට සම්බන්ධ වන වැදගත් ඉගෙනුම් සහායක සේවාවන් 04කි. ඒවා පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල ජාලය, තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය, වෘත්තීය මාර්ගෝපදේශන සේවා ඒකකය හා ඉංග්‍රීසි භාෂාව ඉගෙන්වීමේ ඒකකය ලෙස හැඳින්වේ. විශේෂිත පුහුණු හා සේවා කෘත්‍යයන් ඉටු කිරීම සඳහා වෙනත් මධ්‍යස්ථාන හා ඒකක කිහිපයක් ස්ථාපිත කොට ඇති අතර එම මධ්‍යස්ථාන හා ඒකක මගින් ඩිප්ලෝමා හා සහතික පත්‍ර මට්ටමේ පාඨමාලා හා විවිධ තාක්ෂණික හා වෘත්තීය සේවාවන් මූලිකවම ගාස්තු අය කිරීමේ පදනම මත සැලසුම් කොට පිරිනමනු ලබයි. ප්‍රධාන මධ්‍යස්ථාන හා ඒකක වල ජයග්‍රහණයන් හා සාමාන්‍ය විස්තර අංක 04 කොටසෙහි විස්තරාත්මකව ඉදිරිපත් කර ඇත.

# සංවිධාන ව්‍යුහය



විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
කුලපති
විශ්වවිද්‍යාලය
පාලක සභාව
සභාපති සභාව
උපකුලපති
නියෝජ්‍ය උපකුලපති
මධ්‍යම පරිපාලනය
ලේඛකාධිකාරී
මූල්‍යාධිකාරී
අභ්‍යන්තර විගණන අංශය
අධ්‍යයන ආයතන අංශය
මූලධන පුනරුත්ථාපන අංශය
සංයුක්ත කළමනාකරණ අංශය
පාලක සභා හා අධ්‍යයන අංශය
සාමාන්‍ය පරිපාලන අංශය
නීති හා ප්‍රලේඛන අංශය
අනධ්‍යයන ආයතන අංශය
ශිෂ්‍ය ලියාපදිංචි අංශය
ශිෂ්‍ය සේවා අංශය
වෛද්‍ය මධ්‍යස්ථානය
උද්‍යාන අංශය
විනාරක්ෂක අංශය
ශාරීරික අධ්‍යාපන අංශය
මහජන සම්බන්ධතා අංශය
ආරක්ෂක අංශය
සංඛ්‍යා ලේඛන හා තොරතුරු අංශය
ශිෂ්‍ය නේවාසික අංශය
වැඩ දෙපාර්තමේන්තුව
මූලධන ගෙවීම් හා මූලධන
අයවැය පාලන අංශය
පීඨ සහ මධ්‍යස්ථාන අංශය
අවසන් ගිණුම් අංශය
ස්ථාවර වත්කම් හා ගබඩා අංශය
කළමනාකරණ පීඨය
දේශීය හා විදෙස් සැපයුම් අංශය
අභ්‍යන්තර පද්ධති හා තත්ත්වාරක්ෂණ අංශය
ගෙවීම් සහ අයවැය පාලන අංශය
පර්යේෂණ වෙනත් මුදල් හා ව්‍යාපෘති අංශය
දේශීය ආදායම් බැදුම්කර විගණන විමසුම් හා මුදල් කළමනාකරණ අංශය
වැටුප් ණය හා විශ්‍රාම ප්‍රතිලාභ අංශය
ශිෂ්‍ය සේවා අංශය
මධ්‍යස්ථාන හා ඒකක
අධ්‍යක්ෂවරුන්
කළමනාකරණ මණ්ඩලය
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය
පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය
තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය
මානව හිමිකම් අධ්‍යක්ෂන මධ්‍යස්ථානය
කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය
ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකකය
වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය
ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය
අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ඒකකය
අන්තර්ජාල හා සන්නිවේදන සේවා ඒකකය
ප්‍රධාන පුස්තකාලය
ප්‍රධාන පුස්තකාලයාධිපති
පීඨ පුස්තකාලය
කෘෂි විද්‍යා
සමසෞඛ්‍ය
දන්ත වෛද්‍ය
ඉංජිනේරු
වෛද්‍ය
විද්‍යා
පශු වෛද්‍ය
පීඨ
පීඨාධිපතින්
පීඨ මණ්ඩල
කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය
විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
දෙපාර්තමේන්තු/මධ්‍යස්ථාන/ඒකක
අංශ ප්‍රධානීන්
පශ්චාත් උපාධි ආයතනය
කළමනාකරණ මණ්ඩලය
අධ්‍යක්ෂවරුන්
කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය
විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

## 1.2 පාලක සභාව

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 44වැනි වගන්තිය ප්‍රකාරව සහ 1985 අංක 07 දරණ (සංශෝධිත) විශ්වවිද්‍යාල පනතේ 24වැනි වගන්ති ප්‍රකාරව 2018 වසරේ විශ්වවිද්‍යාල පාලක සභාව පහත සඳහන් සාමාජිකයන්ගෙන් යුක්ත විය.

| | |
|---|---|
| **උපකුලපති** | මහාචාර්ය උපුල් බී. දිසානායක |
| **නියෝජ්‍ය උපකුලපති** | මහාචාර්ය එස්.එච්.පී.පී. කරුණාරත්න |

**පීඨාධිපතීන්**

| | |
|---|---|
| කෘෂි විද්‍යා පීඨය | මහාචාර්ය ඩී.කේ.එන්.ජී. පුෂ්පකුමාර |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | වෛද්‍ය ඩී.බී.එම්. වික්‍රමරත්න |
| ශාස්ත්‍ර පීඨය | මහාචාර්ය ඕ.ජී. දයාරත්න බංඩා |
| දන්ත වෛද්‍ය පීඨය | මහාචාර්ය ඩබ්.එම්. තිලකරත්න (2018.08.09 දක්වා) |
| | වෛද්‍ය ජේ.ඒ.වී.පී. ජයසිංහ (2018.08.10 සිට) |
| ඉංජිනේරු පීඨය | මහාචාර්ය ලීලානන්ද රාජපක්ෂ (2018.10.30 දක්වා) |
| | මහාචාර්ය ජී.බී.බී. හෙරත් (2018.10.31 සිට) |
| කළමනාකරණ පීඨය | ආචාර්ය එම්. ඇල්ෆ්‍රඩ් |
| වෛද්‍ය පීඨය | මහාචාර්ය වී.එස්. වීරසිංහ (2018.09.11 දක්වා) |
| | මහාචාර්ය ආසිරි අබේගුණවර්ධන (2018.09.12 සිට) |
| විද්‍යා පීඨය | මහාචාර්ය එස්.ආර්. කොඩිතුවක්කු |
| පශු වෛද්‍ය පීඨය | මහාචාර්ය එච්.බී.එස්. ආරියරත්න (2018.10.30 දක්වා) |
| | වෛද්‍ය ඩී.එම්.එස්. මුණසිංහ (2018.10.31 සිට) |

**සනාතන සභාව විසින් නම් කරන ලද සාමාජිකයන්**

මහාචාර්ය එන්.ඒ.ඒ.එස්.පී. නිස්සංක
මහාචාර්ය ඒ.එස්.පී. අභයරත්න

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරන ලද සාමාජිකයින්**

| | |
|---|---|
| පී.සී.එස්. රත්වත්ත මයා | වෛද්‍ය එම්.ටී. සියාඩ් මොහොමඩ් |
| ආචාර්ය රනිල් අබේසිංහ | රාවන් විජේරත්න මයා |
| යූ.ඩබ්.බී. අත්තනායක මයා | මනීෂ සෙනවිරත්න මයා |
| මහාචාර්ය කේ.එන්.ඕ. ධර්මදාස | ආචාර්ය එස්. තිරුචන්ද්‍රන් |
| ඊ.එච්.පී. ඇල්කඩුව මයා | මහාචාර්ය ජී.එස්.ජේ. දිසානායක |
| උපුල් කුමාරපෙරුම මයා | මහාචාර්ය සී.එම්. මද්දුමබණ්ඩාර |
| මහාචාර්ය පී.එස්. මීගස්කුඹුර | මහාචාර්ය අයි.එම්.කේ. ලියනගේ |

## 1.3 සනාතන සභාව

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ, 1985 අංක 07 දරණ සංශෝධිත පනතින් 46වැනි කොටසේ වගන්ති ප්‍රකාරව සංයුක්ත වූ සනාතන සභාව විශ්වවිද්‍යාලයේ අධ්‍යයන බලමණ්ඩලය වේ.
එහි සමාජිකයින් පහත පරිදි වේ.

| | |
|---|---|
| **1.3.1 උපකුලපති** | මහාචාර්ය උපුල් බී. දිසානායක |
| **1.3.2 නියෝජ්‍ය උපකුලපති** | මහාචාර්ය එස්.එච්.පී.පී. කරුණාරත්න |

### 1.3.3 පශ්චාත් උපාධි ආයතනවල අධ්‍යක්ෂවරුන්

| | |
|---|---|
| කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | මහාචාර්ය සී.එම්.බී. දෙමටවැව |
| විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | මහාචාර්ය එච්.එම්.ටී.ජී.ඒ. පිටවල (වැ.බ.) |
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | ආචාර්ය ජේ.එම්.ඒ. ජයවික්‍රම |

### 1.3.4 පීඨාධිපතීන්

| | |
|---|---|
| කෘෂි විද්‍යා පීඨය | මහාචාර්ය ඩී.කේ.එන්.ජී. පුෂ්පකුමාර |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | වෛද්‍ය ඩී.බී.එම්. වික්‍රමරත්න |
| ශාස්ත්‍ර පීඨය | මහාචාර්ය ඕ.ජී. දයාරත්න බංඩා |
| දන්ත වෛද්‍ය පීඨය | මහාචාර්ය ඩබ්.එම්. තිලකරත්න (2018.08.09 දක්වා) |
| | වෛද්‍ය ජේ.ඒ.වී.පී. ජයසිංහ (2018.08.10 සිට) |
| ඉංජිනේරු පීඨය | මහාචාර්ය ලීලානන්ද රාජපක්ෂ (2018.10.30 දක්වා) |
| | මහාචාර්ය ජී.බී.බී. හෙරත් (2018.10.31 සිට) |
| කළමනාකරණ පීඨය | ආචාර්ය එම්. ඇල්ෆ්‍රඩ් |
| වෛද්‍ය පීඨය | මහාචාර්ය වී.එස්. වීරසිංහ (2018.09.11 දක්වා) |
| | මහාචාර්ය ආසිරි අබේගුණවර්ධන (2018.09.12 සිට) |
| විද්‍යා පීඨය | මහාචාර්ය එස්.ආර්. කොඩිතුවක්කු |
| පශු වෛද්‍ය පීඨය | මහාචාර්ය එච්.බී.එස්. ආරියරත්න (2018.10.30 දක්වා) |
| | වෛද්‍ය ඩී.එම්.එස්. මුණසිංහ (2018.10.31 සිට) |

| | |
|---|---|
| **1.3.5 පුස්තකාලයාධිපති** | ආර්. මහේෂ්වරන් මයා (වැ.බ.) |

### 1.3.6 අංශ ප්‍රධානීන්

**කෘෂි විද්‍යා පීඨය**

| | |
|---|---|
| කෘෂි ජීව විද්‍යා අධ්‍යයන අංශය | ආචාර්ය එච්.එම්.වී.ජී. හේරත් (2018.09.02 දක්වා) |
| | ආචාර්ය කේ.එස්. හේමචන්ද්‍ර (2018.09.03 සිට) |
| කෘෂි ආර්ථික විද්‍යා හා ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයන අංශය | මහාචාර්ය කේ.ඒ.එස්.එස්. කොඩිතුවක්කු |
| කෘෂි ඉංජිනේරු අධ්‍යයන අංශය | මහාචාර්ය එම්.අයි.එම්. මොව්ජුද් (2018.10.14 දක්වා) |
| | ආචාර්ය එස්. පත්මරාජා (2018.10.15 සිට) |
| කෘෂි ව්‍යාප්ති අධ්‍යයන අංශය | ආචාර්ය එම්.ඩබ්.ඒ.පී ජයතිලක (2018.08.31 දක්වා) |
| | ආචාර්ය එල්.එන්.ඒ.සී. ජයවර්ධන (2018.09.01 සිට) |
| සත්ව විද්‍යා අධ්‍යයන අංශය | එම්.බී.පී. මහීපාල මහතා (2018.05.31 දක්වා) |
| | ආචාර්ය ඒ.ආර්.එස්.බී. අතාවුද (2018.06.01 සිට) |
| බෝග විද්‍යා අධ්‍යයන අංශය | මහාචාර්ය ටී. සිවානන්තවේල (2018.11.13 දක්වා) |
| | ආචාර්ය ඩබ්.එම්.ටී.පී. ආරියරත්න (2018.11.14 සිට) |
| ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයන අංශය | ආචාර්ය ආර්.පී.එන්.පී. රාජපක්ෂ |
| පාංශු විද්‍යා අධ්‍යයන අංශය | ආචාර්ය ඩබ්.එස්. දන්දෙණිය |

**සම සෞඛ්‍ය විද්‍යා පීඨය**

| | |
|---|---|
| වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යයන අංශය | වෛද්‍ය එම්.බී.එම්.එල්.ඩී.කේ. යටවර |
| හෙදවේද අධ්‍යයන අංශය | වෛද්‍ය ආර්.පී. ඉල්ලපෙරුම |
| භෞතවේද අධ්‍යයන අංශය | ඒ.එල්.අයි. ප්‍රසන්න මහතා |
| විකිරණ හා විකිරණ චිකිත්සක අධ්‍යයන අංශය | වෛද්‍ය එම්.ඒ.ජේ.සී. මාරසිංහ |
| ඖෂධවේද අධ්‍යයන අංශය | වෛද්‍ය ඒ.සී.එම්. ෆහීම් |
| මූලික විද්‍යා අධ්‍යයන අංශය | වෛද්‍ය එච්.එම්.ටී.යු. හේරත් |

**ශාස්ත්‍ර පීඨය**

| | |
|---|---|
| අරාබි හා ඉස්ලාමීය සංස්කෘතික අධ්‍යයන අංශය | ආචාර්ය එම්.එල්.එම්. හනීෆා |
| පුරාවිද්‍යා අධ්‍යයන අංශය | ආචාර්ය ආර්.එම්.එම්. චන්ද්‍රරත්න |
| සම්භාව්‍ය භාෂා අධ්‍යයන අංශය | ආචාර්ය ඩබ්.එම්.ඩබ්.ජී.සී.එස්.එම්. වික්‍රමසිංහ (2018.05.31 දක්වා) |
| | ආචාර්ය ආර්.පී. සෙනෙවිරත්න (2018.06.01 සිට) |
| ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයන අංශය | මහාචාර්ය එස්. විජේසන්දිරන් මයා |
| අධ්‍යාපන අධ්‍යයන අංශය | ආචාර්ය පී.ආර්.කේ.ඒ. විතාරන |
| ඉංග්‍රීසි භාෂා අධ්‍යයන අංශය | මහාචාර්ය සී.එස්. වික්‍රමගමගේ |
| ලලිත කලා අධ්‍යයන අංශය | ආචාර්ය එම්.ඒ.ජී.එම්.එස්.බී. අලවතුකොටුව |
| භූගෝල විද්‍යා අධ්‍යයන අංශය | එම්.ඒ.එස්. ජයකුමාර මහතා |
| ඉතිහාස අධ්‍යයන අංශය | ආචාර්ය එන්.ඒ. විමලසේන |
| නීති අධ්‍යයන අංශය | ආචාර්ය එස්.එස්.කේ.බී.එම්. දොරබාවිල |
| දර්ශන අධ්‍යයන අංශය | මහාචාර්ය පී.එම්. ජමාහිර් |
| මනෝවිද්‍යා අධ්‍යයන අංශය | ආචාර්ය බී.ඩී.ඩී. පතිරණ |
| දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය | ආචාර්ය එම්.ඩබ්.ඒ.ජී. විතානවසම් මයා |
| | මහාචාර්ය ආර්.ඩී.ජී. ජයවර්ධන |
| පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය | ආචාර්ය බී. ශාන්තවිමල හිමි |
| | මහාචාර්ය ආර්.ජී.ඩී. ජයවර්ධන |
| සිංහල භාෂා අධ්‍යයන අංශය | ආචාර්ය ඩබ්.බී.එස්.කේ. ප්‍රේමසිරි (2018.05.09 දක්වා) |
| | ඩී.එම්.එම්.කේ. දිසානායක මහතා (2018.06.10 සිට) |
| සමාජ විද්‍යා අධ්‍යයන අංශය | ආචාර්ය ආර්.එම්. අබේරත්න |
| දෙමළ භාෂා අධ්‍යයන අංශය | ආචාර්ය එස්.ආර්. තීවර් |

**දන්ත වෛද්‍ය පීඨය**

| | |
|---|---|
| මූලික විද්‍යා අධ්‍යයන අංශය | වෛද්‍ය කේ.එස්.එන්. ආරියසිංහ (2018.02.26 දක්වා) |
| | මහාචාර්ය එච්.ආර්.ඩී. පීරිස් (2018.02.27 සිට) |
| සමාජ දන්ත සෞඛ්‍ය අධ්‍යයන අංශය | වෛද්‍ය වී.එස්.එන්. විතානාරච්චි |
| මුඛ සෞඛ්‍ය හා පරිදන්ත වෛද්‍ය අධ්‍යයන අංශය | මහාචාර්ය එච්.එන්.එස්. සොයිසා (2018.07.16 දක්වා) |
| | මහාචාර්ය පී.එස්. රාජපක්ෂ (2018.06.17 සිට) |
| | මහාචාර්ය එච්.එන්.එස් සොයිසා (2018.08.20 සිට) |
| මුඛ ව්‍යාධවේද අධ්‍යයන අංශය | මහාචාර්ය ඊ.ඒ.පී.ඩී. අමරතුංග |
| කෘතීම දන්ත වෛද්‍ය අධ්‍යයන අංශය | වෛද්‍ය ජේ.ඒ.වී.පී. ජයසිංහ (2018.08.09 දක්වා) |
| | වෛද්‍ය ආර්.එම්. ජයසිංහ (2018.08.10 සිට) |
| දන්ත සංරක්ෂණ අධ්‍යයන අංශය | මහාචාර්ය කේ.එම්. විජේරත්න (2018.09.30 දක්වා) |
| | වෛද්‍ය එම්.සී.එන්. ෆොන්සේකා (2018.10.01 සිට) |
| මුඛ හා හනු ශල්‍ය අධ්‍යයන වෛද්‍ය අංශය | වෛද්‍ය ඩබ්.එම්.පී.එස්.කේ. විජේකෝන් |

**ඉංජිනේරු පීඨය**

| | |
|---|---|
| රසායන හා සැකසුම් ඉංජිනේරු අධ්‍යයන අංශය | ආචාර්ය සී.එස්. කල්පගේ |
| සිවිල් ඉංජිනේරු අධ්‍යයන අංශය | ආචාර්ය ඒ.ජී.එච්.ජේ. එදිරිසිංහ |
| පරිගණක ඉංජිනේරු අධ්‍යයන අංශය | ආචාර්ය කේ.ඩබ්.එච්.එම්.ආර්.ඩී.බී. ඇල්කඩුව |
| විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අධ්‍යයන අංශය | මහාචාර්ය එම්.ඒ.ආර්.එම්. ප්‍රනාන්දු |
| ඉංජිනේරු කළමනාකරණ අධ්‍යයන අංශය | ආචාර්ය ජී.බී.බී. හේරත් (2018.10.30 දක්වා) |
| | ආචාර්ය කේ.කේ.කේ. සිල්වා (2018.10.31 සිට) |
| ඉංජිනේරු ගණිත විද්‍යා අධ්‍යයන අංශය | ආචාර්ය ජී.ඩබ්.ආර්.එම්.ආර්. පාලමකුඹුර (2018.05.31 දක්වා) |
| | ආචාර්ය ආර්. මීගස්කුඹුර (2018.06.01 සිට) |
| යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයන අංශය | ආචාර්ය එස්.ඩී.ජී.එස්.පී. ගුණවර්ධන |
| නිෂ්පාදනය හා කර්මාන්ත ඉංජිනේරු අධ්‍යයන අංශය | ආචාර්ය සී.ඩී. සේනානායක |

**කළමනාකරණ පීඨය**

| | |
|---|---|
| ව්‍යාපාර මූල්‍ය අංශය | ආචාර්ය ඊ.එම්.ඒ.එස්.බී. ඒකනායක |
| මානව සම්පත් කළමනාකරණ අංශය | ආචාර්ය ඩබ්.පී.ආර්. වික්‍රමරත්න මයා (2018.06.30 දක්වා) |
| | එන්. අගිලන් මයා (2018.07.01 සිට) |
| කළමනාකරණ අධ්‍යයන අංශය | වී. තර්මතාසන් මයා |
| වෙළඳ කළමනාකරණ අධ්‍යයන අංශය | ඩබ්.එම්.එච්.යු. විජේතුංග (2018.09.20 දක්වා) |
| | ආචාර්ය බී.ඒ.එන්. එරන්ද (2018.09.21 සිට) |
| මෙහෙයුම් කළමනාකරණ අධ්‍යයන අංශය | ආචාර්ය එස්. මහේස්වරන් (2018.01.01 සිට) |

**වෛද්‍ය පීඨය**

| | |
|---|---|
| කාය ව්‍යවච්ඡේද අධ්‍යයන අංශය | වෛද්‍ය ජේ.කේ. දිසානායක |
| නිර්වින්දන වෛද්‍ය අධ්‍යයන අංශය | වෛද්‍ය එම්.වී.ජී. පින්ටෝ |
| ජෛව රසායන විද්‍යා අධ්‍යයන අංශය | වෛද්‍ය එච්.කේ.අයි. පෙරේරා |
| ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය | වෛද්‍ය ටී.එම්.යු.එස්.බී. තෙන්නකෝන් (2018.03.31 දක්වා) |
| | මහාචාර්ය එස්.ඩී. ධර්මරත්න (2018.04.01 සිට) |
| අධිකරණ වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය | මහාචාර්ය කේ.ඒ.එස්. කොඩිකාර |
| වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය | මහාචාර්ය අයි.බී. ගවරම්මාන්න (2018.08.31 දක්වා) |
| | මහාචාර්ය යූ.ඒ.බී. මැදගම (2018.09.01 සිට) |
| ක්ෂුද්‍ර ජීව විද්‍යා අධ්‍යයන අංශය | වෛද්‍ය බී.එන්. දිසානායක (2018.06.02 දක්වා) |
| | වෛද්‍ය සී.ඩී. ගමගේ (2018.06.03 සිට) |
| ප්‍රසව හා නාරිවේද අධ්‍යයන අංශය | වෛද්‍ය ආර්.එම්.සී.ජේ. රත්නායක |
| ළමා රෝග අධ්‍යයන අංශය | වෛද්‍ය එස්.බී. කුඩගම්මන |
| පරපෝෂ විද්‍යා අධ්‍යයන අංශය | වෛද්‍ය ඩබ්.ඩී.එස්.ජේ. වික්‍රමසිංහ (2018.09.19 දක්වා) |
| | වෛද්‍ය ඩබ්.එම්.ඩී.ආර්. ඉද්දවෙල (2018.09.20 සිට) |
| ව්‍යාධවේද අධ්‍යයන අංශය | වෛද්‍ය එස්. විජේතුංග |
| භිෂග්වේද අධ්‍යයන අංශය | වෛද්‍ය වයි.ඒ. ඉලංගසේකර |
| භෞතවේද අධ්‍යයන අංශය | මහාචාර්ය එන්.එස්. කලුපහන |
| මනෝ වෛද්‍ය අධ්‍යයන අංශය | වෛද්‍ය ජී.එස්.එස්.එස්.ආර්. ඩයස් (2018.06.05 දක්වා) |
| | වෛද්‍ය පී. ගිනිගේ (2018.06.06 සිට) |
| විකිරණ විද්‍යා අධ්‍යයන අංශය | වෛද්‍ය රොසයිරෝ (2018.06.05 දක්වා) |
| | මහාචාර්ය පී.බී. හේවාවිතාන (2018.06.06 සිට) |
| ශල්‍ය වෛද්‍ය අධ්‍යයන අංශය | මහාචාර්ය කේ.බී. ගල්කැටිය (2018.06.05 දක්වා) |
| | වෛද්‍ය ඒ.ඩී. ධර්මපාල (2018.06.06 සිට) |

## විද්‍යා පීඨය

| | |
|---|---|
| උද්භිත විද්‍යා අධ්‍යයන අංශය | මහාචාර්ය ඩී.එම්.ඩී. යකන්දාවල |
| රසායන විද්‍යා අධ්‍යයන අංශය | මහාචාර්ය එම්.එම්.ඒ.එන්. නවරත්න (2018.05.07 දක්වා) |
| | ආචාර්ය ඩබ්.එම්.ඒ.ටී. බණ්ඩාර (2018.05.08 සිට) |
| භූගර්භ විද්‍යා අධ්‍යයන අංශය | මහාචාර්ය ආර්.එල්.ආර්. චන්ද්‍රජිත් |
| අණුක ජීව විද්‍යා හා ජෛව රසායන අධ්‍යයන අංශය | ආචාර්ය එස්.ඩී.එස්.එස්. සූරියපතිරණ |
| ගණිත විද්‍යා අධ්‍යයන අංශය | මහාචාර්ය ඒ.ඒ.අයි. පෙරේරා |
| භෞතික විද්‍යා අධ්‍යයන අංශය | ආචාර්ය එල්.ආර්.ඒ.කේ. බණ්ඩාර (2018.01.15 දක්වා) |
| | මහාචාර්ය ඩී.එම්.වී.ඒ. සෙනෙවිරත්න (2018.01.16 සිට) |
| සංඛ්‍යාන හා පරිගණක විද්‍යා අධ්‍යයන අංශය | ආචාර්ය යූ.ඒ.ජේ. පිනිදියආරච්චි |
| සත්ව විද්‍යා අධ්‍යයන අංශය | ආචාර්ය එම්.ඩබ්.එස්.කේ. යටිගම්මන |

## පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය

| | |
|---|---|
| පශු මූලික විද්‍යා අධ්‍යයන අංශය | වෛද්‍ය එල්.ජේ.පී.ඒ.පී. ජයසූරිය (2018.02.19 දක්වා) |
| | වෛද්‍ය ඩී.එම්.එස්. මුනසිංහ (2018.02.20 සිට) |
| | වෛද්‍ය ඩබ්.එම්.ඒ.පී. වනිගසේකර (2018.11.31 සිට) |
| ගොවිපල සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යයන අංශය | වෛද්‍ය පී.ඒ.බී.ඩී. ඇලෙක්සැන්ඩර් (2018.10.24 දක්වා) |
| | මහාචාර්ය පී.ජී.ඒ. පුෂ්පකුමාර (2018.10.25 සිට) |
| පශු චිකිත්සක විද්‍යා අධ්‍යයන අංශය | වෛද්‍ය කේ.ඒ.එන්. විජයවර්ධන |
| පශු ව්‍යාධි ජීව විද්‍යා අධ්‍යයන අංශය | මහාචාර්ය ආර්.පී.වී.ජේ. රාජපක්ෂ (01.08.2017 සිට) |
| පශු මහජන සෞඛ්‍ය හා භිෂග්වේද අධ්‍යයන අංශය | වෛද්‍ය ආර්.එස්. කලුපහන (2018.04.15 දක්වා) |
| | වෛද්‍ය එම්.එච්. හතුරුසිංහ (2018.04.16 සිට) |

### 1.3.7 අංශ ප්‍රධානීන් නොවන වෙනත් මහාචාර්යවරුන්

**කෘෂි විද්‍යා පීඨය**

මහාචාර්ය ඩී.සී. බණ්ඩාර
මහාචාර්ය බී.එෆ්.ඒ. බස්නායක
මහාචාර්ය ඩබ්.ඒ.ජේ.එම්. ද කොස්තා
මහාචාර්ය ඩී.එම්. ද කොස්තා
මහාචාර්ය ඩී.ඒ.එන්. ධර්මසේන
මහාචාර්ය ඊ.ආර්.එන්. ගුණවර්ධන
මහාචාර්ය ඩී.සී.කේ. ඉලේපෙරුම
මහාචාර්ය ඩබ්.එම්.ටී. මදුජිත්
මහාචාර්ය පී.ඩබ්.එම්.බී.බී. මාරඹේ
මහාචාර්ය කේ.ඒ. නන්දසේන
මහාචාර්ය එන්.ඒ.ඒ.එස්.පී. නිශ්ශංක
මහාචාර්ය ආර්.එම්.සී.පී. රාජපක්ෂ
මහාචාර්ය කේ. සමරසිංහ
මහාචාර්ය එස්. සමිත
මහාචාර්ය ජී.එල්.එල්.පී. සිල්වා
මහාචාර්ය ඩබ්.පී.ආර්.පී. ද සිල්වා
මහාචාර්ය වී.ඒ. සුමනසිංහ
මහාචාර්ය ඩබ්.ඒ.ඩී.පී. වනිගසුන්දර
මහාචාර්ය එච්.එල්.ජේ. වීරහේවා
මහාචාර්ය ඩබ්.ඒ.පී. වීරක්කොඩි
මහාචාර්ය එම්.පී.බී. විජේගුණවර්ධන
මහාචාර්ය එල්.එච්.පී. ගුණරත්න
මහාචාර්ය වයි.වී.ඒ. ජනක්කමිල්
මහාචාර්ය එම්.අයි.එම්. මච්ඡුද්

**ශාස්ත්‍ර පීඨය**

මහාචාර්ය ජී.ඩී.ආර්.යූ.යූ. අබේරත්න
මහාචාර්ය ඒ.එස්.පී. අභයරත්න
මහාචාර්ය ඩී.පී.ඩී. අමරසේකර
මහාචාර්ය එම්. ඥානානන්ද හිමි
මහාචාර්ය ඩී.එන්.බී. ගුණවර්ධන
මහාචාර්ය ඒ.එල්.ටී. හේවාවසම්
මහාචාර්ය පී.එම්. ජමාහීර්
මහාචාර්ය ජී.ජී.එස්. කුලරත්න
මහාචාර්ය ඩබ්.ඒ. ලියනගේ
මහාචාර්ය වී. මහේෂ්වරන්
මහාචාර්ය ඩබ්.එල්.පී. පෙරේරා
මහාචාර්ය එම්.ආර්. පින්නවල
මහාචාර්ය කේ. රාහුල හිමි
මහාචාර්ය එස්. සිවමෝහන්
මහාචාර්ය එම්. සෝමතිලක
මහාචාර්ය ඒ. පරාක්‍රම
මහාචාර්ය එස්.ඩබ්. පෙරේරා

**දන්ත වෛද්‍ය පීඨය**

මහාචාර්ය ඒ.කේ. අරඹවත්ත
මහාචාර්ය එස්.එල්. ඒකනායක
මහාචාර්ය පී.ආර්. ජයසූරිය
මහාචාර්ය ජේ.ඒ.එම්.එස්. ජයතිලක
මහාචාර්ය ආර්.ඩී. ජයසිංහ
මහාචාර්ය ජේ.ඒ.සී.කේ. ජයවර්ධන
මහාචාර්ය එස්.පී.එන්.පී. නාගරත්න
මහාචාර්ය සී.ඩී. නානායක්කාර
මහාචාර්ය කේ.එස්.එන්. ආරියසිංහ

**ඉංජිනේරු පීඨය**

මහාචාර්ය එස්.බී.එස්. අබේකෝන්
මහාචාර්ය පී.බී.ආර්. දිසානායක
මහාචාර්ය ජේ.බී. ඒකනායක
මහාචාර්ය යූ. ද එස්. ජයවර්ධන
මහාචාර්ය ආර්. ශාන්තිනී
මහාචාර්ය කේ.ඒ.එස්. සුසන්ත
මහාචාර්ය ඩී.එන්. උඩුවාවල
මහාචාර්ය කේ.එස්. වල්ගම
මහාචාර්ය එස්.බී. වීරකෝන්
මහාචාර්ය කේ.එම්. ලියනගේ
මහාචාර්ය කේ.ඩී.ඩබ්. නන්දලාල්
මහාචාර්ය කේ.පී.පී. පතිරණ
මහාචාර්ය එස්.ඩී. පතිරණ
මහාචාර්ය ජේ.ජේ. විජේතුංග
මහාචාර්ය එල්. රාජපක්ෂ

## වෛද්‍ය පීඨය

මහාචාර්ය එස්.බී. අධිකාරී
මහාචාර්ය ඩබ්.ඩී.එම්.ටී.එල්. දසනායක
මහාචාර්ය ඒ.එම්.එස්.ඩී.එම්. දිසානායක
මහචාර්ය කේ.බී. ගල්කැටිය
මහාචාර්ය අයි.බී. ගවරම්මාන්න
මහාචාර්ය කේ. ගුණවර්ධන
මහාචාර්ය පී.බී. හේවාවිතාරන
මහාචාර්ය එම්.ඩබ්.සී.ජේ. ජයසිංහ
මහාචාර්ය ඒ. ජයසිංහ
මහාචාර්ය පී.වී.ආර්. කුමාරසිරි
මහාචාර්ය එස්.ඒ.එම්. කුලරත්න
මහාචාර්ය එම්.ඩී. ළමාවංශ
මහාචාර්ය කේ.එන්. මාරඹේ
මහාචාර්ය ආර්.එම්. මුදියන්සේ
මහාචාර්ය එෆ්. නූර්ධීන්
මහාචාර්ය ජේ.ජී.එස්. රණසිංහ
මහාචාර්ය ආර්. වඩුගේ
මහාචාර්ය සී.එන්.ආර්.ඒ. අලස්
මහාචාර්ය ඩබ්.ඒ.ටී.ඒ. ජයලත්
මහාචාර්ය ටී.එන්. රාජපක්ෂ
මහාචාර්ය වී.එස්. වීරසිංහ
මහාචාර්ය ඩබ්.ඩී.එස්.ජේ. වික්‍රමසිංහ
මහාචාර්ය ඩී.එම්.පී.යූ.කේ. රළපනාව
මහාචාර්ය එන්.වී.අයි. රත්නතුංග
මහාචාර්ය එච්.එම්.ඒ. සොමිනන්ද

## විද්‍යා පීඨය

මහාචාර්ය එච්.ඒ. ධර්මගුණවර්ධන
මහාචාර්ය එම්.වයි.යූ. ගනේහේනගේ
මහාචාර්ය එච්.ඒ.එච්. ජයසේන
මහාචාර්ය ඩී.එන්. කරුණාරත්න
මහාචාර්ය එන්.එල්.වී.වී. කරුණාරත්න
මහාචාර්ය එස්.එච්.පී.පී. කරුණාරත්න
මහාචාර්ය ඩබ්.ඒ.අයි.පී. කරුණාරත්න
මහාචාර්ය එච්.එම්.එස්.පී. මඩවල
මහාචාර්ය එච්.එම්.ඩී.ඩී. නාමල් ප්‍රියන්ත
මහාචාර්ය ඒ.ඩී.එල්.සී. පෙරේරා
මහාචාර්ය ජී.ඒ.ඩී. පෙරේරා
මහාචාර්ය ආර්.එම්.ජී. රාජපක්ෂ
මහාචාර්ය ආර්.ජී.එස්. රාජපක්ෂ
මහාචාර්ය ආර්.එස්. රාජකරුණා
මහාචාර්ය කේ.බී. රණවන
මහාචාර්ය පී. සමරසේකර
මහාචාර්ය ඒ. සේනාරත්න
මහාචාර්ය ඒ. වික්‍රමසිංහ
මහාචාර්ය සී.එල්. අබයසේකර
මහාචාර්ය එස්.එන්.එම්.ඩබ්.ඩබ්.එම්.පී. විජේකෝන්
මහාචාර්ය එල්.ආර්.ඒ.කේ. බණ්ඩාර
මහාචාර්ය සී.වී. හෙට්ටිආරච්චි
මහාචාර්ය කේ.එම්.ජී.ජී. ජයසූරිය
මහාචාර්ය එච්.එම්.ඒ.එන්. නවරත්න
මහාචාර්ය පී. සමරවීර
මහාචාර්ය වයි.පී.ආර්.ඩී. යාපා

## පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය

මහාචාර්ය ඒ. දංගොල්ල
මහාචාර්ය අයි.ඩී. සිල්වා
මහාචාර්ය එච්.බී.එස්. ආරියරත්න

### 1.3.8. සනාතන සභාවේ පීඨ නියෝජිතයන්

**කෘෂි විද්‍යා පීඨය**

ආචාර්ය ඩබ්.එම්.ටී.පී. ආරියරත්න
ආචාර්ය කේ.කේ.එස්.පී. කොඩිතුවක්කු

**සම සෞඛ්‍ය විද්‍යා පීඨය**

වෛද්‍ය ඩී. බණ්ඩාරනායක (ඉල්ලා අස්වන තෙක්)
වෛද්‍ය යූ.ජේ.එම්.ඒ.එල්. ජයසිංහ
වෛද්‍ය එම්.පී.එස්. මුදලිගේ

**ශාස්ත්‍ර පීඨය**

ආචාර්ය සුරේෂ් ද මෙල්
ආචාර්ය වී. එදිරිසිංහ

**දන්ත වෛද්‍ය පීඨය**

වෛද්‍ය ඒ.එම්. ආටිගල
වෛද්‍ය එම්.සී.එන්. ෆොන්සේකා

**ඉංජිනේරු පීඨය**

ආචාර්ය එස්.ඩී. දේවසුරේන්ද්‍ර
ආචාර්ය ඩී.එච්.එස්. මෛත්‍රීපාල

**කළමනාකරණ පීඨය**

ආචාර්ය එස්. කොඩිතුවක්කු මිය
එම්.ජී.පී.ඩී. මැණිකේ
එන්. අගිලන් මහතා
ආචාර්ය ආර්.එච්. කුරුප්පුගේ (එන්. ඇගිලන් මහතාගේ ඉතිරි කාලය තෙක්)
ආචාර්ය බී.ඒ.එන්. එරන්ද
එම්. රණසිංහ මිය (එරන්ද මහතාගේ ඉතිරි කාලය තෙක්)

**වෛද්‍ය පීඨය**

වෛද්‍ය එස්. ඩී. ධර්මරත්න
වෛද්‍ය ඩී.එම්.ජී. ප්‍රනාන්දු

**විද්‍යා පීඨය**

ආචාර්ය ඒ.ඒ.එස්. පෙරේරා
මහාචාර්ය ඩබ්.බී. දවුන්දසේකර

**පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය**

වෛද්‍ය පී.ජී.ඒ. පුෂ්පකුමාර
වෛද්‍ය ආර්.ඒ.සී. රබෙල් (පුෂ්පකුමාර මහතාගේ ඉතිරි කාලය තෙක්)

## 1.4 සමස්ත කාර්ය සාධනය

### 1.4.1 උපාධි ලබාගැනීම

2017/2018 අධ්‍යයන වර්ෂය තුළදී ද දින දර්ශනයේ දිනවලට අනුව සැලසුම් කළ සියලුම අධ්‍යයන ක්‍රියාකාරකම් සාර්ථකව අවසන් කරන ලදි. ඒ අනුව පීඨ නවයේ හා පශ්චාත් උපාධි ආයතන තුනෙන් උපාධිධාරීන් 3442 දෙනෙකු ප්‍රථම උපාධි (2561) හා දර්ශනශූරී උපාධි 40ක් හා පශ්චාත් උපාධි 768ක් ඇතුළත්ව උපාධි 881ක් ලබාගන්නට විය.

**වගුව 1 උපාධිලාභීන්ගේ සාරාංශ වාර්තාව - උපාධි ප්‍රදානෝත්සවය 2017**

**වගුව 1:1 ප්‍රථම උපාධි**

| පීඨය/ආයතනය | උපාධි | ශිෂ්‍ය සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|
| කෘෂි විද්‍යා | විද්‍යාවේදී (කෘෂි කළමනාකරණ) | 147 | 203 |
| | විද්‍යාවේදී (සත්ව විද්‍යාව හා මත්ස්‍ය) | 42 | |
| | විද්‍යාවේදී (ආහාර විද්‍යා තාක්‍ෂණය) | 14 | |
| සම සෞඛ්‍ය | වෛද්‍ය රසායනාගාර විද්‍යා | 25 | 197 |
| | හෙදවේද | 22 | |
| | ඖෂධවේද | 30 | |
| | විකිරණ චිකිත්සක | 62 | |
| | විකිරණ විද්‍යා | 58 | |
| කලා | ගෞරව උපාධි | 1 | 831 |
| | වාණිජවේදී | 43 | |
| | නීතිවේදී | 51 | |
| | ශාස්ත්‍රවේදී (විශේෂ) | 481 | |
| | ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) | 255 | |
| දන්ත වෛද්‍ය | දන්ත වෛද්‍යවේදී | 79 | |
| ඉංජිනේරු | විද්‍යාවේදී | 403 | |
| කළමනාකරණ | ව්‍යාපාර පරිපාලනවේදී | 128 | 128 |
| වෛද්‍ය | වෛද්‍ය විද්‍යාවේදී | 202 | |
| විද්‍යා | විද්‍යාවේදී (විශේෂ) | 165 | 439 |
| | විද්‍යාවේදී (ව්‍යවහාරික) | 36 | |
| | විද්‍යාවේදී (සාමාන්‍ය) | 134 | |
| | විද්‍යාවේදී (සංඛ්‍යානය හා මෙහෙයුම් පර්යේෂණ) | 32 | |
| | විද්‍යාවේදී (පරිගණක කළමනාකරණ) | 72 | |
| පශු වෛද්‍ය හා සත්ව විද්‍යා | පශු වෛද්‍ය විද්‍යාවේදී | 80 | |
| **එකතුව** | | **2562** | **2562** |

**වගුව 1:2 පශ්චාත් උපාධි**

| පීඨය/ආයතනය | උපාධි | ශිෂ්‍ය සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|
| කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | දර්ශනශූරී | 9 | 371 |
| | දර්ශනපති | 20 | |
| | ව්‍යාපාර පරිපාලනපති | 22 | |
| | විද්‍යාපති | 320 | |

වගුව 1:2 පශ්චාත් උපාධි වගුව හා සම්බන්ධ වේ.

| පීඨය/ආයතනය | උපාධි | ශිෂ්‍ය සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|
| විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | දර්ශනශූරී | 18 | 235 |
| | දර්ශනපති | 21 | |
| | විද්‍යාපති | 196 | |
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | දර්ශනශූරී | 8 | 194 |
| | දර්ශනපති | 13 | |
| | ශාස්ත්‍රපති | 170 | |
| | M.D.P | 3 | |
| ඉංජිනේරු | දර්ශනශූරී | 2 | **30** |
| | දර්ශනපති | 4 | |
| | විද්‍යාපති (ඉංජිනේරු) | 24 | |
| වෛද්‍ය | දර්ශනශූරී | 3 | **15** |
| | දර්ශනපති | 6 | |
| | විද්‍යාපති | 6 | |
| පශු වෛද්‍ය හා සත්ව විද්‍යා | පශු වෛද්‍ය විද්‍යාවේදී | 8 | **35** |
| | පශු විද්‍යාපති | 27 | |
| **එකතුව** | | 880 | 880 |

## වගුව 2 ප්‍රථම උපාධි වර්ගීකරණය - උපාධි ප්‍රදානෝත්සවය - 2017

| උපාධිය | උපාධි වැඩසටහන | පලමු පෙළ | දෙවන පෙළ ඉහළ | දෙවන පෙළ පහළ | තෙවන පෙළ | සමත් | එකතුව | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| කෘෂි විද්‍යා | කෘෂි තාක්ෂණ හා කළමනාකරණ | 11 | 51 | 52 | | 33 | **147** | 203 |
| | සත්ව විද්‍යා හා මත්ස්‍ය | | 15 | 10 | | 17 | **42** | |
| | ආහාර විද්‍යා හා තාක්ෂණ | 2 | 8 | 3 | | 1 | **14** | |
| සම සෞඛ්‍ය | වෛද්‍ය රසායනාගාර විද්‍යා | | 8 | 7 | | 10 | **25** | 197 |
| | හෙදවේද | | 3 | 13 | | 6 | **22** | |
| | ඖෂධවේද | 5 | 14 | 9 | | 2 | **30** | |
| | භෞත චිකිත්සකවේද | 1 | 8 | 19 | | 34 | **62** | |
| | විකිරණ විද්‍යාවේදී | 2 | 12 | 21 | | 23 | **58** | |
| කලා | කලා විශේෂවේදී | 20 | 286 | 137 | | 38 | **481** | 829 |
| | කලා සාමාන්‍යවේදී | | 65 | 119 | | 71 | **255** | |
| | වාණිජවේදී | 1 | 12 | 12 | | 18 | **43** | |
| | නීතිවේදී | | 5 | 11 | | 35 | **51** | |
| දන්ත වෛද්‍ය | දන්ත ශල්‍ය වෛද්‍යවේදී | 5 | 16 | 29 | | 29 | **79** | 79 |
| ඉංජිනේරු | ඉංජිනේරු විද්‍යාවේදී | 43 | 118 | 104 | 114 | 24 | **403** | 403 |
| කළමනාකරණ | කළමනාකරණ | 6 | 37 | 24 | | 61 | **128** | 128 |
| වෛද්‍ය | වෛද්‍ය විද්‍යාවේදී | 7 | 20 | 64 | | 111 | **202** | 202 |
| විද්‍යා | විද්‍යාවේදී (සාමාන්‍ය) | | 9 | 20 | | 105 | **134** | 439 |
| | විද්‍යාවේදී (විශේෂ) | 37 | 92 | 28 | | 8 | **165** | |
| | ව්‍යවහාර විද්‍යාවේදී | 2 | 8 | 19 | | 7 | **36** | |
| | ගණන කළමනාකරණවේදී | 3 | 8 | 13 | | 48 | **72** | |
| | සංඛ්‍යාන හා මෙහෙයුම් පර්යේෂණ | 4 | 8 | 9 | | 11 | **32** | |
| පශු වෛද්‍ය හා සත්ව විද්‍යා | පශු වෛද්‍ය විද්‍යාවේදී | 3 | 31 | 20 | | 26 | **80** | 80 |
| එකතුව | | **152** | **834** | **743** | **114** | **718** | **2561** | |

# උපාධි ප්‍රදානෝත්සවය



### 1.4.2 හොඳම වාර්ෂික වාර්තා හා ගිණුම් ප්‍රකාශන - දෙවන ස්ථානය

ශ්‍රී ලංකා රාජ්‍ය මුදල් ගිණුම්කරුවන්ගේ සංගමය වාර්ෂික වාර්තා හා ගිණුම් පිළිබඳ පැවැත් වූ තරගයකදී රාජ්‍ය අංශයේ 2015 සඳහා වන හොඳම වාර්ෂික වාර්තා සහ ගිණුම් පිළිබඳ ත්‍යාගයේ දෙවන ස්ථානය පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ලබාදී ඇත. මෙම උත්සවය බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විය.







### 1.4.3 කාර්ය මණ්ඩලය හා සිසුන් විසින් ලද සම්මාන

පේරාදෙණිය විශ්වවිද්‍යාලය එහි විශිෂ්ටතා දැක්වීම 2018 වසරේදී ද අඛණ්ඩව පවත්වාගෙන ගිය අතර සිසුන් හා කාර්ය මණ්ඩලය ඒ ඒ අංශවලින් ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් දක්ෂතා දැක්වීම තුළින් අත්කරගත් ජයග්‍රහණ අතරින් කිහිපයක් පහත ලැයිස්තු ගතකොට දැක්වේ.

- විද්‍යා පීඨයේ භූ විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය ආර්.එල්.ආර්. චන්ද්‍රජිත් භෞතික විද්‍යා ක්ෂේත්‍රයේ වඩාත් කැපී පෙනෙන ජ්‍යෙෂ්ඨ පර්යේෂකයාට හිමි CVCD විශිෂ්ටතා සම්මානය - 2018 හිමිකර ගන්නට සමත්විය.

- කෘෂි විද්‍යා පීඨයේ භෝග විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය ඩබ්.ඒ.ජේ.එම්.ද කොස්තා ජීව විද්‍යා කෘෂිකර්ම හා සම සෞඛ්‍ය විද්‍යා ක්ෂේත්‍රයේ වඩාත් කැපීපෙනෙන ජ්‍යෙෂ්ඨ පර්යේෂකයාට හිමි විශිෂ්ටතා සම්මානය 2018 හිමිකරගන්නට සමත්විය.

- විද්‍යා පීඨයේ සත්ව විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය එස්.එච්.පී.පී. කරුණාරත්නට ඔහුගේ පර්යේෂණ තුළින් ශ්‍රී ලංකාවට කළ දායකත්වය වෙනුවෙන් විද්‍යාභිවර්ධනය සඳහා වන ශ්‍රී ලංකා සංගමය විසින් සාමාන්‍ය පර්යේෂණ කමිටු ත්‍යාගය 2018 ප්‍රදානය කරන ලදි.

- මහාචාර්ය ජී.එල්.එල්.පී සිල්වා, මහාචාර්ය කේ.එම්.එස්. විමලසිරි, ආචාර්ය බී.ඩී.ආර්. ප්‍රසාන්ත, ආචාර්ය කේ.එෆ්.එස්.ටී. සිල්වා සහ නැසීගිය ආචාර්ය එච්.ඒ.එම්. වික්‍රමසිංහ 2015 වසර සඳහා විද්‍යාත්මක ප්‍රකාශන වෙනුවෙන් ජාතික පර්යේෂණ සභාවේ දක්ෂතා සම්මානය ලබාගෙන ඇත.

- කෘෂිකර්ම ඉංජිනේරු අධ්‍යයන අංශයේ මහාචාර්ය ඊ.ආර්.එන්. ගුණවර්ධන, මහාචාර්ය එම්.අයි.එම්. මව්ජූද්, ආචාර්ය එන්.ඩී.කේ. දයාවංශ හා ආචාර්ය ඒ.කේ. කරුණාරත්න ජාතික විද්‍යා පදනමෙන් ප්‍රදානය කළ සම්මානය ලබාගෙන ඇත.

- පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය සාමාජිකයන් 72 දෙදෙනෙකු 2018 වසරේදී 2016 වසර සඳහා වන උසස් තත්ත්වයේ විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මානය ලබාගන්නට විය.




- වෛද්‍ය එස්.ඩී.අයි. නානයක්කාර 2019 වසර සඳහා ශ්‍රී ලංකා භෞතික විද්‍යා සංගමයේ සභාපති ලෙස පත්කරන ලදි.
- මහාචාර්ය ආසිරි අබේගුණවර්ධන බාලි නුවර පැවැත් වූ ආසියා පැසිෆික් ළමාරෝග සංගම් සමුළුවේදී විශිෂ්ට ආසියානු කළමනාකරණ විශේෂඥ ත්‍යාගය 2018 දිනාගන්නට විය. වෛද්‍ය ඒ.ඒ.සී. අලහකෝන් 2018 වසර සඳහා වන කේ.එන්. සෙනෙවිරත්න ත්‍යාගය ලබාගන්නට විය.
- මහාචාර්ය වජිර වීරසිංහ, වෛද්‍ය පද්මිනි දහනායක, වෛද්‍ය මනෝජ් පතිරගේ ඇතුලු ඔවුන්ගේ කණ්ඩායමට ඔවුන් ඉදිරිපත් කළ පර්යේෂණ පත්‍රය සඳහා 48වැනි ජපන් සායනික ස්නායු භෞතික විද්‍යා සංගමයෙන් හොඳම උපුටන සඳහා වන දෙවන ස්ථානයට හිමි ත්‍යාගය ලබාදෙන්නට විය.
- මහාචාර්ය තාරක දසනායක, වෛද්‍ය දේවාස්මිත විජේසුන්දර, වෛද්‍ය චානක කහතුඩුව, මහාචාර්ය වජිර වීරසිංහ ඇතුලු කණ්ඩායම ශ්‍රී ලංකා ස්නායුවේදීන්ගේ සංගමයේ වාර්ෂික සැසියේදී හොඳම වාචික උපුටන ත්‍යාගය දිනාගන්නා ලදි.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සුමුදු නිරාජී සෙනෙවිරත්න මිය ඇගේ "ගිහින් එන්න කානිවල්" හොඳම සිංහල කෙටිකථා එකතුව සඳහා රජත පුස්තක ත්‍යාගය දිනාගත්තාය.
- ඉංග්‍රීසි භාෂා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය කණ්චුක ධර්මසිරි හොඳම පරිවර්තන නාට්‍ය "තට්ට ගායිකාව" සඳහා රාජ්‍ය සාහිත්‍ය සම්මානය දිනාගෙන ඇත.
- මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ දර්ශනශූරී උපාධි අපේක්ෂිකා ආචාර්ය ඉරෝමි ආරියරත්න හොඳම පර්යේෂණ ප්‍රකාශය සඳහා "මුල් බුදු සමයේ සුබ හා අචාර ධර්ම සංකල්පය අතර සම්බන්ධතාවය" රාජ්‍ය සාහිත්‍ය සම්මානය දිනාගෙන ඇත. මෙම පර්යේෂණයේ අධීක්ෂකයන් වශයෙන් මහාචාර්ය පූජ්‍ය එම්. ඥාණානන්ද හා යාවජීව මහාචාර්ය පී.ඩී. ප්‍රේමසිරි කටයුතු කළහ.
- මූලික අධ්‍යයන ජාතික ආයතනයේ පර්යේෂණ මහාචාර්ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ හිටපු අධ්‍යක්ෂ හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ යාවජීව මහාචාර්ය (භෞතික විද්‍යා) ලක්ෂමන් දිසානායක සහ ජාතික මූලික අධ්‍යයන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ යාවජීව මහාචාර්ය සී.බී දිසානායක ජීවිත කාලීන ජයග්‍රහණ වෙනුවෙන් වූ සම්මානය ජනාධිපතිතුමන් අතින් ලබාගත්හ. ජාතික විද්‍යා පදනම විසින් මෙම සම්මානය ප්‍රදානය කරනු ලබන්නේ මෙරට විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයට විශාල මෙහෙවරක් ඉටුකළ පුරෝගාමී විද්‍යාඥයන්ට උපහාර පිණිසය.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා අධ්‍යයන අංශයේ යාවජීව මහාචාර්ය කමලා ලියනගේ මහත්මිය ජපන් ශ්‍රී ලංකා පර්යේෂණ සම්බන්ධතා ශක්තිමත් කිරීම පිණිස ඇය විසින් ඉටුකළ සේවය අගයනු පිණිස ජපන් විදේශ ඇමතිගේ ප්‍රශංසනාත්මක ගෞරවය පිරිනැමීය.

- යාවජීව මහාචාර්ය කේ.එන්.ඕ. ධර්මදාස මහතාට ඔහුගේ ජීවන කාලීන ජයග්‍රහණයන් හා දායකත්වයන් වෙනුවෙන් "සාහිත්‍ය රත්න" සම්මානය පිරිනැමීය.
- ශිෂ්‍යත්ව විශිෂ්ටත්වය හා අතිරේක කටයුතු විශිෂ්ටත්වය සඳහා වන පදක්කම (කළමනාකරණ පීඨය)
- ශ්‍රී ලංකා වයඹ සබරගමුව විශ්වවිද්‍යාලය සංවිධානය කළ අන්තර් විශ්වවිද්‍යාලයීය ප්‍රශ්න විචාරාත්මක තරඟයේ - 2018 ශූරයන් බවට ව්‍යාපාර මුදල් අධ්‍යයන අංශය නියෝජනය කළ කණ්ඩායම පත්විය.
- කැලණිය විශ්වවිද්‍යාලය සංවිධානය කළ අන්තර් විශ්වවිද්‍යාල මුදල් ප්‍රශ්න විචාරාත්මක තරඟයට සහභාගි වූ ව්‍යාපාර මුදල් අධ්‍යයන අංශයේ කණ්ඩායම එහි ශූරයන් බවට පත්විය.

### 1.4.4 ගෝලීය ශ්‍රේණිගත කිරීම්

**1.4.4.(අ)** 2018 නවතම ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වල ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතන අතරින් පේරාදෙණිය විශ්වවිද්‍යාලය පළමු ස්ථානයේ රැඳී සිටී.

| විශ්වවිද්‍යාලය | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| පේරාදෙණිය | 2230 | 2361 | 2113 | 2020 |
| කොළඹ | 2039 | 2092 | 2259 | 2166 |
| මොරටුව | 2407 | 2515 | 2861 | 2722 |
| රුහුණ | 4525 | 4318 | 2874 | 2666 |
| ජයවර්ධනපුර | 4282 | 3752 | 3349 | 3072 |
| කැලණිය | 3129 | 2815 | 2808 | 2753 |



**1.4.4.(ආ)** ආසියානු විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වල පේරාදෙණිය විශ්වවිද්‍යාලය 2018 වසරේදී දෙවන ස්ථානයේ ශ්‍රේණිගත කොට ඇත.




**1.4.4.(ඇ)** පේරාදෙණිය විශ්වවිද්‍යාලය 2018 වසරේදී ලකුණු 4450ක් ලබාගෙන ග්‍රීන් මෙට්‍රික් ලෝක ශ්‍රේණිගත කිරීමේ 412වැනි ස්ථානය හිමිකරගෙන ඇත. එමෙන්ම ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාල අතරින් දෙවන ස්ථානය ද හිමිකරගෙන ඇත. ග්‍රීන් මෙට්‍රික් ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම ආරම්භ කරන ලද්දේ විශ්වවිද්‍යාලවල චිරස්ථායි බව පවත්වා ගැනීමට ගන්නා උත්සාහයන් මැන බැලීමට හා ලෝකය පුරා පවතින විශ්වවිද්‍යාලවල චිරස්ථායි වැඩසටහන් හා ප්‍රතිපත්ති පිළිබිඹු කෙරෙන online සමීක්ෂණයක් නිර්මාණය කිරීමේ අරමුණෙනි.

**1.4.4(ඈ)** පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2018 වසරේදී SËMAGO ආයතනයේ ශ්‍රේණිගත කිරීම්වල ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අතර ප්‍රථම ස්ථානය හිමිකරගෙන ඇත. මෙම ශ්‍රේණිගත කිරීම ලෝකය පුරා විශ්වවිද්‍යාල හා පර්යේෂණ ආයතන පිළිබඳව වඩාත් පුළුල් වූ පර්යේෂණාත්මක ශ්‍රේණිගත කිරීම් කරන ක්‍රමයකි.

### 1.4.5 අධ්‍යයන සංවර්ධනය හා සැලසුම

සංවර්ධනයට අදා පේරාදෙණිය විශ්වවිද්‍යාලය නිරන්තරයෙන්ම ජාතික හා ගෝලීය සන්දර්භය තුළ උසස් අධ්‍යාපනයේ වෙනස්වන ප්‍රවණතාවන් සමඟ ගමන් කොට ඇති අතර මතුවන ප්‍රවණතාවන්ට හා අවශ්‍යතාවන්ට ප්‍රතිචාර වශයෙන් අධ්‍යයන පුහුණු වැඩසටහන්වල හා ක්‍රියාමාර්ගවලට අදාළ නව ක්‍රියාමාර්ග සහ අධ්‍යයන සැලසුම හා වෙනත් සංශෝධන සිදුකොට ඇත.

### 1.4.6 තත්ත්වාරක්ෂණය

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ඒකක අලුතින් නිකුත් කළ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 2015/04 යටතේ දැක්වෙන මාර්ගෝපදේශයන්ට අනුව 2016 පෙබරවාරි 15 දින ප්‍රතිස්ථාපනය කරන ලදි.

මෙම ඒකකය ස්ථාපිත කිරීමේ පරමාර්ථය වනුයේ සැලසුම, සංවිධානය, සම්බන්ධීකරණය, පහසුකම් සැපයීම, ක්‍රියාත්මක කිරීම, නිරීක්ෂණය හා සියලුම අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ක්‍රියාකාරකම් පිළිබඳව වාර්තා කිරීම හරහා විශ්වවිද්‍යාල තුළ තත්ත්ව සංස්කෘතියක් ප්‍රවර්ධනය කොට ආයතනගත කිරීමයි. ඊට අමතරව පීඨ මට්ටමින් තත්ත්වාරක්ෂණ සංසද පිහිටුවා ඇත.

සනාතන සභාව හා එහි අනු කමිටු අධ්‍යයන සංවර්ධන හා සැලසුම් කමිටු සහ අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ඒකකය නිරන්තරයෙන්ම නිත්‍ය තත්ත්වාරක්ෂණ ක්‍රියා කාරකම්වල නියැලී සිටි. පීඨ මට්ටමින් ගත්කල පීඨ මණ්ඩල හා ඒවායේ විෂයමාලා සංවර්ධන අනු කමිටු පීඨ තත්ත්වාරක්ෂණ සංසද සමඟ නිත්‍ය තත්ත්වාරක්ෂණ කටයුතු සිදුකරනු ලබයි.

කලා සහ කළමනාකරණ පීඨවල වැඩසටහන් සමාලෝචන කටයුතු අවසන් කොට ඇත. 2018 වසරේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්වාරක්ෂණ ඒකකයෙන් ප්‍රතිපාදනය කෙරෙන උසස්ම "A" ශ්‍රේණිය කළමනාකරණ පීඨයේ ව්‍යාපාර පරිපාලන (ගෞරව) උපාධි වැඩසටහනට හිමිවිය.

සිසුන් විසින් ගුරුවරුන් ඇගයීම සෑම පීඨයකම විධිමත්කොට ඇති අතර එය සෑම සමාසිකයදීම සිදුකරනු ලබයි.

## 1.4.7 විෂයමාලා හා වැඩසටහන් සංවර්ධනය

විශ්වවිද්‍යාලය එහි අධ්‍යයන වැඩසටහන් ක්‍රමවත්ව සමාලෝචනය හා සංශෝධන කිරීම අඛණ්ඩව සිදුකරීමේ හා විශ්වවිද්‍යාලයේ දැක්ම, මෙහෙවර හා ඉලක්කයන්ට අනුගතවන ආකාරයෙන් එහි අධ්‍යයන වැඩසටහන් පවත්වාගෙන යෑමේ සංස්කෘතියක් විශ්වවිද්‍යාලය සතුව පවතී. මෙම කරුණු සම්බන්ධයෙන් උපකුලපති, පීඨාධිපති හා ආයතනවල අධ්‍යක්ෂවරුන් සනාතන සභාවට වාර්තා කරයි. පාඨමාලා හා පාඨමාලා ඒකකවල සංශෝධන පීඨ විෂයමාලා සංවර්ධන කමිටු, පීඨ මණ්ඩල, සනාතන සභා අධ්‍යයන, සංවර්ධන හා සැලසුම් කමිටු හා සනාතන සභාව විසින් අනුමත කරනු ලබයි. මේ සම්බන්ධයෙන් පුළුල් සාකච්ඡා හා උපදේශන නිත්‍ය පදනමින් සිදුකෙරේ.

## 1.4.8 පර්යේෂණ ප්‍රතිඵල

පේරාදෙණිය විශ්වවිද්‍යාලය අධ්‍යයන සංවර්ධන හා සැලසුම් කිරීමේ ක්‍රියාවලින් පිළිබඳ නව්‍යකරණ මාලාවක් ආරම්භ කොට ඇත. වෙනත් ජාත්‍යන්තරව පිළිගත් විශ්වවිද්‍යාල සමඟ ජාත්‍යන්තර සබඳතා පුළුල් කරගැනීම තුළින් එහි බුද්ධිමය හා පර්යේෂණ දායකත්වයන් ඉහළ නංවාගනිමින් විශ්වවිද්‍යාලයේ ගෝලීය ශ්‍රේණිගත කිරීමේ තත්ත්වය වඩා දියුණු කරගැනීමේ ක්‍රම සහ උපාය මාර්ග පුළුල්ව අනුගමනය කරයි.

උසස් තත්ත්වයේ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර කටයුතු පිළිබඳ කාර්යාලයක් මේ වන විටත් ස්ථාපිත කොට ඇති අතර විශ්වවිද්‍යාල පර්යේෂණ සභාවක් පිහිටුවීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වේ. බහු ක්ෂේත්‍ර ජාතික ආයතන ඉන්කියුබේෂන් මධ්‍යස්ථානයක් හා ව්‍යාපාර සබඳතා නව නිපැයුම් ඉන්ක්‍යුබේෂන් හා තාක්ෂණ පැවරුම් කාර්යාලයක් මේ වනවිටත් ස්ථාපිත කොට ඇත.

### 1.4.8 (අ) ලද පර්යේෂණ ප්‍රදාන (බාහිර මුදල් 2010-2018)

| | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|---|---|---|
| පර්යේෂණ ප්‍රදාන සංඛ්‍යාව | 140 | 144 | 167 | 163 | 129 | 137 | 114 | 96 | 75 |
| වටිනාකම (රු. මිලියන) | 62.71 | 46.58 | 68.80 | 75.92 | 118.90 | 148.83 | 122.68 | 134.92 | 129.64 |



### 1.4.8 (ආ) ප්‍රදානය කළ විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන 2007-2018

| | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පර්යේෂණ ප්‍රදාන සංඛ්‍යාව | 52 | 54 | 42 | 0 | 48 | 63 | 93 | 67 | 0 | 82 | 57 | 53 |
| වටිනාකම (රු. මිලියන) | 4 | 4 | 4 | 0 | 4 | 11 | 52.85 | 48.48 | 0 | 80.17 | 34.4 | 30 |




### 1.4.8 (ඇ) ජල තාක්ෂණය සඳහා චීන-ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ හා ප්‍රදර්ශන මධ්‍යස්ථානය

චීන විද්‍යා ඇකඩමිය නගර සැලසුම් හා ජල සම්පාදන සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සහයෝගිතාවක් මගින් යෝජිත ජල පර්යේෂණ විද්‍යාගාරයේ ඉදිකිරීම් කටයුතු 2018 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කරන ලදි. මෙහි ඉදිකිරීම් 2020 මාර්තු වන විට අවසන් කිරීමට නියමිතය.



### 1.4.9 ප්‍රජා කටයුතු, උපදේශන හා සමාජ ක්‍රියාකාරකම්

#### 1.4.9. (අ) විශ්වවිද්‍යාල රාජ්‍ය ඔසුසල විවෘත කිරීම

විශ්වවිද්‍යාල රාජ්‍ය ඔසුසල සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ ඖෂධවේදී අධ්‍යයන අංශයේ, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සහ ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ සංස්ථාවේ ඒකාබද්ධ සහයෝගීතා ව්‍යාපෘතියකි. ජන ප්‍රජාවට ඖෂධ සම්බන්ධ සේවාවන් සැපයීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. ඊට අමතරව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ඉගැන්වීම් පුහුණුව හා පර්යේෂණ අවස්ථා සකසා දෙනු ලබයි. එමෙන්ම මෙම ඔසුසල තුළින් ඖෂධ පරිහරණය කරන්නන්හට දැඩි අවශ්‍යතාවක් වන උපදේශනය ලබාදීම ද කලාපීය ඖෂධ නිරීක්ෂණ මධ්‍යස්ථානයක් ලෙසද එය ඉතා ප්‍රයෝජනවත් වේ. පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය සිසුන්ට හා කාර්ය මණ්ඩලයට මෙහිදී මිලදී ගන්නා ඖෂධවල මුළු වියදමෙන් 5% වට්ටමක් ලබාදෙනු ලබයි. දීර්ඝ කාලයක සිට දැනුනු මෙම පහසුකම සාක්ෂාත් කරගත හැකි වුයේ රාජ්‍ය ඖෂධ සංස්ථාවෙන් ලබාදෙන ලද මුල්‍ය හා භාණ්ඩ සහයෝගය හේතුවෙනි.

### 1.4.10 දූරස්ථ අධ්‍යාපනය

විශ්වවිද්‍යාලයේ විවෘත හා දූරස්ථ ඉගෙනුම් වැඩසටහන් දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය හරහා පිරිනමනු ලබයි. මෙහි සියලු වැඩසටහන් විශ්වවිද්‍යාලයේ දැක්ම හා මෙහෙවර අනුව සිදුකෙරේ. වර්තමානය වනවිට උපාධි වැඩසටහන් දෙකක් එනම් ශාස්ත්‍රවේදී (බාහිර) හා ව්‍යාපාර පරිපාලනවේදී (Online) උපාධි මෙන්ම කළමනාකරණ හා සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමාවක් ද පිරිනමනු ලබයි.

බාහිර උපාධි ලාභීන්ගේ උපාධි ප්‍රදානෝත්සවය දෙසැම්බර් 06 දින මහනුවර පොල්ගොල්ල මහින්ද රාජපක්ෂ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදි. 2017 වසරේ දී ශාස්ත්‍රවේදී උපාධියේ හා ව්‍යාපාර පරිපාලනවේදී උපාධියේ අවශ්‍යතා සම්පුර්ණ කළ උපාධිලාභීන් 1026 දෙනෙකු මෙහිදී උපාධි ලබාගත්හ.

### 1.4.11 සිසුන් හා කාර්ය මණ්ඩලය සඳහා නේවාසික පහසුකම්

විශ්වවිද්‍යාලයේ සියලුම සිසුන්ට නේවාසික පහසුකම් ලබාදීමේ ප්‍රතිපත්තියක් විශ්වවිද්‍යාලය සතුව පැවතියද දැනට පවතින නේවාසිකාගාරවලින් එම පහසුකම සැලසිය හැකිවන්නේ 55%ක ප්‍රමාණයකට පමණි. අදාළ වසර තුළදී අලුතින් ඉදිකළ සරසවිඋයන හා සේනක බිබිලේ යන නේවාසිකාගාර සිසුන්ගේ පරිහරණය සඳහා ලබාදීමට විශ්වවිද්‍යාලයට හැකිවිය. මහකන්ද අංක 05 හා උඩපේරාදෙණිය ඇතුලත්මුදලි අංක 06 නේවාසිකාගාරවල වැඩ අවසන් කලද ඒවාට අවශ්‍ය ගෘහභාණ්ඩ මෙතෙක් ලැබී නැත. මෙම නේවාසිකාගාර දෙකෙන් සිසුන් 800 දෙනෙකුට 2019 වසරේදී පහසුකම් සැපයීමට නියමිතය. රාමනාදන් ශාලාව ආසන්නයේ ඉදිකළ අංක 07 හා අංක 08 (සරසවි මැදුර) නේවාසිකාගාර දෙකට අවශ්‍ය ගෘහභාණ්ඩ සැපයීමෙන් අනතුරුව සිසුන් 800 දෙනෙකුට නේවාසික පහසුකම් සැපයීමට අපේක්ෂා කෙරේ.

**වගුව 04 සිසුන් සඳහා නේවාසික පහසුකම් - 2018**

| | නේවාසිකාගාරයේ නම | කාමර සංඛ්‍යාව | කාමර ලබාගත් සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|
| | | | පිරිමි | ගැහැණු | එකතුව |
| 1 | අක්බාර් ශාලාව | 289 | 607 | | 607 |
| 2 | අරුණාචලම් ශාලාව | 64 | 190 | | 190 |
| 3 | හිල්ඩා ඔබේසේකර ශාලාව | 164 | | 492 | 492 |
| 4 | අයිවර් ජෙනිංග්ස් ශාලාව | 130 | 528 | | 528 |
| 5 | ජේම්ස් පීරිස් ශාලාව | 73 | 244 | | 244 |
| 6 | ජයතිලක ශාලාව | 64 | 189 | | 189 |
| 7 | සංඝාරාමය හා කෙහෙල්පන්නල භික්ෂු ශාලාව | 57 | 89 | | 89 |
| 8 | මාකස් ප්‍රනාන්දු ශාලාව | 82 | 246 | | 246 |
| 9 | මාර්ස් ශාලාව | 80 | 237 | | 237 |
| 10 | නව අක්බාර් ශාලාව | 60 | 138 | | 138 |
| 11 | රාමනාදන් ශාලාව | 305 | | 1244 | 1244 |
| 12 | සංඝමිත්තා ශාලාව | 186 | | 654 | 654 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 13 | සරසවි උයන ශාලාව | 14 | | 146 | 146 |
| 14 | විජේවර්ධන ශාලාව | 359 | | 828 | 828 |
| 15 | AQ 40 | 5 | 30 | | 30 |
| 16 | මහඉලුප්පල්ලම පිරිමි ශාලාව | 28 | 200 | | 200 |
| 17 | මහඉලුප්පල්ලම ගැහැණු ශාලාව | 100 | | 200 | 200 |
| 18 | හිඳගල ශාලාව | 15 | 56 | | 56 |
| 19 | එදිරිවීර සරත්චන්ද්‍ර ශාලාව | 100 | | 285 | 285 |
| 20 | ගුණපාල මලලසේකර ශාලාව | 100 | | 282 | 282 |
| 21 | සේනක බිබිලේ ශාලාව | 100 | 300 | | 300 |
| | | **2275** | **3054** | **4131** | **7185** |

### 1.4.12 මධ්‍යම පරිපාලනය

සාමාන්‍ය පරිපාලනයේ සංවිධාන ව්‍යුහය කෘත්‍යයන් හා රාජකාරි කටයුතු පුළුල්ව සමාලෝචනය කොට සංශෝධන කටයුතු ආරම්භකොට ඇත.

විශ්වවිද්‍යාලයේ රාජකාරීවල සුමට ගලනයක් ඉලක්ක කොටගෙන විවිධ පරිපාලන තනතුරුවල වගකීම් කෙරෙහි නිසි අවධානය යොමුකරමින් නිලධාරී ධූරාවලිය ප්‍රතිව්‍යුහගත කිරීමට කටයුතු සලසා ඇත. සාමාන්‍ය කළමනාකරණය හා සම්බන්ධව කටයුතු කරන අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා වැඩමුළු රාශියක් විශ්වවිද්‍යාලය විසින් පවත්වා ඇති අතර මෙහි ප්‍රතිඵලයක් වශයෙන් රාජකාරී කාර්යක්ෂමව හා ඵලදායි ආකාරයෙන් ඉටුකිරීමට අවශ්‍ය කුසලතා හා දැනුම සම්බන්ධයෙන් පවතින දුර්වලතා සහ දියුණු කළ යුතු අංශ හඳුනා ගැනීමට හැකිවිය.

මේ හැරුණුවිට සේවකයන් සඳහා කළමනාකරණ මාර්ගෝපදේශ පොතක් සකස් කිරීමට කටයුතු ආරම්භ කොට ඇත. විශ්වවිද්‍යාල පණත්, රෙගුලාසි, පරිපාලන හා මුදල් කළමනාකරණයට අදාළ මාර්ගෝපදේශ, විවිධ රාජකාරී පැවරුණු නිලධාරීන්, පද්ධතියේ සංවිධාන ව්‍යුහය, අංශ හා ඒකක සහ එම අංශ හා ඒකකවලට පැවරුණු රාජකාරී ආදි කරුණු මෙම පොතේ අන්තර්ගත වේ. එමෙන්ම ආදායම් උපයන කටයුතු වලට සම්බන්ධ මධ්‍යස්ථාන හා ඒකක විසින් පිළිපැදිය යුතු මාර්ගෝපදේශ පරිපාලන හා මුදල් කළමනාකරණ ක්‍රියාපටිපාටීන්ද මෙහි ඇතුළත් වේ. සියලුම අධ්‍යයන, අධ්‍යයන සහායක හා අනධ්‍යයන සේවක තනතුරු සමාලෝචනය කොට පුරප්පාඩු පිරවීමට හැකි උපරිමයෙන් කටයුතු කරන ලදි. කාර්ය මණ්ඩලයේ සියලුම සේවක කාණ්ඩ සඳහා රැකියා විස්තර ලබාදෙන්නට විය. විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ක්‍රියාත්මක වන ස්ථාන මාරු කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කොට අනධ්‍යයන සේවකයන්ගේ වගකීම් ඉටුකිරීමට හා ඔවුන්ගේ කාර්යක්ෂමතාවය දියුණුකර ගැනීමට අවස්ථාව ලබාදෙයි.

### 1.4.13 කාර්ය මණ්ඩල සංවර්ධනය

සාමාන්‍ය පරිපාලනයට අනුයුක්ත කාර්ය මණ්ඩලය අඛණ්ඩව පුහුණු කිරීම දීර්ඝ කාලයක සිට දැනුණු අවශ්‍යතාවයකි. මේ නිසා සංශෝධන, පරිපාලන හා කළමනාකරණ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීමත් සමඟ සාමාන්‍ය පරිපාලනයට සම්බන්ධ කාර්ය මණ්ඩලයේ සියලුම සේවක කාණ්ඩ සඳහා වෘත්තීය සංවර්ධනය අඛණ්ඩව පවත්වා ගැනීම පිළිබඳව යෝග්‍ය පුහුණු වැඩසටහන් ආරම්භ කිරීමට මූලික පියවර ගෙන ඇත.
එමෙන්ම විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල දෙකම වෙනුවෙන් කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීමේ බලය කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයට පවරා ඇති බව සඳහන් කළ යුතුය. කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයට අමතරව තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය හා වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය ද කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ කටයුතුවලට සහාය දක්වයි.

### 1.4.14 මුදල් සහ ගිණුම්

පේරාදෙණිය විශ්වවිද්‍යාලය එහි මුදල් අංශය ප්‍රතිසංස්කරණය කොට සංශෝධනය කිරීම පිණිස ප්‍රගතිශීලී පියවර කිහිපයක් ගෙන ඇති අතර ඒ තුළින් මුදල් පරිපාලනයේ කාර්යක්ෂමතාවය දියුණු කිරීම සඳහා සහ එහි ක්‍රියාපටිපාටි සංවිධාන කිරීම හා දුර්වලතා නිවැරදි කිරීම සිදු කරනු ඇත.

#### 1.4.14(අ) විගණන මතය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මුදල් වර්ෂයේ මුදල් ප්‍රකාශනය පිළිබඳව විගණකාධිපතිගෙන් සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කිරීම යන විගණන මතය ලබා ගැනීමට පේරාදෙණිය විශ්වවිද්‍යාලයට හැකිවිය.

#### 1.4.14(ආ) විගණන කමිටුව

මහා භාණ්ඩාගාරය විසින් නිර්දේශ කරන ලද පරිදි විගණන කමිටුව ස්ථාපිත කරන ලද්දේ මුදල් කළමනාකරණයේ කාර්යක්ෂමතාවය දියුණු කිරීමට හා වඩා යහපත් පාලනයක් හඳුන්වා දීම සඳහායි. විගණන කමිටුව විසින් අභ්‍යන්තර හා රජයේ විගණන වාර්තා නිත්‍ය පදනමින් සමාලෝචනය කරනු ලබන්නේ නිවැරදි හා ප්‍රතිකාර්මික පියවර නිර්දේශ කිරීම පිණිසයි. යහපාලනය සඳහා වන රාජ්‍ය ව්‍යවසායක මාර්ගෝපදේශ විශේෂකොට දක්වා ඇති විෂයපථයට අනුව විගණන කමිටුව එහි රාජකාරී ඉටුකරන අතර පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මුදල් කළමනාකරණයේ අභ්‍යන්තර පාලන පද්ධති ශක්තිමත් කරණු පිණිස හා පරිපාලන ක්‍රියාපටිපාටි දියුණු කිරීම පිණිස නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි. 2018 වසරේ දී උපකුලපති, නියෝජ්‍ය උපකුලපති, ලේඛකාධිකාරී, මුල්‍යාධිකාරී හා අදාළ පරිපාලන කාර්ය මණ්ඩලය ආරාධිත අමුත්තන් ලෙස සහභාගී වූ විගණන කමිටු රැස්වීම් පහක් පවත්වන ලදි. ශ්‍රී ලංකා විගණකාධිපති නියෝජනය කරමින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විගණකාධිකාරී ද මෙම රැස්වීම්වලට සහභාගී විය.

#### 1.4.14.(ඇ) මුදල් වෙන්කිරීම් උපයෝජනය හා කළමනාකරණය

අදාළ වසර සඳහා වෙන්කළ රුපියල් මිලියන 6768.5 ප්‍රතිවිරුද්ධව 2018 වසර සඳහා රජයේ ප්‍රදාන ලෙස විශ්වවිද්‍යාලයට ලද මුදල රුපියල් මිලියන 6934කි. අදාළ වසර සඳහා විශ්වවිද්‍යාලයට වෙන්කළ මුදල් ප්‍රමාණවත් නොවීම නිසා අවස්ථා කිහිපයකදීම මහා භාණ්ඩාගාරයේ නිලධාරීන්ගෙන් අමතර මුදල් ප්‍රදාන ඉල්ලා සිටීමට විශ්වවිද්‍යාලයට සිදුවිය. කෙසේ වෙතත් 2018 වසර සඳහා ලද රජයේ මුළු මුදල් ප්‍රදාන පහත සඳහන් පරිදි උපයෝගිකර ගැනීමට විශ්වවිද්‍යාලයට හැකිවිය.

| | වෙන්කළ මුදල (මිලියන) | ලබාගෙන උපයෝගි කරගත් මුදල් (මිලියන) |
|---|---|---|
| මූලධන ප්‍රදාන | 1,535 | 1,417 |
| පුනරාවර්තන ප්‍රදාන | 5,339 | 5,553.4 |

#### 1.4.15 මූලධන ආයෝජන

භෞතික යටිතල සංවර්ධනය උදෙසා පේරාදෙණිය විශ්වවිද්‍යාලයට සැලකියයුතු මුදලක් ලැබුණු අතර අදාළ වසර තුළදී අධ්‍යයන වැඩසටහන් පුළුල් කිරීමත් සමඟ දැනට කෙරීගෙන යන හා නව ඉදිකිරීම් ව්‍යාපෘතිවල විස්තර පහත වගුවලින් පෙන්නුම් කෙරේ.

**මුළු මූලධන ආයෝජනය පහත පරිදි වේ.**

ඉදිකිරීම් සඳහා රුපියල් මිලියන 725යි.
පුනරුත්ථාපනය හා ව්‍යපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 325යි.
මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 18යි.
පර්යේෂණ සවිමත් කිරීම සඳහා රුපියල් මිලියන 30යි.
ස්ථාවර වත්කම් අත්කරගැනීම සඳහා රුපියල් මිලියන 252යි.

2018 වසර තුළදී රුපියල් මිලියන 629ක වටිනාකමින් යුතු නව ඉදිකිරීම් ව්‍යාපෘති හතරක් ක්‍රියාත්මක කිරීමට විශ්වවිද්‍යාලයට හැකි වූ අතර එම වර්ෂයට වෙන්කළ සමස්ත මූලධන හා පුනරුත්ථාපන මුදල් වෙන්කිරීම් උපයෝගී කරගැනීමට ද හැකිවිය.

## 5 වගුව මූලධන යටිතල සංවර්ධන ව්‍යාපෘති

| අංක | ව්‍යාපෘතියේ නම | කොන්ත්‍රාත්කරුගේ නම | වැටසහිත ටෙන්ඩර් මුදල රුපියල් | 2019.01.01 දිනට අතුරු ගෙවීම් රුපියල් | භෞතික ප්‍රගතිය% |
|---|---|---|---|---|---|
| 1 | සරසවි උයන ශිෂ්‍ය නේවාසිකාගාරය පුළුල් කිරීම | ඒ. එස්. බී. කන්ස්ට්‍රක්ෂන් | 77,739,160.97 | 66,727,370.10 | 86% |
| 2 | මාර්කස් ප්‍රනාන්දු ශාලාවට ජලය සැපයීම. | NWS & DB | 7,000,000.00 | 5,600,952.00 | 80% |
| 3 | විශ්වවිද්‍යාල විදුලිබලය බෙදාහැරීමේ පද්ධතිය ඉහළ නැංවීම | ලං.වි.ම | 54,742,360.70 | 54,742,360.70 | 100% |
| 4 | පාරා සායනික ගොඩනැගිල්ල ඉදිකිරීම අදියර II | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | 608,874,537.92 | 241,186,079.95 | 40% |
| 5 | වෛද්‍ය පීඨයේ උසස් වෛද්‍ය විද්‍යායතනය සඳහා යෝජිත ගොඩනැගිල්ල (උපදේශන) | ආර්ච් ඉන්ටනැෂනල් | 49,628,852.46 | 39,703,081.96 | 80% |
| 6 | සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ විද්‍යාගාර දේශනශාලා සහිත පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම | ම. ඉංජී. සේ. පුද්. සමාගම | 80,948,702.45 | 70,849,013.69 | 88% |
| 7 | ශාරීරික අධ්‍යාපන අංශය සඳහා හොකී සහ මලල ක්‍රීඩාගාරයක් ඉදිකිරීම | මිහිර බිල්ඩර්ස් | 36,446,487.96 | 21,025,720.66 | 58% |
| 8 | ඉංජිනේරු පීඨයේ රසායනික ඉංජිනේරු ගොඩනැගිල්ලේ II අදියර ඉදිකිරීම | රාජ්‍ය ඉංජි. සංස්. | 85,489,600.00 | 69,391,714.50 | 81% |
| 9 | ශාස්ත්‍ර පීඨයේ කළමනාකරණ අධ්‍යයන අංශය සඳහා ඉදිකෙරෙන ගොඩනැගිල්ලේ II අදියර | ඒ.එස්.බී. කන්ස්ට්‍රක්ෂන් | 92,936,317.06 | 82,202,091.47 | 88% |
| 10 | වෛද්‍ය පීඨයේ ශල්‍ය වාට්ටුවේ යෝජිත දිගුව | රාජ්‍ය ඉංජි. සංස් | 80,937,642.03 | 66,828,798.67 | 83% |
| 11 | දන්ත වෛද්‍ය පීඨයේ මහල පහකින් යුතු යෝජිත ගොඩනැගිලි සංකීර්ණය | ටියෝ කන්ස්ට්‍රක්ෂන් | 207,338,895.68 | 169,180,489.68 | 82% |
| 12 | කෘෂි විද්‍යා පීඨයේ ප්‍රධාන සැලසුම සංවර්ධනය II අදියර | මයික්‍රෝ කන්ස්ට්‍රක්ෂන් | 379,953,000.00 | 286,548,003.07 | 75% |
| 13 | සංඛ්‍යාන හා පරිගණක විද්‍යා අධ්‍යයන අංශය සඳහා යෝජිත ගොඩනැගිලි සංකීර්ණය. | ඒ. එස්. බී. කන්ස්ට්‍රක්ෂන් | 166,060,972.80 | 145,931,468.92 | |
| 14 | ඉංජිනේරු පීඨයේ යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයන අංශය සංවර්ධනය කිරීමේ සැලසුම් හා ඉදිකිරීම් | සතුට බිල්ඩර්ස් පුද්ගලික. සමාගම | 149,269,367.50 | 126,878,962.38 | |
| 15 | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලයේ යෝජිත ගොඩනැගිලි දිගුව සැලසුම් කිරීම හා ඉදිකිරීම | ඒ. එස්. බී. කන්ස්ට්‍රක්ෂන් | 252,574,500.00 | 121,651,792.90 | |
| 16 | පේරාදෙණිය ඉංජිනේරු පීඨයේ ගණන මධ්‍යස්ථානය, ඉංජිනේරු ගණිතය, ඉංජිනේරු කළමනාකරණය, ඉංජිනේරු පර්යේෂණ හා පශ්චාත් උපාධි සඳහා සිව්මහල් ගොඩනැගිල්ල සැලසුම් කිරීම හා ඉදිකිරීම | සතුට බිල්ඩර්ස් පුද්ගලික. සමාගම | 294,199,325.00 | 193,054,911.75 | 66% |
| 17 | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා පිටිය වටා ඇවිදීමේ පථය ඉදිකිරීම | මයික්‍රෝ කන්ස්ට්‍රක්ෂන් | 27,375,831.65 | 16,472,338.22 | 60% |
| 18 | පශු වෛද්‍ය පීඨයේ ගොවිපල සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යයන අංශය සඳහා දැනට පවතින ගොඩනැගිල්ලට යෝජිත දිගුව සැලසුම් කිරීම හා ඉදිකිරීම | සෙන්ට්‍රල් ඉංජි.සර්විසස් පුද්ගලික සමාගම | 97,870,750.00 | 39,588,462.50 | 40% |
| 19 | පේරාදෙණිය දන්ත වෛද්‍ය පීඨයට මුඛ පිළිකා පිළිබඳ පර්යේෂණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම | නිව්ලැන්ඩ් ඉන්ඩස්ට්‍රිස් | 52,174,577.12 | 26,980,452.10 | 52% |
| 20 | ඉංජිනේරු පීඨයේ පීඨ මධ්‍යස්ථානයක් ඉදිකිරීම | ඉඩම් අත්කර ගැනීමේ හා සංවර්ධන සමාගම | 22,877,743.50 | 4,345,548.70 | |
| 21 | ශාස්ත්‍ර පීඨයේ නව සත්මහල් ගොඩනැගිල්ලක් සැලසුම් කිරීම හා ඉදිකිරීම | සතුට බිල්ඩර්ස් පුද්ගලික. සමාගම | 456,928,796.20 | | |
| | **එකතුව** | | **3,281,367,421.00** | **1,848,889,613.92** | |

වගුව 6 මූලධන නව ව්‍යාපෘති

| අංක | ව්‍යාපෘතියේ නම | කොන්ත්‍රාත් කරුගේ නම | ප්‍රදානය කිරීමේ ලිපිය නිකුත් කළේ | ගිවිසුම අත්සන් කළේ | ව්‍යාපෘතිය අවසන් කරන දිනය | ටෙන්ඩර් මුදල (වැට් සහිත) | 2018.01.01 දිනට අතුරු ගෙවීම් | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශු වෛද්‍ය පීඨයේ ගොවිපල සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යයන අංශයේ පවතින ගොඩනැගිල්ලට යෝජිත ගොඩනැගිලි දිගුව සැලසුම් කිරීම හා ඉදිකිරීම | සෙන්ට්‍රිල් ඉංජි.සේවා පුද්. සමාගම | 15.02.2018 | 02.05.2018 | 01.11.2019 | 97,870,750.00 | 39,588,462.50 | 40% |
| 2 | පේරාදෙණිය දන්ත වෛද්‍ය පීඨයේ මුඛ පිළිකා පර්යේෂණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම | නිව්ලැන්ඩ් ඉන්ඩස්ට්‍රිස් | 15.02.2018 | 27.02.2018 | 26.02.2019 | 52,174,577.12 | 26,980,452.10 | 52% |
| 3 | ඉංජිනේරු පීඨයේ පීඨ මධ්‍යස්ථානයක් ඉදිකිරීම | ඉඩම් අත්කර ගැනීමේ හා සංවර්ධන සමාගම | 26.06.2018 | 30.10.2018 | 29.07.2019 | 22,877,743.50 | 4,345,548.70 | 19% |
| 4 | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ නව සත් මහල් ගොඩනැගිල්ල සැලසුම් කොට ඉදිකිරීම | සතුට බිල්ඩර්ඩ් පුද්. සමාගම | 19.12.2018 | | | 456,928,796.20 | | 0% |
| | **එකතුව** | | | | | **629,851,866.82** | **70,914,463.30** | |

## 1.4.16 ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම

2018 වසරේදී ස්ථාවර වත්කම් ලේඛනය අවසන් කරන ලදි. ස්ථාවර වත්කම් ප්‍රතිගණනය සඳහා වන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්වල දක්වා ඇති ප්‍රතිපාදන අනුගමනය කරමින් විශේෂඥ තාක්ෂණික කමිටුවක් විසින් සකස් කරන ලද ක්‍රමයක් මත පාලක සභාවේ මඟ පෙන්වීම පරිදි මෙම ගණනය සිදුකරන ලදි. මෙම කාර්යයේදී පැවති අධික වැඩ ප්‍රමාණය හේතුවෙන් සමස්ත වත්කම් ගණනය කිරීමට නොහැකි වුවත් 90%ක පමණ ස්ථාවර වත්කම් ගණනය කිරීම අවසන් කරන ලදි.

## 1.4.17 AHEAD ව්‍යාපෘතිය

ලෝක බැංකුව විසින් අනුග්‍රහය දක්වන ලද රුපියල් මිලියන 205ක වටිනාකමින් යුතු තරගකාරී AHEAD ප්‍රදානයක් දිනාගැනීමට පේරාදෙණිය විශ්වවිද්‍යාලයට හැකිවිය. එම ප්‍රදානයෙන් ආර්ථික සංවර්ධනය, උසස් අධ්‍යාපනයේ ගුණාත්මක බව දියුණු කිරීම, පර්යේෂණ සංවර්ධනය හා නව නිපැයුම් යන ක්ෂේත්‍රයන්ට ප්‍රමුඛතාවය ලබාදෙමින් කෘෂි විද්‍යා, දන්ත වෛද්‍ය, ඉංජිනේරු, වෛද්‍ය, විද්‍යා, පශු වෛද්‍ය හා සත්ව විද්‍යා යන පීඨවලට මුදල් ලබාදෙන ලදි.

## 1.4.18 උපක්‍රමික/සංයුක්ත සැලසුම

2018 වසරේදී සියලුම පාර්ශවයන් සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව පෙර පැවති උපක්‍රමික සැලසුම 2014-2018 කාලවකවානුව තුල සංශෝධනය කොට 2017-2021 කාලපරිච්ඡේදය සඳහා උපක්‍රමික සැලසුම සංවර්ධනය කරන ලදි. පාලක සභාව විසින් 2018 ජනවාරි මාසයේදී එය අනුමත කරන ලදි. නගර සැලසුම් ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශවල හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ජාතික සංවර්ධන සැලසුම් හා සංයුක්ත සැලසුම්වලට සමගාමීව මෙම සැලසුම සංවර්ධනය කරන්නට විය. සියලුම ප්‍රධාන කාර්ය මණ්ඩලවල සහභාගිත්වය ඇතිව 2017-2021 උපක්‍රමික සැලසුම සමාලෝචනය කිරීම පිණිස දෙදින නේවාසික වැඩමුළුවක් 2019 මැයි මාසයේ දී පැවැත්වීමට සැලසුම් කර ඇත. 2018 ක්‍රියාකාරී සැලසුම විශ්වවිද්‍යාල පාලක සභාව විසින් 2018 පෙබරවාරි මාසයේ දී අනුමත කොට ඇත.

### 1.4.19 උපස්ථම්භක සේවාවන්

උපස්ථම්භක සේවාවන්ගේ විස්තර හා ජයග්‍රහණ පස්වන කොටසෙහි ඇතුළත් කොට ඇත.

### 1.4.20 තොරතුරු තාක්ෂණ හා ඉංග්‍රීසි භාෂා කුසලතා, පුස්තකාල සේවාවන්, වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශනය

සමාලෝචිත වර්ෂයේදී සියලු පීඨවල 2016/2017 සිසු කණ්ඩායම්වලට හා සමහර පීඨවල 2017/2018 සිසු කණ්ඩායම් සඳහා දිශානුයෝජනා වැඩසටහන් පරිපූරක හා අනුපූරක පාඨමාලා (ඉංග්‍රීසි, ගණිතය, මූලික භෞතික විද්‍යාව සිංහල සිසුන්ට දෙමළ භාෂාවත් දෙමළ සිසුන්ට සිංහල භාෂාවත්) NILET ආයතනය සමග පවත්වන ලදි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය ඉංග්‍රීසි භාෂා කුසලතා හා තොරතුරු සන්නිවේදන තාක්ෂණය සම්බන්ධ පුළුල් පරාසයක පාඨමාලා රාශියක් ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය හා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය විසින් පවත්වන පාඨමාලා හරහා පිරිනමනු ලබයි.

### 1.4.21 ජාත්‍යන්තර සම්බන්ධතා

අදාළ වර්ෂය තුළදී පේරාදෙණිය විශ්වවිද්‍යාලය ජාත්‍යන්තරකරණය වෙනුවෙන් විශාල කාර්යයන් ප්‍රමාණයක් අඛණ්ඩව පවත්වාගෙන යන ලදි. මෙම කාර්ය සාක්ෂාත් කරගනු පිණිස ගත් උත්සහයන්ගේ කොටසක් ලෙස ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය 2012 වසරේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ස්ථාපිත කිරීමෙන් අනතුරුව එම කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා පාලක සභාවේ අනුමැතියෙන් 2017 වසරේදී ජාත්‍යන්තර කටයුතු පිළිබඳ කාර්යාලය ස්ථාපිත කරන ලදි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ගෝලීය දෘශ්‍යතාවය පහසුකරවීමෙන් අධ්‍යයන හා පර්යේෂණ කාර්යයෙහි විශිෂ්ට මධ්‍යස්ථානයක් ලෙස අනන්‍යතාවයක් ගොඩනගා ගැනීමත් අරමුණු කොටගෙන ජාත්‍යන්තර කටයුතු කාර්යාලය ස්ථාපිත කරන ලදි.

2018 වසරේදී දියත්කළ සමහර ජාත්‍යන්තර කටයුතු අතරට ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවලින් දූත මණ්ඩල 20ක් පේරාදෙණියට පැමිණීම ජාත්‍යන්තරකරණ ක්‍රියා ගණයට ඇතුළත්වේ. වර්තමානය වන විට පේරාදෙණිය විශ්වවිද්‍යාලය සතුව ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සමග ඇති කරගත් ක්‍රියාකාරී අවබෝධතා ගිවිසුම් 77ක් පවතින අතර ඒවායින් සමහර ගිවිසුම් ඉතා ක්‍රියාකාරී මට්ටමේ පවතී. 2018 වසරේදී විදෙස් විශ්වවිද්‍යාල හා ආයතන සමග අවබෝධතා ගිවිසුම් තිස්තුනක් (33) අත්සන් කරන ලදි. ජාත්‍යන්තර සිසුන් 51 දෙනෙකු වෛද්‍ය පීඨයේ ලියාපදිංචි වූහ. මේ වනවිට උපාධි අපේක්ෂක ජත්‍යන්තර සිසුන් 58 දෙනෙකු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීනව අධ්‍යාපනය හදාරමින් සිටිති. එමෙන්ම මෙම විශ්වවිද්‍යාලය 2018 වසරේදී පශ්චාත් උපාධි හදාරන ජාත්‍යන්තර සිසුන් 159 දෙනෙකු ලියාපදිංචි කොට ඇත. මීට අමතරව විවිධ ශිෂ්‍ය හුවමරු වැඩසටහන් යටතේ කෙටි කාලීන පාඨමාලා හදාරන ජාත්‍යන්තර සිසුන් ද වෙති.

අභ්‍යන්තර හා බාහිර ශිෂ්‍ය හුවමාරු වැඩසටහන්වල ප්‍රතිඵලයක් වශයෙන් සිසුන් තිදෙනෙකු මැදපෙරදිග තාක්ෂණික විශ්වවිද්‍යාලයටත් සිසුන් සිව් දෙනෙකු චීනයේ විද්‍යා ඇකඩමි විශ්වවිද්‍යාලයටත් යැවීමට පේරාදෙණිය විශ්වවිද්‍යාලයට හැකිවිය. එපමණක් නොව සිසුන් තිදෙනෙකු එක් අයෙකු බැගින් ජපානයේ සයිතමා විශ්වවිද්‍යාලයට, උට්සුනෝමියා විශ්වවිද්‍යාලයට සහ සගා විශ්වවිද්‍යාලයට ගොස් ඇත. මොවුන් කෙටි කාලීන ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් යටතේ යවන ලදි. තව එක් ශිෂ්‍යයෙකු තායිලන්තයේ තමාසත් විශ්වවිද්‍යාලයට යැවීමට තෝරාගෙන ඇති අතර එහි කටයුතු සිදුවෙමින් පවතී.

බාහිර ශිෂ්‍ය හුවමාරු වැඩසටහන යටතේ ජපානයේ නිගාටා විශ්වවිද්‍යාලයෙන් සිසුන් දෙදෙනෙකු මෙහි පැමිණියහ. විශ්වවිද්‍යාලයේ උපාධි වැඩසටහන් ජාත්‍යන්තරකරණය කිරීමේ කොටසක් ලෙස සිසුන් සියදෙනෙකුට (100) වැඩි සංඛ්‍යාවක් ශ්‍රී ලංකාවෙන් පිටත විවිධ කටයුතු සඳහා සහභාගී වී ඇත.

## 1.4.22 කෙටි කාලීන පුහුණු/ පැවරුම් සඳහා සහභාගි වූ විදෙස් සිසුන් (මාසයකට නොඅඩු කාලයක්) - 2018

| අධ්‍යයන වැඩසටහන | රට | පැමිණි/පුහුණුව ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව | | |
|---|---|---|---|---|
| | | පිරිමි | ගැහැණු | එකතුව |
| **කෘෂි විද්‍යා පීඨය** | | | | |
| කෘෂි ව්‍යාපෘති | ජපානය | - | 1 | 1 |
| ආහාර විද්‍යා හා තාක්ෂණය | ජපානය | - | 1 | 1 |
| සත්ව විද්‍යාව | ස්වීඩනය | - | 2 | 2 |
| **කළමනාකරණ පීඨය** | | | | |
| ව්‍යාපාර පරිපාලන උපාධිය | පකිස්තානය | - | 1 | 1 |
| **එකතුව** | | 0 | 5 | 5 |

ශාස්ත්‍ර පීඨය විදෙස් විශ්වවිද්‍යාල කිහිපයක් සමග ඇතිකරගත් සම්බන්ධිත වැඩසටහන් යටතේ ශිෂ්‍යත්ව කිහිපයක් සිසුන්ට ප්‍රදානය කරන ලද අතර ඒවා පහත දැක්වෙන පරිදි වේ.

| විශ්වවිද්‍යාලයේ නම | ශිෂ්‍යත්ව සංඛ්‍යාව | කාලපරිච්ඡේදය |
|---|---|---|
| ෆුකුඕකා කාන්තා විශ්වවිද්‍යාලය ශිෂ්‍ය හුවමාරු වැඩසටහන - ජපානය | 03 | අවුරුදු එකයි |
| ඩොන්ගුක් විශ්වවිද්‍යාල ශිෂ්‍ය හුවමාරු වැඩසටහන - කොරියාව | 04 | සමාසික එකයි |
| හොකයිඩො විශ්වවිද්‍යාල ශිෂ්‍ය හුවමරු වැඩසටහන - ජපානය | 02 | අවුරුදු එකයි |

## 1.4.23 ක්‍රීඩා හා විනෝද ක්‍රියාකාරකම්

### අන්තර් විශ්වවිද්‍යාල ක්‍රීඩා ශූරතාවය - 2018

ඉහත ශූරතාවයේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලය බර ඉසිලීමේ ඉසව්වෙන් ශූරයන් ලෙසත් පාපන්දු රග්බි හා චෙස් තරගවල පිරිමි ඉසව්වේ දෙවන ස්ථානයත් චෙස් සහ එල්ලේ තරගවල කාන්තා කාණ්ඩයෙන් දෙවන ස්ථානය ද හිමිකරගන්නට විය. පැසිපන්දු (පිරිමි) මල්ලව පොර (පිරිමි) බැඩ්මින්ටන් (කාන්තා) සහ කැරම් (කාන්තා) යන ඉසව්වලින් තෙවන ස්ථානයද අත්කරගන්නට විය.

## 1.4.24 සනාතන සභාවේ වැදගත් නිර්දේශයන්

### (අ) කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

වැඩබලන අධ්‍යක්ෂ/කෘ.වි.ප.උ.ආ. විසින් බාරදෙන ලද "CS 5210 –Plant Functional Traits" (2018.01.24 දින පවත්වන ලද 429වැනි සනාතන සභා රැස්වීමෙන් පිළිගෙන 2018.05.26 දින පැවැත් වූ පාලක සභා රැස්වීමේදී නිර්දේශ කරන ලදි.)

### (ආ) විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

1. ප්‍රතිඵල නිකුත් කිරීම (පශ්චාත් උපාධි ඩිප්ලෝමා) - එය බලපැවැත්වෙන දිනය පැහැදිලි කරගැනීම

සුළු සංශෝධන සහිත පර්යේෂණාත්මක ජෛව තාක්ෂණවෙදී විද්‍යාපති වැඩසටහනේ පාඨමාලා අන්තර්ගතය.

පරිගණක විද්‍යාව පිළිබඳ ව්‍යාපෘති වැඩසටහන - අලුතින් හඳුන්වාදුන් පාඨමාලාවේ අන්තර්ගතය (ස්වාධීන අධ්‍යයනය SC 559) *(2017.10.25 දින පැවැත් වූ 427වැනි සනාතන සභා රැස්වීමේදී පිළිගෙන 2018.01.27 දින පැවැත් වූ 471වැනි පාලක සභා රැස්වීමේදී නිර්දේශ කරන ලදි)*

2. සුළු සංශෝධන සහිත විද්‍යාපති වැඩසටහන් නවයක පාඨමාලා අන්තර්ගතය (*2018.09.19 දින පැවැත් වූ 435වැනි සනාතන සභා රැස්වීමේදී පිළිගෙන 2018.10.27 දින පැවැති 480වැනි පාලක සභා රැස්වීමේදී නිර්දේශ කරන ලදි.)*

**(ඈ) මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය**

1. යෝජනා හඳුන්වාදීම.
   - (අ) සමාජ වැඩ පිළිබඳ පශ්චාත් උපාධිය
   - (ආ) සමාජ වැඩ පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

   *(2017.10.25 දින පැවැත් වූ 427වැනි සනාතන සභා රැස්වීමේදී පිළිගෙන 2018.01.27 දින පැවැත් වූ පාලක සභා රැස්වීමේදී නිර්දේශ කරන ලදි)*
2. ප්‍රජා සංවර්ධන හා සැලසුම්කරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හඳුන්වාදීමේ යෝජනාව, මෙම ආයතනයේ අධ්‍යක්ෂ විසින් බාරදෙන ලදි. (*2018.01.24 දින පැවැත් වූ 429වැනි සනාතන සභා රැස්වීමේදී පිළිගෙන 2018.05.26 දින පැවැත් වූ පාලක සභා රැස්වීමේදී නිර්දේශ කරන ලදි.*)

**(ඇ) සම සෞඛ්‍ය විද්‍යා පීඨය**

1. උපාධි වැඩසටහන නැවත නම් කිරීම
   *(2018.01.24 දින පැවැත්වූ 429වැනි සනාතන සභා රැස්වීමේදී පිළිගෙන 2018.01.27 දින පැවැත් වූ පාලක සභා රැස්වීමේදී නිර්දේශ කරන ලදි.)*

**(ඉ) කලා පීඨය**

1. සමාජ විද්‍යා අධ්‍යයන අංශයෙන් සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි වැඩසටහන හඳුන්වා දීමේ යෝජනාව *(2017.10.25 දින පැවැත් වූ 427වැනි සනාතන සභා රැස්වීමේදී පිළිගෙන 2018.01.27 දින පැවැත්වූ 471 වැනි පාලක සභා රැස්වීමේදී නිර්දේශ කරන ලදි)*
2. ශාස්ත්‍ර පීඨයේ චීන භාෂා පාඨමාලාවේ නිවැරදි කළ පිටපත *(2018.01.24 දින පැවැත් වූ 429වැනි සනාතන සභා රැස්වීමේදී පිළිගෙන 2018.05.26 දින පැවැත් වූ 474වැනි පාලක සභා රැස්වීමේදී නිර්දේශ කරන ලදි)*
3. ආචාර්ය ධර්මසේන පතිරාජ මහතා සිනමාවට, චිත්‍රපට අධ්‍යයනයට, නාට්‍යයට හා කලාවට සිදුකළ සේවය අගයනු පිණිස ආචාර්ය උපාධියක් පිරිනැමීමේ යෝජනාව. *(2018.05.26 දින පැවැත් වූ 431වැනි සනාතන සභා රැස්වීමේදී පිළිගෙන 2018.05.26 දින පැවැත් වූ 474වැනි පාලක සභා රැස්වීමේදී නිර්දේශ කරන ලදි)*
4. ලලිත කලා අධ්‍යයන අංශයේ දැනට පවතින විෂය නිර්දේශවලට වෛකල්පිත පාඨමාලා 10ක් හඳුන්වාදීමේ යෝජනාව *(2018.06.20 දින පැවැත් වූ 433වැනි සනාතන සභා රැස්වීමෙන් පිළිගෙන 2018.06.26 දින පැවැත් වූ 478 වැනි පාලක සභා රැස්වීමේදී නිර්දේශ කරන ලදි.)*

**(ඊ) දන්ත වෛද්‍ය පීඨය**

1. දන්ත වෛද්‍ය පීඨයේ දන්ත ශල්‍ය වෛද්‍යවේදී උපාධියේ විභාග නීති හා රෙගුලාසි සංශෝධනය කිරීමේ යෝජනාව *(2018.06.20 දින පවත්වන ලද 427වැනි සනාතන සභා රැස්වීමේදී පිළිගෙන 2018.01.27 දින පැවැති පාලක සභා රැස්වීමේදී නිර්දේශ කරන ලදි)*
2. පස් අවුරුදු දන්ත ශල්‍ය වෛද්‍ය විද්‍යාවේදී අධ්‍යයන වැඩසටහනේ විෂය නිර්දේශයේ සංශෝධන බාරදීම. *(2018.10.25 දින පැවැත් වූ 427 වැනි සනාතන සභා රැස්වීමේදී පිළිගෙන 2018.01.27 දින පැවැත් වූ 471 වැනි පාලක සභා රැස්වීමේදී නිර්දේශ කරන ලදි.)*
3. දන්ත වෛද්‍ය පීඨයේ සුළු මුඛ ශල්‍යකර්ම පිළිබඳ පශ්චාත් උපාධිය සඳහා යෝජනාව (*2017.11.22 දින පැවති 428වැනි සනාතන සභා රැස්වීමේදී පිළිගෙන 2018.02.24 දින පැවැති පාලක සභා රැස්වීමේදී නිර්දේශ කරන ලදි)*

**(උ) ඉංජිනේරු පීඨය**

1. ඉංජිනේරු ගණිත අධ්‍යයනාංශය විසින් පිරිනමන, පවතින පාඨමාලා සංශෝධනය හා නව පාඨමාලා හඳුන්වාදීම *(2018.06.20 දින පැවැත් වූ 433වැනි සනාතන සභා රැස්වීමේදී පිළිගෙන 2018.08.26 දින පැවැත් වූ පාලක සභා රැස්වීමේදී නිර්දේශ කරන ලදි)*

**(ඌ) කළමනාකරණ පීඨය**

1. පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය කළමනාකරණ පීඨයේ ව්‍යාපාර පරිපාලනවේදී Online උපාධි වැඩසටහන *(2018.10.27 දින පැවැති 436වැනි සනාතන සභා රැස්වීමේදී පිළිගෙන 2018.11.24 දින පැවැති 481වැනි පාලක සභා රැස්වීමේදී නිර්දේශ කරන ලදි)*

**(එ) වෛද්‍ය පීඨය**

1. වෛද්‍ය අධ්‍යාපන ඒකකය එහි දැනට සිටින සේවක තනතුරු සමඟ වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයන අංශය ලෙස ඉහළ නැංවීමේ යෝජනාව *(2018.01.24 දින පැවැති 429වැනි සනාතන සභා රැස්වීමේදී පිළිගෙන 2018.05.26 දින පැවැති 474වැනි පාලක සභා රැස්වීමේදී නිර්දේශ කරන ලදී.)*

2. වෛද්‍ය අධ්‍යාපන ඒකකයේ ඉගැන්වීමේ කැපවීම-ශල්‍ය වෛද්‍යවේදී උපාධි වැඩසටහන *(2018.01.24 දින පැවැති 429වැනි සනාතන සභා රැස්වීමේදී පිළිගෙන 2018.05.26 දින පැවැති 474වැනි පාලක සභා රැස්වීමේදී නිර්දේශ කරන ලදී)*

**(ඒ) විද්‍යා පීඨය**

1. ක්ෂුද්‍ර ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධි වැඩසටහනේ යෝජිත විෂයමාලා *(2018.10.27 දින පැවැති 436වැනි සනාතන සභා රැස්වීමේදී පිළිගෙන 2018.11.24 දින පැවැති 481 වැනි පාලක සභා රැස්වීමේදී නිර්දේශ කරන ලදී)*

## 1.5 බාධක සහ පිළියම්

- වර්ෂ ආරම්භයේදී විශ්වවිද්‍යාලය තුළ හටගත් වැඩවර්ජන හේතුවෙන් සැලසුම්කල ක්‍රියාකාරකම් 2018 පෙබරවාරි සිට අප්‍රේල් දක්වා පැවැත්වීමට නොහැකිවිය. මෙම හේතුව සමස්ත වර්ෂයේම විශ්වවිද්‍යාල කාර්ය සාධනයට ප්‍රබල බාධකයක් විය.

- උසස් අධ්‍යාපනයේ වෙනස්වන තාක්‍ෂණයට මුහුණදීම සඳහා නව සේවක තනතුරු හඳුන්වාදීම අත්‍යාවශ්‍ය සාධකයකි. ජාත්‍යන්තර කටයුතු කාර්යාලය, ජාල සන්නිවේදන හා සේවා ඒකකය, වෙබ් සංවර්ධන ඒකකය අභ්‍යන්තර තත්ත්වාරක්‍ෂණ ඒකකය වැනි අංශ සඳහා පුහුණු වෘත්තිකයන් අවශ්‍යව පවති. මෙම අවශ්‍යතාවන් සම්පූර්ණ නොවීම විශ්වවිද්‍යාලයේ සුමට ගලනයට බාධාවකි. මෙවැනි වැදගත් තනතුරු සඳහා අමතර සේවකයන් පත්කිරීම සම්බන්ධයෙන් කළ ඉල්ලීම්වලට මෙතෙක් අනුමැතිය ලැබී නොමැත.

- මහා භාණ්ඩාගාරය විසින් රුපියල් මිලියන 6886.5ක මුදලක් වෙන්කර තිබුනද අදාළ වසර සඳහා විශ්විද්‍යාලයට ලැබී ඇති මුදල වනුයේ රුපියල් මිලියන 6768.5කි. එම මුදල ලැබී ඇත්තේ ඉල්ලීම් කිහිපයකට පසුව බව සඳහන් කළ යුතුවේ. මෙම බාධාව හේතුවෙන් වර්ෂාරම්භයේ අනුමත කළ වැය ශීර්ෂයෙන් සීමාකොට තිබෙන මුදල් ප්‍රමාණයෙන් ඉදිරි කටයුතු කරගෙන යෑමට විශ්වවිද්‍යාලයට සිදුවිය.

- අදාළ වර්ෂයේ දී මූලධන අරමුදල්වල වෙන් කිරීමේ සැලකිය යුතු පහත වැටීමක් සිදුවූ හෙයින් සමහර ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව කරගෙන යෑම දුෂ්කර විය.

- වෙන්කළ මුදල් එපරිද්දෙන්ම නොලැබීම නිසා නියම අයවැය පාලනයක් පවත්වාගැනීම දුෂ්කර කාර්යයකි.

- කෙරීගෙන යන හා නව මූලධන ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 2396.7ක මුදලක් ඉල්ලා සිටියද විශ්වවිද්‍යාලයට ලැබී ඇත්තේ රුපියල් මිලියන 535ක් පමණි. එබැවින් මෙම උග්‍ර මුදල් හිඟය හේතුවෙන් ගෙවීම් නිසිකලට කළ නොහැකිවීම මූලධන ව්‍යාපෘතිවල ප්‍රගතියට ප්‍රබලව බලපා ඇත.

## 1.6 අනාගත සැලසුම්

- කෘෂි විද්‍යා, වෛද්‍ය, පශු වෛද්‍ය හා සම සෞඛ්‍ය යන පීඨවල අධ්‍යයන වැඩසටහන් තත්ත්වාරක්ෂණ සභාව විසින් 2019 වසරේදී සමාලෝචනය කරනු ඇත. ආයතනික සමාලෝචනය 2021 වසරේදී සිදුවනු ඇත.

- විශ්වවිද්‍යාලය 2019 වසරේදී නව ඉදිකිරීම් හා පුනරුත්ථාපන ව්‍යාපෘති 51ක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂාකරයි. එහි වටිනාකම රුපියල් මිලියන 4800ක් වන අතර වර්ෂ 60කට වඩා පැරණි නේවාසිකාගාර හතරක් ප්‍රතිසංස්කරණය කිරීම (ජයතිලක, විජේවර්ධන, අරුණාචලම් හා හිල්ඩා ඔබේසේකර යන ශාලා ඒ අතරට ඇතුළත් වේ)

- විශ්වවිද්‍යාල ක්‍රීඩාපිටි ආවරණය කරමින් ඉදිවන ඇවිදීමේ කි.මී. 1.2 මාර්ගය කටයුතු හැකි විගස අවසන් කෙරෙනු ඇත. මේ සඳහා රුපියල් මිලියන 40ක මුදල් ප්‍රමාණයක් විශ්වවිද්‍යාලයට ලැබී ඇත.

- විශ්වවිද්‍යාලයේ ජලකානු පද්ධතිය මහනුවර නගර සභාවේ ජලකානු පද්ධතියට සම්බන්ධ කිරීමේ සැලසුම් සකස්වෙමින් පවතී. මේ සඳහා රුපියල් මිලියන 464ක මුදලක් වැය වේ.

- සමස්ත විශ්වවිද්‍යාලයට සම්බන්ධ කෙරෙන ඵලදායි ජාල පද්ධතියක් හඳුන්වාදීමේ උත්සාහයක් ක්‍රියාත්මක වෙමින් පවතී.

- ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වන විසඳුමක් ලෙස ඉන්සිනරේටරයක් හා පොලිතීන් සම්පීඩනය කරන යන්ත්‍රයක් මිලදී ගැනීම.

- පරිසර හිතකාමී ලෙස රසායනික අපද්‍රව්‍ය බැහැර කිරීම පිණිස රසායනික අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීම. මේ සම්බන්ධයෙන් INCEE ECO CYCLE (PVT) Ltd සමඟ ගිවිසුමක් අත්සන් කිරීම අපේක්ෂිතයි.

- නව භූ විද්‍යා ගොඩනැගිල්ලක් 2019 වසරේ මුල්කාලයේ විවෘත කිරීමට අපේක්ෂා කෙරේ.

- ශාඛා ස්ථාපිත කිරීම පිණිස HR පද්ධතිය අවසන් කිරීම.

- උපාධි වැඩසටහන් ජාත්‍යන්තරකරණය කිරීම අඛණ්ඩව පැවැත්වීම.

- ආගන්තුක මහාචාර්යවරුන්/සහෘදත්ව සමඟ නව අධ්‍යයන හා පර්යේෂණ සහයෝගිතා සංවර්ධනය කිරීම.

## 2. ශිෂ්‍ය කාර්ය මණ්ඩල කටයුතු

### ශිෂ්‍ය ලියාපදිංචිය

පීඨ නවය සඳහා ලියාපදිංචි කළ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 12756ක් වන අතර ලියාපදිංචි කළ බාහිර ශිෂ්‍ය සංඛ්‍යාව 9500කි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් කළ වාර්ෂික ශිෂ්‍ය බඳවා ගැනීම 2679ක් වන අතර එය රටේ සියලු විශ්වවිද්‍යාලවලට ඇතුළත් කළ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 25%කි. සමාලෝචිත වර්ෂයේදී පීඨවල කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ හා විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ලියාපදිංචි වූ පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව 8314කි.




### කාර්ය මණ්ඩලය

විශ්වවිද්‍යාලයේ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය 840ක් වන අතර ඉන් 65%ක් ලෝක ප්‍රසිද්ධ පුරෝගාමී විශ්වවිද්‍යාලවලින් දර්ශනශූරී උපාධි ලැබුවන් වන අතර 24%ක් මහාචාර්යවරුන්ය. අධ්‍යයන දෙපාර්තමේන්තු, පරිපාලන හා සේවා අංශවල සේවයේ නියැලී සිටින සහාය කාර්ය මණ්ඩල සාමාජිකයන් ගණන ආසන්න වශයෙන් 2200කි.

## 2.1 සිසුන්

### 2.1.1 සම්පත් හා සිසුන්

| පීඨය | පාඨමාලාව | ශිෂ්‍ය සංඛ්‍යාව | අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව | සහාය අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව | අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| **කෘෂි විද්‍යා** | කෘෂි තාක්ෂණය හා කළමනාකරණ විද්‍යාවේදී (විශේෂ උපාධිය) | 671 | 104 | - | 202 |
| | සත්ව විද්‍යා හා මත්ස්‍ය විද්‍යාවේදී උපාධිය | 157 | | | |
| | ආහාර විද්‍යා හා තාක්ෂණ විද්‍යාවේදී උපාධිය | 160 | | | |
| **සම සෞඛ්‍ය** | ඖෂධවේද | 132 | 56 | - | 66 |
| | වෛද්‍ය රසායනාගාර විද්‍යාවේදී | 145 | | | |
| | හෙදවේද විද්‍යාවේදී | 210 | | | |
| | භෞත චිකිත්සක විද්‍යාවේදී | 155 | | | |
| | විකිරණ චිකිත්සක විද්‍යාවේදී | 191 | | | |
| **කලා** | ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) | 3958 | 173 | - | 80 |
| | ශාස්ත්‍රවේදී (විශේෂ) | | | | |
| | නීතිවේදී | 257 | | | |
| **දන්ත වෛද්‍ය** | දන්ත ශල්‍ය විද්‍යාවේදී | 387 | 52 | 1 | 155 |
| **ඉංජිනේරු** | ඉංජිනේරු | 1660 | 125 | 7 | 194 |
| **කළමනාකරණ** | ව්‍යාපාර පරිපාලනය | 615 | 38 | - | 26 |
| **වෛද්‍ය** | වෛද්‍ය විද්‍යාව | 1501 | 114 | 1 | 209 |
| **විද්‍යා** | විද්‍යාවේදී (විශේෂ) | 735 | 112 | 3 | 129 |
| | විද්‍යාවේදී (සාමාන්‍ය) | | | | |
| | විද්‍යාවේදී (ගණනය කිරීම් හා කළමනාකරණය) | 213 | | | |
| | විද්‍යාවේදී ( සංඛ්‍යාන හා මෙහෙයුම් පර්යේෂණ) | 251 | | | |
| | විද්‍යාවේදී (ව්‍යවහාර විද්‍යාව) | 990 | | | |
| **පශු වෛද්‍ය** | පශු වෛද්‍යවේදී | 368 | 44 | - | 71 |
| **වෙනත්** | | | 22 | 27 | 1078 |
| **එකතුව** | | **12756** | **840** | **39** | **2210** |

## 2.1.2 ප්‍රථම උපාධි අපේක්ෂක වැඩසටහනේ දේශීය සිසුන්

| පීඨය | පාඨමාලාව | නව බඳවා ගැනීම | | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2017/18 | 2016/17 | 2015/16 | 2014/15 | 2013/14 | 2012/13 | 2011/12 | |
| කෘෂි විද්‍යා | කෘෂි තාක්ෂණය හා කළමනාකරණය | 178 | 201 | 145 | 145 | | | | 669 |
| | ආහාර විද්‍යා හා තාක්ෂණය | 42 | 45 | 36 | 37 | | | | 160 |
| | සත්ව විද්‍යා හා මත්ස්‍ය | 41 | 48 | 40 | 28 | | | | 157 |
| සම සෞඛ්‍ය | ඖෂධවේදී | 29 | 27 | 20 | 26 | 29 | | | 131 |
| | වෛද්‍ය රසායනගාර විද්‍යාව | 30 | 29 | 26 | 29 | 31 | | | 145 |
| | හෙදවේද | 49 | 49 | 37 | 33 | 42 | | | 210 |
| | භෞත චිකිත්සක | 30 | 29 | 27 | 31 | 38 | | | 155 |
| | විකිරණ විද්‍යාව හා විකිරණ චිකිත්සක | 40 | 48 | 38 | 31 | 31 | | | 188 |
| කලා | කලා | 768 | 895 | 752 | 957 | 586 | | | 3958 |
| | නීතිය | 50 | 49 | 50 | 50 | 56 | | | 255 |
| දන්ත වෛද්‍ය | දන්ත වෛද්‍ය විද්‍යාව | 71 | 77 | 78 | 80 | 81 | | | 387 |
| ඉංජිනේරු | ඉංජිනේරු විද්‍යාව | 415 | 415 | 414 | 416 | | | | 1660 |
| කළමනාකරණ | ව්‍යාපාර පරිපාලනය | 170 | 169 | 140 | 136 | | | | 615 |
| වෛද්‍ය | වෛද්‍ය විද්‍යාව | 205 | 205 | 205 | 205 | 204 | 195 | 231 | 1450 |
| විද්‍යාව | ජීව විද්‍යාව | 170 | 173 | 134 | 157 | 101 | | | 735 |
| | භෞතික විද්‍යාව | 232 | 230 | 190 | 216 | 122 | | | 990 |
| | ගණනය කිරීම් හා කළමනාකරණය | 47 | 52 | 47 | 47 | 58 | | | 251 |
| | සංඛ්‍යානය හා මෙහෙයුම් පර්යේෂණ | 40 | 51 | 38 | 43 | 41 | | | 213 |
| පශු වෛද්‍ය | පශු වෛද්‍ය විද්‍යාව | 72 | 79 | 64 | 88 | 65 | | | 368 |
| **එකතුව** | | **2679** | **2871** | **2481** | **2755** | **1485** | **195** | **231** | **12697** |

## 2.1.3 ප්‍රථම උපාධි අපේක්ෂක වැඩසටහනේ විදෙස් සිසුන්

| පීඨය | පාඨමාලාව | නව බඳවා ගැනීම | | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2017/18 | 2016/17 | 2015/16 | 2014/15 | 2013/14 | 2012/13 | 2011/12 | |
| කෘෂි විද්‍යා | කෘෂි තාක්ෂණ හා කළමනාකරණය | | 2 | | | | | | **2** |
| සම සෞඛ්‍ය විද්‍යා | ඖෂධවේද | | 1 | | 2 | 1 | | | **4** |
| කලා | නීතිය | | 1 | 1 | | | | | **2** |
| වෛද්‍ය | වෛද්‍ය විද්‍යා හා ශල්‍ය වෛද්‍ය විද්‍යාව | | 8 | 7 | 7 | 7 | 12 | 10 | **51** |
| **එකතුව** | | | **12** | **8** | **9** | **8** | **12** | **10** | **59** |

සියලු පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

## 2.1.4 පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා විදෙස් සිසුන් නව බඳවා ගැනීම් හා ලියාපදිංචිය

| පීඨය | නව ලියාපදිංචිය | | | | බඳවා ගැනීම | | | | එකතුව | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දේශීය | | විදේශීය | | දේශීය | | විදේශීය | | නව ලියාපදිංචිය | | බඳවා ගැනීම | |
| | | | | | | | | | දෙස් + විදෙස් | | දෙස් + විදෙස් | |
| | ගැහැණු | එකතුව | ගැහැණු | එකතුව | ගැහැණු | එකතුව | ගැහැණු | එකතුව | ගැහැණු | එකතුව | ගැහැණු | එකතුව |
| කෘෂි විද්‍යා (ප.උ.ආ.) | 285 | 417 | 0 | 1 | 912 | 1605 | 4 | 5 | 285 | 418 | 916 | 1610 |
| කලා හා කළමනාකරණ (මා.ශා. හා ස.වි. ප.උ.ආ) | | 1079 | 17 | 43 | 1708 | 2627 | 36 | 152 | 775 | 1122 | 1744 | 2779 |
| දන්ත වෛද්‍ය | 8 | 12 | 0 | 0 | 29 | 44 | 0 | 0 | 8 | 12 | 29 | 44 |
| ඉංජිනේරු | 50 | 223 | 0 | 1 | 341 | 1455 | 2 | 5 | 50 | 224 | 343 | 1460 |
| වෛද්‍ය | 7 | 11 | 0 | 0 | 35 | 49 | 0 | 0 | 7 | 11 | 35 | 49 |
| විද්‍යා (වි.ප.උ.ආ.) | 180 | 362 | 1 | 2 | 1148 | 2282 | 2 | 6 | 181 | 364 | 1150 | 2288 |
| පශු වෛද්‍ය | 14 | 33 | 0 | 0 | 44 | 84 | 0 | 0 | 14 | 33 | 44 | 84 |
| **එකතුව** | **1302** | **2137** | **18** | **47** | **4217** | **8146** | **44** | **168** | **1320** | **2184** | **4261** | **8314** |

## 2.1.5 බාහිර ශිෂ්‍ය ලියාපදිංචිය

| වැඩසටහන | 2018 | | |
|---|---|---|---|
| | පිරිමි | ගැහැණු | එකතුව |
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) පැරණි විෂය නිර්දේශය | 585 | 1514 | 2099 |
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) නව විෂය නිර්දේශය | 1893 | 5501 | 7394 |
| ව්‍යාපාර පරිපාලනවේදී | 471 | 408 | 879 |
| කළමනාකරණ හා සංවර්ධන ඩිප්ලෝමාව | 36 | 17 | 53 |
| **එකතුව** | **2985** | **7440** | **10425** |

## 2.2 කාර්ය මණ්ඩලය

### 2.2.1. (අ) අනුමත සේවක සංඛ්‍යාව හා වර්තමාන කාර්ය මණ්ඩලය

| කාර්ය මණ්ඩල කාණ්ඩය | වැටුප් පරිමාව | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින කාර්ය මණ්ඩලය | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ස්ථිර | | | තාවකාලික | | | කොන්ත්‍රාත් | | | ආගන්තුක | | | පැවරුම් පදනම | | |
| | | | පිරිමි | ගැහැණු | එකතුව | පිරිමි | ගැහැණු | එකතුව | පිරිමි | ගැහැණු | එකතුව | පිරිමි | ගැහැණු | එකතුව | පිරිමි | ගැහැණු | එකතුව |
| | | (1) | | | (2) | | | (3) | | | (4) | | | (5) | | | (6) |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | U-AC 3 to U-AC 5 | **1107** | 463 | 361 | 824 | 3 | 2 | 5 | 4 | 0 | 4 | 252 | 74 | 326 | 1 | 0 | 1 |
| | U-AC 1 to U-AC 2 | **449** | 0 | 0 | 0 | 183 | 303 | 486 | 0 | 0 | 0 | 8 | 3 | 11 | 0 | 0 | 0 |
| පුස්තකාල කාර්ය මණ්ඩලය | U-AC 5 | **1** | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | U-AC 4 | **2** | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | U-AC 3 | **16** | 4 | 11 | 15 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| පරිපාලන කාර්ය මණ්ඩලය හා මුදල් කාර්ය මණ්ඩලය | U-EX 3 | **2** | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | U-EX 2 | **28** | 15 | 15 | 30 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | U-EX 1 | **27** | 4 | 22 | 26 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| වෛද්‍ය විධායක කාර්ය මණ්ඩලය | U-EX 3 | **0** | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |

## 2.2.1. (අ) අනුමත සේවක සංඛ්‍යාව හා වර්තමාන කාර්ය මණ්ඩලය වගුව හා සම්බන්ධ වේ.

| කාර්ය මණ්ඩල කාණ්ඩය | වැටුප් පරිමාව | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින කාර්ය මණ්ඩලය | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ස්ථිර | | | තාවකාලික | | | කොන්ත්‍රාත් | | | ආගන්තුක | | | පැවරුම් පදනම | | |
| | | | පුරුෂ | ගැහැණු | එකතුව | පුරුෂ | ගැහැණු | එකතුව | පුරුෂ | ගැහැණු | එකතුව | පුරුෂ | ගැහැණු | එකතුව | පුරුෂ | ගැහැණු | එකතුව |
| | | (1) | | | (2) | | | (3) | | | (4) | | | (5) | | | (6) |
| වෙනත් විධායක නිලධාරීන් | U-EX 2 | **10** | 5 | 2 | 7 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | |
| | U-EX 1 | **18** | 6 | 0 | 6 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| වෛද්‍ය නිලධාරීන් | U-MO 2 | **1** | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | U-MO 1 | **5** | 1 | 2 | 3 | 0 | 0 | 0 | 1 | 1 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය | U-AS 2 | **93** | 15 | 14 | 29 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | U-AS 1 | | 5 | 5 | 10 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| කාර්මික නිලධාරි කාර්ය මණ්ඩලය | U-EX 2 | **0** | 3 | 0 | 3 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | U-EX 1 | **0** | 11 | 8 | 19 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | U-MN 4 | **2** | 51 | 56 | 107 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | U-MN 3 | **5** | 0 | 6 | 6 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | U-MN 2 | **8** | 2 | 0 | 2 | 0 | 0 | 0 | 3 | 0 | 3 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| කාර්මික නිලධාරි කාර්ය මණ්ඩලය | U-MN 1 | **6** | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | U-MT 1 | **463** | 171 | 100 | 271 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| ලිපිකාර හා සම ශ්‍රේණි කාර්ය මණ්ඩලය | U-MN 4 | **0** | 42 | 99 | 141 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 2 |
| | U-MN 3 | **30** | 11 | 5 | 16 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 |
| | U-MN 2 | **1** | 8 | 1 | 9 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | U-MN 1 | **526** | 152 | 204 | 356 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| මූලික කාර්ය මණ්ඩලය | U-PL 3 | **239** | 389 | 24 | 413 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | U-PL 2 | **248** | 104 | 18 | 122 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | U-PL 1 | **964** | 593 | 78 | 671 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| වෙනත් (කරුණාකර විස්තර කරන්න) | | **0** | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| **එකතුව** | | **4251** | **2058** | **1031** | **3089** | **186** | **305** | **491** | **10** | **1** | **11** | **260** | **77** | **337** | **3** | **1** | **4** |

## 2.2.1 (ආ) අධ්‍යයන කාර්ය මණ්ඩලය

| පීඨය | අධ්‍යයන අංශය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | සහාය මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය | කථිකාචාර්ය | කථිකාචාර්ය (පරිවාස) | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| කෘෂි විද්‍යා පීඨය | කෘෂි ආර්ථික විද්‍යාව හා ව්‍යාපාර කළමනාකරණය | | 3 | | 1 | 3 | 1 | 2 | 10 |
| | කෘෂි ජෛවතාක්ෂණ මධ්‍යස්ථානය | | | | | 1 | | | 1 |
| | කෘෂි ජීව විද්‍යාව | 1 | 2 | | 3 | 2 | | 1 | 9 |
| | කෘෂි ඉංජිනේරු | 3 | 4 | | 1 | 1 | | 3 | 12 |
| | කෘෂි ව්‍යාප්ති | | 1 | | 2 | 1 | | 4 | 8 |
| | සත්ව විද්‍යාව | 1 | 4 | | 3 | 2 | | 7 | 17 |
| | බෝග විද්‍යාව | 4 | 4 | 1 | 3 | 2 | | 4 | 18 |
| | ආහාර විද්‍යාව හා තාක්ෂණය | | 2 | 2 | 2 | 2 | 1 | 1 | 10 |
| | මහ ඉලුප්පල්ලම | | 1 | | 2 | 5 | | 2 | 10 |
| | පාංශු විද්‍යාව | 1 | 1 | | 1 | 3 | | 3 | 9 |
| **එකතුව** | | **10** | **22** | **3** | **18** | **22** | **2** | **27** | **104** |
| සම සෞඛ්‍ය විද්‍යාව | මූලික විද්‍යාවන් | | | | | | 1 | 2 | 3 |
| | වෛද්‍ය රසායනාගාර විද්‍යාව | | 1 | | 1 | 2 | | 6 | 10 |
| | හෙදවේදය | | | | | 1 | 3 | 8 | 12 |
| | ඖෂධවේදය | | 1 | | | 7 | | 4 | 12 |
| | භෞත චිකිත්සාව | | | | | 2 | 2 | 5 | 9 |
| | විකිරණ විද්‍යාව හා විකිරණ චිකිත්සාව | | | | 1 | 4 | | 5 | 10 |
| **එකතුව** | | | **2** | | **2** | **16** | **6** | **30** | **56** |
| කලා පීඨය | අරාබි හා ඉස්ලාම් ශිෂ්ටාචාරය | | | | 2 | 3 | 1 | | 6 |
| | පුරා විද්‍යාව | | 2 | | 3 | 1 | | | |
| | සම්භාව්‍ය භාෂා | | 1 | | | 3 | 1 | 2 | |
| | ආර්ථික විද්‍යාව හා සංඛ්‍යානය | 1 | 4 | | 13 | 3 | 2 | 3 | 1 |
| | අධ්‍යාපන | | | 1 | 2 | 5 | | | |
| | ඉංග්‍රීසි භාෂාව | 3 | 1 | | 1 | 2 | | | 3 |

## 2.2.1 (ආ) අධ්‍යයන කාර්ය මණ්ඩලය වගුව හා සම්බන්ධ වේ.

| පීඨය | අධ්‍යයන අංශය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | සහාය මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය | කථිකාචාර්ය | කථිකාචාර්ය (පරිවාස) | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| කලා පීඨය | ලලිත කලා | | | | 3 | 2 | 1 | 1 | 7 |
| | භූගෝල විද්‍යාව | | 2 | | 5 | 9 | 2 | 3 | 21 |
| | ඉතිහාසය | 1 | 1 | | 1 | 7 | 1 | 2 | 13 |
| | නීතිය | | 1 | | | 1 | 2 | 1 | 5 |
| | පාලි හා බෞද්ධ අධ්‍යයනය | | 3 | | | 3 | 1 | | 7 |
| | දර්ශනය | | 1 | | 3 | 3 | | 1 | 8 |
| | මනෝ විද්‍යාව | | | | 3 | 2 | | | 5 |
| | දේශපාලන විද්‍යාව | | 1 | | | 7 | 1 | 3 | 12 |
| | සිංහල | | 2 | | 1 | 8 | | | 11 |
| | සමාජ විද්‍යාව | | 2 | | 6 | 5 | 1 | 3 | 17 |
| | දෙමළ | | 1 | | 1 | 1 | 1 | 3 | 7 |
| **එකතුව** | | **5** | **22** | **1** | **44** | **65** | **14** | **22** | **173** |
| දන්ත වෛද්‍ය පීඨය | මූලික විද්‍යාවන් | 1 | 7 | | | 2 | | 2 | 12 |
| | ප්‍රජා දන්ත සෞඛ්‍ය | 1 | 1 | | 1 | 4 | | 2 | 9 |
| | මුඛ හනුක හා විකලාංග ශල්‍ය වෛද්‍ය | | 1 | | 1 | 2 | 1 | | 5 |
| | මුඛ වෛද්‍ය හා පරිදන්ත විද්‍යාව | 2 | 4 | | 1 | 2 | | 3 | 12 |
| | මුඛ ව්‍යාධවේදය | 1 | 4 | | | | | | 5 |
| | කෘතීම දන්ත වෛද්‍ය | | | | 1 | 2 | | 1 | 4 |
| | සංරක්ෂණ දන්ත වෛද්‍ය | | 2 | | 2 | | | 1 | 5 |
| **එකතුව** | | **5** | **19** | | **6** | **12** | **1** | **9** | **52** |
| ඉංජිනේරු පීඨය | රසායන හා සැකසුම් ඉංජිනේරු | 1 | | | 1 | 5 | | | 7 |
| | සිවිල් ඉංජිනේරු | 4 | 4 | | 9 | 16 | 1 | 4 | 38 |
| | පරිගණක මධ්‍යස්ථානය | | | | | | | 1 | 1 |
| | පරිගණක ඉංජිනේරු | | | | 5 | 5 | 2 | 1 | 13 |
| | විදුලි හා විද්‍යුත් ඉංජිනේරු | 1 | 3 | | 6 | 11 | | 1 | 22 |
| | ඉංජිනේරු කළමනාකරණය | | | | | 3 | | 1 | 4 |
| | ඉංජිනේරු ගණිතය | 1 | 1 | | 2 | 8 | | 1 | 13 |

## 2.2.1 (ආ) අධ්‍යයන කාර්ය මණ්ඩලය වගුව හා සම්බන්ධ වේ.

| පීඨය | අධ්‍යයන අංශය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | සහාය මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය | කථිකාචාර්ය | කථිකාචාර්ය (පරිවාස) | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| ඉංජිනේරු පීඨය | කර්මාන්ත පුහුණු හා වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය | | | | 1 | 1 | | 3 | 5 |
| | යාන්ත්‍රික ඉංජිනේරු | | 1 | | | 7 | | 3 | 11 |
| | නිෂ්පාදන ඉංජිනේරු | | 1 | | | 6 | | 4 | 11 |
| **එකතුව** | | **7** | **11** | | **24** | **61** | **3** | **19** | **125** |
| කළමනාකරණ පීඨය | ව්‍යාපාර හා මුදල් | | | | 1 | 4 | 2 | 4 | 11 |
| | මානව සම්පත් කළමනාකරණය | | | | | 1 | 1 | 4 | 6 |
| | කළමනාකරණ අධ්‍යයනය | | | | 2 | | | 6 | 8 |
| | වෙළඳ කළමනාකරණය | | | | | 1 | 2 | 1 | 4 |
| | මෙහෙයුම් කළමනාකරණය | | 1 | | | 1 | 1 | 6 | 9 |
| **එකතුව** | | | **1** | | **3** | **7** | **6** | **21** | **38** |
| වෛද්‍ය පීඨය | නිර්වින්දන වෛද්‍ය | | 1 | | | | 2 | 1 | 4 |
| | කායව්‍යවච්ඡේදය | | 2 | | | 3 | 1 | 1 | 7 |
| | ජෛව තාක්ෂණය | | 3 | | 2 | 1 | | 3 | 9 |
| | ප්‍රජා වෛද්‍ය | | 2 | 1 | 2 | 2 | 1 | | 8 |
| | අධිකරණ වෛද්‍ය | | 2 | | 1 | 2 | | | 5 |
| | ප්‍රසව හා නාරිවේදය | | 1 | | 1 | 2 | 1 | | 5 |
| | වෛද්‍ය අධ්‍යාපන ඒකකය | | 1 | | | | 1 | | 2 |
| | වෛද්‍ය විද්‍යාව | 1 | 5 | | 1 | 1 | | 4 | 12 |
| | ක්ෂුද්‍ර ජීව විද්‍යාව | | 1 | | | 3 | | 2 | 6 |
| | න්‍යෂ්ඨික වෛද්‍ය ඒකකය | | | | 2 | | | | 2 |
| | ළමා රෝග | 1 | 1 | | 3 | 2 | | | 7 |
| | පරපෝෂ විද්‍යාව | | 1 | | | 3 | | | 4 |
| | ව්‍යාධවේදය | 1 | 1 | 1 | 3 | 1 | | 2 | 9 |
| | භිෂග්වේදය | | | | 2 | 2 | | | 4 |
| | භෞතික විද්‍යාව | | 3 | | 3 | 1 | | 2 | 9 |

## 2.2.1 (ආ) අධ්‍යයන කාර්ය මණ්ඩලය වගුව හා සම්බන්ධ වේ.

| පීඨය | අධ්‍යයන අංශය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | සහය මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය | කථිකාචාර්ය | කථිකාචාර්ය (පරිවාස) | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| වෛද්‍ය පීඨය | මනෝ වෛද්‍ය | | 2 | | | 2 | | 1 | 5 |
| | විකිරණ විද්‍යාව | | 1 | | | 2 | | 1 | 4 |
| | ශල්‍ය වෛද්‍ය | | 2 | | 1 | 7 | 1 | 1 | 12 |
| **එකතුව** | | **3** | **29** | **2** | **21** | **34** | **7** | **18** | **114** |
| විද්‍යා පීඨය | උද්භිත විද්‍යාව | 1 | 4 | | 4 | 5 | | 1 | 15 |
| | රසායන විද්‍යාව | 4 | 5 | | 1 | 7 | | 1 | 18 |
| | භූගර්භ විද්‍යාව | 2 | 4 | | | 5 | | 1 | 12 |
| | ගණිතය | | 1 | 1 | | 4 | | 8 | 14 |
| | අණුක විද්‍යාව | | 3 | | | | 1 | 2 | 6 |
| | භෞතික විද්‍යාව | | 2 | | 2 | 8 | | 2 | 14 |
| | විද්‍යා අධ්‍යාපන ඒකකය | | | | | 1 | | 1 | 2 |
| | සංඛ්‍යානය හා පරිගණක විද්‍යාව | 1 | 2 | | 1 | 6 | 2 | 4 | 16 |
| | සත්ව විද්‍යාව | 2 | 3 | | 3 | 2 | 1 | 4 | 15 |
| **එකතුව** | | **10** | **24** | **1** | **11** | | **4** | **24** | **112** |
| පශු වෛද්‍ය හා සත්ව විද්‍යාව | මූලික පශු වෛද්‍ය විද්‍යාව | | 1 | | 2 | 7 | | 2 | 12 |
| | ගොවිපල සත්ව නිෂ්පාදනය හා සෞඛ්‍ය | | 2 | | 1 | 4 | | 1 | 8 |
| | පශු සායනික විද්‍යාව | 1 | 1 | | 2 | 5 | | 2 | 11 |
| | පශු මහජන සෞඛ්‍ය හා භිෂග්වේදය | | | | 1 | 2 | | 1 | 5 |
| | පශු ව්‍යාධි ජීව විද්‍යාව | 1 | | | 1 | 4 | 1 | 1 | 8 |
| **එකතුව** | | **2** | **4** | | **7** | **23** | **1** | **7** | **44** |
| ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකය | ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකය | | | | | | | 6 | 6 |
| **එකතුව** | | | | | | | | 6 | 6 |
| **පුස්තකාලය** | | 16 | | | | | | | 16 |
| **එකතුව** | | | | | | | | | 16 |
| **මුළු එකතුව** | | **43** | **133** | **7** | **138** | **282** | **38** | **183** | **840** |

## 2.2.1 (ඇ) අනුමත සේවක තනතුරු හා වර්තමාන අධ්‍යයන කාර්ය මණ්ඩලය

| සේවක | | වැටුප් පරිමාව | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින කාර්ය මණ්ඩලය | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ස්ථිර | | | තාවකාලික | | | කොන්ත්‍රාත් | | | ආගන්තුක | | | පැවරුම් | | |
| | | | | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
| | | | (1) | | | (2) | | | (3) | | | (4) | | | (5) | | | (6) |
| මහාචාර්ය | ජ්‍යෙ. මහාචාර්ය | U-AC 5 (I) | 78 | 6 | 2 | 31 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 131 | 36 | 167 | 0 | 0 | 0 |
| | මහාචාර්ය | U-AC 5 (II) | | 13 | 10 | | 0 | 0 | | 1 | 0 | | 0 | 0 | | 0 | 0 | |
| ජ්‍යෙ. මහාචාර්ය | | U-AC 5 (I) | 1022 | 25 | 10 | 793 | 0 | 0 | 4 | 0 | 0 | 3 | 0 | 0 | 159 | 0 | 0 | 1 |
| මහාචාර්ය | | U-AC 5 (II) | | 80 | 30 | | 0 | 0 | | 0 | 0 | | 2 | 0 | | 1 | 0 | |
| සහාය මහාචාර්ය | | U-AC 4 | | 4 | 3 | | 0 | 0 | | 0 | 0 | | 0 | 0 | | 0 | 0 | |
| ජ්‍යෙ. කථිකාචාර්ය I ශ්‍රේණිය | | U-AC 3(I) | | 80 | 58 | | 2 | 1 | | 0 | 0 | | 0 | 0 | | 0 | 0 | |
| ජ්‍යෙ. කථිකාචාර්ය II ශ්‍රේණිය | | U-AC 3(II) | | 166 | 116 | | 0 | 0 | | 0 | 0 | | 119 | 38 | | 0 | 0 | |
| කථිකාචාර්ය | | U-AC 3(III) | | 21 | 17 | | 0 | 0 | | 3 | 0 | | 0 | 0 | | 0 | 0 | |
| කථිකාචාර්ය (පරිවාස) | | U-AC 3(IV) | | 68 | 115 | | 0 | 0 | | 0 | 0 | | 0 | 0 | | 0 | 0 | |
| ලේඛකාධිකාරී (වෛද්‍ය) | | U-AC 3 | 6 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| විකිරණ ආරක්ෂණ නිලධාරි | | U-AC 3 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| තාවකාලික ජ්‍යෙ. කථිකාචාර්ය | | U-AC 3 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| තාවකාලික කථිකාචාර්ය/ තාවකාලික සහකාර කථිකාචාර්ය | | U-AC 2 (fixed) | 133 | 0 | 0 | 0 | 77 | 107 | 184 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| තාවකාලික පර්යේෂණ සහායක | | U-AC 2/U-AC 1 (fixed) | 29 | 0 | 0 | 0 | 15 | 40 | 55 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| තාවකාලික උපදේශක | | U-AC 1 (fixed) | 160 | 0 | 0 | 0 | 49 | 127 | 176 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| තාවකාලික උපදේශක | | U-AC 1 (fixed) | 126 | 0 | 0 | 0 | 0 | 29 | 29 | 0 | 0 | 0 | 8 | 3 | 11 | 0 | 0 | 0 |
| තාවකාලික උපකාරක ගුරු | | U-AC 1 (fixed) | 0 | 0 | 0 | 0 | 42 | 0 | 42 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| තාවකාලික විද්‍යාත්මක සහායක | | U-AC 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| එකතුව | | | **1556** | **463** | **361** | **824** | **186** | **305** | **491** | **4** | **0** | **4** | **260** | **77** | **337** | **1** | **0** | **1** |

## 2.2.2 අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය

| අධ්‍යයන දෙපාර්තමේන්තුව | ස්ථිර කාර්ය මණ්ඩල සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | පිරිමි | ගැහැණු | එකතුව |
| ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය | 1 | 4 | 5 |
| පුස්තකාලය | 3 | - | 3 |
| ශාරීරික අධ්‍යාපන අංශය | 4 | 3 | 7 |
| වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය | - | 1 | 1 |
| දන්ත වෛද්‍ය විද්‍යා | - | 1 | 1 |
| ඉංජිනේරු | 2 | 5 | 7 |
| වෛද්‍ය | 1 | - | 1 |
| විද්‍යා | 2 | 1 | 3 |
| දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය | - | 1 | 1 |
| මුදල් පරිපාලන | - | 2 | 2 |
| තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය | 7 | 1 | 8 |
| **එකතුව** | **20** | **19** | **39** |






## 2.2.3 අනධ්‍යයන කාර්ය මණ්ඩලය

| ව්‍යාපෘතිය | ස්ථිර කාර්ය මණ්ඩල සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | පිරිමි | ගැහැණු | එකතුව |
| කෘෂි විද්‍යා | 161 | 43 | 204 |
| සම සෞඛ්‍ය | 40 | 26 | 66 |
| කලා | 52 | 31 | 83 |
| දන්ත වෛද්‍ය | 70 | 85 | 155 |
| ඉංජිනේරු | 169 | 27 | 196 |
| කළමනාකරණ | 13 | 13 | 26 |
| වෛද්‍ය | 131 | 79 | 210 |
| විද්‍යා | 90 | 41 | 131 |
| පශු වෛද්‍ය | 48 | 23 | 71 |
| වෙනත් | 798 | 270 | 1068 |
| **එකතුව** | 1572 | 638 | 2210 |



## 2.2.4 නව බඳවා ගැනීම් - අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය 2009-2018

| වර්ෂය | අධ්‍යයන කාර්ය මණ්ඩල සමාජික සංඛ්‍යාව | අනධ්‍යයන කාර්ය මණ්ඩල සමාජික සංඛ්‍යාව |
|---|---|---|
| 2009 | 30 | 75 |
| 2010 | 24 | 90 |
| 2011 | 26 | 75 |
| 2012 | 35 | 56 |
| 2013 | 59 | 148 |
| 2014 | 52 | 77 |
| 2015 | 61 | 75 |
| 2016 | 43 | 53 |
| 2017 | 48 | 79 |
| 2018 | 39 | 133 |





## 2.2.5 ප්‍රථම උපාධි අපේක්ෂක ඉගැන්වීම්/පශ්චාත් උපාධි ඉගැනවීම්/පර්යේෂණ/සම්මන්ත්‍රණ/වැඩමුළු සඳහා පැමිණි විදෙස් ආගන්තුකයන්

| පීඨය | වැඩසටහනේ නම | රට | කාර්ය මණ්ඩල සංඛ්‍යාව |
|---|---|---|---|
| **සම සෞඛ්‍ය විද්‍යා** | | | |
| හෙදවේද අංශය | ජාත්‍යන්තර හෙද සමුළුව | මැලේසියාව | 1 |
| භෞත චිකිත්සක අංශය | පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය භෞතික චිකිත්සක සමුළුව-2018 | ඇමෙරිකාව | 1 |
| භෞත චිකිත්සක අංශය | පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය භෞතික චිකිත්සක සමුළුව-2018 | ඉන්දියාව | 1 |
| ඖෂධවේදී අධ්‍යයන අංශය | සායනික ඖෂධ | එක්සත් රාජධානිය | 2 |
| | | | 3 |
| **ශාස්ත්‍ර පීඨය** | | | |
| භූ තොරතුරු අධ්‍යයන අංශය | කාලගුණ විපර්යාස ජාත්‍යන්තර සමුළුව | ඉන්දියාව | 100 |
| භූගෝල විද්‍යා අංශය | අවබෝධතා ගිවිසුම් | ස්විස්ටර්ලන්තය | 1 |
| අර්ථික විද්‍යා හා සංඛ්‍යාන අංශය | පේරාදෙණිය පර්යේෂණ සැසිය-2018 | රොමේනියාව | 11 |
| | | ඉන්දියාව | 7 |
| | | පකිස්ථානය | 2 |
| **දන්ත වෛද්‍ය පීඨය** | | | |
| මූලික විද්‍යා අධ්‍යයන අංශය | මයික්‍රස්කොපික් ඇනටොමි වැඩමුළුව | ජපානය | 6 |
| පර්යේෂණ සහ උසස් උපාධි | හෙද පර්යේෂණ යෝජනාවක් සැලසුම් කිරීමේ අභියෝග | ලන්ඩනය | 1 |
| මුඛ පිළිකා පර්යේෂණ මධ්‍යස්ථානය | මුඛ පිළිකා පිළිබඳ පර්යේෂණ යෝජනා සාකච්ඡාව | ලන්ඩනය | 1 |
| පීඩෝඩොන්ට්‍රික් අංශය | ආර්කෝනියා ක්‍රවුන් | ඉන්දියාව | 1 |
| **විද්‍යා පීඨය** | | | |
| රසායන විද්‍යා අධ්‍යයන අංශය | පරිසර විද්‍යාව සහයෝගීතා දැනුම පලපුරුද්ද හුවමාරු වැඩසටහන | ඇමෙරිකාව | 1 |
| | පුහුණු වැඩසටහන | ඕස්ට්‍රේලියාව | 1 |
| | සකුරා විද්‍යා සැලසුම්-2018 | ජපානය | 1 |
| | සමුද්‍ර ජීව විද්‍යාව හා ජල ජීව විද්‍යා ජාතික කෞතුකාගාරය | තායිවානය | 1 |
| භූ විද්‍යා අධ්‍යයන අංශය නිගාටා විශ්වවිද්‍යාලය | ජාත්‍යන්තර සහයෝගීතා පිළිබඳ පර්යේෂණ | ජපානය | 1 |
| **පශු වෛද්‍ය පීඨය** | | | |
| පර්යේෂණ විද්‍යා අංශය | පර්යේෂණ | ජර්මනිය | 2 |
| | අණුක විද්‍යාව පිළිබඳ වැඩමුළුව | ඕස්ට්‍රේලියාව | 1 |
| | | වියට්නාමය | 1 |
| | | තායිලන්තය | 1 |
| ක්ෂුද්‍ර ජීව විද්‍යා අංශය | කුකුළු සත්ව වෛරස් රෝග හඳුනා ගැනීමේ වැඩමුළුව | පකිස්ථානය | 1 |

## 2.2.6 පශ්චාත් උපාධි සඳහා ලියාපදිංචි වූ අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලය (දේශීය හා විදේශීය)

| පීඨය/අධ්‍යයන අංශය/අංශය/ඒකකය | කාර්ය මණ්ඩල සාමාජිකයාගේ නම | තනතුර | පශ්චාත් උපාධිය | මුදල් ලැබෙන මූලාශ්‍රය | රට |
|---|---|---|---|---|---|
| **කෘෂි විද්‍යා පීඨය** | | | | | |
| සත්ව විද්‍යා අධ්‍යයන අංශය | පී. වෙත්තසිංහ මිය | කථිකාචාර්ය (පරිවාස) | දර්ශනශූරි | | නෝර්වේ |
| සත්ව විද්‍යා අධ්‍යයන අංශය | එස්.ජී.වී.බී. වර්ණසූරිය මිය | කථිකාචාර්ය (පරිවාස) | විද්‍යාපති | ස්වයං මූල්‍ය | ශ්‍රී ලංකාව |
| සත්ව විද්‍යා අධ්‍යයන අංශය | ඩබ්.එම්.එම්.පී. හුලුගල්ල මයා | කථිකාචාර්ය (පරිවාස) | විද්‍යාපති | ස්වයං මූල්‍ය | ශ්‍රී ලංකාව |
| කෘෂි ජීව විද්‍යා අධ්‍යයන අංශය | ඩබ්.එච්. ජයසිංහ මයා | කථිකාචාර්ය (පරිවාස) | දර්ශනශූරි | ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ඒජන්සිය (JICA) | ජපානය |
| බෝග විද්‍යා අධ්‍යයන අංශය | | කථිකාචාර්ය (පරිවාස) | දර්ශනශූරි | | නවසීලන්තය |
| **සම සෞඛ්‍ය විද්‍යා පීඨය** | | | | | |
| මූලික විද්‍යා අධ්‍යයන අංශය | වෛද්‍ය ටී.එන්. හත්තොටුව | කථිකාචාර්ය (පරිවාස) | දර්ශනශූරි | AHEAD | නවසීලන්තය |
| මූලික විද්‍යා අධ්‍යයන අංශය | වෛද්‍ය ආර්.ඩී.වී.එස්. රණසිංහ | කථිකාචාර්ය (පරිවාස) | දර්ශනශූරි | | ශ්‍රී ලංකාව |
| **ශාස්ත්‍ර පීඨය** | | | | | |
| පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය | කේ. ධර්මසිරි මයා | කථිකාචාර්ය | දර්ශනශූරි | HKU ශිෂ්‍යත්ව | හොංකොං |
| සම්භාව්‍ය භාෂා අධ්‍යයන අංශය | කේ.එම්.ආර්.එන්. කුලතුංග මිය | කථිකාචාර්ය | දර්ශනශූරි | | ග්‍රීසිය |
| සම්භාව්‍ය භාෂා අධ්‍යයන අංශය | ජේ. ධම්මාලෝක හිමි | කථිකාචාර්ය (පරිවාස) | දර්ශනශූරි | | නවසීලන්තය |
| ඉතිහාසය අධ්‍යයන අංශය | ආර්.ඩී. ජයනෙත්ති මිය | කථිකාචාර්ය (පරිවාස) | දර්ශනශූරි | NCAS | ජර්මනිය |
| සිංහල භාෂා අධ්‍යයන අංශය | ඩබ්.එන්.ඩී.එන්. විජේසිරි මයා | ජ්‍යෙ. කථිකාචාර්ය II ශ්‍රේණිය | දර්ශනශූරි | NCAS | ඕස්ට්‍රේලියාව |
| ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයන අංශය | ඩබ්.එල්.සී. වේරගොඩ මිය | කථිකාචාර්ය (පරිවාස) | ශාස්ත්‍රපති | | ශ්‍රී ලංකාව |
| **දන්ත වෛද්‍ය පීඨය** | | | | | |
| මුඛ හා මුඛ හනුක අධ්‍යයන අංශය | වෛද්‍ය කේ.ජී.කේ.ඩී. කපුගම | කථිකාචාර්ය (පරිවාස) | විදෙස් පුහුණුව | | ස්කොට්ලන්තය |

## 2.2.6 පශ්චාත් උපාධි සඳහා ලියාපදිංචි වූ අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලය (දේශීය හා විදේශීය)

| පීඨය/අධ්‍යයන අංශය/අංශය/ඒකකය | කාර්ය මණ්ඩල සාමාජිකයාගේ නම | තනතුර | පශ්චාත් උපාධිය | මුදල් ලැබෙන මූලාශ්‍රය | රට |
|---|---|---|---|---|---|
| **වෛද්‍ය පීඨය** | | | | | |
| භෞතික විද්‍යා අධ්‍යයන අංශය | වෛද්‍ය ටී.ඩී.පී. නන්දදේව | කථිකාචාර්ය | | | ඇමෙරිකාව |
| නිර්වින්දන හා අවධානම් සත්කාරක අධ්‍යයන අංශය | වෛද්‍ය එච්.එම්.ජී.යූ. ජයසිංහ | කථිකාචාර්ය (පරිවාස) | | | |
| **කළමනාකරණ පීඨය** | | | | | |
| කළමනාකරණ අධ්‍යයන අංශය | ටී.එස්.එස්. ප්‍රනාන්දු මයා | කථිකාචාර්ය (පරිවාස) | විද්‍යාපති | ස්වයං මූල්‍ය | ශ්‍රී ලංකාව |
| කළමනාකරණ අධ්‍යයන අංශය | ජී.එස්. ශිරෝමි මිය | කථිකාචාර්ය (පරිවාස) | දර්ශනශූරී | AHEAD | ශ්‍රී ලංකාව |
| වෙළඳ කළමනාකරණ අධ්‍යයන අංශය | ඩබ්.එම්.එච්.යූ. විජේතුංග මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය | දර්ශනපති/ජපුර | ස්වයං මූල්‍ය | එක්සත් රාජධානිය |
| ව්‍යාපාර මුදල් අධ්‍යයන අංශය | එම්.එන්.එෆ්. හුස්කියා මිය | කථිකාචාර්ය (පරිවාස) | දර්ශනපති/ජපුර | වි.වි.ප්‍ර.කො. සභාව | ශ්‍රී ලංකාව |
| මෙහෙයුම් කළමනාකරණ අධ්‍යයන අංශය | එස්.පී. ආරියරත්න මිය | කථිකාචාර්ය (පරිවාස) | දර්ශනපති/කෘ. වි. ප. උ. ආ | වි.වි.ප්‍ර.කො. සභාව | ශ්‍රී ලංකාව |
| මෙහෙයුම් කළමනාකරණ අධ්‍යයන අංශය | ජී.එම්.ඩී.එස්.එම්. බණ්ඩාර මයා | කථිකාචාර්ය (පරිවාස) | | | ශ්‍රී ලංකාව |
| **විද්‍යා පීඨය** | | | | | |
| අණුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණ අධ්‍යයන අංශය | එම්.පී.සී.එස්. ධනපාල මිය | කථිකාචාර්ය | | | ශ්‍රී ලංකාව |
| **පශු වෛද්‍ය පීඨය** | | | | | |
| ගොවිපල සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යයන අංශය | වෛද්‍ය ජී.ඩී.ආර්.කේ. පෙරේරා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය | | | ශ්‍රී ලංකාව |
| **පරිපාලන** | | | | | |
| වෛද්‍ය පීඨය | ඩබ්.එච්.ජී.ඩී. දිල්රුක්ෂි මිය | ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි | ව්‍යාපාර කළමනාකරණපති | පේරාදෙණිය විශ්වවිද්‍යාලය විද්‍යාලය | ශ්‍රී ලංකාව |
| මුදල් පරිපාලන අංශය | බී.ජී.එස්.පී. ජයකොඩි මයා | ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි | ව්‍යාපාර පරිපාලනපති | පේරාදෙණිය විශ්වවිද්‍යාලය විද්‍යාලය | ශ්‍රී ලංකාව |
| ජාත්‍යන්තර කටයුතු කාර්යාලය | ජී.එම්.ජී.එච්. සෙනෙවිරත්න මයා | සම්බන්ධීකරණ ලේකම් | විද්‍යාපති | ස්වයංමූල්‍ය | ශ්‍රී ලංකාව |

## 2.3 හඳුන්වාදුන් නව පාඨමාලා

| පීඨය | වැඩසටහන් | වැඩසටහන් වර්ගය | කාලය | මාධ්‍යය |
|---|---|---|---|---|
| දන්ත වෛද්‍ය | ප්‍රතිසංස්කරණ සහිත මුඛ පිළිකා ශල්‍ය කළමනාකරණය | සහතිකපත්‍ර පාඨමාලා | එක් අවුරුදු | ඉංග්‍රීසි |
| | ප්‍රතිසංස්කරණ සහිත මුඛ පිළිකා ශල්‍ය කළමනාකරණය කෙටි පුහුණු පාඨමාලාව | වෙනත් පාඨමාලා | මාස එකයි | ඉංග්‍රීසි |
| | දන්ත වෛද්‍ය විද්‍යාව | දර්ශනපති | පූර්ණ කාලින අවු. 2යි | ඉංග්‍රීසි |
| | | දර්ශනපති | අර්ධ කාලීන අවු. 3යි | ඉංග්‍රීසි |
| | | දර්ශනශූරී | පූර්ණ කාලීන අවු 3යි | ඉංග්‍රීසි |
| | | | අර්ධ කාලීන අවු. 4යි | ඉංග්‍රීසි |
| | පශු වෛද්‍ය විද්‍යාව | දර්ශනශූරී | පූර්ණ කාලීන/අර්ධ කාලීන අවු.3 (අවම) | ඉංග්‍රීසි |
| **ඉංජිනේරු** | රැහැන් රහිත සන්නිවේදනයේ ඉංජිනේරු විද්‍යාපති ද්විත්ව උපාධි | පශ්චාත් උපාධි වැඩසටහන | අවු. 2යි | ඉංග්‍රීසි |
| **පශු වෛද්‍ය හා සත්ව විද්‍යා** | | දර්ශනපති | පූර්ණ කාලීන අවු. 2යි (අවම) | ඉංග්‍රීසි |
| | | දර්ශනපති | අර්ධ කාලීන අවු. 2යි | ඉංග්‍රීසි |

## 2.4 (අ) දේශීය සංවිධාන සමඟ අත්සන් කළ අවබෝධතා ගිවිසුම

| විශ්ව විද්‍යාලය/පීඨය | ක්‍රියාකාරකමේ කාර්ය භාරය (ශිෂ්‍ය හුවමාරු/කාර්ය මණ්ඩල හුවමාරු/පර්යේෂණ ව්‍යාපෘති/පුහුණු/පහසුකම් ආදිය | ගිවිසුම අත්සන් කළේද නැද්ද ඔව්/නැත | සහයෝගිතා ආයතනය |
|---|---|---|---|
| සම සෞඛ්‍ය විද්‍යා පේරාදෙණිය විශ්වවිද්‍යාලය | පුහුණු | ඔව් | |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | විදුලි හා විද්‍යුත් ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන හා පුහුණු ක්‍රියාකාරකම්<br>ශ්‍රී ලංකාවේ තාක්‍ෂණික හැකියාවන් දියුණු කිරීම පිණිස සුදුසු අංශ හඳුනාගෙන සහයෝගීතා පර්යේෂණ හා සංවර්ධන කටයුතු බාරගැනීම<br>අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක සැකැස්මක් සංවර්ධනය කොට පර්යේෂණ පැවැත්වීම සඳහා විශ්වවිද්‍යාලය හා ACCIMT දෙපාර්ශවය අතර මානව සම්පත් පර්යේෂණ උපකරණ සහ වෙනත් යටිතල පහසුකම් හුවමාරු කරගැනීම. | ඔව් | ආතර් සී ක්ලාක් නවීන තාක්‍ෂණ ආයතනය |
| කළමනාකරණ පීඨයේ ව්‍යාපාර මුදල් අධ්‍යයන අංශය | ගිණුම් හා මුදල් විෂයට අදාළ හොඳම ශිෂ්‍යාට උපාධි ප්‍රදානෝත්සවයේදී රන් පදක්කමක් ප්‍රදානය කිරීම | ඔව් | බ්‍රැන්ඩික්ස් ලංකා සමාගම |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය | | | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය |
| පශු වෛද්‍ය හා සත්ව විද්‍යා | ශිෂ්‍ය පුහුණු | ඔව් | ආර්ථික අමාත්‍යාංශය |

## 2.4 (ආ) ජාත්‍යන්තර සංවිධාන සමඟ අත්සන් කළ අවබෝධතා ගිවිසුම

| | විශ්වවිද්‍යාලය / පීඨය | ක්‍රියාකාරකමේ කාර්යභාරය<br>(ශිෂ්‍ය හුවමාරු/කාර්ය මණ්ඩල හුවමාරු/පර්යේෂණ ව්‍යාපෘති/පුහුණු/පහසුකම් ආදිය | රට |
|---|---|---|---|
කෘෂි තාක්ෂණ හා කළමනාකරණ විද්‍යාවේදී උපාධියේ සහ සත්ව විද්‍යා හා මත්ස්‍ය විද්‍යාවේදී උපාධිවල විෂය නිර්දේශයන් සංශෝධනය කිරීම සහ ආහාර විද්‍යා හා තාක්ෂණ විද්‍යාවේදී උපාධියේ විෂය නිර්දේශ ලේඛන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම වෙත බාරදීම 2019 වසරේ ප්‍රමුඛතාවන් වේ. එමෙන්ම ඉහත සඳහන් උපාධි වැඩසටහන් සඳහා ස්වයං-ඇගයීම් වාර්තා තත්ත්වාරක්ෂණ සභාව වෙත මේ වසරේදී බාරදීමට ද පීඨය අපේක්ෂා කරයි. මේ අතර සත්ව විද්‍යා අධ්‍යයන අංශයේ රංග ශාලාව හා ශ්‍රවණාගාරය පීඨයේ ප්‍රධාන ශ්‍රවණාගාරය සහ බෝග විද්‍යා අධ්‍යයන අංශයේ ශ්‍රවණාගාරය අවශ්‍ය අංගෝපාංගවලින් සමන්විත කිරීමට ද පීඨය සැලසුම් කරයි. එසේම සම්මානිත ආගන්තුක මහාචාර්යවරුන් හඳුනාගැනීම හා උපාධි වැඩසටහන් ජාත්‍යන්තරකරණය කිරීම ද 2019 වසරේ ප්‍රමුඛතාවයන්ය. පීඨයේ උද්‍යාන අලංකාරණ කටයුතුවලට අදාළව පීඨයේ ප්‍රධාන සැලසුම 2019 වසරේදී අවසන් කිරීමට නියමිතය. විදෙස් විශ්වවිද්‍යාල සමඟ ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් හා ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන් තවදුරටත් ශක්තිමත් කරගැනීමටත් සම්මානිත ආගන්තුක මහාචාර්යවරුන්/සහෘදත්ව සාමාජිකයන් සමග නව අධ්‍යයන හා පර්යේෂණ සහයෝගීතා සංවර්ධනය කර ගැනීමට ද පීඨය අපේක්ෂා කරයි. එසේම මෙම පීඨය එහි උපාධි වැඩසටහන්වලට නවතම විෂයමාලා සමාලෝචන එළඹුම් යෙදවීමට ද සැලසුම් කරයි. එමෙන්ම පීඨ AHEAD යෝජනාව සහ ICE ව්‍යාපෘතිය වඩාත් ඵලදායී හොඳම ආකාරයෙන් 2019 වසරේදී ක්‍රියාත්මක කිරීම ද මෙම පීඨයේ එක් ප්‍රමුඛතාවයකි.

## 3.2 සම සෞඛ්‍ය විද්‍යා පීඨය

(පීඨාධිපති - මහාචාර්ය ඩී.බී.එම්. වික්‍රමරත්න)

### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අටවැනි පීඨය ලෙස සම සෞඛ්‍ය විද්‍යා පීඨය 2007 වසරේදී ස්ථාපිත කරන ලදි. ආරම්භයේදී මෙම පීඨය හෙදවේදය හා සම සෞඛ්‍ය විද්‍යාවන් පිළිබඳ සිව් අවුරුදු විශේෂ ප්‍රථම උපාධි හයක් ප්‍රදානය කළ අතර එතුළින් හෙදවේදය පිළිබඳ විද්‍යාවේදී උපාධිය භෞත චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය, වෛද්‍ය රසායනාගාර විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය, ඖෂධවේද උපාධිය, විකිරණ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය හා විකිරණ චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී උපාධි සඳහා සුදුසුකම් ලබයි. එහෙත් 2010 වසරේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපදෙස් යටතේ මෙම උපාධි වැඩසටහන්වල ව්‍යුහය (සාමාන්‍ය/විශේෂ) ලෙස වෙනස් කරන ලදි. අනතුරුව 2014 වසරේදී මෙම උපාධි වැඩසටහන් ජාත්‍යන්තර මට්ටමට උචිත වන පරිදි සම්මාන 120 ලෙස ප්‍රතිව්‍යුහගත කරන ලදි. අධ්‍යයන අංශ හයකින් සමන්විත සම සෞඛ්‍ය විද්‍යා පීඨය අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් පනස්හය දෙනෙකුගෙන් හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් හැට දෙනෙකුගෙන් යුක්ත වේ. පීඨයට බඳවාගත් හත්වැනි ශිෂ්‍ය කණ්ඩායම මේ වන විට ඔවුන්ගේ පාඨමාලා අවසන් කොට ඇත. වර්තමානය වනවිට ඉහත සඳහන් කළ අධ්‍යයන පාඨමාලා හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව 825 ක් වන අතර මේ දක්වා උපාධිලාභීන් බවට පත් වූ සංඛ්‍යාව 1048කි. සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ සිසුන්ට සායනික පුහුණුව හා විද්‍යාගාර පුහුණුව ලබාදීම සඳහා ජාතික හා පුද්ගලික රෝහල්වල බලධාරීන් සමඟ සහයෝගීතාවයන් ගොඩනගා ගෙන ඇත. පීඨයේ පවතින භෞත චිකිත්සක සහ විකිරණ විද්‍යා සේවා අංශ මගින් බාහිර රෝගීන්ට ගුණාත්මක සේවාවන් ලබාදනු ලබන අතර සිසුන්හට මනා සායනික පුහුණුවක් ද ලබාදෙනු ලබයි. ඔසුවේද අධ්‍යයන අංශය හා රාජ්‍ය ඖෂධ සංස්ථාව අතර ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස විශ්වවිද්‍යාල රාජ්‍ය ඔසුසල 2018 වසරේදී ස්ථාපිත කරන ලදි. මෙතුළින් සාමාන්‍ය මහජනතාවට වෛද්‍ය ඖෂධ ලබාදෙන අතරම ඔසුවේදය හදාරන සිසුන්ට අත්‍යාවශ්‍ය කරන පුහුණුව ද ලබාදෙනු ලබයි. වෛද්‍ය රසායනාගාර විද්‍යාව විකිරණ විද්‍යා හා විකිරණ චිකිත්සක අධ්‍යයන අංශ මගින් ද ඒවාට අදාළ සේවා මධ්‍යස්ථාන ඉදිරියේදී ස්ථාපිත කරනු ඇත. එවිට මෙම සේවාවන් තුළින් විද්‍යාගාර පරීක්ෂණ එක්ස්-රේ සහ මැමෝග්‍රෆි ස්කෑන් ආදී සේවාවන් ලබා ගැනීමට මහජනතාවට හැකිවනු ඇත. ගෝලීය වශයෙන් පිළිගත් හෙද වෘත්තිකයන් බිහිකරන සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ හෙදවේද අධ්‍යයන අංශය එවන් සේවයක් සලසන ශ්‍රී ලංකාවේ ප්‍රථමයා වීමේ අභිමානය උසුලයි. විද්‍යාවේදී හෙදවේද උපාධි පිරිනමන හෙදවේද අධ්‍යයන අංශයේ අධ්‍යයන වැඩසටහන සම්මාන 120කින් යුක්ත වන අතර එහි විෂය නිර්දේශය ජාත්‍යන්තර තත්ත්වයන්ට යෝග්‍ය වන පරිදි සැලසුම් කොට ඇත. වෛද්‍ය විද්‍යාවේ හෙදවේද විද්‍යාවේ මූලික සංකල්පයන් සියලුම ප්‍රථම උපාධි අපේක්ෂක හෙද සිසුන්ට හඳුන්වා දෙන අතර රෝහල් මුල්කරගත් පුහුණුව ද ඒ හා බැඳි පවති.

විවිධ වූ හා නව්‍යකරණ ක්‍රම මගින් හා ජාත්‍යන්තර සහයෝගීතාවන් හරහා සෞඛ්‍ය විද්‍යා අධ්‍යාපන පද්ධතිය හා සෞඛ්‍ය අංශය විප්ලවීකරණයට ලක්කොට නායකත්වය නව්‍යකරණය, අපූර්වත්වය සහ බුද්ධිමත් බව සහ නිපුණතාවයෙන් යන අනගි වටිනාකම්වලින් පිරිපුන් ගෝලීය වශයෙන් පිළිගත් හෙද වෘත්තිකයන් පිරිසක් බිහිකිරීම අපගේ ඉලක්කයයි.

මේ වනවිට මූලික විද්‍යා අධ්‍යයන අංශය ක්ෂේත්‍ර කිහිපයක් යටතේ දේශන හා පුහුණු වැඩසටහන් පවත්වනු ලබයි. ඒ අතරට මිනිස් භෞතික විද්‍යාව i (AH1104), මිනිස් භෞතික විද්‍යාව (RA1101) මිනිස් භෞතික විද්‍යාව, ii (AH 1204) විශ්ලේෂණාත්මක රසායන විද්‍යාව (ML1202), මූලික ජෛව රසායන විද්‍යාව (ML 1104) භෞත චිකිත්සකයන් උදෙසා ජෛව රසායන විද්‍යාව (PT 1101), මූලික ජෛව රසායන විද්‍යා (RA 1102), හෙදියන් උදෙසා මූලික ජෛව රසායන විද්‍යාව (NS 1101) මූලික මිනිස් කායව්‍යවච්ඡේදය (AH 1103) සාමාන්‍ය කාය ව්‍යාධවේදය (AH 1203) ව්‍යවහාරික කාය ව්‍යවච්ඡේදය (RA 1203) මූලික සංඛ්‍යානය (AH 1202) සහ තොරතුරු තාක්ෂණය (AH 1102) යන පාඨමාලා මොඩියුල උපාධි වැඩසටහන් පහ යටතේ පීඨයට ඇතුළත් වන සියළුම ප්‍රථම වසර උපාධි අපේක්ෂක සිසුන් සඳහා දේශන හා පුහුණුව මගින් දැනුම දායාද කෙරේ.

**ජයග්‍රහණ**

1. **විකිරණ විද්‍යා/විකිරණ චිකිත්සක අධ්‍යයන අංශය**
   - විකිරණ විද්‍යා හා මැමෝග්‍රෆි සඳහා නව සේවා ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා දිවිනැගුම පරිශ්‍රය මෙම අධ්‍යයන අංශය වෙත ලබාදෙන ලදි.
   - එක්ස්-කිරණ සේවාව සඳහා අවශ්‍ය කරන උපකරණ ඔස්ට්‍රියා ව්‍යාපෘතිය යටතේ මිලදී ගන්නා ලදි. (අල්ට්‍රා සවුන්ඩ් ස්කැන් යන්ත්‍රය, ජංගම X-කිරණ ඒකකය ආදිය)
   - විකිරණ විද්‍යා/විකිරණ චිකිත්සක අධ්‍යයන අංශයෙන් ශිෂ්‍ය කණ්ඩායම් දෙකක් (2011/2012 හා 2012/2013) ඔවුන්ගේ අධ්‍යයන පාඨමාලාවන් සාර්ථකව නිමකොට 2018 උපාධි ප්‍රදානෝත්සවයේදී උපාධි ලබාගත්හ.

2. **වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යයන අංශය**
   - ජනාධිපති සම්මාන - 01 (මහාචාර්ය එච්.එම්.ටී.යූ.හේරත්)
   - ප්‍රකාශන
     - අ. දර්ශක වාර සඟරා - 02
     - ආ. උපුටන / සමුළු ප්‍රකාශන - 03
     - ඇ. ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවලට සහභාගී වීම - 01
   - 2016/2017 නවක සිසු කණ්ඩායම බඳවා ගැනීම - සිසුන් 27 යි.
   - 2012/2013 සිසු කණ්ඩායම වෛද්‍ය රසායනාගාර විද්‍යා උපාධි වැඩසටහන අවසන් කිරීම
   - ඔස්ට්‍රියානු ප්‍රදානවලින් විද්‍යාගාර උපකරණ මිලදී ගැනීම
   - වැඩමුළු පැවැත්වීම

**2012/2013 සිසු කණ්ඩායම සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩමුළුව**

ජූනි 13 දින උපාධි ලබාගත් සිසුන් වෙනුවෙන් වැඩමුළුවක් පවත්වන ලදි. රැකියා අවස්ථා පශ්චාත් උපාධි අධ්‍යයන හා වෛද්‍ය රසායනාගාර විද්‍යා උපාධිධාරීන්ගේ විෂය පථය පිළිබඳ ඔවුන්ව දැනුවත් කිරීම මෙහිදී සිදු වූ අතර ඒ සඳහා රාජ්‍ය අංශය පුද්ගලික අංශය හා වියතුන් නියෝජනය කරමින් සම්පත්දායක පුද්ගලයන් සිව්දෙනෙකු සහභාගී වූහ.

**විෂයමාලා සංශෝධන වැඩමුළුව/ඕක් රේ රිජන්සි හෝටලය**

දැනට පවතින වෛද්‍ය රසායනාගාර විද්‍යා විෂයමාලාව සමාලෝචනය කිරීම සඳහා එම උපාධියට අදාළ විවිධ විෂයන් නියෝජනය කරමින් විශේෂඥයන් 22 දෙනෙකුගේ සහභාගිත්වයෙන් වරුවක වැඩමුළුවක් පවත්වන ලදි.

3. **භෞත චිකිත්සක අධ්‍යයන අංශය**
   - පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය භෞතික චිකිත්සක විද්‍යාවේදී උපාධියේ විෂයමාලාව ලෝක භෞත චිකිත්සක සංගමයේ මාර්ගෝපදේශවලට අනුකූලව සංශෝධනය කරන ලදි.
   - මෙම අධ්‍යයන අංශයේ සීමිත ඉඩකඩ ප්‍රමාණයක් පැවැතුනද ඊට ඇතුළත් කරගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව 45ක් දක්වා වැඩිකරන ලදි.
   - ඇමෙරිකාවේ ස්ලිපරි රොක් විශ්වවිද්‍යාලයේ සමග අවබෝධතා ගිවිසුමක් ආරම්භ කරන ලදි. (නීති නිලධාරීන් විසින් යෝජිත සංශෝධන සඳහා එම විශ්ව විද්‍යාලයේ අනුමැතිය අපේක්ෂාවෙන් පසුවේ.)
   - භෞත චිකිත්සක විද්‍යාපති පශ්චාත් උපාධි වැඩසටහන සඳහා විෂයමාලාවක් සංර්ධනය කිරීම සාර්ථක වූ අතර එය පීඨ මණ්ඩලය වෙත බාරදී ඇත.
   - පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය භෞත චිකිත්සක සමුළුව-2018 සහ ජාත්‍යන්තර සමුළුව මැයි මාසයේදී සාර්ථකව පවත්වන ලදි.
   - මෙම අධ්‍යයන අංශය සඳහා නව ගොඩනැගිලක් ඉදිකිරීම වෙනුවෙන් ශක්‍යතා වාර්තාවක් සහ BOQ (මිලියන 55ක්) මුදල් අමාත්‍යාංශය වෙත බාරදෙන ලදි.

4. **හෙදවේද අධ්‍යයන අංශය**

- 2015/2016 හෙද සිසු කණ්ඩයමේ පහන් දැල්වීමේ උත්සවය ජූලි 25 දින සමසෞඛ්‍ය විද්‍යා පීඨයේදී පවත්වන ලදි. මෙම උත්සවයේ ප්‍රධාන අමුත්තා ලෙස ඇමෙරිකාවේ යාලේ විශ්වවිද්‍යාලයේ යාලේ හෙද පාසලේ පීඨාධිපති මහාචාර්ය ඇන් කර්ත් සහ හෙදවේදී මහාචාර්ය ලින්ඩා කොච් ලොරිමර් සහභාගි වු අතර උපකුලපති, පීඨාධිපතීන් හා පීඨයේ කාර්ය මණ්ඩලය සහභාගි වුහ. ප්‍රතිඥාදීමේ උත්සවයේ වැදගත් කම පැහැදිලි කරන ලද්දේ හෙදවේද අධ්‍යයන අංශ ප්‍රධානී විසිනි. ප්‍රධාන අමුත්තාගේ දේශනයේදී හෙද සිසුන් විසින් මිනිස් ජීවිත සමග කටයුතු කිරීමේදී ඔවුන් වෙත පැවරී තිබෙන වගකීම් සහ කාර්යභාරයන් කරුණාවෙන් හා මෛත්‍රීයෙන් යුතුව ඉටුකරන ලෙසට මනා ප්‍රේරණයක් හෙද සිසුන් වෙත ලබාදෙන්නට විය. හෙද සිසුන් දල්වාගත් පහන් අතින් දරාගෙන වේදිකාවට මතුවී නයිටිංගේල් ප්‍රතිඥාව ලබාදෙන ඒ මනස්කාන්ත දසුන අධ්‍යයන කාර්ය මණ්ඩලය ආකර්ෂණය කරගන්නක් විය.
- සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ හෙදවේද අධ්‍යයන අංශය ප්‍රථම වතාවට "යහපත් සෞඛ්‍ය සත්කාර්යයක් වෙනුවෙන් හෙදියන්ගේ කාර්යභාරය ගවේෂණය" යන තේමාව යටතේ ජාත්‍යන්තර හෙද සමුළුවක් 2018 අප්‍රේල් 6-7 යන දිනවල මහනුවර ඔක්රේ රිජෙන්සි හෝටලයේදී පවත්වන්නට විය. ඇමෙරිකාවේ ජෝන් හොප්කින්ස් හෙද පාසල හා මැලේසියා විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ හෙද විද්‍යා අධ්‍යයන අංශය මෙම සමුළුවේ පාර්ශවකරුවන් විය.
- මෙම පීඨය හෙදවේද අධ්‍යයන අංශය ඇමෙරිකාවේ ජෝන් හොප්කින්ස් විශ්වවිද්‍යාලයීය හෙද පාසල සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කළේය.
- එමෙන්ම මෙම පීඨයේ හෙදවේද අධ්‍යයන අංශය එක්සත් රාජධානියේ එඩිමන්බර්ග් විශ්වවිද්‍යාලයේ හෙද පීඨය, මැලේසියා විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ හෙද විද්‍යා අධ්‍යයන අංශය හා දකුණු කොරියාවේ චුන්හේ සෞඛ්‍ය විද්‍යායතනය යන කීර්තිමත් විශ්වවිද්‍යාල සමග නව අවබෝධතා ගිවිසුම් කිහිපයක් ඇතිකරගැනීමට සමත් විය.
- වෛද්‍ය එම්.එල්. පතිරත්න ජපානයේ නිගාටා විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය විද්‍යා උපාධි විද්‍යා පීඨයෙන් හෙදවේදය පිළිබඳ දර්ශනශූරී උපාධිය අවසන් කළේය.
- වෛද්‍ය එච්.ඩී.ඩබ්.ටී. දසනායක මැලේසියා විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ හෙද විද්‍යා අධ්‍යයන අංශයෙන් දර්ශනශූරී උපාධිය අවසන් කළේය.
- බී.එම්.එස්. රත්නායක මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් ව්‍යවහාරික වසංගතරෝග විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධි අවසන් කළේය.
- යූ.ඩබ්.එස්. රත්නායක මහතාට සහ යමුනා අතුකෝරළ මහත්මියට ජාතික විද්‍යාත්මක ඵලදායිතාවය ඉහළනැංවීම සඳහා දිරි දීමනාවක් ලබාදීම වෙනුවෙන් ජනාධිපති සම්මානය පිරිනමනු ලැබීය.
- ටී.ජී.එන්.එස්. ගුණරත්න මිය හා පී.ඒ.ඩී. පෙරේරා යන මහත්මීන්ට ඔවුන්ගේ දර්ශනශූරී උපාධියේ පර්යේෂණ කටයුතු ආරම්භ කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ AHEAD ව්‍යාපෘතියෙන් පර්යේෂණ ප්‍රදානයක් පිරිනමනු ලැබීය.
- වෛද්‍ය පතිරත්න මහත්මියට ඇගේ දර්ශනශූරී උපාධියෙන් පසු ඇගේ පර්යේෂණ කටයුතු ආරම්භ කිරීම පිණිස පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රදානයක් ලැබිණ.
- එච්.එම්.ආර්.කේ. නන්දසේන මහත්මියට ඇගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු (දර්ශනපති) කරගෙන යෑම පිණිස පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ප්‍රදානයක් ලැබිණ.
- ජපානයේ නිගාටා විශ්වවිද්‍යාලය සමඟ පවත්වාගෙන යන Sister Link වැඩසටහන යටතේ මෙම අධ්‍යයන අංශයේ සිසුන් දෙදෙනෙකු කෙටි අධ්‍යයන වැඩසටහනක් සඳහා ජපානයට යවන ලදි.
- සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ උසස් උපාධි කමිටුව හෙදවේද ක්ෂේත්‍රයට අදාළ දර්ශනපති හා දර්ශනශූරී උපාධි වැඩසටහන් ප්‍රදානය කිරීම ආරම්භ කරන ලදි.

5. **ඖෂධවේද අධ්‍යයන අංශය**

- **විශ්වවිද්‍යාල රාජ්‍ය ඔසුසල විවෘත කිරීම**

  ඉහත ඔසුසල 2018 සැප්තැම්බර් 1වැනි දින උත්සවාකාරයෙන් විවෘත කරන ලදි. සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ මෙම වැදගත් අවස්ථාවට සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය, වෛද්‍ය රාජිත සේනාරත්න, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති, රාජ්‍ය ඖෂධ සංස්ථාවේ සභාපති, සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති විශේෂ අමුත්තන් ලෙස සහභාගී වූහ. මෙම ඔසුසල සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ ඔසුවේද අධ්‍යයන අංශයේ හා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ සංස්ථාවේ ඒකාබද්ධ සහයෝගීතා ව්‍යාපෘතියකි. ජනතාව වෙනුවෙන් උසස් ඖෂධීය සේවාවන් සැපයීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි.

ඊට අමතරව පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය සිසුන්ට ඉගැන්වීම, පුහුණුව හා පර්යේෂණ සඳහා අවස්ථාව ලබාදෙන ස්ථානයක් ද වේ. එමෙන්ම ඖෂධ භාවිත කරන්නන්ට අත්‍යාවශ්‍ය වන උපදේශන සේවාවන් ලබාදීමට හා කලාපීය ඖෂධ විමර්ශන මධ්‍යස්ථානයක් ලෙසද කටයුතු කරන අතර විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට ඖෂධ මිලදී ගැනීමේදී එම මුළු වියදමෙන් 5%ක වට්ටමක් මෙමගින් ලබාදෙනු ලබයි.

- පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ඖෂධ සංගමය විසින් සංවිධානය කළ "Future Pharma Eue" වැඩමුළුව මැයි මස 26 දින පවත්වනු ලැබීය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ඖෂධ ශිෂ්‍ය සංගමයේ ඖෂධවේදී උපාධිය හදාරන ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන්ගේ ශිෂ්‍ය සංගමය ඖෂධවේද අධ්‍යයන අංශය සමඟ සහයෝගීතාවයෙන් මෙම වෘත්තීය මාර්ගෝපදේශන වැඩමුළුව සංවිධානය කරන ලද්දේ ඖෂධ කර්මාන්තය පිළිබඳව ඔවුන්ගේ දැනුම වඩා වර්ධනය කර ගැනීම සඳහායි. මෙම ක්ෂේත්‍රයේ සිටින පුරෝගාමී වෘත්තිකයන් සම්පත්දායකයන් ලෙස මෙම වැඩමුළුවට සහභාගී වූ අතර (ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු ඖෂධවේද අධ්‍යයන අංශයේ ආදි විද්‍යාර්ථීන්ය) එච්.ආර්.ඩබ්.ඩී.පී.කේ. නියන්ගොඩ මහත්මිය සහ වෛද්‍ය එච්.එම්.ඩී.ආර්. හේරත් ඒ අතර වූහ.
- අවසන් වසර ඖෂධවේදී උපාධි අපේක්ෂක සිසුන් වෙනුවෙන් සායනික ඖෂධ ඉගැන්වීම හා පුහුණුව අගෝස්තු 6 දින සිට 17 දින දක්වා පවත්වන ලදි.
- මේ අතර රාජකීය බ්‍රිස්බේන් හා කාන්තා රෝහලේ සහ ඕස්ට්‍රේලියාවේ ක්වින්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලයේ සහාය මහාචාර්ය ඉයන් කැම්බ්ස්, ඕස්ට්‍රේලියාවේ බ්‍රිස්බේන් ප්‍රින්සස් ඇලෙක්සැන්ඩ්‍රා කාන්තා රෝහලේ ජුඩිත් කැම්බ්ස් මහත්මිය, ඕස්ට්‍රේලියාවේ මැකේ මූලික රෝහලේ බ්‍රිජට් ඕබ්‍රියන් මහත්මිය, එක්සත් රාජධානියේ ජුඩ් කෝප් මිය හා ජේන් හෝ මහත්මිය මෙම පීඨයේ ඖෂධවේද අධ්‍යයන අංශයට පැමිණ ඖෂධවේද උපාධි අපේක්ෂක සිසුන් වෙනුවෙන් සති දෙකක කාලයක් දේශන සහ පුහුණු සැසි පැවැත්විය. ඔවුන්ගේ දේශන න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණු වලින් යුක්ත විය. සිසුන්ට මෙහිදී සායනික ඖෂධ පුහුණුව මෙන්ම හෘදරෝග, වෛද්‍ය විද්‍යාව, ශල්‍යකර්ම, ළමා රෝග ආදි වෙනත් විවිධ අංශ පිළිබඳ මනා පුහුණුවක් මහනුවර ශික්ෂණ රෝහලේදී ලබාදෙන්නට විය.
- ඖෂධවේදීන් හා වෛද්‍ය කාර්ය මණ්ඩලයේ සහයෝගීතාවයෙන් "රෝගීන්ට වඩාත් සුදුසු වෛද්‍ය ප්‍රතිකාර තෝරාගැනීම" පිළිබඳ ඉදිරිපත් කිරීමේ සම්මන්ත්‍රණයක් පේරාදෙණිය ශික්ෂණ රෝහලේදී අගෝස්තු 9 දින පවත්වන ලදි. සහාය මහාචාර්ය ඉයන් කැම්බ්ස් ඖෂධවේදී අධ්‍යයන අංශයට පැමිණි කාලය තුළ එම අධ්‍යයන අංශයේ සහයෝගයෙන් සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදි. ඖෂධ පුහුණුව පිළිබඳ විෂයමාලා සංශෝධන විශේෂඥ වැඩමුළුවක් අගෝස්තු 13 දින පවත්වන ලදි.
- රජයේ ඖෂධවේදීන් සඳහා "Translating Evidence into Practice – Pharmacist impact on Patient Care" යන තේමාව යටතේ දින භාගයේ වැඩමුළුවක් මෙම පීඨයේ ඖෂධවේද අධ්‍යයන අංශයේදී අගෝස්තු 13 දින පවත්වන ලදි.
- ඖෂධවේද අධ්‍යයන අංශය ඕස්ට්‍රේලියානු සහ එක්සත් රාජධානියේ සායනික ඖෂධවේදීන් සමඟ සහයෝගීතාවයෙන් රජයේ ඖෂධවේදීන්ගේ ඔසුහල් පරිහරණය පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම සඳහා මෙම වැඩමුළුව පවත්වන්නට විය.
- ඖෂධ විද්‍යාවන් පිළිබඳ විෂයමාලා සංශෝධන වැඩමුළුවක් දෙසැම්බර් 18 දින පවත්වන ලදි.

## 6. මූලික විද්‍යා අධ්‍යයන අංශය

- පෙර පීඨාධිපති කාර්යාලය පැවති පරිශ්‍රය තුළ මූලික විද්‍යා අධ්‍යයන අංශය ස්ථිරව ස්ථාපිත කිරීමට පසුගිය වසරතුළ අපට හැකිවිය.
- ඊට අමතරව අධ්‍යයන අංශයට අත්‍යාවශ්‍ය කරන වීදුරු භාණ්ඩ, රසායනික ද්‍රව්‍ය හා පරිභෝජන ද්‍රව්‍ය මිලදීගත් අතර එක් ලක්ෂ පන්දහසක් පමණ වටිනා කායව්‍යවච්ඡේද ආකෘති පරිත්‍යාගයක් ද මෙම අංශය වෙත ලැබී ඇත. මෙම පරිත්‍යාගය කරන ලද්දේ සීමාසහිත හෙම්සන් පුද්ගලික සමාගම විසිනි. සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ කායව්‍යවච්ඡේද කෞතුකාගාරයක් ස්ථාපිත කිරීම සඳහා මිනිස් සිරුරේ අවයව SAIITM වෙතින් ලබාගැනීමට තරම් මෙම අධ්‍යයන අංශය වාසනාවන්ත විය.
- විද්‍යාගාර කාර්ය මණ්ඩලය බඳවා ගැනීමත් සමඟම බොහොමයක් පර්යේෂණ පැවැත්විය හැකි මට්ටමට මූලික විද්‍යා විද්‍යාගාරය දියුණු කරගැනීමට හැකිවිය.
- මානව භෞතික විද්‍යාව, මූලික ජෛව රසායන විද්‍යාව හා මූලික මිනිස් කායව්‍යවච්ඡේදය යන විෂයන් සම්බන්ධව බාහිර විශේෂඥයන් සමග විෂයමාලා සංශෝධන වැඩමුළු පැවැත්වීමට මෙම අධ්‍යයන අංශයට හැකි විය.

- එක් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු කථිකාචාර්ය තනතුරේ ස්ථිර කළ අතර වෙනත් පරිවාස කථිකාචාර්යවරියක් ඇගේ දර්ශනශූරී උපාධිය හැදෑරීම සඳහා නවසීලන්තයේ ඔටාගො විශ්වවිද්‍යාලය බලා පිටත්ව යනු ඇත. තව ද අලුතින් බඳවාගත් පරිවාස කථිකාචාර්යවරියක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයෙන් ඇගේ දර්ශනපති උපාධිය හැදෑරීම ආරම්භ කොට ඇත.

**බාධක සහ පිළියම්**

1. **හෙදවේද අධ්‍යයන අංශය**
   - සිසුන් විසින් පවත්වන ලද සංකේත වර්ජන කිහිපයක් හේතුවෙන් 2011/2012 සිසු කණ්ඩායමට ඔවුන්ගේ අධ්‍යයන වැඩසටහන නිසි කලට අවසන් කිරීමට නොහැකි විය. කෙසේ වුවත් ඔවුන් එම අධ්‍යයන වැඩසටහනේ සියලු කොටස් 2017 ඔක්තෝම්බර් අවසාන වනවිට අවසන් කරන ලද අතර අවසන් පරීක්ෂණයට 2017-11-09 දින පෙනී සිටින ලදී. 2018 උපාධි ප්‍රදානෝත්සවයේදී ඔවුහු උපාධි ලබාගත්හ.

2. **මූලික විද්‍යා අධ්‍යයන අංශය**
   - SAIITM වෙතින් කායව්‍යවච්ඡේද ආකෘති මෙම අධ්‍යයන අංශයට ලැබුණ ද විද්‍යාගාර කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට නොහැකි විය.
   - ප්‍රමාණවත් උපකරණ හා යටිතල පහසුකම් නොලැබීම හේතුවෙන් සියළුම උපාධි අපේක්ෂක සිසුන්ට ප්‍රායෝගික අත්දැකීමක් ලබාදීමේ හැකියාවක් මෙම අධ්‍යයන අංශයට නොමැත.

**අනාගත සැලසුම්**

1. **භෞත චිකිත්සක අධ්‍යයන අංශය**
   - මෙම අධ්‍යයන අංශය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම ආරම්භ කිරීම (පළමු අදියර) ප්‍රධාන ප්‍රමුඛතාවයකි
   - ජෛව යාන්ත්‍රික හෝ චලන විශ්ලේෂණ විද්‍යාගාරයක් ස්ථාපිත කිරීම මෙහි තවත් ප්‍රමුඛතාවයක් වන අතර මුදල් අපේක්ෂාවන් යෝජනා කිහිපයක්ම බාරදී ඇත
   - රෝගී සත්කාරක දීර්ඝ කිරීම සඳහා ක්‍රීඩා භෞත චිකිත්සක පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම
   - සහයෝගීතා පර්යේෂණ සහ කාර්ය මණ්ඩල හා ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් සඳහා විදෙස් විශ්වවිද්‍යාල සමඟ අවබෝධතා ගිවිසුම් ස්ථාපිත කරගැනීම ද මෙම අධ්‍යයන අංශය අපේක්ෂා කරයි
   - භෞත චිකිත්සක දැනුම ඉහළනැංවීම පිණිස විදෙස් හා දේශීය විශේෂඥයන්ගේ උදව් ඇතිව වැඩමුළු සහ සම්මන්ත්‍රණ පැවැත්වීම
   - අදාළ බලධාරීන්ගේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව භෞත චිකිත්සාව පිළිබඳ විද්‍යාපති උපාධිය ආරම්භ කිරීමට ද සැලසුම් කෙරෙමින් පවති

2. **වෛද්‍ය රසායනාගාර අධ්‍යයන අංශය**
   - ගැටඹේ දිවිනැගුම ගොඩනැගිල්ලේ වෛද්‍ය රෝග හඳුනා ගැනීමේ විද්‍යාගාරයක් ස්ථාපිත කිරීම
   - විද්‍යාගාර ආරක්ෂණය හා පුහුණුව පිළිබඳව කාර්මික නිලධාරීන් හා විද්‍යාගාර සහයකයන් වෙනුවෙන් වැඩමුළුවක් පැවැත්වීම
   - මධ්‍යම පළාතේ පාසල්වල අ.පො.ස. (උ.පෙ.) සිසුන් වෙනුවෙන් ජීව විද්‍යාව පිළිබඳ පාසල් විද්‍යා වැඩසටහනක් පැවැත්වීම

3. **විකිරණ විද්‍යා/විකිරණ චිකිත්සක අධ්‍යයන අංශය**
   - මෙම අධ්‍යයන අංශය පිහිටි ගොඩනැගිල්ලේ දෙවන මහල ඉදිකිරීම ආරම්භ කිරීම

4. **ඖෂධවේද අධ්‍යයන අංශය**
   - විද්‍යාගාර තුනක් ස්ථාපිත කිරීමේ අමාත්‍යාංශ මණ්ඩල අනුමැතිය ලද ගොඩනැගිලි ව්‍යාපෘතිය AHEAD ව්‍යාපෘතියේ මුදල් ප්‍රතිපාදන යටතේ 2019 වසරේදී ආරම්භවනු ඇත. මේ තුළින් ප්‍රථම උපාධි

අපේක්ෂකයන්ට හා පශ්චාත් උපාධි හදාරන සිසුන්ට දැඩි අවශ්‍යතාවක් වූ විද්‍යාගාර පහසුකම් සැපයෙනු ඇත.

5. **මූලික විද්‍යා අධ්‍යයන අංශය**

- කායව්‍යච්ඡේද කෞතුකාගාරයක් ස්ථාපිත කිරීමට හා කායව්‍යවච්ඡේද පුහුණු පංති ආරම්භ කිරීමට ද මෙම අධ්‍යයන අංශය සැලසුම් කරමින් සිටී. එමෙන්ම ඉගැන්වීමේ සහ පර්යේෂණ කටයුතු සඳහා Cell Culture විද්‍යාගාරයක් ස්ථාපිත කිරීමට ද අපේක්ෂා කරයි.

6. **හෙදවේද අධ්‍යයන අංශය**

- සියළුම පාර්ශවකරුවන්ගේ උපදෙස් ලබාගනිමින් හෙදවේද විද්‍යාවේදී ප්‍රථම උපාධි අපේක්ෂක විෂයමාලාව සංශෝධනය කිරීමට ද හෙදවේදය පිළිබඳ විද්‍යාපති නව උපාධි වැඩසටහන් ආරම්භ කිරීමට ද මෙම අධ්‍යයන අංශය අදහස් කරයි
- හෙදවේද අධ්‍යයන මධ්‍යස්ථානයක් සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ ස්ථාපිත කිරීම
- සම සෞඛ්‍ය පීඨයේ යෝජිත දැඩි සත්කාර ඒකකයක් ස්ථාපිත කිරීම
- හෙදවේද අධ්‍යයන අංශයේ සේවා ඒකකයක් ලෙස දිවිනැගුම ගොඩනැගිල්ලේ තුවාල සත්කාරක මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම
- හෙදවේද අධ්‍යයන අංශයේ නව ගොඩනැගිලි වැඩසටහන කඩිනම් කිරීම
- සම සෞඛ්‍ය විද්‍යා පීඨය හා ගෝලීය වශයෙන් පිළිගත් සෞඛ්‍ය විද්‍යාව පිළිබඳ විශ්වවිද්‍යාල අතර අවබෝධතා ගිවිසුම් සංවර්ධනය කරගැනීම තුළින් ජාත්‍යන්තර සහයෝගීතාවන් ඉහළ නැංවීම

## 3.3 ශාස්ත්‍ර පීඨය

(පීඨාධිපති - මහාචාර්ය ඕ.ජී. දයාරත්න බංඩා)

### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාල ශාස්ත්‍ර පීඨය ශ්‍රී ලංකාවේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ක්ෂේත්‍රයේ ඉගැන්වීමෙහි හා පර්යේෂණ කාර්යයෙහි නිරත ප්‍රමුඛතම මධ්‍යස්ථානයකි. මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ක්ෂේත්‍රයේ විෂයපථ 20කට අදාළව ශාස්ත්‍රවේදී උපාධි, වාණිජවේදී උපාධි, නීතිවේදී උපාධි සහ අධ්‍යාපනවේදී උපාධි මෙම පීඨය මගින් ප්‍රධානය කෙරේ. කලා උපාධි හදාරන සිසුන් 2891කට, නීතිවේදී උපාධි හදාරන සිසුන් 207කට, වාණිජවේදී උපාධි හදාරන සිසුන් 110කට සහ අධ්‍යාපනවේදී උපාධිය හදාරන සිසුන් 176ක් ඇතුළුව ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් 3384 දෙනෙකුට ඉගැන්වීමේ පහසුකම් 2018 වසරේදී සපයන ලදි. එමෙන්ම 2018 වසරේදී පවතින අධ්‍යයන වසර සඳහා සිසුන් 795 දෙනෙකු පීඨයට ඇතුළත් කරගත් අතර ඉන් සිසුන් 745 දෙනෙකු ශාස්ත්‍රවේදී උපාධිය සඳහා ද සිසුන් 50 දෙනෙකු නීතිවේදී උපාධිය සඳහා ද ලියාපදිංචි කරන ලදි.

### ජයග්‍රහණ

2018 වසරේදී ශාස්ත්‍ර පීඨය පහත සඳහන් පරිදි උපාධිධාරීන් 830 දෙනෙකු බිහිකරන ලදි.

| ශාස්ත්‍රවේදී (ගෞරව) | ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) | නීතිවේදී | වාණිජවේදී |
|---|---|---|---|
| 481 | 255 | 51 | 43 |

ප්‍රථම උපාධි ප්‍රදානය වර්ගීකරණය

| ප්‍රථම පංති සාමාර්ථ | දෙවන පෙළ සාමාර්ථ | | සමත් |
|---|---|---|---|
| | ඉහළ | පහළ | |
| 21 | 368 | 279 | 190 |

පුළුල් ක්ෂේත්‍ර ගණනාවක් තුළින් පර්යේෂණ හුවමාරු කරගැනීමේ මංපෙත් විවර කළ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යාවන් පිළිබඳ සිව්වැනි ජාත්‍යන්තර සමුළුව මෙම වසර තුළදී පීඨය මගින් සංවිධානය කරන ලදි. තව ද ශාස්ත්‍රීය පර්යේෂණ පත්‍ර විශාල සංඛ්‍යාවක් ඉදිරිපත් වූ මෙම සමුළුව ක්ෂේත්‍රයේ ඉහළ ප්‍රතිරූපයක් ගොඩනගා ගැනීමට කලා පීඨයට හේතු පාදක විය. මේ අතර ශාස්ත්‍ර පීඨයේ පාලි හා බෞද්ධ අධ්‍යයන දෙපාර්තමේන්තුව සිව්වැනි ජාත්‍යන්තර පාලි භාෂා සමුළුව සංවිධානය කළ අතර එතුළින් විද්වතුන්ට පාලි භාෂාව පිළිබඳව පවතින විවිධ විෂය පථයන්ට අදාළ කරුණු සාකච්ඡා කිරීමටත් ආධුනික හා ජ්‍යෙෂ්ඨ විද්වත් පිරිසට ඔවුනොවුන්ගේ දැනුම හුවමාරු කරගැනීමටත් අවස්ථාව උදාවිය. එපමණක් නොව ආර්ථික විද්‍යා හා සංඛ්‍යාලේඛන අධ්‍යයන අංශය 6වැනි ජාත්‍යන්තර ආර්ථික විද්‍යා පර්යේෂණ සම්මන්ත්‍රණය-2018 ද භූගෝල විද්‍යා අධ්‍යයන අංශය 7වැනි UGIT ජාත්‍යන්තර සමුළුව ද පවත්වන්නට විය. මේ අතර තරුණ පර්යේෂකයන්ට ඔවුන්ගේ පර්යේෂණ සොයාගැනීම් ව්‍යාප්ත කරගැනීමට වේදිකාවක් නිර්මාණය කෙරෙන උපාධි අපේක්ෂක පර්යේෂණ සැසිය 2018 ශාස්ත්‍ර පීඨය විසින් සාර්ථකව පවත්වන ලදි.

යටිතල සංවර්ධන ව්‍යාපෘති යටතේ පහත සඳහන් ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකර ඇත.

1. වසර 75ක් පැරණි කලාගාරය සහ ප්‍රධාන කලා ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය
2. නව කලාගාර (NAT) ගොඩනැගිල්ලේ වැසිකිළි පද්ධතිය ප්‍රතිසංස්කරණය

### ශිෂ්‍යත්ව/සහෘදත්ව

ශාස්ත්‍ර පීඨය විදෙස් විශ්වවිද්‍යාල කිහිපයක් සමඟ ඇතිකරගත් සම්බන්ධිත වැඩසටහන් යටතේ පහත දැක්වෙන් පරිදි ශිෂ්‍යත්ව කිහිපයක් සිසුන් වෙත පිරිනමන ලදි

| විශ්වවිද්‍යාලයේ නම | ශිෂ්‍යත්ව සංඛ්‍යාව | කාලය |
|---|---|---|
| ජපානයේ ෆුකුඔකා කාන්තා විශ්ව විද්‍යාලය ශිෂ්‍ය හුවමාරු | 03 | අවුරුදු එකයි |
| කොරියාවේ ඩොන්ගුක් විශ්වවිද්‍යාලය ශිෂ්‍ය හුවමාරු වැඩසටහන | 04 | එක් සමාසිකයක් |
| ජපානයේ හොකයිඩො විශ්වවිද්‍යාලය ශිෂ්‍ය හුවමාරු වැඩසටහන | 02 | අවුරුදු එකයි |

**අනාගත සැලසුම්**

ශාස්ත්‍ර පීඨය කලා උපාධි වැඩසටහන්, පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් මෙන්ම ප්‍රජා සමාජ කටයුතු සංවර්ධනය කිරීමට සැලසුම් සකස් කොට ඇත. මෙම කටයුතු සංශෝධිත විෂයමාලාව ක්‍රියාත්මක කිරීමෙන් නව උපාධි වැඩසටහන් හඳුන්වාදීම, ප්‍රායෝගික පුහුණුව හා ක්ෂේත්‍ර පුහුණුව මෙන්ම අන්තේවාසිකත්ව ඇතුළත් කිරීම යන විවිධ ක්‍රියාමාර්ග තුළින් සිදු කිරීමට නියමිතයි. නව ගොඩනැගිලි ඉදිකිරීම ඉගැන්වීමට අවශ්‍ය අලුත් ද්‍රව්‍ය නව පොත් හා වාරසඟරා මිලදී ගැනීම තුළින් භෞතික වත්කම් හා යටිතල පහසුකම් දියුණු කරනු ඇත. ජාත්‍යන්තර සමුළු හා ප්‍රථම උපාධි අපේක්ෂක සම්මන්ත්‍රණ පැවැත්වීම තුළින් දැනුම ව්‍යාප්ත කිරීම වාර්ෂික ක්‍රියාවක් ලෙස සංවර්ධනය කරනු ඇත. සිසුන්ට කර්මාන්ත ක්ෂේත්‍රයට හා රැකියා අවස්ථාවන් සඳහා විවෘත කරවීම අන්තේවාසික වැඩසටහන් වෘත්තීය පොළවල් හා ස්වේච්ඡා කටයුතු තුළින් වැඩි දියුණු කරනු ඇත.

2019 වසර තුළදී පහත සඳහන් සුවිශේෂී ක්‍රියාකාරකම් සිදුකිරීමට නියමිතය.

1. පීඨ තත්ත්වාරක්ෂණ සංසදය හරහා අධ්‍යයන වැඩසටහන හා සම්බන්ධ සියළු තත්ත්වාරක්ෂණ ක්‍රියාකාරකම් සිදුකිරීම
2. අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් විෂයමාලා සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණ, වැඩමුළු පැවැත්වීම
3. පීඨ තත්ත්වාරක්ෂණ කමිටු රැස්වීම් හා විෂයමාලා සංවර්ධන කමිටු රැස්වීම් පැවැත්වීම
4. සංශෝධිත විෂයමාලාව ක්‍රියාත්මක කිරීම.
5. වර්තමානය වනවිට භාවිත කෙරෙන ඉගැන්වීමේ ක්‍රමවේදයන් ඇගයීමට ලක් කිරීම
6. අදාළ පාඨමාලාවන්ට නව ඉගැන්වීමේ ක්‍රමවේදයන් හඳුනාගැනීම
7. ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ක්‍රමයට ඇතුළත් කිරීම සඳහා නව ඉගැන්වීමේ ක්‍රමවේදයන් එකතු කිරීම හා පවතින ක්‍රමවේදයන් නවීකරණය කිරීම.
8. ඉගැන්වීම/ඉගෙනීම/ඇගයීම සම්බන්ධ ක්‍රමවේදයන් පිළිබඳ වැඩමුළු/සම්මන්ත්‍රණ පැවැත්වීම
9. සත් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම
10. මලලසේකර ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කොට පුළුල් කිරීම
11. භාෂා විද්‍යාගාරයක් ඉදිකිරීම
12. පීඨයට අවශ්‍ය ඉගැන්වීමේ ද්‍රව්‍ය/උපකරණ හා ලී බඩු මිලදී ගැනීම
13. සමස්ත පීඨයම ජාලකරණය කිරීම
14 Wi-Fi ජාල ස්ථාපිත කිරීම
15. අදාළ පොත් සහ වාරසඟරා මිලදී ගැනීම
16 පීඨයට නව අධ්‍යයන හා අනධ්‍යයන සේවක තනතුරු ඉල්ලා සිටීම
17. සියළුම පාඨමාලා/අධ්‍යයන වැඩසටහන්වල ඉගැන්වීම සිසුන් විසින් ඇගයීමට ලක් කිරීම
18. සියළුම පාඨමාලා/අධ්‍යයන වැඩසටහන්වල ඉගැන්වීම සම ඇගයීමට ලක්කිරීම
19. ඉගැන්වීම පිළිබඳ විශිෂ්ටතා සම්මානයක් පිරිනැමීම
20. ආචාර්යවරුන් ඇගයීම පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
21. අදාළ පාර්ශවකරුවන් සමඟ සිසුන් වෙනුවෙන් එළිමහන් ක්‍රියාකාරකම් සිදුකරන දින පැවැත්වීම
22. අන්තේවාසික වැඩසටහන් සංවිධානය කිරීම.
23. නිසි පාර්ශවකරුවන් සමඟ සම්බන්ධතා සංවර්ධනය කිරීම
24. ඒකාබද්ධ උපාධි ප්‍රදානය කිරීම සඳහාත් කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් දියත් කිරීම පිණිස විදෙස් විශ්වවිද්‍යාල සම්බන්ධතා ගොඩනැගීම.
25. විද්‍යාවේදී උපාධි ඉගැන්වීම.

26. විෂයමාලාවට භාෂා පරිවර්තන පාඨමාලා හඳුන්වාදීම
27. ශාරීරික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී උපාධිය පැවැත්වීම
28. ගණිත විෂය ඉගැන්වීම පිළිබඳ අධ්‍යාපනවේදී උපාධිය පැවැත්වීම
29. DPP පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය පැවැත්වීම
30. ව්‍යවහාර සමාජ සංඛ්‍යානය පිළිබඳ නව උපාධි වැඩසටහනක් හඳුන්වාදීම
31. සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
32. සීමාවාසික පුහුණු, ස්වේච්ඡා හා ප්‍රජා සමාජ සේවා කටයුතු සම්බන්ධීකරණය සඳහා සම්බන්ධීකරණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම
33. LMS හඳුන්වාදීම
34. සියළුම අධ්‍යයන අංශවලට Moodle හඳුන්වාදීම
35. කියවීම්/ඉගෙනීම් ද්‍රව්‍ය හඳුන්වාදීම
36. ප්‍රථම උපාධි අපේක්ෂක පර්යේෂණ සමුළුව 2019
37. ක්ෂේත්‍ර පුහුණු හා සමාජ ක්‍රියාකාරකම් සියළුම අධ්‍යයන වැඩසටහන්වලට ඇතුලත් කිරීම
38. පීඨ තොරතුරු සන්නිවේදන තාක්ෂණ ඒකකයක් ස්ථාපිත කිරීම
39. විෂය ක්ෂේත්‍ර සංගම් විසින් සංවිධානය කරන තරඟ සහ හැකියාවන් පිළිබිඹු වන ප්‍රදර්ශන පැවැත්වීම
40. පීඨාධිපතීන්ගේ ලැයිස්තුවක් හා පීඨ ත්‍යාගයක් හඳුන්වාදීම
41. අවසන් වසර අවසානයේ වෘත්තීය පොළක් සංවිධානය කිරීම
42. විමර්ශන වාරසඟරා ප්‍රකාශනවලට වාර්ෂිකව පර්යේෂණ ප්‍රදාන සම්බන්ධ කිරීම
43. පර්යේෂණ පහසු කරවීම සඳහා හඳුනාගත් ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් සංවර්ධනය
44. විදෙස් රටවල ඉහළ තත්ත්වයේ විශ්වවිද්‍යාල ආගන්තුක විද්වතුන්ට ආරාධනා කිරීම
45. පුරෝගාමී පුද්ගලයන්ගේ සහභාගීත්වයෙන් මහජන සම්මන්ත්‍රණ පැවැත්වීම
46. අධ්‍යයන වැඩසටහන් සඳහා විශේෂ අමුත්තන් හා ආගන්තුක කථිකාචාර්යවරුන් ලෙස පුරෝගාමී පුද්ගලයන්ට ආරාධනා කිරීම
47. මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යාවන් පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ වැඩසටහන් සංවර්ධනය කිරීම
48. පර්යේෂණ වෙනුවෙන් මෙරට අනෙකුත් කලා පීඨ (මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යාවන්) අතර අන්තර් විශ්වවිද්‍යාල හා සහයෝගීතා සංවර්ධනය කිරීම
49. පර්යේෂණ යෝජනා ලිවීම හා පර්යේෂණ පිළිබඳ වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීම
50. පරිවාස මට්ටමේ කථිකාචාර්යවරුන් IELTS, TOFEL හා GRE වැනි කාර්යයන් සඳහා දිරිගැන්වීම
51. පර්යේෂණ ප්‍රකාශන වෙනුවෙන් සංස්කරණ සේවාවක් ස්ථාපිත කිරීම
52. පීඨ උපදේශන ඒකකයක් ස්ථාපිත කිරීම
53. පීඨ ශිෂ්‍ය සුබසාධන මධ්‍යස්ථානය දියුණු කිරීම
54. පීඨයේ නිත්‍ය ක්‍රීඩා ක්‍රියාකාරකම් සංවිධානය කිරීම
55. පීඨයේ කලා සභාව හරහා සංගීතය, කලාව හා නාට්‍ය පිළිබඳ පුහුණු වැඩසටහන් හඳුන්වාදීම
56. අධ්‍යයන අංශ/සංගම්/මධ්‍යස්ථාන හරහා ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති/CSR ව්‍යාපෘති දියත් කිරීම
57. පීඨ සාමාජිකයන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
58. ගිණි ගැනීමේ අවාධානම් සහිත ස්ථාන හඳුනාගෙන ගිනි නිවීමේ පද්ධතියක් සවිකිරීම
59. පරිගණක විද්‍යාගාර, සර්වර් කාමර, පුරාවිද්‍යා විද්‍යාගාර ආශ්‍රිතව CCTV කැමරා/ආරක්ෂක පද්ධති සවිකිරීම

## 3.4 දන්ත වෛද්‍ය විද්‍යා පීඨය

(පීඨාධිපති - මහාචාර්ය ජේ.ඒ.වී.පී. ජයසිංහ)

### හැඳින්වීම

ඉගැන්වීම, පර්යේෂණ හා රෝගී සත්කාරක කටයුතුවලට සහාය වන පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය දන්ත වෛද්‍ය පීඨය හා දන්ත වෛද්‍ය (ශික්ෂණ) රෝහල සැලකිය යුතු මට්ටමේ පහසුකම් සහිත ගොඩනැගිලි සමුදායකින් යුක්ත වේ. රටට අවශ්‍ය දන්ත ශල්‍ය වෛද්‍යවරුන් පුහුණු කරන එකම ආයතනය දන්ත වෛද්‍ය පීඨය වන අතර එය අධ්‍යයන අංශ හතකින් (7) සමන්විත වේ. වාර්ෂික දන්ත ශල්‍ය වෛද්‍යවරුන් 80 දෙනෙකු පුහුණු කරන මෙම පීඨය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන සමග සහයෝගීතාවයෙන් යුතුව දන්ත විශේෂඥ වෛද්‍යවරුන් පුහුණු කිරීම හා දන්ත වෛද්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ වෙනත් උපස්ථම්භක වෘත්තිකයන් පුහුණු කිරීම ප්‍රථම උපාධි අපේක්ෂකයන් පුහුණු කිරීමට අමතරව සිදුකරනු ලබන ප්‍රධාන කාර්යයන්ය. තව ද මෙම පීඨය හා දන්ත වෛද්‍ය ශික්ෂණ රෝහල තෘතීය රෝගී සත්කාරක මධ්‍යස්ථානයක් ලෙස ද, ක්‍රියාකරන අතර එහි පවතින පහසුකම් වෛද්‍ය හා සම සෞඛ්‍ය විද්‍යා පීඨ සිසුන්ගේ පුහුණුව සඳහා ද භාවිත කරගනු ලබයි. ඉගැන්වීම හා සේවා කෘත්‍යයට අමතරව සැලකිය යුතු පර්යේෂණ සංඛ්‍යාවක් දේශීය හා විදේශීය සහයෝගීතා ව්‍යාපෘති සමඟ එක්ව සිදුකරනු ලබයි. ප්‍රථම උපාධි විෂයමාලාව සංශෝධනය කොට 2016 වසරේ සිට වර්ෂ පහක් (5) දක්වා දීර්ඝකර 2017 වසරේදී ආරම්භ කරන ලදි.

### ජයග්‍රහණ

- අවුරුදු පහක විෂයමාලාව සඳහා දෙවන සිසු කණ්ඩායම (2018/2019) 2018 ජනවාරි මාසයේදී ලියාපදිංචි කළ අතර එම වැඩසටහනේ තෙවන හා සිව්වන සමාසිකයන් සාර්ථකව ක්‍රියාත්මක කරන ලදි.
- ප්‍රථම උපාධි විෂයමාලාව සංශෝධනය කිරීමේ කාර්යයන් අඛණ්ඩව නිත්‍ය පදනමින් සිදුවෙමින් පවති.
- 2018 ශිෂ්‍ය අත්පොත සමාසික 1-4 දක්වා වන වැඩසටහන් පොත හා ප්‍රථම උපාධි සිසුන්ගේ කොටස් 1 සහ 11 පොත් පළකරන ලදි.
- දන්ත වෛද්‍ය ප්‍රථම උපාධි අපේක්ෂකයන් සඳහා උපාධිධාරී ආකෘති හඳුන්වාදෙන ලදි.
- දන්ත වෛද්‍යවේදී වැඩ සටහන සඳහා වැඩසටහන් පොත පළකරන ලදි.
- පුළුල් වූ මුඛ සෞඛ්‍ය සත්කාරක අධ්‍යයන අංශයක් ස්ථාපිත කිරීම සඳහා වන යෝජනාව ADPC විසින් අනුමත කළ අතර එය සනාතන සභාවේ අනුමැතිය සඳහා බාරදෙන ලදි.
- මධ්‍යම රොගී දන්ත ගබඩා පද්ධතිය සියළුම සායනික අංශවල ක්‍රියාත්මක කරන ලදි.
- මුඛ ව්‍යාධවේද විද්‍යාපති වැඩසටහන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ථාවර කමිටුව විසින් අනුමත කරන ලදි.
- සුළු මුඛ ශල්‍ය වෛද්‍ය විද්‍යාපති වැඩසටහන විශ්වවිද්‍යාල පාලක සභාව විසින් 2018-02-24 දින අනුමත කරන ලදි.
- සාමාන්‍ය දන්ත වෛද්‍ය පුහුණුව පිළිබඳ නව විද්‍යාපති උපාධිය පීඨ මණ්ඩලයේ අනුමැතිය සඳහා බාරදෙන ලදි.
- දන්ත වෛද්‍ය හදිසි ප්‍රතිකාර ඒකකය, විකිරණ විද්‍යා ඒකකය, රෝපණ ඒකකය, සෙඩේෂන් ඒකකය හා පරිදන්ත විද්‍යා අංශය සඳහා රුපියල් මිලියන හතලිස් හතක් වටිනා උපකරණ ලබාගන්නා ලදි.
- AHEAD ව්‍යාපෘතියේ හා විශ්වවිද්‍යාල මුදල් මගින් දන්ත වෛද්‍ය ඒකක විසිදෙකක් හා ඩිජිටල් එක්ස් කිරණ ඒකකවලින් යුත් පුළුල් සත්කාරක ඒකකයක් ඇති කිරීමට හැකි විය.
- මුඛ පිළිකා පර්යේෂණ මධ්‍යස්ථානය මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්යසාධක බලකායෙන් රුපියල් මිලියන එකයි දශම පහක ප්‍රදානයක් ලබාගන්නා ලදි.
  මෙම ප්‍රදාන මුදල යොදාගනිමින් පහත සඳහන් ක්‍රියාකාරකම් පවත්වන/ආරම්භ කරන ලදි.
  - දන්ත වෛද්‍ය පීඨයට අනුබද්ධ දුම්කොළ නැවැත්වීමේ සායනයක් ස්ථාපිත කිරීම ආරම්භ කරන ලදි. ඒ සඳහා උපකරණ මිලදී ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කළ අතර දන්ත ශල්‍ය වෛද්‍යවරුන් හා දන්ත වෛද්‍ය හෙදියන් පුහුණු කිරීම මේ වනවිටත් ආරම්භ කොට ඇත.
  - “දුම්කොළ නැවැත්වීම” නමින් පර්යේෂණ යෝජනාවක් සකස් කොට දන්ත වෛද්‍ය පීඨයේ ආචාරධර්ම සමාලෝචන කමිටුවෙන් පැහැදිලි කරගැනීම සඳහා බාරදෙන ලදි.

- ජාතික මුඛ පිළිකා නිවාරණ ව්‍යාපාරයක් කරගෙන යෑම සඳහා කොළඹ ජනාධිපති කාර්යාලයේ මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායෙන් රුපියල් මිලියන 12.6ක ප්‍රදානයක් ලබාගන්නා ලදි.
- දන්ත වෛද්‍ය පීඨයේ ඊ-ඉගෙනුම් ඒකකය එම පීඨයේ "E" ගොඩනැගිල්ලේ සිව්වන මහලේ ස්ථාපිත කළ අතර එය විවෘත කිරීම උපකුලපතිතුමාගේ දන්ත වෛද්‍ය හා වෛද්‍ය පීඨාධිපතින්ගේ සහභාගීත්වයෙන් 2018.11.21 දින සිදුකරන ලදි. එම අවස්ථාවේ විශේෂ අමුත්තා ලෙස මහාචාර්ය ඩී.වයි.ඩී. සමරවික්‍රම සහභාගී විය. ඔහු එක්සත් රාජධානියේ ශ්‍රී ලාංකික වෛද්‍ය හා දන්ත වෛද්‍ය සංගමය සමඟ එක්ව E - විද්‍යාගාරය වෙත පරිගණක 20ක් පරිත්‍යාග කළේය. මේ වනවිට මෙම විද්‍යාගාරයේ මල්ටිමීඩියා හා ජාල පහසුකම් සහිතව සැසි පැවැත්වීමේ හැකියාව පවතී.
- 2018 වසරේදී මුඛ රෝග සම්බන්ධ රෝගීන් 150කට සාර්ථක ශල්‍යකර්ම පවත්වා ඇත.
- දන්ත වෛද්‍ය සහාය පුහුණු පාසල

- නව බඳවා ගැනීම්-2018

| අංකය | පුහුණු වැඩසටහන | පුහුණුවන සංඛ්‍යාව |
|---|---|---|
| 1 | දන්ත වෛද්‍ය සහයක ඩිප්ලෝමාව | 09 |
| 2 | දන්ත වෛද්‍ය තාක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව | 15 |

- උපාධිලාභීන් - 2018

| අංකය | පුහුණු වැඩසටහන | උපාධි ලබාගත් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | දන්ත වෛද්‍ය තාක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව | 09 |
| 2 | දන්ත වෛද්‍ය සහයක ඩිප්ලෝමාව | 15 |

## අධ්‍යයන ජයග්‍රහණ/පත්කිරීම්

- වෛද්‍ය ජේ.ඒ.වී.පී. ජයසිංහ දන්ත වෛද්‍ය පීඨයේ දහවැනි පීඨාධිපති ලෙස 2018 අගෝස්තු 10 දින පත්කරන ලදි.
- මහාචාර්ය ආර්.ඩී. ජයසිංහ මුඛ වෛද්‍ය හා පරිදන්ත විද්‍යා මහාචාර්ය ලෙස උසස් කරන ලදි.

අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පහත සඳහන් සාමාජිකයන් මහාචාර්ය තනතුරට උසස් කරන ලදි.

- වෛද්‍ය බී.එම්.එච්.එස්.කේ. බන්නැහැක කායව්‍යවච්ඡේද මහාචාර්ය
- වෛද්‍ය බී.ජී.ටී.එල්. නන්දසේන කායව්‍යවච්ඡේද මහාචාර්ය
- වෛද්‍ය ඒ.එම්. ආටිගල මුඛ හා හනුක ශල්‍ය මහාචාර්ය
- මහාචාර්ය ඒ. තිලකරත්න වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ දන්ත ශල්‍ය වෛද්‍ය අධ්‍යයන අංශයේ සභාපති තනතුරට පත්කරන ලදි.
- මහාචාර්ය ආර්.ඩබ්. පල්ලේගම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ලෙස (අර්ධ කාලීන) නැවත පත්කරන ලදි.
- මහාචාර්ය ඒ.එම්. ආටිගල දන්ත වෛද්‍ය අධ්‍යාපන සංවර්ධන ඒකකයේ (අර්ධකාලීන) අධ්‍යක්ෂ ලෙස පත්කරන ලදි.
- වෛද්‍ය වී. විජේකුමාරන් ආසියානු සෞන්දර්ය දන්ත වෛද්‍ය ඇකඩමියේ සභාපති තනතුරට තෝරාගන්නා ලදි.
- වෛද්‍ය ඊ.එම්.යු.සී.කේ. හේරත් ශ්‍රී ලංකා සංරක්ෂණ දන්ත වෛද්‍ය විශේෂඥ සංගමයේ සභාපති තනතුර සඳහා තෝරා ගන්නා ලදි.

**ප්‍රකාශන**

- මහාචාර්ය එන්.එස්. සොයිසා "භිෂග්වේදයේ මූලික අංග" නමින් පොතක් පළකර ඇත.
- ප්‍රකාශන සඳහා අවශ්‍ය සහ දන්ත වෛද්‍ය පීඨයේ යහපත් ඉගෙනුම් පරිසරයක් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ කිහිපයක් සකස්කරන ලදි. මෙම මාර්ගෝපදේශ දන්ත වෛද්‍ය අධ්‍යාපන ඒකකයේ EXCO රැස්වීමේදී අනුමත කිරීමෙන් අනතුරුව පීඨ මණ්ඩලයෙන් ද අනුමත කරන ලදි.
- ඉගැන්වීම්/ඉගෙනීම සහ ප්‍රකාශන සඳහා රෝගීන්ගේ ඡායාරූප, ශ්‍රව්‍ය දෘෂ්‍ය පටිගත කිරීම් සිදුකරන ලදි.
- විද්‍යුත් - පුස්තකාලයේ පරිහරණය සඳහා මාර්ගෝපදේශ සැලසීම
- දන්ත වෛද්‍ය පීඨයේ යහපත් ඉගෙනුම් පරිසරයක් ඇතිකිරීමට අදාළ මාර්ගෝපදේශ
- ප්‍රකාශන අයිතියට අදාළ නීති කඩනොකර දන්ත වෛද්‍ය අධ්‍යාපන ඒකකය සමඟ ප්‍රකාශන පළකරන්නේ කෙසේද?
- ඉගැන්වීමේ සම්පත් කිහිපයක් නිෂ්පාදනය කොට (වීඩියෝ පට) අධ්‍යයන වැඩසටහන් කිහිපයක් (CPD) ආවරණය කරන ලදි.

| ඉගැන්වීමේ සම්පත් / ක්‍රියාකාරකම් | කතුවරයා |
|---|---|
| දන්ත දෘඪ ටිෂු සැකසීම | මහාචාර්ය ඒ.කේ.එස්. අරඹවත්ත |
| Staining of Dental Hard Tissues | මහාචාර්ය ඒ.කේ.එස්. අරඹවත්ත |
| රුධිර පීඩනය මැනීම | එරන්ති පෙරේරා මිය හා සංවරී අළුවිහාරේ |
| Cantilever spring | වෛද්‍ය නිශාන්ති විතානආරච්චි |

- මූලික විද්‍යා අධ්‍යයන අංශය විසින් විද්‍යාගාර ආරක්ෂණ අත්පොත සැකසීම
- ශිෂ්‍ය අත්පොත 2017/2018
- 1-4 සමාසික වැඩසටහන් පොත
- අවසන් දන්ත වෛද්‍ය විද්‍යාවේදී පාඨමාලා පොත-2018
- දන්ත වෛද්‍ය විද්‍යාවේදී උපාධිය සඳහා වැඩසටහන් අත්පොත (පස් අවුරුදු විෂය නිර්දේශය)
- පීඨාධිපති කාර්යාලය සඳහා ක්‍රියාමාර්ග අත්පොත

**පරිත්‍යාග**

පහත සඳහන් පොත් / වාරසඟරා දන්ත වෛද්‍ය පුස්තකාලයට පරිත්‍යාග කොට ඇත.

| | |
|---|---|
| 01. | Kumar &Clarks Clinical Medicine [Monograph] / Praveen Kumar, Michael,Clark (eds) |
| 02. | Scully's medical problems in Dentistry / Crispian Scully |
| 03. | Contemporary Oral Ooncology: Rehabilitation and Supportive Care/ Moni Abraham Kuriakose (ed) |
| 04. | SLMA guides & information on vaccines |
| 05. | SLMA guides & information on vaccines |
| 06. | MCQs in Anatomy :An Aid to Revision and Self-assessment / Deepthi Nanayakkara, Malkanthi Chandrasekara and Deepthika Chandrasekera |
| 07. | Temporomandibular Disorders : Essentials of Diagnosis and Management |
| 08. | Oral Radiography and Radiology for Dental Students / Ruwan Duminda Jayasinghe |
| 09. | Child and Adolescent Dentistry : APicture Guide / Chandra Herath and Nandani Nagarathne |
| 10. | History of Medicine in Sri Lanka 1948-2017 / Sri Lanka Medical Association |
| 11. | Textbook of oral and maxillofacial surgery / Neelima Anil Malik (eds) |
| 12. | Grant's Atlas of Anatomy / Anne M.R. Agur & Arthur F. Dalley |
| 13. | Textbook and color atlas of Traumatic injuries to the teeth / J.O. Andreasen (ed.) |
| 14. | Essential Microbiology for Dentistry / Lakshman Samaranayake |
| 15. | Essential Microbiology for Dentistry / Lakshman Samaranayake |
| 16. | Adhesion Aspects in Dentistry / Jukka P. Matinlinna and K.L.Mittal |

| | |
|---|---|
| 17. | Child and Adolescent Dentistry : APicture Guide / Chandra Herath and Nandani Nagarathne |
| 18. | MCQs in Dentistry(clinical sciences) / Singh,Vijaya Pratap,Dhankar, |
| 19. | The Tobacco Atlas/ Shafey, Omar, Eriksen, Michael, ross, Hana, Mackay, Judith |
| 20. | Robbins and Cotran Review of Pathology / Edward C. Klatt, Vinay Kumar |
| 21. | Pharmacology condensed |
| 22. | Woelfel's Dental Anatomy / Rickne G. Scheid, Gabriela Weiss |
| 23. | Carranza's Clinical Periodontology / MG Newman, HH Takei, PR Klokkevoid and FA Carranza (eds) |
| 24. | Fundamentals of Periodontal Instrumentation &Advanced Root Instrumentation / Jill S. Gehrig, Rebecca Sroda and Darlene Saccuzzo |
| 25. | Essentials of Clinical Periodontology and Periodontics / Shantipriya Reddy |
| 26. | Practical periodontal plastic surgery / Serge Dibart (ed) |
| 27. | Jawetz, Melnick & Adelberg'sMedical Microbiology / Geo. F. Brooks et.al. |
| 28. | Marsh and Martin's Oral Microbiology / Philip D. Marsh et. al. |
| 29. | Dental Public Health at a glance / Ivor G. Chestnutt |
| 30. | Ganong's review of Medical Physiology / Kim E. Barrett et. al. |
| 31. | Guyton &Hall textbook of Medical Physiology / John E. Hall |
| 32. | Basic Dental Materials / John J. Manappallil |
| 33. | Kumar &Clarks clinical medicine / Praveen Kumar, Michael,Clark (eds) |
| 34. | Ananthanarayan and Paniker's textbook of microbiology / Reba Kanungo (ed) |
| 35. | Basic Pathology:An Introduction to the Mechanisms of Disease / Suni R. Lakhani,Susan A. Dilly,Caroline J. Finlayson |
| 36. | Textbook of Prosthodontics / V.Rangarajan and T.V. Padmanabhan |
| 37. | Oral and Maxillofacial Pathology / Brad W. Neville |
| 38. | Wheater's Basic Pathology : A Text, Atlas and Review of Histopathology / Barbara Young, William Stewart& Geraldine O'Dowd |
| 39. | Dentist on the Ward / Andrew Sadler and Leo Cheng |
| 40. | Grey Areas in Restorative Dentistry : Don't Believe Everything You Think/ Robert L. Caplin |
| 41. | Bhatia's dentogist MCQ's in dentistry with explanatory answers clinical sciences/ Himani Saini |
| 42. | Manual of Clinical Periodontics (includes Case History, Instruments and viva Voce) / Shantipriya Reddy |
| 43. | Difiore'sAtlas of Histology with Functional Correlations / Victor P. Eroschenko |
| 44. | Bhatia's dentogistmcqs in dentistry with explanatory answers basic sciences/ Himani Saini |
| 45. | Clinical problem solving in dentistry |
| 46. | Ananthanaraya and Paniker's textbook of microbiology MCQ's / Beena Philomina, P.M. Anitha,M. B. Shabina, K.L.Sarada Devi |
| 47. | Contemporary Oral Oncology: Oral and Maxillofacial Reconstructive Surgery/ Moni Abraham Kuriakose (ed) |
| 48. | Essential Pathology for Dental Students / Harsh Mohan |
| 49. | Cawson`s essentials of Oral Pathology and Oral Medicine/ R.A. Cawson, E.W. Odell, |
| 50. | Paediatric Dentistry / Richard Welbury |
| 51. | An introduction to Orthodontics / Laura Mitchell |
| 52. | Mandell,Douglas, and Bennett's principles and practice of infectious diseases Vol. / John E. Bennett, Raphael Dolin and Martin J. Blaser |
| 53. | Mandell,Douglas, and Bennett's principles and practice of infectious diseases Vol. 2 / John E. Bennett, Raphael Dolin and Martin J. Blaser |
| 54. | TenCate's Oral Histology: Development, Structure ,and Function / Antonio Nanci |
| 55. | Temporary anchorage devices in orthodontics / Ravindra, Nanda |
| 56. | Oral Microbiology and Immunology /Richard J. Lamont et. al. (eds) |
| 57. | Marsh and Martin's Oral Microbiology / Philip D. Marsh et. al. |
| 58. | Dental public health at a glance / Ivor G. Chestnutt |
| 59. | Textbook of geriatric dentistry / Poul Holm-Pedersen |
| 60. | Basic Immunology Functions and Disorders of the Immune System/ Abul K. Abbas,Andrew H, Lichtman,Shiv,Pillai, |
| 61. | Oral Anatomy, Histology and Embryology / B.K.B. Berkovitz, G.R. Holland, B.J. Moxham |
| 62. | Guyton and hall textbook of Medical Physiology / John E. Hall |
| 63. | Textbook of Prosthodontics/ V Rangarajan, T.V. Padmanabhan |

පහත දැක්වෙන උපකරණ භාණ්ඩ හා ද්‍රව්‍යය පීඨයට පරිත්‍යාග කරන්නට විය.

- රුමේනියාවේ වෛද්‍ය ඔවිදූ රොටාරු විසින් මුඛ හා හනුක ශල්‍ය වෛද්‍ය අධ්‍යයන අංශයට භාණ්ඩ කිහිපයක් පරිත්‍යාග කරන ලදි.
- පිළිමතලාව සිංහ සමාජය විසින් නැබුලයිසර්ස් හා මුහුණු ආවරණ
- පේරාදෙණිය දන්ත වෛද්‍ය පීඨයේ ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය විසින් පරිත්‍යාග කළ UPS
- අකුරණ දිස්ත්‍රික්ක රෝහල විසින් උසස් දන්ත සංරක්ෂණ විද්‍යාගාරය සඳහා නිල් රබර් රෝද පෙට්ටි අටක් (8)
- 96/97 ශිෂ්‍ය කණ්ඩායමේ වෛද්‍ය මෙව්නා ද සිල්වා විසින් විකලාංග දන්ත වෛද්‍ය අංශයට පරිත්‍යාග කළ භාණ්ඩ

## සමුළු/වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන්

- සිව්වැනි සමාසිකයේ දන්ත වෛද්‍ය උපාධි අපේක්ෂකයන්ගේ සායනික වැඩසටහන් ප්‍රේරණ උත්සවය නොවැම්බර් 1 දින මහාචාර්ය එන්.ඒ.එස්. ද අමරතුංග, දන්ත වෛද්‍ය පීඨයේ පීඨාධිපති, අංශ ප්‍රධානීන් හා පරිපාලන කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් පීඨයේ බඹරදෙණිය ශ්‍රවණාගාරයේදී පවත්වන ලදි.
- 2017/2018 නවක සිසුන් පිළිගැනීමේ උත්සවය උපකුලපතිතුමාගේ, නියෝජ්‍ය උපකුලපති, පීඨාධිපතීන්, අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලයේ සහභාගිත්වයෙන් පීඨයේ බඹරදෙණිය ශ්‍රවණාගාරයේදී නොවැම්බර් 7 දින පවත්වන ලදි.
- “VLE කාර්ය මණ්ඩල පුහුණු හා සංවර්ධන වැඩසටහන” පිළිබඳ වැදගත් පුහුණු වැඩමුළුවක් විද්‍යුත් විද්‍යාගාරයේදී ජූලි 16-18 දින වල පවත්වන ලදි. ඕමාන් දන්ත වෛද්‍ය පාසලේ විද්‍යුත් ඉගෙනුම් අංශයේ අංශ ප්‍රධාන හා තොරතුරු තාක්ෂණ විශේෂඥ ආචාර්ය සිව කුමාර් විසින් පවත්වන ලදි. මෙම වැඩමුළුවට දන්ත වෛද්‍ය පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් හා අනෙකුත් පීඨ නවයේ සාමාජිකයන් සහභාගි වූහ.
- “MEDEX EXPO 2018” ප්‍රදර්ශනය 2018 දෙසැම්බර් 7-8 යන දිනවල මහනුවර සිටි සෙන්ටර්හිදී පවත්වන ලදි. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අනුමත කළ මෙම ප්‍රදර්ශනය වෙනුවෙන් ප්‍රදර්ශන කුටි දෙකක් ලබා දී තිබුණි.
- නවක සිසුන් වෙනුවෙන් පරිගණක පිළිබඳ දැනුවත් කිරීමේ හා තොරතුරු තාක්ෂණ වැඩසටහනක් පීඨයේ විද්‍යුත් විද්‍යාගාරයේදී පවත්වන ලදි. මීට පෙර මෙම වැඩසටහන පවත්වන ලද්දේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේදීය. එනමුත් වර්තමානයේදී එම කාර්යය දන්ත වෛද්‍ය පීඨයේදීම පවත්වන්නට ලැබීම අමතර වාසියකි.
- දන්ත වෛද්‍ය අවසන් වසර සිසුන්ගේ හොඳම සිද්ධි අධ්‍යයන වාර්තා සඳහා පදක්කම් සහ සහතික පත්‍ර ප්‍රදානය කිරීම වෙනුවෙන් මුඛ ව්‍යාධවේද විවෘත දිනය නොවැම්බර් 12 දින පවත්වන ලදි.
- මුඛ පිළිකා පිළිබඳ දැනුවත් කිරීමේ හා තිරගත කිරීමේ වැඩසටහනේ සමාරම්භක උත්සවය ජනවාරි 26 දින පවත්වන ලදි.
- පිළිකා සත්කාරක සේවා ඒකකය විසින් සමාජ ක්‍රියාකාරකම් වැඩසටහන් 11ක් හා පාසල් වැඩසටහන් 16ක් පවත්වා ඇත.
- මුඛ පිළිකා කලින් හඳුනාගැනීම පිළිබඳ වැඩමුළු හයක් පවුල් සෞඛ්‍ය නිලධාරීන් හා වතු වෛද්‍ය සහායකයන් සඳහා වැඩමුළු හයක් පවත්වන ලදි.
- දන්ත වෛද්‍ය පීඨයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය යටතේ වෛද්‍ය එච්.එම්.ටී.ඩී.කේ. හේරත් විසින් “සතිය” පිළිබඳ වැඩමුළු මාලාවක් පවත්වන ලදි.

**බාධක සහ පිළියම්**

- උපකරණ මිලදී ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් නව නිපුණතා විද්‍යාගාරය "E" ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීමට නොහැකි විය.
- ස්ථාපිත කරන ලද රෝපණ ඒකකය (Implant unit) එක් අංශයක් තුළ පිහිටීම නිසා උපරිම ආකාරයෙන් ක්‍රියාත්මක නොවේ.
- Dental Moodle පරිහරණය වර්ධනය වෙමින් පැවතියත් තවමත් එය ඌන උපයෝජිත තත්ත්වයේ පවතී.
- රෝග දත්ත ගබඩාවේ පරිහරණය අසතුටුදායක මට්ටමේ පවතී.
- DATS ගොඩනැගිල්ලේ දෙවන මහලේ කටයුතු මෙතෙක් අවසන් වී නොමැත.

**අනාගත සැලසුම්**

- එක් එක් පාඨමාලවේ එක් කොටසකටවත් විද්‍යුත් ඉගෙනුම අනිවාර්ය කොට විද්‍යුත්-ඉගෙනුම් පහසුකම් පරිහරණය දියුණු කිරීම
- දන්ත වෛද්‍ය අධ්‍යාපන ඒකකයේ ප්‍රකාශන ක්‍රියා පටිපාටිය සංවිධානය කිරීම
- පස් අවුරුදු කාලවකවානුව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වා අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා විෂය නිර්දේශයක් සැලසුම් කිරීම
- පස් අවුරුදු විෂයමාලාව නිතර සංශෝධනය කිරීම
- වාට්ටු, දැඩිසත්කාර ඒකකය සහ ශල්‍යාගාරවලට අදාළ ගැටලු නිරීක්ෂණය සඳහා කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කිරීම
- තාක්ෂණික සම්පත් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම
- අන්තර් ක්ෂේත්‍ර පර්යේෂණ පීඨය තුළ දියුණු කිරීම
- ශිෂ්‍ය සුබසාධන පහසුකම් දියුණු කිරීම
- DATS ගොඩනැගිල්ලේ කටයුතු අවසන් කොට කාර්යාලයක්, පොදු කාමරයක්, දේශන කාමර හා විද්‍යාගාරයක් ස්ථාපිත කිරීම
- විකලාංග විද්‍යාගාරය දීර්ඝ කිරීම
- පර්යේෂණ පහසුකම් ඉහළ නැංවීම සඳහා මධ්‍යම පර්යේෂණ විද්‍යාගාර පිහිටුවීම
- රෝපණ ඒකකය "E" ගොඩනැගිල්ලේ පළමු මහල වෙත මාරුකිරීම
- පුළුල් මුඛ සෞඛ්‍ය සත්කාරක අධ්‍යයන අංශයක් ස්ථාපිත කිරීම
- නව විෂයමාලාවේ සුමට ගලනය පහසුකරවීම සඳහා වෙනම ඉගෙනුම් ඒකකයක් ස්ථාපිත කිරීම
- සියළුම සායනික ක්ෂේත්‍රවලට පිළිගත් ආසාදන පාලන පද්ධතියක් පිහිටුවා ක්‍රියාත්මක කිරීම
- පීඨයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සුබසාධන පහසුකම් දියුණු කිරීම

## 3.5 ඉංජිනේරු පීඨය
(පීඨාධිපති - මහාචාර්ය ජී.බී.බී. හේරත්)

### හැඳින්වීම

ඉංජිනේරු පීඨය උපාධි අපේක්ෂක සිසුන් 1600 කට අධික පිරිසකට රසායන සහ සැලසුම් ඉංජිනේරු, සිවිල් ඉංජිනේරු, පරිගණක ඉංජිනේරු, විදුලි හා විද්‍යුත් ඉංජිනේරු, නිෂ්පාදන හා කර්මාන්ත ඉංජිනේරු සහ යාන්ත්‍රික ඉංජිනේරු යන ක්ෂේත්‍රවලට අදාළ එහි නිත්‍ය අධ්‍යයන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. අදාළ වසරේ අවසන් වසර සිසුන්ගේ උපාධි ලබාගැනීම ශිෂ්‍ය සංගම්වල වර්ජන හේතුවෙන් ප්‍රමාදවුවත් 2019 පෙබරවාරි වනවිට ඔවුන් උපාධි ලබාගැනීමට අපේක්ෂිතයි. කෙසේවෙතත් පීඨයට ඇතුළත් වන නවක සිසුන්ගේ අධ්‍යයන වැඩසටහන ආරම්භ කිරීමේ දිනවලට මෙතුළින් බලපෑමක් නොවීමට පීඨය කටයුතු කරන ලදි. සිසුන් 415ක් ඇතුළත් E/17 සිසු කණ්ඩායම ලියාපදිංචි කිරීම නොවැම්බර් 26 දින සිදුකරන ලදි. මෙරට අනෙකුත් ඉංජිනේරු පීඨ අතරින් 2017 සිසු කණ්ඩායමේ අධ්‍යයන වැඩසටහන ප්‍රථමයෙන්ම ආරම්භ කරන ලද්දේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ඉංජිනේරු පීඨයයි. මේ සම්බන්ධයෙන් කාර්ය මණ්ඩල සාමාජිකයන් ඉටුකළ කැපවීම පීඨාධිපති වශයෙන් මම මහත් ඉහළින් ඇගයීමට ලක්කරමි.

පීඨයේ පශ්චාත් උපාධි සම්බන්ධයෙන් සලකා බැලීමේදී ඉදිකිරීම් කළමනාකරණ පශ්චාත් උපාධි වැඩසටහනක් මේ වසරේදී හඳුන්වාදීමට කටයුතු කළ අතර එම එකතුවත් සමඟ මේ වනවිට මෙම පීඨය මගින් සෑම වසරකම පිරිනමන නිත්‍ය පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන් සංඛ්‍යාව 12කි.

### ජයග්‍රහණ

ඉංජිනේරු පීඨය එහි නව එකතු කිරීම් සමඟ පීඨයට බඳවාගනු ලබන වාර්ෂික ප්‍රථම උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළනැංවීම කෙරෙහි සලකා බලමින් සිටී. ඉදිරි වසර පහක (5) කාලය තුළ එම ශිෂ්‍ය සංඛ්‍යාව 415 සිට 515 දක්වා වැඩිකර ගැනීම පිණිස 2018 නොවැම්බර් මාසයේදී ව්‍යාපෘතියේ අරමුදල් ලබාගැනීමට ඉල්ලුම් කර ඇත.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ඉංජිනේරු පීඨයේ අධ්‍යයන දෙපාර්තමේන්තු හයෙන් පහකටම වොෂින්ටන් සම්මුතියේ පිළිගැනීම ලැබී ඇත. එම අධ්‍යයන දෙපාර්තමේන්තු වනුයේ රසායන හා සැකසුම් ඉංජිනේරු, විදුලි හා විද්‍යුත් ඉංජිනේරු, යාන්ත්‍රික ඉංජිනේරු, පරිගණක ඉංජිනේරු සහ සිවිල් ඉංජිනේරු අංශයයි. නිෂ්පාදන හා කර්මාන්ත ඉංජිනේරු අධ්‍යයන අංශය එම තත්ත්වය අපේක්ෂාවෙන් පසුවේ.
චීන විද්‍යා ඇකඩමිය, නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යාංශය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සහයෝගීතාවක් වන යෝජිත ජල පර්යේෂණ විද්‍යාගාරයේ ඉදිකිරීම් කටයුතු සැප්තැම්බර් මාසයේදී ආරම්භ කරන ලදි. මෙහි ඉදිකිරීම් 2020 වනවිට අවසන් කිරීමට අපේක්ෂිතයි. අදාළ වර්ෂය තුළදී ඉංජිනේරු පීඨය එහි වාණිජ හස්තය වන ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානයේ සහයෝගය ඇතිව පීඨය හා කර්මාන්ත සබඳතා පුළුල් කරගන්නා ලදි. විශේෂඥ සේවා, වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු හරහා මෙම පීඨය මගින් දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයට සේවාවන් රාශියක් ලබාදෙන ලදි. ගොඩනැගිලි සේවාවන් පිළිබඳ දින අටේ පුහුණු වැඩසටහන, තෙදින ස්ටීම් ඉංජිනේරු විද්‍යාව හා දෙදින බලශක්ති සංරක්ෂණ වැඩසටහන් ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානයේ කැපීපෙනෙන වැඩසටහන් තුනකි.

ඉංජිනේරු පීඨය දේශීය කර්මාන්ත හා විදෙස් විශ්වවිද්‍යාල/ආයතන සමඟ අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් විශාල සංඛ්‍යාවක් අත්සන් කොට ඇති අතර එතුළින් කර්මාන්ත අන්තර්ක්‍රියා හා පර්යේෂණ දියුණු කිරීම ඉහළනැංවීම අරමුණයි. එම ගිවිසුම් අතර චීනයේ සන්ගායි විදුලිබල විශ්වවිද්‍යාලය, කොරියාවේ ඉන්චියන් ජාතික විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ ආතර් සී. ක්ලාක් නවීන තාක්ෂණික මධ්‍යස්ථානය සහ මෙල්බර්න් රාජකීය තාක්ෂණ ආයතනය සමඟ අත්සන් කළ ගිවිසුම් ඉන් කිහිපයකි.

ඉංජිනේරු පීඨයේ අධ්‍යයන වැඩසටහන් දියත් කිරීමට ගුණාත්මක බව හා ප්‍රමිතිය දියුණු කිරීමට සෘජුව හා වක්‍රව දායකවන දීර්ඝකාලයක සිට අපේක්ෂාවෙන් සිටි ව්‍යාපෘති රාශියක් 2018 වසරේදී අවසන් කරන ලදි. යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයන අංශයේ සිව්මහල් ගොඩනැගිලි දිගුවේ ඉදිකිරීම් අවසන් කළ අතර එය කාර්ය මණ්ඩලයට හා සිසුන් වෙත බාරදීමට නියමිතයි. ගිණිගෙන කොටසක් විනාශ වූ නිෂ්පාදන හා කර්මාන්ත ඉංජිනේරු අධ්‍යයන අංශයේ ගොඩනැගිල්ල පුනරුත්ථාපනය කොට වැඩිදියුණු කළ පහසුකම් සහිතව 2018

නොවැම්බර් මාසයේදී නැවත විවෘත කරන ලදි. ඊට අමතරව පීඨයේ පශ්චාත් උපාධි හස්තය, පරිගණක මධ්‍යස්ථානය, කර්මාන්ත පුහුණු හා වෘත්තීය මාර්ගෝපදේශන අංශ/ඒකක ගණිත ඉංජිනේරු අධ්‍යයන අංශය ස්ථාපිත කෙරෙන සිව්මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම 2019 මැදභාගය වනවිට අවසන් කිරීමට අපේක්ෂිතයි.

පසුගිය වසර කිහිපය පුරාවට කර්මාන්ත ක්ෂේත්‍රයෙන් කළ ප්‍රතිසංස්කරණයෙන්, පෞරුෂත්ව සංවර්ධනය සහ වෘත්තීය මාර්ගෝපදේශන අවශ්‍යතාවන් ඉස්මතුකොට දක්වා තිබූ අතර ඒ අනුව එම අවශ්‍යතා ඉටුකිරීම පිණිස පියවර ගන්නා ලදි. මෘදු කුසලතා සංවර්ධනය සඳහා නිත්‍ය සමාසික කාලසටහනට අමතර කාල පරිච්ඡේද වෙන්කොට ඇත. එපමණක් නොව කාර්ය මණ්ඩලයට මෙම අංශ කෙරෙහි පුහුණුව ලබාගැනීම සඳහා ද පහසුකම් සපයා ඇත.

පරිගණක ඉංජිනේරු අධ්‍යයන අංශය ප්‍රථම උපාධි පර්යේෂණ සම්මන්ත්‍රණයක් කොළඹදී පවත්වන ලදි. සිසුන්ගේ කාර්යයන් සමාජගත කිරීමේදී මෙවැනි කටයුතු ඉතා ප්‍රබල බලපෑමක් හා වැදගත්කමක් උසුලන අතර කර්මාන්ත ක්ෂේත්‍රයෙන් ප්‍රශංසනීය ප්‍රතිපෝෂණයක් ඇති කරයි. තවද ඉංජිනේරු පීඨය තාක්ෂණික අනුග්‍රහයක් වශයෙන් නිෂ්පාදන හා මෙහෙයුම් කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර සමුළුවක් පවත්වන ලදි. පීඨයට ප්‍රවේශවන මාර්ගය දිගේ රාජකීය තල්ගස් නැවත වගාකිරීම පේරාදෙණිය ඉංජිනේරු පීඨ ආදි විද්‍යාර්ථීන්ගේ සංගමයේ මූලිකත්වයෙන් දියත්කරන ලදි.

**අනාගත සැලසුම්**

ප්‍රධාන සම්පත් අවශ්‍යතාවන් සතුටුදායක මට්ටමින් සපුරාගත් මෙම පීඨයේ මේ වනවිට ප්‍රතිඵල පදනම් කරගත් නිසි ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ තත්ත්වයක පසුවේ. මේ සම්බන්ධයෙන් එක් එක් අධ්‍යයන අංශ ඒවායේ විෂයමාලා පුළුල් ලෙස සංශෝධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් සිටී. සමස්තයක් ලෙස ඉංජිනේරු පීඨය මෙහි වැඩසටහන් හා සම්පත් ඇගයීමට පීඨයට පැමිණි ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ වෘත්තිකයන්ගේ යෝජනාවලට සමාන්තරව විෂයමාලාව සංශෝධනය කිරීමේ කාර්යයෙහි නියැලී සිටී.

මෙම කාර්යය සාක්ෂාත් කරගනු පිණිස පීඨ මණ්ඩලයේ අනුමැතිය සහිතව ප්‍රථම වසර අධ්‍යයන වැඩසටහන ඉහළනැංවීමේ අරමුණින් යුතුව විශේෂ මණ්ඩලයක් එනම් ඉංජිනේරු සාමාන්‍ය වැඩසටහන සඳහා අධ්‍යයන මණ්ඩලයක් ස්ථාපිත කරන ලදි. ප්‍රථම වසර උපාධි වැඩසටහනේ තත්ත්වය දියුණු කිරීමේ මූලික කාර්ය ඉටුකරගැනීමෙන් පසුව ඉහත සඳහන් අධ්‍යයන මණ්ඩලය 2018 වසරේදී සාමාන්‍ය වැඩසටහනේ පූර්ණ සමාලෝචනයක් ආරම්භ කළ අතර එය 2019 වසරේදී අවසන් කිරීමට නියමිතය.

ඊට අමතරව පීඨය විසින් ප්‍රදානය කරනු ලබන සාමාන්‍ය Elective පාඨමාලාවල විෂය මාලාවේ ප්‍රධාන සංශෝධනයක් ඉංජිනේරු කළමනාකරණ අධ්‍යයන අංශය විසින් සිදුකරනු ඇත. තව ද යාන්ත්‍රික ඉංජිනේරු, රසායන ඉංජිනේරු හා සැකසුම් ඉංජිනේරු අධ්‍යයන අංශවල ප්‍රථම උපාධි විෂයමාලා මෙන්ම සිවිල් ඉංජිනේරු අධ්‍යයන අංශයේ පශ්චාත් උපාධි විෂයමාලාවේද ප්‍රධාන සංශෝධන සිදු කෙරෙනු ඇත.

ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි නියාමනය නැවත සැලකිල්ලට ගෙන එම වැඩසටහන් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය සංශෝධන හඳුන්වාදෙනු ඇත. ඉංජිනේරු අධ්‍යාපන ඒකකය හා ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය පීඨයේ සහ කර්මාන්ත ක්ෂේත්‍රයේ අවශ්‍යතාවන්ට සරිලන පරිදි වඩාත් සංක්ෂිප්ත හා සුවිශේෂී හඳුන්වාදීම තුළින් වඩාත් ශක්තිමත් කෙරෙනු ඇත.

පීඨයේ පර්යේෂණ සංවර්ධන හා නව නිපැයුම් ක්‍රියාකාරකම් උසස් තත්ත්වයට ගෙනඒම සඳහා ඒ වෙනුවෙන්ම කැපවූ ඒකකයක් හඳුන්වාදීමට මෙම පීඨය සැලසුම් කරයි. මෙම යෝජිත ඒකකය පීඨය සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීමට නියමිත අතර පීඨයේ පර්යේෂණ කාර්යයන්ට හා නිෂ්පාදන සංවර්ධනයට සහායවීම පිණිස කර්මාන්ත ක්ෂේත්‍රයෙන් හා ආදි විද්‍යාර්ථීන්ගෙන් සහයෝගය ලබාගැනීමට කටයුතු කරයි.

පීඨයේ ප්‍රධාන සැලසුම් නැවත සලකාබලා අවශ්‍යනම් සංශෝධනය කිරීමට නියමිතය. ඊට අමතරව ඉංජිනේරු පීඨය වඩාත් පරිසර හිතකාමී හා පීඨය තුළ ප්‍රසන්න ඉගෙනුම් වටපිටාවක් නිර්මාණය කිරීම පිණිස යටිතල සංවර්ධනය පුළුල් කිරීමටත් පීඨ පරිශ්‍රය හරිත වර්ණ ගැන්වීමත් 2019 වසරේ ප්‍රමුඛතාවයකි.

## 3.6 කළමනාකරණ පීඨය

(පීඨාධිපති - ආචාර්ය එම්. ඇල්ෆ්‍රඩ්)

### හැඳින්වීම

**ස්ථාපනය**

2014 ඔක්තෝම්බර් 20වැනි දින රජයේ ප්‍රකාශ පත්‍රයකින් අනුමත කරන ලද කළමනාකරණ පීඨය, ඒ සඳහා පීඨාධිපතිවරයෙකු හා අධ්‍යයන අංශ පහක් (5) සඳහා අංශ ප්‍රධානීන් පත්කිරීමත් සමඟ 2015 ජනවාරි 28 දින එහි අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදි. කළමනාකරණ පීඨයට අදාළව අධ්‍යයන දෙපාර්තමේන්තු අටක් (8) ඒකක පහක් (5) හා කළමනාකරණ පුස්තකාලයක් ස්ථාපිත කිරීම සඳහා ගැසට් නිවේදනයකින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අවසර ලබාදෙන ලදි. මූලිකව අධ්‍යයන අංශ පහක් ස්ථාපිත කිරීමට මෙම පීඨය පියවරගත් අතර එම අධ්‍යයන අංශ, ව්‍යාපාර මුදල්, මානව සම්පත් කළමනාකරණ, කළමනාකාරණ අධ්‍යයන, වෙළඳ කළමනාකරණ හා මෙහෙයුම් කළමනාකරණ යන නම්වලින් හැඳින්වේ. පීඨයේ මානව සම්පත් හා භෞතික සම්පත් සංවර්ධනය වීමෙන් අනතුරුව ගිණුම් අධ්‍යයන අංශය, ව්‍යාපාර ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය හා ව්‍යාපාර තොරතුරු තාක්‍ෂණ යන අධ්‍යයන අංශ තුන ස්ථාපිත කෙරෙනු ඇත.

**අධ්‍යයන වැඩසටහන**

කළමනාකරණ පීඨය සිසුන් 1500 දෙනෙකු ඉලක්ක කොටගෙන ප්‍රථම උපාධි වැඩසටහන් රාශියක් ප්‍රදානය කරනු ලබයි. කළමනාකරණ පීඨයේ සෘජුවම ලියාපදිංචි වන සිසුන් වෙත ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධි වැටසටහන පිරිනමනු ලබයි. වාර්ෂිකව මෙම අධ්‍යයන වැඩසටහනට 175 දෙනෙකු ඇතුළත් සිසු කණ්ඩායමක් විෂය ක්‍ෂේත්‍ර පහක් එනම්, ගිණුම් හා මුදල්, මානව සම්පත් කළමනාකරණ, මෙහෙයුම් කළමනාකරණ හා සංවිධාන කළමනාකරණය යන විෂයන් හැදෑරීම සඳහා ඇතුළත් කරගැනේ. වාණිජවේදී උපාධිය හා ගණනය හා කළමනාකරණ විද්‍යාවේදී යන උපාධි වැඩසටහන් ශාස්ත්‍ර පීඨය හා විද්‍යා පීඨය සමඟ සහයෝගීතාවයකින් පිරිනමනු ලබන අතර ඒ එක් එක් වැඩසටහන සඳහා වාර්ෂිකව සිසුන් 60 දෙනෙකු ඇතුළත් කරගැනේ. තවද ශාස්ත්‍රවේදී උපාධියේ උප විෂයක් ලෙස හැදෑරීම පිණිස කලා සිසුන්ට පාඨමාලා විශාල සංඛ්‍යාවක් ද පිරිනමනු ලැබේ. අභ්‍යන්තර ප්‍රථම උපාධි වැඩසටහන්වලට අමතරව මෙම පීඨය දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය සමඟ එක්ව ව්‍යාපාර පරිපාලනවේදී (මාර්ගගත) උපාධි වැඩසටහන හා කළමනාකරණ හා සංවර්ධන ඩිප්ලෝමාව ද පවත්වනු ලබන අතර ඒ එක් එක් වැඩසටහන සඳහා සිසුන් 200ක් හා 100ක් පිළිවෙළින් ඇතුළත් කරගනී. මීට අමතරව පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථාන හරහා සහතික පත්‍ර පාඨමාලා හයක් (6) හා ඩිප්ලෝමා වැඩසටහන් පහක් (5) පිරිනැමීම සඳහා ද අනුමැතිය ලැබී ඇති අතර ඒවා ප්‍රදානය කිරීමට සූදානමින් පවති. එමෙන්ම පරිගණක පදනම් කරගත් ගිණුම් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා ද මෑතකදී අනුමැතිය හිමිවී ඇත. තවද මෙම පීඨය පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් දෙකක් ද පවත්වනු ලබයි. ගිණුම් හා මුදල් පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හා කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව මීට ඇතුළත් වන අතර මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සමඟ ඒ හරහා ගිණුම් හා මුදල් සහ කළමනාකරණය පිළිබඳ දර්ශනශූරී උපාධි වැඩසටහන් ද පවත්වනු ලබයි. තව ද ව්‍යාපාර පරිපාලනපති, විද්‍යාපති හා දර්ශනශූරී උපාධි වැඩසටහන් පැවැත්වීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය අපේක්‍ෂාවෙන් යෝජනාවක් ඉදිරිපත් කොට ඇත.

**මානව සහ භෞතික සම්පත්**

පීඨයට වෙන්කොට ඇති මුළු සේවක තනතුරු සංඛ්‍යාව 59ක් වන අතර මේ වනවිට ඉන් තනතුරු 38ක් පුරවා ඇත. ඒ අතර අනධ්‍යයන හා පරිපාලන තනතුරු සියල්ලම පුරවා ඇත. පීඨයේ අධ්‍යයන හා පරිපාලන කටයුතු සඳහා වර්ග අඩි 30,000ක පමණ ගොඩනැගිලි දෙකක් පවති. ජාලකරණයෙන් යුතු පරිගණක 75ක විද්‍යාගාරයක් ද මෙම පීඨය සතුව පවති. වර්ග අඩි 60,000ක භූමි ප්‍රමාණයකින් යුතු මහල් හයකින් සමන්විත නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලබාදී ඇති අතර එය 2020 වසරේදී ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවෙන් නිර්දේශ කොට ඇත.

**ජයග්‍රහණ**

**පීඨය**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්වාරක්ෂණ සභාව විසින් 2018 වසරේදී ව්‍යාපාර පරිපාලනවේදී (ගෞරව) උපාධි වැඩසටහන සඳහා ඉහළම “A” ශ්‍රේණිය ලබාදී ඇත.
- ලෝක බැංකුව අනුග්‍රහය දක්වන AHEAD ව්‍යාපෘතියේ තරඟකාරී ප්‍රදාන 2018 වසරේදී දිනාගැනීමට හැකි විය.

**අධ්‍යයන වැඩසටහන**

- සංශෝධිත ව්‍යාපාර පරිපානවේදී උපාධියේ විෂයමාලාව 2018/2019 අධ්‍යයන වර්ෂයේ සිට ක්‍රියාත්මක කොට ඇත.
- සංශෝධිත වාණිජවේදී උපාධියේ විෂයමාලාවද 2018/2019 අධ්‍යයන වර්ෂයේ සිට ක්‍රියාත්මක කොට ඇත.
- වාණිජවේදී උපාධි වැඩසටහන ශාස්ත්‍ර පීඨයෙන් කළමනාකරණ පීඨය වෙත ගෙනයෑමට පියවර ගෙන ඇත.
- විද්‍යා පීඨය විසින් අතරමග නවතා දැමූ ගණනය හා කළමනාකරණ විද්‍යාවේදී උපාධි වැඩසටහන කළමනාකරණ පීඨය යටතේ 2020/2021 අධ්‍යයන වසර තුළ නැවත ආරම්භ කිරීම සඳහා පියවර ගෙන ඇත.

**අධ්‍යයන ජයග්‍රහණ**

පහත දැක්වෙන කාර්ය මණ්ඩල සාමාජිකයන් ඔවුන්ගේ දර්ශනශූරී උපාධියේ කටයුතු අවසන් කොට නැවත අදාළ අධ්‍යයන අංශ වෙත පැමිණ සිටී.

- ආචාර්ය බී.ජේ.එන්. එරන්ද - වෙළඳ කළමනාකරණ අධ්‍යයන අංශ
- ආචාර්ය ආර්.එම්. කුරුප්පුගේ - මෙහෙයුම් කළමනාකරණ අධ්‍යයන අංශය
- ආචාර්ය ඩබ්.පී.ආර්. වික්‍රමරත්න - මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශය

දර්ශනශූරී උපාධි හැදෑරීම සඳහා පහත සඳහන් සාමාජිකයන්ට AHEAD ව්‍යාපෘතියේ ශිෂ්‍යත්ව පිරිනමා ඇත.

- ඩබ්.එම්.එච්.යූ. විජේතුංග මිය - වෙළඳ කළමනාකරණ අධ්‍යයන අංශය
- ජී.සී.අයි. ගුණරත්න මයා - මෙහෙයුම් කළමනාකරණ අධ්‍යයන අංශය
- එච්.එල්.එම්. ද සිල්වා මිය - මෙහෙයුම් කළමනාකරණ අධ්‍යයන අංශය
- පී.එල්.ඩබ්. ප්‍රියදර්ශනි මිය - ව්‍යාපාර මුදල් අධ්‍යයන අංශය
- එන්. අගිලන් මයා - මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශය
- ආර්.එම්.සී. කුමාරි මිය - කළමනාකරණ අධ්‍යයන අංශය
- ඩී.අයි.ජේ. සමරනායක මයා - කළමනාකරණ අධ්‍යයන අංශය
- වයි.එම්.ජී.එච්. ජයරත්න මිය - කළමනාකරණ අධ්‍යයන අංශය
- පී.එච්.ආර්.ආර්.පී.කේ. මුනසිංහ මිය - මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශය
- ජී.එම්.ජී.එස්.එම්. බංඩාර මයා - මෙහෙයුම් කළමනාකරණ අධ්‍යයන අංශය
- ඩබ්.එම්.එච්.යූ. විජේතුංග මිය - ඇගේ දර්ශනශූරී උපාධිය හැදෑරීමේ කටයුතු එක්සත් රාජධානියේ නොටිංහැම් විශ්වවිද්‍යාලයේ උපාධිය හැදෑරීම සඳහා ශිෂ්‍යත්වයක් ලබාගෙන ඇත.
- වී. විජයකුමාර් දර්ශනශූරී උපාධිය හැදෑරීම සඳහා ශිෂ්‍යත්වයක් ලබාගෙන ඇත.

**පර්යේෂණ ජයග්‍රහණ**

- කාර්ය මණ්ඩල සාමාජිකයන් පොත් දෙකක් පළකොට ඇති අතර පර්යේෂණ පත්‍ර/උපුටන 31ක්, වාරසඟරා හා ජාත්‍යන්තර සමුළුවලට ඉදිරිපත්කොට ඇත.

**උසස්වීම්**

- ආචාර්ය ඊ.එම්.ජී.එස්.බී. ඒකනායක, ව්‍යාපාර මුදල් අධ්‍යයන අංශය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියේ සිට I ශ්‍රේණිය දක්වා උසස් කොට ඇත.

- ආචාර්ය ඩබ්.පී.ආර්. වික්‍රමරත්න ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශය එම තනතුරේ I ශ්‍රේණියට උසස් කරන ලදි.

පහත දැක්වෙන පීඨ සාමාජිකයන් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියට උසස් කොට ඇත.

- ආචාර්ය එස්. මහේස්වරන්, මෙහෙයුම් කළමනාකරණ අධ්‍යයන අංශය
- ආචාර්ය බී.ඒ.එන්. එරන්ද, වෙළඳ කළමනාකරණ අධ්‍යයන අංශය
- වී. විජයකුමාර් මිය, ව්‍යාපාර මුදල් කළමනාකරණ අධ්‍යයන අංශය
- පී.එල්.ඩබ්. ප්‍රියදර්ශනි මිය, ව්‍යාපාර මුදල් කළමනාකරණ අධ්‍යයන අංශය

**සම්මන්ත්‍රණ /වැඩමුළු**

- පීඨය සහ අධ්‍යයන අංශ සම්මන්ත්‍රණ හා වැඩමුළු 17ක් පවත්වා ඇත.
- පීඨ සාමාජිකයන් හා සිසුන් සම්මන්ත්‍රණ සහ වැඩමුළු හතරකට සහභාගී වී ඇත.

**විදෙස් සහයෝගීතා**

- පේරාදෙණිය විශ්වවිද්‍යාලය චීනයේ හුආකිඕ විශ්වවිද්‍යාලය සහ තායිවානයේ ජාතික සන්-යැට්-සෙන් විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කොට ඇත.

**ශිෂ්‍ය ජයග්‍රහණ**

- ව්‍යාපාර පරිපාලනවේදී සිසුන් දෙදෙනෙකුට රන් පදක්කම් දෙකක් ප්‍රදානය කොට ඇත.
- ව්‍යාපාර මුදල් අධ්‍යයන අංශය නියෝජනය කරමින් ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කළ අන්තර් විශ්වවිද්‍යාල ප්‍රශ්න විචාරාත්මක තරඟයේ ශූරතාවය දිනා ගැනීමට එම කණ්ඩායම සමත්විය.
- කැලණිය විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කළ අන්තර් විශ්වවිද්‍යාල මූල්‍ය ප්‍රශ්න විචාරාත්මක තරඟයේ ශූරයන් බවට පත්වූයේ ව්‍යාපාර මුදල් අධ්‍යයන අංශය නියෝජනය කළ කණ්ඩායමයි.

**අන්තේවාසිකත්ව**

- අදාළ වසර තුළදී මෙම පීඨය එහි සිව්වැනි ප්‍රථම උපාධි අන්තේවාසික හා පර්යේෂණ සම්මන්ත්‍රණය පවත්වන ලදි.

**බාධක සහ පිළියම්**

- අදාළ අධ්‍යයන ක්ෂේත්‍රවලින් අයදුම්කරුවන් නොමැතිවීම හේතුවෙන් පීඨයේ ජ්‍යෙෂ්ඨ තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීමට නොහැකි විය.
- ක්‍රියාපටිපාටිවල ප්‍රමාදය හේතුවෙන් ව්‍යාපාර පරිපාලනපති හා විද්‍යාපති වැඩසටහන් ආරම්භ කිරීමට නොහැකි විය. එම යෝජනා තවමත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ රැදී ඇත.
- ප්‍රමාණවත් දේශනශාලා, ශිෂ්‍ය පොදු කාමරය, ශිෂ්‍ය ආපනශාලාව, හා ශ්‍රවණාගාරය ස්ථාපිත කිරීමේ අදහසින් ඉදිකිරීමට නියමිත මහල් හයකින් සමන්විත ගොඩනැගිල්ල ඉදිකිරීමේ යෝජනාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කොට ඇති අතර එය 2020 වසරේදී ක්‍රියාත්මක කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිර්දේශ කොට ඇත.

**අනාගත සැලසුම්**

- ගිණුම් අධ්‍යයන අංශය හා ව්‍යාපාර ආර්ථික විද්‍යා අධ්‍යයන අංශ දෙක 2019 වසරේදී ආරම්භ කිරීම
- ගිණුම් හා සංයුක්ත පාලන, ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය, මුදල් පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය හා ජාත්‍යන්තර ව්‍යාපාර හා භාණ්ඩ පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී යන නව උපාධි වැඩසටහන් තුන (3) 2019/2020 අධ්‍යයන වර්ෂයේදී ආරම්භ කිරීම.
- පීඨයේ නිත්‍ය ප්‍රකාශන දෙකක් වන පේරාදෙණිය කළමනාකරණ සමාලෝචනය හා කළමනාකරණ පාඨකයා 2019 වසරේදී ප්‍රකාශයට පත් කිරීම
- කළමනාකරණ පීඨ ගොඩනැගිලි ආසන්නයේ ප්‍රමාණවත් භූමි ප්‍රමාණයක් නොමැති හෙයින් විශ්වවිද්‍යාල විහාරස්ථානයට මදක් ඉහළින් නව භූමියක පීඨයේ ඉදිරි ගොඩනැගිලි ඉදිකිරීම.

## 3.7 වෛද්‍ය පීඨය

(පීඨාධිපති - මහාචාර්ය වී.එස්. වීරසිංහ)

### හැඳින්වීම

වෛද්‍ය පීඨය පිහිටුවා වර්ෂ 56ක් සපිරීම නිමිත්තෙන් එය සැමරීම පිණිස ශිෂ්‍ය සංගමය විසින් ලේ දන්දීමේ කඳවුරක් සංවිධානය කරන ලදි. මානව කායව්‍යවච්ඡේද කෞතුකාගාරයක් මැයි 28 දින විවෘත කරන ලදි. වෛද්‍ය එස්.ඩී.අයි. නානායක්කාර ශ්‍රී ලංකා භෞතික විද්‍යා සංගමයේ සභාපති ලෙස 2019 වසර සඳහා පත්කරන ලදි. තෝරාගත් සිසුන් වෙනුවෙන් නිවර්තන වෛද්‍ය විද්‍යාව සඳහා පුහුණු වැඩසටහන් 2018 සැප්තැම්බර් 5-9 දින දක්වා පවත්වන ලදි. ශ්‍රී ලංකා ළමා රෝග විශේෂඥ විද්‍යාලයීය 21වැනි වාර්ෂික විද්‍යාත්මක සමුළුව සැප්තැම්බර් 19-21 දිනවල පවත්වන ලද අතර ශ්‍රී ලංකා භෞතික විද්‍යා සංගමයේ වාර්ෂික විද්‍යාත්මක සැසිය 2018 නොවැම්බර් 17 දින පීඨ පරිශ්‍රයේදී පවත්වන ලදි. PeMSAA විසින් සංවිධානය කළ 14වැනි ජාත්‍යන්තර වෛද්‍ය කොංග්‍රසය දෙසැම්බර් 12-14 දිනවල පවත්වන ලදි. ජාතික සෞඛ්‍ය පර්යේෂණ සභාව හා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ ඒකකය වෛද්‍ය පීඨය හා සම්බන්ධවී සෞඛ්‍ය පර්යේෂණ පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වන්නට විය. ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී ඩබ්.එච්.ඒ.ඩී. දිල්රුක්ෂි මහත්මිය වෛද්‍ය පීඨයට මාරුකර එවන ලදි. මේ අතර පීඨ සාමාජිකයන් හය දෙනෙකු මහාචාර්ය තනතුරට උසස් කරන ලදි. පීඨයට බඳවාගත් නවක සිසුන් පිළිගැනීමේ උත්සවය ඔක්තෝම්බර් 22වැනි දින පැවැත්වූ අතර මහාචාර්ය හරේන්ද්‍ර ද සිල්වා එහි ආගන්තුක කථිකයා විය.

### ජයග්‍රහණ

පේරාදෙණිය වෛද්‍ය පීඨ ක්‍රිකට් කණ්ඩායම හා කොළඹ ක්‍රිකට් කණ්ඩායම අතර පැවති අන්තර් වෛද්‍ය පීඨ ක්‍රිකට් තරඟාවලියේ ජය මෙම පීඨයට හිමිවිය. මෙම තරඟය අස්ගිරිය ක්‍රිකට් ක්‍රීඩාංගනයේදී පැවැත්විණි. ජෛව රසායන විද්‍යා අධ්‍යයන අංශයේ වෛද්‍ය කළණ මාදුවගේ 2016 වසරේ විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මානය දිනාගන්නා ලදි. බාලි නුවර පැවැත්වූ ආසියා පැසිෆික් ළමා රෝග විශේෂඥ සංගම් සමුළුවේදී කැපී පෙනෙන ආසියානු ළමාරෝග විශේෂඥ සම්මානය 2018 දිනාගැනීමට මහාචාර්ය ආසිරි අබේගුණවර්ධන සමත්විය. මේ අතර වෛද්‍ය ඒ.ඒ.සී. අලහකෝන්හට 2018 වසර සඳහා කේ.එන්. සෙනෙවිරත්න සම්මානය පිරිනමන ලදි. මහාචාර්ය වජිර වීරසිංහ, වෛද්‍ය පද්මිණී දහනායක, වෛද්‍ය මනෝජ් පතිරගේ හා ඔවුන්ගේ කණ්ඩායමට ඔවුන් ඉදිරිපත් කළ පර්යේෂණ පත්‍රය වෙනුවෙන් 48වැනි ජපන් සායනික භෞත චිකිත්සක සංගමයේ හොඳම "Abstract Runner-up" ත්‍යාගය හිමිවිය. මහාචාර්ය තාරක දසනායක, වෛද්‍ය දේවාස්මිත විජේසුන්දර, වෛද්‍ය චානක කහතුඩුව, මහාචාර්ය වජිර වීරසිංහ ඇතුලු ඔවුන්ගේ කණ්ඩායම ශ්‍රී ලංකා ස්නායු වෛද්‍ය සංගමයේ වාර්ෂික සැසියේදී හොඳම වාචික උපුටන ත්‍යාගය දිනාගන්නා ලදි. මහාචාර්ය එස්.ඩී. ධර්මරත්න, ගුගල් ස්කොලර් පිටුවේ උපුටා දැක්වීම් 35275 දක්වා පැමිණීමට සමත්විය. මෙය සුවිශේෂී අවස්ථාවකි. පීඨ සාමාජිකයන් විසින් දේශීය ජාත්‍යන්තර වාරසඟරාවල පර්යේෂණ පත්‍ර 29ක් පළකරන ලදි. තවද අධිකරණ වෛද්‍ය අධ්‍යයන අංශය අධිකරණ වෛද්‍ය, විද්‍යා හා නීතිය ශ්‍රී ලංකා වාරසඟරාවේ අටවැනි කාණ්ඩය පළකරන ලදි. එපමණක් නොව, පීඨ සාමාජිකයන් තිදෙනෙකු ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ දේශන ඉදිරිපත් කිරීමේ ගෞරවය හිමිකරගන්නා ලදි.

### බාධක හා පිළියම්

අපගේ පාලනයෙන් පරිබාහිර වූ කරුණු හේතුවෙන් පීඨාධිපති කාර්යාලයේ වෙනත් අධ්‍යයන දෙපාර්තමේන්තු හා ඒකක ඇතුලු පීඨයේ යටිතල සංවර්ධන කටයුතු අඩාල වුවත් පාරා සායනික ගොඩනැගිල්ලේ දෙවන අදියර 2018 වසර තුළදී පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන අතර එය 2020 වනවිට අවසන් කිරීමට නියමිතය. එතුළින් පීඨයේ අවශ්‍යතා රාශියක් සපුරාලනු ඇත.

### අනාගත සැලසුම්

යෝජිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ස්ථාපිත කිරීම සහ පීඨයේ නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කඩිනම් කිරීම

## 3.8 විද්‍යා පීඨය

(පීඨාධිපති - මහාචාර්ය එස්.ආර්. කොඩිතුවක්කු)

### හැඳින්වීම

1942 වසරේ ස්ථාපිත කරන ලදුව 1961 වසරේ ජූලි මාසයේදී දැනට පිහිටුවා ඇති ස්ථානයට මාරුකළ පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය විද්‍යා පීඨය නව නිපැයුම් පර්යේෂණ හා අධ්‍යාපනයේ අනගි අවස්ථාවන් ප්‍රදානය කරමින් පසුගිය වසර 70ක කාලයක් පුරා මෙරට විද්‍යා අධ්‍යාපනයේ පුරෝගාමීත්වය ගෙන කටයුතු කරයි. එම කාලය පුරාවට අධ්‍යාපනයේ මතුව ආ අවශ්‍යතාවන්ගෙන් ප්‍රේරණය ලැබ විශාල සිසුන් පිරිසකට පහසුකම් සැපයීම නව පීඨ අධ්‍යයන අංශ හා මධ්‍යස්ථාන පිහිටුවා පවතින පහසුකම් පුළුල්කරන ලදි. වර්තමානය වනවිට මෙම පීඨය සතුව අධ්‍යයන අංශ අටක් පවතින අතර මහාචාර්යවරුන් හා අධ්‍යයන කාර්ය මණ්ඩලය සියයක් වන අතරම ප්‍රථම උපාධි අපේක්ෂකයන් 1700ක් හා පශ්චාත් උපාධි සිසුන් 200 දෙනෙකු ශිල්ප හදාරයි. තව ද මෙම විද්‍යා පීඨය සතුව විද්‍යා අධ්‍යාපන ඒකකයක් ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකයක් හා විද්‍යා අධ්‍යාපන අන්තර්ක්‍රියා සංසදයක් ද පවති.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය විද්‍යා පීඨය වාර්ෂිකව සිසුන් 530 දෙනෙකු වෙනුවෙන් පළමු උපාධි වැඩසටහන් 15ක් පවත්වනු ලබයි. ජීව විද්‍යාව, උද්භිත විද්‍යාව, රසායන විද්‍යාව, පරිගණක විද්‍යාව, භූගර්භ විද්‍යාව, ගණිතය, අනුකජීව විද්‍යාව හා ජෛව තාක්‍ෂණ විද්‍යාව, භෞතික විද්‍යාව, පරිසර විද්‍යාව, සංඛ්‍යානය හා පරිගණක විද්‍යාව, සංඛ්‍යානය හා මෙහෙයුම් පර්යේෂණ ගණනය හා කළමනාකරණය (ශාස්ත්‍ර පීඨය සමග එක්ව) යන විෂයන් පිළිබඳව සිව් අවුරුදු විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසහන් ප්‍රදානය කරනු ලබයි. එපමණක් නොව මෙම පීඨය මගින් තුන් අවුරුදු විද්‍යාවේදී උපාධි වැඩසටහන් ද ප්‍රදානය කරන අතර වෛකල්පිත විෂයක් ලෙස ව්‍යවහාරික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී සිව් අවුරුදු ගෞරව උපාධිය සිසුන්ට හැදැරිය හැකි අතර මෙහිදී ඔවුන්ට කර්මාන්ත ක්ෂේත්‍ර සම්බන්ධ පාඨමාලා හැදෑරීම සඳහා අමතර අවුරුද්දක් ගත කිරීමට සිදුවන අතර එම ක්ෂේත්‍රයේ අවස්ථාවන් අත්කර ගැනීමේ හැකියාවද පවති.

සියළුම උපාධි පාඨමාලා හදාරන සිසුන් කර්මාන්ත ක්ෂේත්‍රයට අනුයුක්ත කොට කර්මාන්ත ක්ෂේත්‍රය සමග සබඳතා ශක්තිමත් කරන ලදි. මෙහිදී පරිගණක විද්‍යා හා ව්‍යවහාරික විද්‍යා වැඩසටහන් සුවිශේෂී තැනක් උසුලයි.

විද්‍යා පීඨය ප්‍රථම උපාධි ඉගැන්වීමේ වැඩසටහනට හා රටේ සංවර්ධනයට ප්‍රේරණය හා දැනුම ලබාදෙමින් පශ්චාත් උපාධි පර්යේෂණ කාර්යභාරයේ වැදගත්කම වටහාගනිමින් විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සමග සමීපව සම්බන්ධ වී පශ්චාත් උපාධි ඉගැන්වීම් හා පර්යේෂණ වැඩසටහන් පවත්වනු ලබයි. මෙම පීඨය අති නවීන උපකරණ හා වෙනත් භෞතික සම්පත් වලින් සන්නධව මූලික විද්‍යාවන් මෙන්ම ව්‍යවහාරික විද්‍යාවන් සම්බන්ධයෙන් උසස් ගුණාත්මක තත්ත්වයේ පර්යේෂණ පවත්වයි. පීඨයේ අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන් බොහෝ දෙනෙකු ජාතික හා ජාත්‍යන්තර ප්‍රසිද්ධ ත්‍යාග ලබාගත්හ. එමෙන්ම පීඨයේ ප්‍රකාශන හා ජාතික හා ජාත්‍යන්තර යන අංශ දෙකෙන්ම අත්කරගත් පේටන්ට් බලපත්‍ර වාර්තාවන් ඉහත කාරණය සපථ කිරීමට, තවදුරටත් සාක්ෂි සාධක සපයයි.

### ජයග්‍රහණ

#### මානව සම්පත් සංවර්ධනය

විද්‍යා පීඨය 2018 වසරේදී ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් සිව්දෙනෙකු හා පරිවාස කථිකාචාර්යවරුන් තිදෙනෙකු බඳවා ගැනීමට සමත්විය. කාර්ය මණ්ඩල සාමාජිකයෝ පස්දෙනෙකු මහාචාර්ය තනතුරට උසස් කළ අතර සාමාජිකයන් තිදෙනෙකු ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුරට උසස් කරන ලදි. කථිකාචාර්යවරුන් දෙදෙනෙකු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණියටත් තව දෙදෙනෙකු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියටත් උසස් කරන ලදි. පීඨයේ සාමාජිකයෝ කිහිපදෙනෙකු විශේෂ පුහුණු වැඩසටහන් වැඩමුළු, සමුළු හා සහයෝගීතා පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා විදෙස් විශ්වවිද්‍යාල හා විද්‍යාගාරවලට ගියහ. මේ අතර කාර්මික නිලධාරීන්. කළමනාකරණ සහායක හා විද්‍යාගාර සහායකයන් ඇතුලුව අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු නවයක් පුරවන ලදි.

#### ත්‍යාග සහ පර්යේෂණ ප්‍රකාශන

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය විද්‍යා පීඨයෙන් 2016 සඳහා වන විද්‍යාත්මක ප්‍රකාශන වෙනුවෙන් ජනාධිපති සම්මානලාභීන් දස දෙනෙකු බිහිවිය. දර්ශක වාරසඟරාවල තමන්ගේ ශාස්ත්‍රීය කටයුතු පළකරන ශ්‍රී ලාංකික විද්‍යාඥයන් වෙනුවෙන් ජනාධිපති සම්මාන පිරිනමනු ලබයි.

මහාචාර්ය එස්.එච්.පී.පී. කරුණාරත්න විද්‍යාවේ අභිවර්ධනය සඳහා වන ශ්‍රී ලංකා සංගමයෙන් සාමාන්‍ය පර්යේෂණ කමිටු ත්‍යාගය ලබාගත්තේය. මහාචාර්ය ආර්.එල්.ආර්. චන්ද්‍රජිත් 2018 වසරේ 15 විද්‍යා හා තාක්ෂණ ජයග්‍රහණ වෙනුවෙන් 2018 දක්ෂතා සම්මානය හිමිකර ගත්තේය. පීඨයේ කාර්ය මණ්ඩල සාමාජිකයන් 2018 වසර තුළදී දර්ශක වාරසඟරාවල පර්යේෂණ ලිපි 58ක්, විමර්ශන නොවූ වාරසඟරාවල 25ක්, පූර්ණ පර්යේෂණ පත්‍ර 19ක්, උපුටන 124ක්, ග්‍රන්ථ පරිච්ඡේද 6ක් හා පොත් 2ක් ප්‍රකාශයට පත්කරන ලදි. ජාතික පේටන්ට් බලපත්‍රයක් ද පීඨය විසින් අත්කර ගන්නා ලදි.

**සමුළු හා සමාජ වැඩසටහන්**

විද්‍යා පීඨය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සමඟ සහයෝගීතාවකින් දරුණු වකුගඩු රෝගය පිළිබඳව ජාත්‍යන්තර සමුළුවක් සංවිධානය කරන ලදි. මෙම සමුළුව විශ්ලේෂණාත්මක හා විසඳුම් පදනම් කරගත් සාකච්ඡා පැවැත්වීමටත්, දැනුම හා දැනට ක්‍රියාත්මක වෙමින් පවතින පර්යේෂණ කටයුතු සම්බන්ධ තොරතුරු ව්‍යාප්ත කිරීමට මෙන්ම ජාතික හා ජාත්‍යන්තරව මේ වනවිට වකුගඩු රෝග සම්බන්ධයෙන් පර්යේෂණ කටයුතුවල නියැලී සිටින පුරෝගාමී පර්යේෂකයන් සමඟ අදහස් හුවමාරු කරගන්නා අවස්ථාවක් ද උදාකර දෙන්නට විය.

තවද මෙම විද්‍යා පීඨය අ.පො.ස.(උ.පෙළ.) විද්‍යා විෂය ධාරාවෙන් අධ්‍යාපනය හදාරන සිසුන් 1200කට පමණ දින 20 පාසල් විද්‍යා වැඩසටහනක් විද්‍යා අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයේදී පවත්වන්නට විය. මෙම වැඩසටහන් ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හා ගණිතය යන විෂයන් ඇතුළත් සැසිවලින් යුක්ත විය. මේ අතර ඌව පළාතේ විද්‍යා ගුරුභවතුන් 140 දෙනෙකු ඉලක්ක කොටගෙන ගුරු පුහුණු වැඩසටහන් දෙකක් ද පවත්වන ලදි. කර්මාන්ත දිනය පිළිවෙළින් පස්වන වසරටත් අවසන් වසර සිසුන් හා මෑතකදී උපාධි ලබාගත් සිසුන් වෙනුවෙන් කර්මාන්ත 16ක සේවකයන්ට ආරාධනා කොට සාර්ථකව පවත්වන ලදි.

අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් කිහිපදෙනෙකු රටේ වෙනත් ආයතනවල අධ්‍යක්ෂකවරුන්, සභාපති හා කණ්ඩායම් නායකයන් ලෙස ඔවුන්ගේ සේවාවන් ලබාදුන් අතර තවත් කිහිපදෙනෙකු ජාතික වශයෙන් වැදගත් ව්‍යාපෘතිවලට සම්බන්ධ වී කටයුතු කළහ.

**යටිතල සංවර්ධනය**

සංඛ්‍යාන හා පරිගණක අධ්‍යයන අංශය වෙනුවෙන් ඉදිකෙරෙන නව සිව්මහල් ගොඩනැගිලි සංකීර්ණය හා භූගර්භ විද්‍යා ගොඩනැගිල්ලේ දෙවන අදියරේ ඉදිකිරීම් ද 2018 වසරේදී අවසන් කරන ලදි. පීඨ පරිපාලන ගොඩනැගිල්ල සහ අණුක ජීව විද්‍යා හා ජෛව තාක්ෂණ ගොඩනැගිලි දිගුව සඳහා එහි කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භකොට ඇත. එමෙන්ම රසායන විද්‍යා නව ගොඩනැගිල්ලේ දෙවන අදියරේ ප්‍රතිසංස්කරණ කටයුතු ද ආරම්භ කොට ඇත.

පීඨයේ සිසුන්ගේ හා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පර්යේෂණ හා සංවර්ධනය කටයුතු වලට පහසුකම් සැපයීම වෙනුවෙන් කෝඩ්ජෙන් ලංකා පුද්ගලික සමාගම සමඟ සහයෝගීතාවෙන් පර්යේෂණ විද්‍යාගාරය සංවර්ධනය කරන ලදි.

**බාධක සහ පිළියම්**

පීඨයේ අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය හා විද්‍යාගාර සහ පොදු කාමරයට සිදුකළ ප්‍රතිසංස්කරණවල දුර්වලතා හඳුනාගන්නා ලද අතර පවතින අපද්‍රව්‍ය කළමනාකරණ හා ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති වැඩි දියුණු කිරීම සඳහා යෝජනා සකස් කරන ලදි.

**අනාගත සැලසුම්**

සිසුන්ගේ මෘදු කුසලතා, ඉංග්‍රීසි භාෂා දැනුම හා වෘත්තීය මාර්ගෝපදේශන කටයුතු ඉහළනැංවීම සඳහා "ශිෂ්‍යාධාර වැඩසටහනක්" සංවර්ධනය කොට ඇති අතර මෙම වැඩසටහන තුළින් පීඨයේ සිසුන් හා කාර්ය මණ්ඩලය අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවය ශක්තිමත් කෙරෙනු ඇත. ඉහත කරුණුවලට අමතරව විද්‍යුත් ඉගෙනුම අරමුණු කොටගෙන ඒ සඳහා නව තවත් ප්‍රවේශමාර්ග විවෘත කිරීම වෙනුවෙන් Moodle පද්ධතිය හඳුන්වාදුන් අතර වැඩිදුර දියුණු කිරීමේ කටයුතු ද සැලසුම් කෙරෙමින් පවතී.

පීඨය තුළින් ලබාදෙන සේවාවන්වල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම පීඨ මට්ටමේ කමිටු රැස්වීම්වල හා සනාතන සභා අනුකමිටු රැස්වීම්වල වාර්තාවල මෘදු පිටපත් පවත්වාගෙන යෑම පිණිස ලේඛන කළමනාකරණ පද්ධතියක් හඳුන්වාදීම

## 3.9 පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය
(පීඨාධිපති - වෛද්‍ය ඩී.එම්.එස්. මුණසිංහ)

### හැඳින්වීම

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පශු වෛද්‍ය විද්‍යාවේදී උපාධිය පිරිනැමීමේ බලය හිමි එකම ආයතනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨයයි. වසරකට සිසුන් 80 දෙනෙකු බඳවාගනු ලබන අතර එහි කාල පරිච්ඡේදය වසර හතරකි. විවිධ විෂය පරාසයන්හි නිපුණත්වයලත් අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව 44 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන් අධ්‍යයන අංශ පහක් අතරේ බෙදීයයි. උසස් තත්ත්වයේ අධ්‍යයන හා පරිපාලන ව්‍යුහයක් අත්කර ගැනීම පිණිස පීඨ මණ්ඩලය විසින් පත්කළ අනුකමිටු 15ක් හරහා වගකීම් බෙදාහැර ඇත.

පශු වෛද්‍ය ශික්ෂණ රෝහල, ගිලන් සායනය, පශ වෛද්‍ය ශික්ෂණ ගොවිපල, පශු වෛද්‍ය පුස්තකාලය, පරිගණක ඒකකය, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය, යන අංශවලින් හා ජලජ සත්ව රෝග හඳුනාගැනීමේ මධ්‍යස්ථානය, ජලභීතිකාව හඳුනාගැනීමේ ඒකකය වැනි සේවා අංශවලින් මෙම පීඨයේ අධ්‍යයන පරිසරය සුපෝෂණය කොට ඇත. පීඨයේ අධ්‍යයන වැඩසටහන සමාසික අටක් පුරා පැතිර යන අතර විෂයන් 23කින් යුක්තවේ. ඒ හැම විෂයක්ම සමාසික එකක් හෝ දෙකක කාලයක් පුරා උගන්වනු ලැබේ. එමෙන්ම සිසුන් ද අවසාන වසර දෙකක කාලය තුළ සත්ව සෞඛ්‍ය හෝ සත්ව නිෂ්පාදන පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘති පවත්වනු ලබයි. ඇගයීම් කටයුතු දෙයාකාරයකින් සිදුවේ.

### ජයග්‍රහණ

පශු වෛද්‍ය පීඨයට බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව 100 දක්වා වැඩිකිරීමේ අරමුණින් යුතුව පීඨයේ ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණ කටයුතු රාශියක් අවසන් කොට ඇති අතර පශ මහජන සෞඛ්‍ය හා භිෂග්වේද අධ්‍යයන අංශ ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම, මූලික පශු වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශයේ ජෛව රසායන ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය මෙම කටයුතු අතරට ඇතුළත් වේ. විභාග ශාලාවේ පළමු මහලේ කටයුතු නිමකල අතර එම ශාලාව එහි මුඛ්‍ය පරමාර්ථයට අමතරව කුඩා කණ්ඩායම් සඳහා ඉගැන්වීම, නවක සිසුන්ගේ දිශානුයෝජන වැඩසටහන පැවැත්වීම වැනි කටයුතු සඳහා ද යොදාගැනේ. නවීන පහසුකම්වලින් යුතු රුපියල් මිලියන 139ක වියදමින් සත්ව රෝහල පුළුල් කිරීමේ ඉදිකිරීම් කටයුතු මෑතකදී ආරම්භ කරන ලදි. පශු ශික්ෂණ ගොවිපල සඳහා නවීන කිරි ඒකකයක් ඉදිකෙරෙමින් පවතින අතර ඒ සඳහා පශු සම්පත් හා ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් රුපියල් මිලියන පහක අර්ධ දායකත්වයක් ලැබිණ. ඊට අමතරව ගොවිපලේ කුකුළු සත්ව ඒකකයේ පැති බැම්ම රුපියල් මිලියන 1.3ක වියදමින් ඉදිකළ අතර මී ගව ඒකකය විශ්වවිද්‍යාලයේ වැඩ දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිසංස්කරණය කරන ලදි.

පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෝ බොහෝ දෙනෙකු ඔවුන්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු අවසන් කොට ආපසු පැමිණ පීඨයේ අධ්‍යයන වැඩසටහන සවිමත් කරන්නට දායකවූහ. සත්ව සෞඛ්‍ය සඳහා වන ලෝක සංවිධානය සමඟ යුගල ව්‍යාපෘතියක් ලෙස 2014 වසරේ ආරම්භකළ ප්‍රථම උපාධි විෂයමාලාව සංශෝධනය කිරීමේ කටයුතු අවසන් විය. මෙම ව්‍යාපෘතියේ පේටන්ට් සංවිධානය ලෙස නවසීලන්තයේ මැසේ විශ්වවිද්‍යාලය ක්‍රියාකරන්නට විය. සංශෝධිත විෂයමාලාව වඩාත් ශිෂ්‍ය කේන්ද්‍රීය වන අතර පාඨමාලා කාල පරිච්ඡේදය දේශනවලින් තොර අවසන් වසරත් සමඟ වර්ෂ පහ දක්වා දීර්ඝකර ඇත.

Therioqenology පිළිබඳ පශු වෛද්‍ය විද්‍යාපති උපාධියේ තෙවන සිසු කණ්ඩායම සිසුන් 32 දෙදෙනෙකුගෙන් සමන්විත වන අතර එම උපාධියේ දෙවන කණ්ඩායම එම උපාධිය සාර්ථකව අවසන් කරන්නට විය. පශු මහජන සෞඛ්‍ය, ව්‍යාධජීව විද්‍යාව හා කුකුළු සත්ව සෞඛ්‍ය කළමනාකරණය යන විෂයන් පිළිබඳ පශු වෛද්‍ය විද්‍යාපති උපාධිය ආරම්භ කිරීමේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.

පීඨයේ අඛණ්ඩව ක්‍රියාත්මක පර්යේෂණ කටයුතු හා 2018 වසරේදී අත්කතරගත් ජයග්‍රහණ පහත දැක්වේ.

- පශු මහජන සෞඛ්‍ය හා භිෂග්වේද අධ්‍යයන අංශයේ ආහාර ආරක්‍ෂණ හා තත්ත්වාරක්‍ෂණ විද්‍යාගාරයේ පර්යේෂණ හා සේවා ක්‍රියාකාරිත්වය පුළුල් කිරීම පිණිස උසස් අධ්‍යාපනය පුළුල් කිරීම හා සංවර්ධය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය යටතේ නව නිපැයුම් වාණිජකරණය ඉහළ නැංවීමේ ප්‍රදානයක් පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨයට ලැබිණි.
- ඒ.ඒ.ඒ.ඩබ්.කේ. අමරසිංහ හා ඩබ්.ඩී.ඩී. ප්‍රනාන්දු යන වෛද්‍යවරුන් ඔවුන්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු පිළිවෙලින් කැනඩාවේ සහ ඕස්ට්‍රේලියාවේද අවසන් කොට මෙරටට පැමිණ සිටින අතර උෂානි අතපත්තු හා කේ.ඒ.එස්. නදීශානි යන මහත්මීන් ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් විශ්වවිද්‍යාලයේ ඔවුන්ගේ ආචාර්ය උපාධිය හැදෑරීමේ කටයුතුවල නිරතව සිටිති.
- මහාචාර්ය ආර්.පී.වී.ජේ. රාජපක්‍ෂ, වෛද්‍ය ජී.එස්.පී. ද එස් ගුණවර්ධන, ආර්.එස්. කළුපහන සහ ඩී.ඒ. සතරසිංහ 2016 වසර සඳහා වන විද්‍යාත්මක ප්‍රකාශන වෙනුවෙන් ජනාධිපති සම්මාන 2018 නොවැම්බර් මාසයේදී ලබාගත්හ.
- පශු වෛද්‍ය පීඨය හා සෞඛ්‍ය සඳහා වන මෙල්බර්න් අධ්‍යයන මධ්‍යස්ථානය අතර ඇති කරගත් පර්යේෂණ සහයෝගීතා ගිවිසුම විශ්වවිද්‍යාල සනාතන සභාව විසින් අනුමත කොට ඇත.

**බාධක සහ පිළියම්**

පශු ව්‍යාධජීව විද්‍යා අධ්‍යයන අංශය සඳහා මහල් පහක ගොඩනැගිල්ලක් ඉදිකිරීම සහ පශු ශික්‍ෂණ රෝහලේ දීර්ඝ කිරීමේ කටයුතු වාර්ෂිකව පීඨයට බඳවාගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි නොකිරීම හේතු කොටගෙන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ නතරවී ඇත.

**අනාගත සැලසුම්**

- ප්‍රධාන සැලසුමෙන් යෝජිත පරිදි කුඩා සත්ව ශීක්‍ෂණ රෝහල දීර්ඝ කිරීමට සහ වන සතුන් සඳහා නව රෝහල් ඒකකයක් ඉදිකිරීම සඳහාත් යෝජනාවක් සකස් කොට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත බාරදී ඇත.
- ව්‍යාධජීව විද්‍යා අධ්‍යයන අංශය ස්ථාපිත කිරීම පිණිස පශු ශීක්‍ෂණ රෝහල ආසන්නයේ මහල් පහකින් යුතු ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා සැලසුම් සකස් කොට යෝජනාවක් බාරදී ඇත.
- පීඨයේ ශිෂ්‍ය පොදු කාමරය පුළුල් කිරීමට හා පරිපාලන ගොඩනැගිල්ලේ පළමු සහ දෙවන මහල් ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කෙරේ.
- පශු වෛද්‍ය පීඨය එහි යටිතල සංවර්ධන කටයුතු සඳහා AHEAD ව්‍යාපෘතියෙන් ප්‍රදානයක් ලබාගැනීමට අයදුම් කොට ඇත.

## 3.10 පශ්චාත් උපාධි ආයතනය

### 3.10.1 කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

(අධ්‍යක්ෂ - මහාචාර්ය සී.එම්.බී. දෙමටවැව)

**හැඳින්වීම**

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 1972 අංක 01 දරණ පැරණි ලංකා විශ්වවිද්‍යාල පනත යටතේ 1974 අංක 02 දරණ ව්‍යවස්ථාව මගින් 1975 වසරේදී ස්ථාපිත කොට ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයට අනුබද්ධ කරන ලදි. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධානවලට යටත්ව ඉහත සඳහන් ව්‍යාවස්ථා ආපදා පනතක් ලෙස සලකා කොමිෂන් සභාව විසින් 1979 අංක 09 දරණ පනත පැනවීමෙන් අනතුරුව එය 1980 ජනවාරි පළමු දින සිට ක්‍රියාත්මක තත්ත්වයට පත් වී ආයතනයේ ක්‍රියාකාරිත්වය සඳහා නීතිමය පදනම සකස්කර දෙනු ලබයි. පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා මෙරට තුළ ඉඩ ප්‍රස්ථාවන් සංවර්ධනය කිරීම හා මෙරට සීඝ්‍රයෙන් පුළුල්වන කෘෂිකර්ම ක්ෂේත්‍රයට නිසි ලෙස පුහුණු කළ විද්‍යාත්මක පුද්ගලයන් දායාද කිරීම මෙම අද්විතීය ආයතනය නිර්මාණය කිරීමේ ප්‍රධාන අරමුණු විය. කළමනාකරණ මණ්ඩලයේ මග පෙන්වීම යටතේ මෙම ආයතනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධව පවතී.

**අධ්‍යයන වැඩසටහන්**

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහි ඉලක්කයන් සාක්ෂාත් කරගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ආර්ථිකයට වත්මන් වැදගත්කමින් යුතු විවිධ උසස් උපාධි පාඨමාලාවන් සකස් කොට ඇත. රටේ ඉල්ලුමට උචිතවන පරිදි විෂයමාලාවන් ද සංශෝධනය කොට ඇති අතර වර්තමානය වනවිට මෙම ආයතනය දර්ශනශූරී උපාධි, DBA දර්ශනපති උපාධි සහ විද්‍යාපති උපාධි පාඨමාලාවන් 31ක් පිරිනමනු ලබයි. කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහි උපාධි වැඩසටහන්වලදී පූර්ණ කාලීන නේවාසික පුහුණුව කෙරෙහි වැඩි අවධානයක් යොමුකරයි. මෙතුළින් පශ්චාත් උපාධි සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන කාලය උපරිම වශයෙන් ප්‍රයෝජනය ගැනීමට සහ පර්යේෂණ වැඩසටහන්වලට පූර්ණ වශයෙන් සහභාගීවීමට හැකිවනු ඇත. අධ්‍යයන හා පර්යේෂණ කටයුතු වලට වැඩිකාලයක් කැපකරන සහ අදාළ ක්ෂේත්‍රයෙහි වැඩි ප්‍රාගුණ්‍යයක් අත්කර ගැනීමට කැප වූ විනයගරුක සහ වෙහෙස වී කටයුතු කරන සිසුන් පිරිසක් බිහිකිරීමේ වැදගත් අභියෝගයට කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මුහුණ දී සිටි. එවැනි කැපවීම් තුළින් ආයතනයේ උපාධිධාරීන් තුළ ඔවුන්ගේ චරිතවල ඒකාත්මක වූ කොටසක් බවට පත්වන ප්‍රබල වැඩ ආචාරධර්ම සමුදායක් සංවර්ධනය කිරීමට මෙම ආයතනය අපේක්ෂා කරයි.

ශ්‍රී ලංකා සුදුසුකම් ආකෘතික මාර්ගෝපදේශයන්ට සමානවන ආකාරයෙන් මෙම ආයතනය එහි දැනට පවතින රෙගුලාසි 2017 වසරේ සිට බලපැවැත්වෙන පරිදි සංශෝධනය කොට ඒ අනුව සිසුන් ඇතුළත් කරගන්නා ලදි. මෙම ආයතනය මගින් ප්‍රදානය කෙරෙන උපාධි වැඩසටහන්,

විද්‍යාපති/ව්‍යාපාර පරිපාලනපති - සම්මාන පහක් ඉලක්ක කළ අධ්‍යයන/ව්‍යාපෘති පාඨමාලා වැඩ
විද්‍යාපති/ව්‍යාපාර පරිපාලනපති - අවුරුද්දක පර්යේෂණ ඇතුළත් පාඨමාලා වැඩ හා පර්යේෂණ
දර්ශනපති/දර්ශනශූරී/DBA පර්යේෂණ පමණි.

අදාළ සම්මාන අවශ්‍යතාවන් සපුරන අපේක්ෂකයන්ට පශ්චාත් උපාධි ඩිප්ලෝමා හෝ පශ්චාත් උපාධි සහතික පත්‍ර මට්ටමේ පාඨමාලා හැදැරිය හැකි අතර සම්මාන 25ක් ලබාගන්නා සිසුන්ට පශ්චාත් උපාධි ඩිප්ලෝමාවද සම්මාන 20ක් ලබා ගන්නා සිසුන්ට පශ්චාත් උපාධි සහතික පත්‍ර ද ලබාගත හැක. කෙටි කාලයකින් පශ්චාත් උපාධි සුදුසුකම් අත්කරගැනීමට අවශ්‍ය කරන අපේක්ෂකයන් වෙනුවෙන් මෙම ආයතනය පශ්චාත් උපාධි සහතික පත්‍ර වැඩසටහනක් හඳුන්වාදුන් ප්‍රථම අවස්ථාව මෙයයි.

**ආචාර්ය මණ්ඩලය**

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය පුළුල් ඉගැන්වීමේ හා පර්යේෂණ අත්දැකීම්වලින් සමන්විත 300 දෙනෙකුගෙන් යුක්තවන අතර ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු පේරාදෙණිය කෘෂි විද්‍යා පීඨයට අයත්වන අතර ඉතිරි පිරිස විශ්වවිද්‍යාල පද්ධතියේ වෙනත් පීඨවලින්, රජයේ දෙපාර්තමේන්තු, පර්යේෂණ ආයතන, සංස්ථා, පුද්ගලික අංශයේ ගොවිපලවල්, ජාත්‍යන්තර ආයතන හා රාජ්‍ය නොවන සංවිධානවලට අයත්වේ.

අධ්‍යයන මණ්ඩල 11ක් යටතේ සිසුන් 417 දෙනෙකු 2018 වසරේදී ලියාපදිංචි වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.
විද්‍යාපති - 348, ව්‍යාපාර පරිපාලනපති - 41 දර්ශනපති - 09 දර්ශනශූරී - 15 අනියම්-0

2017 වසරේදී උපාධි ප්‍රදානෝත්සවයේදී සිසුන්ට උපාධි පිරිනැමූ ආකාරය පහත පරිදිය.

දර්ශනශූරී - 09, දර්ශනපති-20, විද්‍යාපති-320, ව්‍යාපාර පරිපාලනපති-22 කි.

**කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ශිෂ්‍ය සංගමය**

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතන දිනය ජූනි 23 දිනට යෙදුන අතර එය සැමරීම සඳහා මෙම ආයතනයේ ශිෂ්‍ය සංගමය සංවිධාන කටයුතු කළේය. එම සැමරුම එක්දින පූර්ණ වැඩසටහනක් ලෙස විශ්වවිද්‍යාල ක්‍රීඩා පිටියේදී පැවැත්විය. එහි සමාරම්භය සනිටුහන් කරමින් නියෝජ්‍ය උපකුලපති විසින් විශ්වවිද්‍යාල කොඩියත් ආයතනයේ අධ්‍යක්ෂ විසින් ආයතනික කොඩියත්, ඔසවා වැඩසටහන ආරම්භ කරන ලදි. මේ සඳහා ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය, සිසුන් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සහභාගීවිය. විනෝදාත්මක ක්‍රියාකාරකම් රාශියකින් සමන්විත වූ මෙම සැමරුමේ හවස්වරුවේ සැසිය මහනුවර ඔක්රේ හෝටලයේදී උත්කර්ෂවත් ලෙස පැවැත්විණ.

**වාර්ෂික කොංග්‍රසය**

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 30වැනි වාර්ෂික කොංග්‍රසය නොවැම්බර් 15-16 යන දින වල මහනුවර අමායා හොටලයේදී පවත්වන ලදි. පාංශු විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ඩබ්.ඒ.යූ. විතාරණ මෙහි සම්බන්ධීකාරක ලෙස කටයුතු කළේය. දේශීය සහ ඉන්දියාව, ජපානය, කැනඩාව, පිලිපීනය හා ඕස්ට්‍රේලියාව යන රටවල පර්යේෂණ සිසුන්ගෙන් මෙම සමුළුවට පර්යේෂණ පත්‍ර 50ක් ලැබී තිබුණි. සමාලෝචනයෙන් පසුව පර්යේෂණ පත්‍ර 40ක් තාක්ෂණික සැසි හතක් යටතේ ඉදිරිපත් කළ අතර කෙටි සන්නිවේදන වැඩසටහන් 12ක් ද ඉදිරිපත් කරන්නට විය. ඒ අතරින් වඩාත් විශිෂ්ට වූ ඉදිරිපත් කිරීම් වෙනුවෙන් ත්‍යාග නවයක් (9) ප්‍රදානය කරන ලදි.

**ජයග්‍රහණ**

**පර්යේෂණ ප්‍රකාශන පහසුකරවීමේ අරමුදල**

විදෙස් රටවල පැවැත් වූ ජාත්‍යන්තර සමුළුවලදී සිසුන්ගේ පර්යේෂණ පිළිබඳ වාචික ඉදිරිපත් කිරීම් සඳහා සිසුන් පස්දෙනෙකු තෝරාගන්නා ලදි. මෙම සිසුන් වෙනුවෙන් ආයතනය අනුග්‍රහය දැක්වූ අතර එක් සිසුවෙකු වෙනුවෙන් රුපියල් 50000ක මුදලක් ගමනාගමනය හා ලියාපදිංචිය ආදි වියදම් සඳහා ලබාදෙන ලදි.

**ජොආචිම් අනුස්මරණ ත්‍යාගය**

2017 වසරේදී ඉහළම GPA අගයක් ලබාගත් සිසුන් සඳහා වාර්ෂික සමුළුවේදී මෙම මුදල් ත්‍යාගය ප්‍රදානය කරන ලදි. පහත සඳහන් සිසුන් 2017 වසරේදී ඔවුන්ගේ උපාධි වැඩසටහන් සඳහා ඉහළම GPA අගයක් අත්කර ගන්නා ලදි.

- ඩී.අයි.එන්. වනිගසූරිය මිය - ශාක ආරක්ෂක
- එෆ්.එච්.සී.ඒ. සිල්වා මයා - කෘෂි ඉංජිනේරු

**මෙම ආයතනය විසින් පවත්වන ලද කෙටි පාඨමාලා/ වැඩමුළු**

| පාඨමාලාවේ නම | සංවිධානය කළේ | ඉලක්ක කණ්ඩායම | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| කිරි ගොවිපල යාන්ත්‍රණය හා සැකසුම් යන්ත්‍ර | කෘෂිකර්ම ඉංජිනේරු අධ්‍යයන මණ්ඩලය | වයඹ පළාතේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පශු සම්පත් සංවර්ධන සහායකයන් | 24 |
| IWRM පිළිබඳ කෙටි පාඨමාලාව | -එම- | වර්ල්ඩ් විෂන් ලංකා නිලධාරීන් | 17 |
| භූ විද්‍යා තොරතුරු පද්ධතිය පිළිබඳ | -එම- | පොල් වගාකිරීමේ මණ්ඩලයේ | 32 |

| | | | |
|---|---|---|---|
| කෙටි පාඨමාලාව | | කාර්ය මණ්ඩලය | |
| කිරි ගොවිපල ව්‍යුහය | -එම- | වයඹ පළාත් සත්ව ආරක්ෂණ හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පශු සම්පත් සංවර්ධන සහායකයන් | 23 |
| කෘෂි ව්‍යාපෘතිය සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ කළමනාකාරිත්වය | කෘෂි ඉංජිනේරු අධ්‍යයන මණ්ඩලය | ව්‍යාපාති නිලධාරීන් තොරතුරු සන්නිවේදන තාක්ෂණ නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් | 26 |
| පශු සම්පත් සංවර්ධනය සඳහා භූ තොරතුරු පද්ධතිය | කෘෂි ඉංජිනේරු අධ්‍යයන මණ්ඩලය | වයඹ පළාත් පශු සම්පත් සංවර්ධන සහායකයන් | 24 |
| අණුක ජීව විද්‍යාවේ ශිල්පීය ක්‍රම හා භාවිතය පිළිබඳ පශ්චාත් උපාධි සහතික පත්‍ර පාඨමාලාව | ශාක ආරක්ෂණ අධ්‍යයන මණ්ඩලය | දිවයින පුරා සිටින අදාළ නිලධාරීන් | 21 |
| පුද්ගල පිබිදීම සතුට ප්‍රේරණය හා ප්‍රතිඵල | කෘ. වි. ප. උ ආයතනය | කෘ. වි. ප. උ. ආයතනයේ කාර්ය මණ්ඩල සාමාජිකයන් | 50 |

**අසමත්කම්**

අදාළ වර්ෂයේදී කිසිදු වැදගත් අසමත්කම් සිදුනොවීය.

**අනාගත සැලසුම්**

- සමාජ මාධ්‍ය ඵලදායීව යොදාගනිමින් සිසුන් බඳවා ගැනීම වැඩි කිරීම
- පර්යේෂණ ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිකිරීම - පර්යේෂණ සිසුන් උනන්දු කරවීම සඳහා පර්යේෂණ පහසුකරවීමේ අරමුදලට මුදල් වැඩිපුර ලබාදීමට ආයතනය සැලසුම් කරයි
- සිසුන් විසින් සිදුකරන පර්යේෂණවල ප්‍රගතිය නිරන්තරයෙන් නිරීක්ෂණය කරන හා ඔවුන් නිසි දිශාවට ගමන් කරවීම සඳහා ඵලදායී යාන්ත්‍රණයක් හඳුන්වාදීම
- කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විවිධ වැඩසටහන් සඳහා සහයෝගීතා ගිවිසුම් මගින් විදෙස් සිසුන් වැඩි පිරිසක් ඇතුළත් කරගැනීම.
- වැඩසටහන් හා වැඩමුළු වැඩි ප්‍රමාණයක් කොළඹ ශාඛාවේදී පැවැත්වීම.
- පර්යේෂණ පදනම් වූ නව දැනුම/තොරතුරු ව්‍යාප්ත කරලීම සඳහා සාමජයේ වැඩිපිරිසක් ආවරණය වන පරිදි කෙටි පාඨමාලා වැඩි ප්‍රමාණයක් පැවැත්වීම.
- අධ්‍යයන සැසි හා සහයෝගීතා පර්යේෂණ පැවැත්වීම පිණිසත් පර්යේෂණ හා සංවර්ධනය සඳහා ජාත්‍යන්තර මුදල් ලබාගැනීමටත් විදෙස් ආගන්තුක මහාචාර්යවරුන්ට ආරාධනා කිරීම.
- මාර්ගගත (online) ගුරු ඇගයීම් පද්ධතියක් හඳුන්වාදීම
- අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක සහයෝගීතා ගොඩනැගීම සඳහා විදෙස් විශ්වවිද්‍යාල හා ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් වැඩි ප්‍රමාණයක් අත්සන් කිරීම.
- කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සේවකයන්ගේ කාර්ය සාධනය වැඩිකිරීම සඳහා නව කාර්ය සාධන සංස්කෘතියක් නිර්මාණය කිරීම.
- දෙස් විදෙස් සිසුන් ආකර්ෂණය කරගැනීම සඳහා ආයතනයේ යටිතල පහසුකම් ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව දියුණු කිරීම.
- පවතින විවිධ අවශ්‍යතාවන් සපුරාලීම සඳහා බාහිර විශේෂඥයෙකුගේ මාර්ගෝපදේශකත්වය යටතේ ආයතනයේ කළමනාකරණ තොරතුරු පද්ධතිය ඉහළනැංවීම හා කඩදාසි පරිහරණය අවම වූ ශිෂ්‍ය හිතකාමි ඵලදායී කළමනාකරණ පද්ධතියක් හඳුන්වාදීම.
- චිරස්ථායි සංවර්ධන ප්‍රතිපත්තිවලට සමගාමීව පරිසර හානිය අවම කරමින් එය ආරක්ෂා කිරීම සඳහා සියළු උපක්‍රම ක්‍රියාත්මක කිරීම සහ ඒ පිළිබඳ සියළු පාර්ශවයන් දැනුවත් කිරීම.

### 3.10.2 මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

(අධ්‍යක්ෂ - මහාචාර්ය ජේ.එම්.ඒ. ජයවික්‍රම)

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 24 වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සකස් කරන ලද ආඥාපනතක් මගින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2014 වසරේදී ස්ථාපිත කරන ලද මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ජාතික ආයතනයකි. මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ක්ෂේත්‍රයේ අධ්‍යාපනය, පර්යේෂණ හා නිර්මාණශීලි චින්තනයේ මෙන්ම සමාජ මෙහෙවර පිළිබඳ සංවේදීතාවයකින් හෙබි විචාරශීලි හා නිදහස් චින්තනය තුළින් දැනුම ප්‍රගුණ කිරීමට කැපවූ විද්වතුන් බිහිකිරීමේ විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත්වීම මෙම ආයතනයේ ඉලක්කයයි.

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය දර්ශනපති හා දර්ශනශූරී වැනි උපාධි ද පශ්චාත් උපාධි ඩිප්ලෝමාද පාඨමාලා වැඩ හා පර්යේෂණ උපාධි වර්තමානය වනවිට පවත්වනු ලබයි. එතුළින් පුහුණුව ලබාදෙන ක්ෂේත්‍රයන්ට අරාබි, ගිණුම්, පුරා විද්‍යාව, බෞද්ධ අධ්‍යයනය, ආර්ථික විද්‍යාව, අධ්‍යාපන, ශාරීරික අධ්‍යාපන, ඉංග්‍රීසි භාෂාව, ලලිත කලාව, භූගෝල විද්‍යාව, ග්‍රීක හා රෝම අධ්‍යයනය, හින්දු ශිෂ්ටාචාරය, නීතිය, කළමනාකරණය, පාලි භාෂාව, දර්ශනය, දේශපාලන විද්‍යාව, මනෝ විද්‍යාව, සංස්කෘත, සිංහල භාෂාව, සමාජ විද්‍යාව, සංඛ්‍යානය හා දෙමළ භාෂාව ඇතුළත් වේ. වර්තමානය වනවිට මෙම ආයතනයට වාර්ෂිකව බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව 500 සිට 800 දක්වා ප්‍රමාණයක පවතී. ආගන්තුක, ඉගැන්වීම් හා අධීක්ෂණ කාර්ය මණ්ඩලය ලෙස කටයුතු කරන සුදුසුකම්ලත් සම්පත්දායක පුද්ගලයන් සංඛ්‍යාව 150ක් පමණ වේ. මේ වනවිට පවත්වන අධ්‍යයන වැඩසටහන්වලට අමතරව විවිධ මට්ටමින් ඉල්ලුම පවතින අන්තර් ක්ෂේත්‍ර උපාධි වැඩසටහන් හඳුන්වාදීමේ ක්‍රියාවලියක මෙම ආයතනය නියැලී සිටී. ශ්‍රම බලකායේ හා කර්මාන්ත ක්ෂේත්‍රය තුළ පවතින සුවිශේෂී අවශ්‍යතාවන්ට සරිලන පරිදි කෙටි කාලීන පුහුණු වැඩසටහන් හඳුන්වාදීමට ද මෙම ආයතනය සැලසුම් කරයි. සාමාන්‍ය වශයෙන් මෙම ආයතනයේ වාර්ෂිකව පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ උපාධි අවසන් කරන ශිෂ්‍ය සංඛ්‍යාව 500කට අධිකය.

2018 වසර තුළදී මෙම ආයතනය 2017 වසරේ අගභාගයේදී ආරම්භ කළ එහි සාමාන්‍ය පරිපාලන ක්‍රියාකාරීත්වය ශක්තිමත් කිරීම අඛණ්ඩව සිදුකරන ලදි. ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීම කාර්ය මණ්ඩලයට වගකීම් පැවරීම, ඔවුන්ගේ කාර්යයන් නිරීක්ෂණය හා පරීක්ෂා කිරීම වැනි කටයුතු සංවිධිත කරන ලදි. 2016 වසරේ ආරම්භ කළ හැකියාවන් ගොඩනැගීමේ ව්‍යාපෘතිය ඉදිරියට ගෙනයන ලදි. සම්මන්ත්‍රණ ශාලා, පරිගණක විද්‍යාගාර, පංති කාමර ආදියට උපකරණ හා ලී බඩු මිලදී ගැනීම අවසන් කරන ලදි. ආයතනයේ ප්‍රථම පස් අවුරුදු සංයුක්ත සැලසුම අතුරු ව්‍යවස්ථා, පර්යේෂණ ප්‍රතිපත්ති හා රෙගුලාසි හා මාර්ගෝපදේශ සකස් කිරීම ද  හැකියාවන් සංවර්ධන සැලසුමට ඇතුළත් විය.

පෙර වර්ෂයන් හා සංසන්දනය කර බැලීමේදී 2018 වසරේදී ආයතනයේ මුදල් කාර්ය සාධනයේ වැඩිදියුණුවක් පෙන්වූ අතර 2018 වසරේ ආයතනයේ මුළු මෙහෙයුම් ආදායම රුපියල් මිලියන 91218ක් විය. මෙහෙයුම් ආදායමෙන් 70%ක් අධ්‍යයන වැඩසටහන් සඳහා සිසුන්ගෙන් අයකළ පාඨමාලා ගාස්තුය. ආයතනයේ 2018 වසරේ මුළු මෙහෙයුම් වියදම රුපියල් මිලියන 69,221ක් වූ අතර ආයතනයේ වාර්තා වූ ශුද්ධ අතිරික්තය රුපියල් මිලියන 22,060කි.

මෙම ආයතනය අදාළ වසර තුළ සාමාන්‍ය කළමනාකරණයේ හා මුදල් හා ගිණුම් කළමනාකරණයේ සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. මෙම තත්ත්වය හේතු පාදක කොටගෙන ශ්‍රී ලංකා විගණකාධිපති විසින් මෙම ආයතනය තුළ මුදල් හා ගිණුම් කළමනාකරණය සත්‍ය හා පැහැදිලි යැයි සඳහන් කිරීම අප ආයතනය අත්කරගත් සුවිශේෂී ජයග්‍රහණයකි. ඒ කෙසේ වෙතත් මෙම ආයතනය වැඩිදුරටත් එහි මෙහෙයුම් ක්‍රියා පටිපාටිවලට ගැලපුම් සිදුකොට දුර්වල අංශ දියුණු කිරීමටත් අත්කරගත් තත්ත්වය තහවුරු කරගැනීමටත් කටයුතු කරයි.

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහි පර්යේෂණ ශක්‍යතාවය හා ප්‍රතිඵල දියුණු කිරීමට හා ඉහල නැංවීම සඳහා ක්‍රියාකාරකම් ආරම්භ කොට ඇත. ආයතනයේ පර්යේෂණ සමුළුව අප්‍රේල් 04

දින පැවැත් වූ අතර එහිදි ආයතනයේ පර්යේෂණ සිසුන් විසින් බාරදුන් පර්යේෂණ පත්‍ර 55කට වැඩි ප්‍රමාණයක් ඉදිරිපත් කොට සාකච්ඡාවට භාජනය කරන ලදි. ආයතනයේ සිසුන්ට විශාල පිටුවහලක් සපයන එහි පර්යේෂණ වාරසඟරාවේ දෙවන වෙළුම පළකිරීමට හැකි විය. ආයතනයේ සිසුන්ට හා කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ දැනුම හුවමාරු කරගැනීමට අවස්ථාව උදාකර දෙමින් අදාළ වර්ෂයේදී වැඩමුළු හා සම්මන්ත්‍රණ සංවිධානය කරන ලදි. මෙම ආයතනය විදෙස් විශ්වවිද්‍යාල හා ආයතන සමඟ මෙන්ම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ඒජන්සි වැනි දේශීය අංශ සමඟත් සහයෝගීතා ආරම්භ කරන ලදි. විදෙස් ආයතන සමඟ සහයෝගීතා ඇතිකර ගැනීම තුළින් සිසුන් හා කාර්ය මණ්ඩල හුවමාරු වැඩසටහන්වලට හා ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අවස්ථාව උදාකර දෙනු ලබයි.

ආයතනයේ සමහර අංශවලින් උපරිම ඵලනෙලා ගැනීමට අවශ්‍ය වැඩිදියුණු කිරීම් කළයුතුව තිබේ. එම අංශ දියුණු කිරීමට ආයතනය පියවර කිහිපයක් ගෙන තිබුණ ද සිසුන්ට අවශ්‍ය ඉගෙනුම්, පර්යේෂණ හා සුබසාධන කටයුතු සැපයීම ප්‍රධාන අභියෝගයක්ව පවතී. දෙස් විදෙස් සිසුන් ආයතනයේ අධ්‍යයන වැඩසටහන් සඳහා ආකර්ෂණය කර ගැනීම සඳහා නවාතැන් පහසුකම් සැපයීමේ අවස්ථා හිඟවීම බාධකයක්ව පවතින අතර එය ආයතනයේ අනාගත සංවර්ධනයට ද බලපෑම් එල්ල කරයි. වර්තමානයේදී ආයතනයේ ප්‍රතිඵල සියළුම විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට මාස හයක පමණ කාලයක් ගතවෙන අතර මෙම ප්‍රමාදය ශිෂ්‍ය ලියාපදිංචියට හා වෘත්තීය ප්‍රගතියට ප්‍රබලව බලපෑම් කරයි. මේ අතර පිළිතුරු පත්‍ර හා උපාධි නිබන්ධන පරීක්ෂා කිරීමට ගතවන කාලය අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. කෙසේ වුවත් එලෙස යම් ප්‍රමාදයක් පවතින්නේ නම් එය අවම කිරීම පිණිස නිරීක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කළයුතුව ඇත. ආයතනයේ සංයුක්ත සැලසුමෙන් හඳුනාගත් පරිදි නව උපාධි වැඩසටහන් සංවර්ධනය කිරීමේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන ගියද එම වැඩසටහන් අනුමත කිරීමට ගතවන කාලය හේතුවෙන් එවැනි නව වැඩසටහන් ආරම්භ කිරීම ප්‍රමාද වේ.

ආයතනයේ ආරම්භයේ සිට අවුරුදු දෙකක (2) කාල පරිච්ඡේදය තුළ එහි පරිපාලන හා මුදල් කළමනාකරණය, වැඩසටහන් පැවැත්වීම, අධ්‍යයන හා පර්යේෂණ සංවර්ධනය, හැකියාවන් සංවර්ධය හා ආයතනයේ සමස්ත කාර්යසාධනය ඉතා සතුටුදායක හා ප්‍රශංසනීය වේ. මෙලෙස අත්කරගත් මෙම ප්‍රගතිය හා අත්දැකීම් සහ 2018-2022 සංයුක්ත සැලසුමෙන් පෙන්වා ඇති මාවතේ ගමන් කිරීමත් සමඟ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ක්ෂේත්‍රයේ විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත්වීම සඳහා මෙම ආයතනයට ඉඩප්‍රස්ථා උදාකරදෙනු ලබයි.

### 3.10.3. විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

[අධ්‍යක්ෂ - මහාචාර්ය එච්.එම්.ටී.ජී.ඒ. පිටවල (වැඩබලන)]

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ විද්‍යාත්මක ක්ෂේත්‍රයේ විද්‍යා අධ්‍යාපනය, පර්යේෂණ හා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම පිණිස උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ආඥා පණතක් මගින් 1996 වසරේ ස්ථාපිත කරන ලද පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ජාතික ආයතනයකි. විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මුඛ්‍ය පරමාර්ථය වනුයේ විවිධ විද්‍යාත්මක ක්ෂේත්‍රයන්ට අදාළ පශ්චාත් උපාධි උපදේශනය, පුහුණුව හා පර්යේෂණ ප්‍රවර්ධනය කොට ලබාදීමත් එතුළින් උපාධිධාරී අධ්‍යයන අත්දැකීම ඉහළනැංවීමයි.

විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ජාතියේ රාජ්‍ය හා පුද්ගලික අංශයේ පවතින ඉල්ලුම පිරිමසාලනු පිණිස විද්‍යාපති, දර්ශනශූරී, දර්ශනපති උපාධි වැඩසටහන් මෙන්ම පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා ද ප්‍රදානය කරනු ලබයි. මෙම ආයතනයේ බොහෝමයක් පර්යේෂණ වැඩසටහන් විද්‍යා පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා රටේ වෙනත් ආයතන සමඟ සහයෝගීතාවයෙන් පවත්වනු ලබයි. ඊට අමතරව කෙටි පාඨමාලා හා වැඩමුළු වැනි ව්‍යුහාත්මක පුහුණු වැඩසටහන් ද පවත්වයි. එමෙන්ම භූ තොරතුරු පද්ධති හා දූරස්ථ සංවේදීතා යෙදුම්, විද්‍යාත්මක රචනය, දත්ත හැසිරවීම හා කළමනාකරණය ආයතනයේ ජනප්‍රිය කෙටි වැඩසටහන් කිහිපයකි. විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මෙම වැඩසටහන් විද්‍යා අධ්‍යාපනය ඇතුලු සියළුම විද්‍යා ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි අධ්‍යයන මණ්ඩල 11ක් හරහා පවත්වනු ලබයි. මෙහි අධ්‍යයන කාර්ය මණ්ඩලය පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පීඨ නවයෙන් මෙන්ම වෙනත් විශ්වවිද්‍යාලවලින්, ආයතන හා කර්මාන්තවලින් කැඳවා ගනු ලබයි. ජෛව වෛද්‍ය විද්‍යාව නව අධ්‍යයන මණ්ඩලයන් ස්ථාපිත කරන ලදි. තව ද, විද්‍යා පශ්චාත් උපාධි ආයතනය දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයට හා රාජ්‍ය/පුදගලික අංශයේ ආයතනවලට උපදේශන සේවාවන් ද ලබාදෙනු ලබයි. ජාත්‍යන්තර ආයතන සමඟ විවිධ වැඩසටහන් හා සහයෝගීතා පර්යේෂණ ව්‍යාපෘති දියත්කොට ඇත. ERASMUS ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ තෝරාගත් සිසුන් පිරිසකට ශිෂ්‍යත්ව ලබාදී ඔවුන්ගේ අධ්‍යයන කටයුතු විදෙස් රටවලදී කරගෙන යෑමට අවස්ථාව උදාකර දී ඇත.

විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වෙනත් ක්‍රියාකාරකම් අතරට විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සමුළුව, වෙනත් ජාත්‍යන්තර සමුළු, විශේෂ සම්මන්ත්‍රණ හා වැඩමුළු යන පර්යේෂණ සමුළු සමග සම්මන්ත්‍රණ පැවැත්වීම ඇතුළත් වේ. මෙම කටයුතු අධ්‍යයන මණ්ඩල හරහා දෙස් විදෙස් සහභාගීවන්නන්ගේ අධ්‍යයන සහයෝගීතාවෙන් සිදුවේ. 2018 පර්යේෂණ සමුළුවේදී නැවුම් පර්යේෂණ සොයා ගැනීම් 130කට වැඩි ප්‍රමාණයක් ඉදිරිපත් කරන්නට විය. රසායන විද්‍යා අධ්‍යයන මණ්ඩලය මධ්‍යම පරිසර අධිකාරිය සමග එක්ව වායුවේ ගුණාත්මක කළමනාකරණය පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කරන ලදි. තව ද, මෙම ආයතනය එහි කැපවූ, මනා පුහුණුව ලත් කාර්ය මණ්ඩලය හරහා එහි පාර්ශවකරුවන් වෙනුවෙන් කාර්යක්ෂම සේවාවන් ලබාදෙන අතර එහි ප්‍රතිඵලයක් ලෙස පසුගිය අවුරුදු කිහිපය තුළ ජාත්‍යන්තරකරණය වෙනුවෙන් ගත් උත්සාහයන් වඩාත් ශක්තිමත්ව ඇත.

විද්‍යාත්මක ක්ෂේත්‍රයෙහි හා පර්යේෂණයෙහි හොඳම පශ්චාත් උපාධි ආයතනය බවට පත්වීමේ එහි දැක්ම ඉදිරියේ දී සාක්ෂාත් කරගැනීමට අපේක්ෂිතයි.

**විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විද්‍යාගාර සංවර්ධනය**

මෙම ආයතනය තුළ පවතින බොහෝ විද්‍යාගාර තුළින් එහි සිසුන්ට අවශ්‍ය පහසුකම් සැපයෙන අතර එම විද්‍යාගාර තවදුරටත් සංවර්ධනය කොට වඩාත් පුළුල් හා ගතික ඉගෙනුම් පරිසරයක් සිසුන් වෙත ලබාදීම සඳහා සැලසුම් සකස් කෙරෙමින් පවතී. එලෙස විද්‍යාගාර සංවර්ධනය කිරීමට ගත් පියවර පහතින් දැක්වේ.

- උපකරණ විද්‍යාගාරය 1- ඇටමික් එමිසන් ස්පෙක්ටෝ ෆොටෝ මීටර්, ගෑස් ක්‍රොමැටෝග්‍රෆ, පොලරයිසං මයික්‍රස්කෝප් වැනි උපකරණ රාශියක් මේ වනවිට මෙම විද්‍යාගාරය තුළ රඳවා ඇත. ආයතනයෙන් උපයාගත් මුදල්වලින් එක්ස්-කිරණ ඩි ෆ්‍රක්ටෝමීටර් යන්ත්‍රයක් මිලදී ගැනීමට නියමිතයි.
- උපකරණ විද්‍යාගාරය II- 2016 වසරේ අවසාන කාර්තුවේදී ආරම්භ කළ මෙම විද්‍යාගාරයේ මූලික අරමුණ වනුයේ ජෛව රසායන, ජෛව තාක්ෂණය හා අණුක ජීව විද්‍යාව යන අංශවල පර්යේෂණ කටයුතු ශක්තිමත් කිරීමයි. මේ වනවිට මෙම විද්‍යාගාරය සතුව PCR ඇගලයිසර්, සෙන්ට්‍රිෆියුජ්

ශේකර් වැනි උපකරණ පවතී. මීට අමතරව තවත් අත්‍යාවශ්‍ය උපකරණ කිහිපයක් මිලදී ගැනීමට කටයුතු කෙරේ.

- භූ තොරතුරු පද්ධති විද්‍යාගාරය I: මෙම විද්‍යාගාරය මෑතකාලයේදී පුළුල්ව දියුණු කළ අතර පසුගිය වසර දෙකක කාලය තුළ විද්‍යාපති උපාධියේ භූ තොරතුරු පද්ධති හා දුරස්ථ සංවේදිතා උපාධිය සඳහා විශාල සිසුන් පිරිසක් ලියාපදිංචි වී ඇත. ඉහත උපාධියේ ප්‍රායෝගික පුහුණුව සඳහා මෙම විද්‍යාගාරය යොදා ගැනේ.
- පරිගණක විද්‍යාගාරය I: මෙම විද්‍යාගාරයෙන් එකවර සිසුන් 65 දෙනෙකුට පහසුකම් සැපයීමේ හැකියාව පවතී.
- පරිගණක විද්‍යාගාරය II: මෙහි කටයුතු කෙරෙමින් පවතී.
- පරිගණක පර්යේෂණ විද්‍යාගාරය : මෙම විද්‍යාගාරය සිසුන් හය දෙනෙකුට ඔවුන්ගේ පරිගණක විද්‍යාව පිළිබඳ පර්යේෂණ කටයුතු කරගෙන යෑම සඳහා සංවර්ධනය කොට ඇත.
- දත්ත විද්‍යා ඒකක : මෙම ආයතනයේ 20වැනි සංවත්සර සැමරුම් දිනයේදී මෙම ඒකකය විවෘත කරන ලදි. පරිගණක 15කින් යුතු දත්ත විද්‍යා ඒකකයට උසස් බලයකින් යුතු පරිගණක මිලදී ගැනීමට කටයුතු කෙරෙමින් පවතී.
- රසායන විද්‍යාගාරය : විශ්ලේෂණාත්මක රසායන විද්‍යාව, පරිසර විද්‍යාව හා විද්‍යා අධ්‍යාපනය පිළිබඳ විද්‍යාපති උපාධියේ විද්‍යාගාර පංති පැවැත්වීම නොකඩවා සිදු කිරීම සඳහා අවශ්‍ය වීදුරු භාණ්ඩ හා පරිහරණ උපකරණ මිලදී ගෙන ඇත.
- පාෂාණ හා පාංශු කාර්මික විද්‍යාගාරය : මේ වනවිට මෙම විද්‍යාගාරය දියුණු කෙරෙමින් පවතින අතර එහි වැඩ අවසන් වූ පස්, භූ විද්‍යා හා ජල භූ විද්‍යා ඉංජිනේරු විද්‍යාපති උපාධියේ විද්‍යාගාර පංති සඳහා යොදාගනු ඇත. එමෙන්ම මහජන සේවාවන් ද දියත් කරනු ඇත.
- තොරතුරු තාක්‍ෂණ විද්‍යාගාරය : මෙම විද්‍යාගාරය සංවර්ධය කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇති අතර එහි වැඩ අවසන් වූ විට වරකට සිසුන් 65 දෙනෙකුට පහසුකම් සැපයේ. තොරතුරු තාක්‍ෂණය හා විද්‍යා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා විද්‍යාපති උපාධි හදාරන සිසුන් වෙනුවෙන් මෙම විද්‍යාගාරය සැලසුම් කොට ඇත.

## අනාගත සැලසුම්

විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ දැක්ම සහ මෙහෙවර අනුව ඉදිරි වර්ෂ කිහිපය සඳහා කටයුතු සැලසුම් කොට ඇත. කළමනාකරණ මණ්ඩලයේ 138 වැනි රැස්වීම 2017 නොවැම්බර් 11 දින පැවැත්වූ අතර එහිදී වැඩමුළු, සමුළු, විභාග සහ දේශන පැවැත්වීම සඳහා අවශ්‍ය උපකරණ මුදල් ලැබෙන පරිදි මිලදී ගැනීමට අනුමැතිය ලබාදෙන්නට විය.

කළමනාකරණ මණ්ඩලය විසින් පහත දැක්වෙන ලැයිස්තුවට අනුමැතිය ලබාදී ඇත.

| | අධ්‍යයන මණ්ඩලය | ඉල්ලුම් කළ උපකරණ | |
|---|---|---|---|
| 1 | සංඛ්‍යානය හා පරිගණක විද්‍යාව | පරිගණක | ක්‍රියාත්මකවේ |
| 2 | ජෛව රසායන විද්‍යා හා අණුක ජීව විද්‍යාව | විද්‍යාගාර කොලරි මීටරය | |
| 3 | රසායන විද්‍යාවන් | අල්ට්‍රාපියෝ ජල පද්ධතිය | |
| 4 | පෘථිවි විද්‍යා | භූ විදුලි ප්‍රතිරෝධ උපකරණ | |
| 5 | පරිසර විද්‍යාව | එක්ස් කිරණ යන්ත්‍රය | |
| 6 | ගණිතය | මල්ටිමීඩියා ඒකක (03) සහ ලැප්ටොප් පරිගණක (03) | ක්‍රියාත්මක වේ |
| 7 | භෞතික විද්‍යාව | ඔටෝලැබ් N සීරීස් | |
| 8 | ශාක විද්‍යාව | ස්ටිරියෝ මයික්‍රොස්කෝප් | |
| 9 | විද්‍යා අධ්‍යාපනය | මල්ටිමීඩියා ඒකක (07) සහ ලැප්ටොප් (06) | |
| 10 | සත්ව විද්‍යාවන් | බයිනෝක්‍යුලර් මයික්‍රස්කෝප් (10) | ක්‍රියාත්මක වේ |

| | | | |
|---|---|---|---|
| 11 | පොදු උපකරණ ලැයිස්තුව | 1 විඩියෝ කන්ෆරන්සි සිස්ටම්<br>2 විදුලි බුෆට් සෙට්<br>3 මෘදුකාංග පැකේජය<br>4 ස්මාට් වයිට් බෝඩ් (02)<br>5 ඩොකියුමන්ට් කැමරා (01)<br>6 ගිණුම් පැකේජය | මිලදී ගෙන ඇත |

**පහත සඳහන් ලැයිස්තුගත කළ සුවිශේෂී ඉලක්කයන් හා ක්‍රියාමාර්ග 2019 වසරේදී ක්‍රියාත්මක කරනු ඇත**

- විද්‍යාගාර තවදුරටත් සංවර්ධනය කිරීම : ජාත්‍යන්තර මට්ටමට උපකරණ විද්‍යාගාරය පුළුල් කිරීම මීට ඇතුළත් වේ. එමෙන්ම අත්‍යාවශ්‍ය උපකරණ මිලදී ගැනීම
- මේ වනවිට ඉදිකෙරෙන ගොඩනැගිල්ල විද්‍යාගාර හතරකින්, ශිෂ්‍ය සේවා මධ්‍යස්ථානයක්, ආපනශාලාවක්, කාර්ය මණ්ඩල කාමර, සාකච්ඡා කාමර, පාඩම් කිරීමේ කාමර හා සමුළු ශාලාවකින් යුක්තවේ. මේ සඳහා අවශ්‍ය ලී බඩු සහ වෙනත් අවශ්‍ය පහසුකම් ලබාගනු ඇත.
- විද්‍යාපති, දර්ශනපති හා දර්ශනශූරී සිසුන් සංඛ්‍යාව වැඩිකිරීම
- කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉල්ලුම සපුරාලන නව විද්‍යාපති උපාධි වැඩසටහනක් හඳුන්වාදීම (උදා-ජීව වෛද්‍ය විද්‍යාවන්, දන්ත විද්‍යාව, විද්‍යුත් ද්‍රව්‍ය/උපකරණ, විදුලි රසායන විද්‍යා හා තාක්ෂණය, ඖෂධ විද්‍යාව හා ව්‍යවහාරික භූ භෞතික විද්‍යාව)
- අලුතෙන් ස්ථාපිත කළ දත්ත විද්‍යා ඒකකයෙන් ජාතික සේවාවන් සැපයීම
- විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ සමුළුව හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ අඛණ්ඩව පැවැත්වීම
- විදෙස් වෘත්තිකයන්ගේ සහභාගීත්වයෙන් පර්යේෂණ සමුළු වැඩි ප්‍රමාණයක් ආරම්භ කිරීම
- ජාතික හා ජාත්‍යන්තර ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් ස්ථාපිත කිරීම
- විදෙස් විශ්වවිද්‍යාල/ආයතන සමඟ සහයෝගීතා තවදුරටත් ශක්තිමත් කිරීම
- ජාතික අවශ්‍යතාවන් සහිත පර්යේෂණ වැඩසටහන් පුළුල් කිරීම
- විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ නව සේවක තනතුරු නිර්මාණය කිරීම
- අනධ්‍යයන කාර්ය මණ්ඩලය පුහුණු කිරීම
- ආයතනයේ වත්මන් වැඩසටහන් පුළුල් ලෙස ඇගයීමකට ලක් කිරීම, පාඨමාලා/පර්යේෂණ වැඩසටහන් හා කවර හෝ සමාජ ක්‍රියාකරකම් වගේම වත්මන් අවශ්‍යතාවන්ට සහ අනාගත ප්‍රවණතාවන්ට අදාළ නව පාඨමාලා සැලසුම් කිරීම
- විද්‍යාත්මක ක්ෂේත්‍රයේ පවතින ජාතික අවශ්‍යතා හා අනාගත ප්‍රවණතා පිළිබඳ ඉදිරි දශකය සඳහා නව පාඨමාලා සැලසුම් කොට සකස් කිරීම. මේ සම්බන්ධයෙන් අනාගත පශ්චාත් උපාධි වැඩසටහන් සැලසුම් කිරීමට ප්‍රථමයෙන් වඩාත් පොදු පාර්ශවකරුවන් ඉලක්ක කොට ගනිමින් අවශ්‍යතා තක්සේරු සමීක්ෂණයක් පවත්වනු ඇත. මෙහි පාර්ශවකරුවන්ගේ ගණයට පුද්ගලික අංශය, කර්මාන්ත, අධ්‍යාපන, රාජ්‍ය අංශය මෙන්ම එම අංශය අදාළ නොවන වෙනත් සේවා ආයතන ඇතුළත් වේ.
- කළමනාකරුවන් පුහුණු කිරීම සඳහා දැඩි අවශ්‍යතාවක්ව පවතින විද්‍යා හා තාක්ෂණ කළමනාකරණ පාඨමාලාවක් ආරම්භ කිරීම මෙන්ම මෑතකදී අ.පො.ස. (උ.පෙ.) සිසුන් වෙත හඳුන්වාදුන් තාක්ෂණ විෂයධාරාවේ ගුරුවරුන් අදාළ කොට ගෙන ඒ පිළිබඳ විද්‍යාපති හා පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් ආරම්භ කිරීම වත්මන් හා අනාගත ඉල්ලුම මුල්කොට ගෙන නව පාඨමාලා සැකසීම ඉතා වැදගත් වේ.
- සියළුම පර්යේෂණ උපාධි වැඩසටහන් උසස් ත්ත්වයකින් පවත්වා ගැනීම පිණිස පර්යේෂණ සිසුන් (දර්ශනපති/දර්ශනශූරී) සඳහා නිත්‍ය සම්මන්ත්‍රණ සංවිධානය කොට පැවැත්වීම හා උපාධි නිබන්ධන ඇගයීම සඳහා දෙවන පරීක්ෂකවරුන් ලෙස කටයුතු කිරීම.
- අවශ්‍ය අවස්ථාවන්වලදී විද්‍යා අධ්‍යාපනය සම්බන්ධව ඉගැන්වීමේ/දේශන පාඨමාලා සහ පර්යේෂණ අධීක්ෂණය බාර ගැනීම

## 3.11 පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල ජාලය

**[පුස්තකාලයාධිපති - ආර්. මහේෂ්වරන් මහතා (වැඩබලන)]**

### හැඳින්වීම

කොළඹ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල විද්‍යා පීඨ පුස්තකාලය ලෙස පේරාදෙණිය විශ්වවිද්‍යාල පුස්තකාලය 1921 වසරේදී ආරම්භ කිරීමෙන් අනතුරුව 1952 වසරේදී එය වර්තමානයේ ස්ථාපිත කොට තිබෙන පරිශ්‍රයට ගෙන එන ලදි. පේරාදෙණියට ගෙන ඒමෙන් අනතුරුව ප්‍රධාන පුස්තකාලය කෘෂි විද්‍යා, සම සෞඛ්‍ය, දන්ත, ඉංජිනේරු, වෛද්‍ය විද්‍යා හා පශු වෛද්‍ය විද්‍යා යන ශාඛා පුස්තකාලවලින් යුතු පුස්තකාල ජාලයක් බවට සංවර්ධනය වී ඇත. මෙහි නවවන ශාඛා පුස්තකාලය කෘෂි විද්‍යා පීඨයට අයත් මහඉලුප්පල්ලම උපමණ්ඩපයට අනුයුක්ත කොට ඇති අතර අනෙකුත් ශාඛා පුස්තකාල අදාළ පීඨයන්හිම පිහිටා ඇත.

ශ්‍රී ලංකාවේ පැරණිම හා විශාලතම පුස්තකාලය පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල ජාලයයි. මේ පිළිබඳ වැඩිදුර විස්තර දැනගැනීම සඳහා "http://www.lib.pdn.ac.lk/Aboutus/generalinfo/generalinfo.html" වෙත පිවිසෙන්න.

### ජයග්‍රහණ

පුස්තකාලයක එක් ප්‍රධාන ඉලක්කයක් විය යුත්තේ ජාතියේ සංස්කෘති හා බුද්ධිමය උරුමයන් සංරක්ෂණය කොට ආරක්ෂා කිරීමයි. ජාතියේ දෙවන විශාලතම තල්පත් පුස්තක එකතුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ප්‍රධාන පුස්තකාලය සතුව පවතින අතර එය සංරක්ෂණය කොට ආරක්ෂා කිරීම දීර්ඝ කාලයක සිට දැනුනු අවශ්‍යතාවයකි. උපකුලපතිතුමාගේ මැදිහත්වීමෙන් හා ඒ වෙනුවෙන් මුදල් වෙන්කිරීම සිදු වූ අතර තල්පත් පුස්තක සංරක්ෂණ ඒකකය මැයි මස 15 දින පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය උපකුලපති මහාචාර්ය උපුල් බී. දිසානායක මහතා විසින් විවෘත කරන ලදි. ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරයෙකුගේ මඟපෙන්වීම යටතේ පුහුණුව ලද කාර්ය මණ්ඩල සාමාජිකයන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමකින් මෙම ඒකකය සම්ප්‍රයුක්ත වේ. ප්‍රධාන පුස්තකාලයේ ධාරිතාව පුළුල් කිරීම පිණිස ප්‍රධාන පුස්තකාල ගොඩනැගිල්ලට ගොඩනැගිලි දිගුවක් ලබාගැනීම 1990 ගණන්වල සිට සැලසුම් කොට අපේක්ෂාවෙන් සිටි දෙයකි. මෙය පුළුල් කිරීම තුළින් වැඩිවන ග්‍රන්ථ එකතු තැන්පත් කිරීමට හා පාඨකයාට වඩා යහපත් පහසුකම් හා සේවාවන් සැපයීමට හැකිවනු ඇත. මෙම ගොඩනැගිලි දිගුවේ ඉදිකිරීම් කටයුතු 2017 අගෝස්තු 18 දින උපකුලපති, මහාචාර්ය උපුල් බී. දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් මුල්ගල තැබීමත් සමඟ ආරම්භ විය. මෙය පුස්තකාල ජාලය අත්කරගත් වැදගත් කැපී පෙනෙන ජයග්‍රහණයක් වන අතර එය වැඩිදුරටත් සංවර්ධනය කිරීමට අදහස් කොට ඇත. මෙම සිව් මහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2018 වසරේදී අවසන් කිරීමට නියමිතය. KOHA සංසරණ මොඩියුලය මෙම වසරේදී සාර්ථකව දියත් කළ අතර එහි ප්‍රථම පියවර ලෙස අධ්‍යයන කාර්ය ප්‍රධාන පුස්තකාලය පරිහරණය කරන අනෙක් පිරිස වෙත එය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වූ පසු ලබාදෙනු ඇත. උපකුලපති මහාචාර්ය උපුල් බී. දිසානායක මහතා විසින් 2017 අගෝස්තු 10 දින මෙම සංරක්ෂණ මොඩියුලය ක්‍රියාත්මක කරන ලදි. 2018 වසරේදී කිසිදු බාධාවකින් තොරව සංසරණ මෙහෙයුම් පවත්වන ලදි. ආයතනයේ සුරක්ෂිතාගාරය නොහොත් ඩිජිටල් පුස්තකාලය සාර්ථකව පවත්වාගෙන යන අතර D space මෘදුකාංගය යොදාගනිමින් එය යාවත්කාලීන කෙරේ. මේ වනවිට එහි උපුටන 6400ක් අඩංගු වේ. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල පුස්තකාල අතරින් 2018 වසරේදී ද පේරාදෙණිය පුස්තකාලය ප්‍රථම ස්ථානයේ රැඳී සිටීමට මෙම සුරක්ෂිතාගාරය ප්‍රධාන සාධකයක් විය. පෙර වසරේ වාර්තාවේ අනාගත සැලසුම් කොටසේ සඳහන් කළ පරිදි මහඉලුප්පල්ලම උප මණ්ඩප පුස්තකාලය ඇතුලුව සියලුම පීඨ පුස්තකාලවලට සම්බන්ධ තොග හරි වැරදි බැලීම 2017 වසරේදී සාර්ථකව අවසන් කරන ලදි.

පුස්තකාල කළමනාකරණය ඩිජිටල් සම්පත් සංවර්ධන හා කාර්ය මණ්ඩල පුහුණුව යටතේ නව අංශයක් ස්ථාපිත කිරීමට පියවර ගෙන ඇත. සැලසුම් කිරීම, සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම, වර්ධනය කිරීම සහ අප ආයතනික සුරක්ෂිතාගාරය පවත්වාගෙන යෑම සහ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා පර්යේෂණ කාර්ය මණ්ඩලය විසින් නිර්මාණය කරන පර්යේෂණ ප්‍රකාශන උඩුගත කිරීම මෙහි අරමුණයි. ශ්‍රී ලංකාවේ අනෙකුත් ආයතනික

සුරක්ෂිතාගාර අතරින් අපගේ සුරක්ෂිතාගාරය හොඳම සුරක්ෂිතාගාරය කිරීමේ කාර්යභාරයක් මෙම නව ඒකකය සතු වගකීමකි. කවර හෝ ආයතනයක සාර්ථකත්වය රඳා පවතිනුයේ එහි මානව සම්පත් සංවර්ධනය බවට කිසිඳු සැකයක් නොමැත. එබැවින් මෙම ඒකක ස්ථාපිත කිරීමෙන් අප බලාපොරොත්තු වනුයේ කාර්ය මණ්ඩලයේ කුසලතා දියුණු කිරීම, අපගේ තත්ත්වය පවත්වා ගැනීම හා තොරතුරු සැපයීමේ පූර්ණත්වයට එළඹීමයි. 2018 වසරේදී පුස්තකාල ජාලයේ මානව සම්පත් සංවර්ධනය කිරීම පිණිස ප්‍රේරණය හා විෂයානුබද්ධ තේමාවන් පිළිබඳ පුහුණු වැඩසටහන් හා වැඩමුළු මාලාවක් සාර්ථකව පවත්වන ලදි.

**බාධක සහ පිළියම්**

- කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාල කාර්ය මණ්ඩලය පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල ජාලය යටතට ගනු ඇත.
- වෙබ් සේවා ශ්‍රේණිගත කිරීම්වල පේරාදෙණිය විශ්වවිද්‍යාල පුස්තකාලය ප්‍රථම ස්ථානය හිමිකරගත්තද පුස්තකාල ජාලයේ ඩිජිටල් පුස්තකාලය නොහොත් ආයතනික සුරක්ෂිතාගාරය එම ස්ථානය කරා ළඟාවීමට තවමත් වෙහෙස දරයි. මෙම අරමුණු සාක්ෂාත් කරගත හැක්කේ අපගේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් හා පර්යේෂකයන්ගේ සහයෝගයෙන් අප විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රකාශනවලින් එය උඩුගත කළහොත් පමණි.
- ප්‍රධාන පුස්තකාලයේ හා සියළුම ශාඛා පුස්තකාලවල තොග ගණනය අවසන් කළත් අස්ථානගත වූ ද්‍රව්‍ය නිවැරදි කිරීමට පුස්තකාල කළමනාකරණයට හා කාර්ය මණ්ඩලයට මෙතෙක් නොහැකි වී ඇත. එය එලෙස සිදුවී ඇත්තේ පුස්තකාලය ආරම්භයේදී හෝ එහි ඉතිහාසයේ යම් අඩවියක ප්‍රවේශ ලේඛන පවත්වාගෙන ගොස් නොමැති හෙයිනි. කෙසේ වෙතත් අත්කර ගැනීමේ ක්‍රියාවලියට ප්‍රවේශ ලේඛන හඳුන්වා දෙමින් මෑතකාලයේදී මෙම දුර්වලතාව නිවැරදි කරන ලදි.

**අනාගත සැලසුම්**

- දැනට ඉදිකෙරෙමින් පවතින යෝජිත නව පුස්තකාල ගොඩනැගිල්ල විවිධ පහසුකම්වලින් යුක්තවන අතර එතුළින් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් ඇතුලත් අපගේ සියළුම පාඨකයන්ට වඩාත් දියුණු සේවාවක් ලබාදීමට හැකිවනු ඇත. ශ්‍රවණාගාරය, කලාගාරය, ප්‍රදර්ශන පෙදෙස, පරිගණක විද්‍යාගාරය හා මල්ටිමීඩියා කාමරය යනාදි පහසුකම් තුළින් විශ්වවිද්‍යාල සාමාජිකයන්ට මෙන්ම බාහිර පුද්ගලයන්ට ද සේවාවන් සැපයීමට අපට හැකිවනු ඇත. එමෙන්ම මෙම පහසුකම් ද සමඟ පුස්තකාල පද්ධතියට අනුයුක්ත කෙට ඇති අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 17 දෙනාගේ දැනුම හා විශේෂඥභාවය යොදා ගනිමින් ජාතික කර්තව්‍යයක් ලෙස සලකා මහජන පුස්තකාලයාධිපතීන් වෙනුවෙන් පාඨමාලා පැවැත්වීමටත් එතුළින් විශ්වවිද්‍යාලයට ආදායම් මාර්ගයක් අත්කර ගැනීමටත් පුස්තකාල කළමනාකරණය අපේක්ෂා කරයි.
- ඉදිරි තොග හරිවැරදි බැලීමේ වැඩසටහන කාර්යක්ෂමව හා ක්‍රමානුකූලව පැවැත්වීම සඳහා එය සංවිධිත කිරීමට පුස්තකාල ජාලය අපේක්ෂා කරන අතර දැනට අස්ථානගත වී ඇති පොත්පත් පිළිබඳ සොයා බැලීමේ නිසි යාන්ත්‍රණයක් නිර්මාණය කිරීමට ද සැලසුම් කරමින් සිටී.
- පේරාදෙණිය විශ්වවිද්‍යාල පුස්තකාල ජාලය දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය සමඟ සහයෝගීතාවෙන් පුස්තකාල හා තොරතුරු විද්‍යා ඩිප්ලෝමා වැඩසටහනක් පැවැත්වීමටත් මෙම විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය සමඟ එක්ව එම විෂය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහනක් පැවැත්වීමටත් සැලසුම් සකස් කරමින් සිටී.
- ආයතනික සාර්ථකත්වය පිටුපස සිටිනුයේ එම ආයතනයේ මානව සම්පතයි යන සත්‍යයට අනුගත වෙමින් අප පුස්තකාල ජාලයේ කාර්ය මණ්ඩල සාමාජිකයන්හට විදෙස් පුහුණුව ලබාදීම පිණිස මුදල් උපයා ගැනීමට ද තීරණය කොට ඇත.
- පනහ දශකයේ අවසාන භාගයේ ඉදිකළ ප්‍රධාන පුස්තකාලය තුළ නැවත විදුලි රැහැන් ඇදීම අවශ්‍යතාවයක්ව පවතින අතර මේ සම්බන්ධයෙන් ඇතිවිය හැකි හානි හා අනතුරු වළක්වා ගැනීම පිණිස ඉක්මන් පියවර ගතයුතුව ඇත.

## 4 ප්‍රධාන මධ්‍යස්ථාන හා ඒකක

### 4.1 තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය

(අධ්‍යක්ෂ - ආචාර්ය ජේ.වී. විජයකුලසූරිය)

**හැඳින්වීම**

තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලයේ තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ කුසලතා සංවර්ධන වැඩසටහනේ කොටසක් ලෙස 2004 වසරේදී ස්ථාපිත කරන ලදි. ප්‍රථම උපාධි අපේක්‍ෂකයන්ගේ හා විශ්වවිද්‍යාල ප්‍රජාවේ අනෙකුත් සාමාජිකයන්ගේ තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ කුසලතා දියුණු කර ගැනීමේ ඉඩප්‍රස්ථා නිර්මාණය කරදීම මෙම මධ්‍යස්ථානයේ එක් ප්‍රධාන අරමුණකි. මධ්‍යස්ථානය විසින් සැලසුම් කිරීමට නියමිත හා පැවැත්වීමට නියමිත විවිධ අර්ධකාලීන හා නිත්‍ය පුහුණු වැඩසටහන් රාශියක් හරහා මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම අපේක්‍ෂාවයි.

පරිගණක 320ක් පමණ ස්ථානගත කළ හැකි පරිදි සැලසුම් කොට ඇති මෙම මධ්‍යස්ථානය VLAN කීපයක් හරහා එකිනෙකට තත්පරයට මෙගා බයිට්ස් 1000ක් ලැබෙන පරිදි සකසා ඇත. මේ වනවිට තොරතුරු තාක්‍ෂණ මධ්‍යස්ථානය ෆයිල් සර්වරයක්, වෙබ් සර්වරයක්, මේල් සර්වරයක්, ප්‍රොක්ෂි සර්වරයක්, ඩේටාබේස් සර්වරයක් සහ කන්ටෙන්ට් මැනේජ්මන්ට් සර්වරයකින් යුක්ත වේ. අන්තර්ජාල සබඳතාවය තත්පරයට මෙගා බයිට් 20ක් වන අතර එම පහසුකම ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය හරහා ලබාගනී. එමෙන්ම අන්තර්ජාල සබඳතාවය සඳහා එක් DSL රැහැනක්ද පවතී.

**ජයග්‍රහණ**

- අභ්‍යන්තර සිසුන් වෙනුවෙන් පවත්වන තොරතුරු තාක්‍ෂණ ඩිප්ලෝමා වැඩසටහනේ ප්‍රධාන ඉලක්කය ශාස්ත්‍ර පීඨ ප්‍රථම උපාධි අපේක්‍ෂක සිසුන් වන අතර එම වැඩසටහන 2019 වසරේදී ආරම්භ කිරීමට නියමිතය.
- ප්‍රථම උපාධි අපේක්‍ෂක සිසුන් වෙනුවෙන් පවත්වන තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ වැඩසටහන් සහ සාමාන්‍ය ජනයා වෙනුවෙන් පවත්වන කෙටි පාඨමාලා අඛණ්ඩව පවත්වන ලදි. පෙර වසර හා සසඳා බැලීමේදී බාහිර සිසුන් හා විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා කෙටි කාලීන පුහුණු වැඩසටහන් රාශියක්ද පවත්වන ලදි.
- විශ්වවිද්‍යාලය විසින් පරිත්‍යාග කළ මුදල් යොදා ගනිමින් Interactive white Board (Tecteasy – TE – 96FTW) මිලදී ගන්නා ලදි.

**බාධක සහ පිළියම්**

තොරතුරු තාක්‍ෂණ ඩිප්ලෝමා වැඩසටහන පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍ර පීඨයේ ප්‍රථම උපාධි අපේක්‍ෂකයන් සඳහා 2019 වසරේ සිට පැවැත්වීම

**අනාගත සැලසුම්**

මෙම මධ්‍යස්ථානයේ සේවාවන් ප්‍රථම උපාධි අපේක්‍ෂකයන්ට මෙන්ම සාමාන්‍ය මහජනතාව සඳහා ලබාදීමට ද අපේක්ෂිතයි

## 4.2 ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය

(අංශ ප්‍රධාන - ඒ.එන්.එම්. සල්ගාදු මහතා)

### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය අධ්‍යයන සහායක අංශයක් වන අතර එහි ප්‍රධාන අරමුණ වනුයේ ප්‍රථම උපාධි සිසුන්ට අධ්‍යයන, වෘත්තීමය හා සාමාන්‍ය කටයුතු සඳහා අවශ්‍ය ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමයි. මෙම ඒකකය පීඨ නවය වෙනුවෙන්ම ඉංග්‍රීසි පාඨමාලා පවත්වන අතර වර්තමානය වනවිට ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය විවිධ මට්ටමින් පිරිනමනු ලබන ඉංග්‍රීසි පාඨමාලා සඳහා සිසුන් 4500ක් පමණ ලියාපදිංචි වී ඇත. අදාළ පීඨවල අවශ්‍යතාවන්ට අනුව ප්‍රථම, දෙවන හා තෙවන වසරවලදී පාඨමාලා පවත්වනු ලබයි. මෙලෙස පවත්වනු ලබන ඉංග්‍රීසි පාඨමාලා දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි, විශේෂ කටයුතු සඳහා ඉංග්‍රීසි හා ශාස්ත්‍රීය කටයුතු සඳහා ඉංග්‍රීසි ලෙස හැඳින්වේ. ඉංග්‍රීසි භාෂා දැනුම ලබා දෙමින් ප්‍රථම උපාධි අපේක්ෂකයන් බලගන්වනු ලබන විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත්වීම ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකයේ දැක්ම වේ. සිසුන්ට ඔවුන්ගේ අදාළ ක්ෂේත්‍රයන්හි හා අනාගත වෘත්තීන්හි නියැලීමේදී කාර්යක්ෂමව කටයුතු කිරීම සඳහා ඉංග්‍රීසි භාෂා කුසලතා දියුණු කිරීම අපගේ මෙහෙවර වේ. පාසැල් මට්ටමින් තම මව් භාෂාවෙන් අධ්‍යාපනය හදාරා විශ්වවිද්‍යාලයට ඇතුළත් වන නවක ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට තෘතීය මට්ටමේදී ඉංග්‍රීසි භාෂාවෙන් අධ්‍යාපනය ලැබීමට හැකිවන පරිදි ඉංග්‍රීසි භාෂා පන්ති පැවැත්වීම ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකයේ වගකීම වේ. මෙම ඒකකය විසින් දෙයාකාරයක පාඨමාලා පවත්වනු ලබයි. විශ්වවිද්‍යාලයට ඇතුළත්වන අවස්ථාවේ කඩිනම් ඉංග්‍රීසි පාඨමාලාව හදාරන සිසුන්ට ඔවුන්ගේ උපාධි පාඨමාලා ආරම්භ කළ විට එම පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරීමට අවශ්‍ය මූලික නිපුණතාව ලබාදෙයි. කඩිනම් ඉංග්‍රීසි පාඨමාලාව අවසන් වීමෙන් අනතුරුව දෙවනුව අඛණ්ඩ ඉංග්‍රීසි පාඨමාලාව ආරම්භ වේ. සමාසික ක්‍රමය විශ්වවිද්‍යාලයට හඳුන්වාදීමෙන් අනතුරුව කඩිනම් යන වචනය භාවිතා නොකෙරේ. ඒ කෙසේ වෙතත්, සිසුන් විශ්වවිද්‍යාලයට ඇතුළත් වන අවස්ථාවේ සිට ඉංග්‍රීසි භාෂා පාඨමාලා ආරම්භ කොට පවත්වාගෙන යනු ලබයි. ඉංග්‍රීසි භාෂා වැඩසටහනේ පළමු කොටස සති 10ක කාලයක් පුරා පැවැත්වෙන අතර ඒ ඒ පීඨවල අවශ්‍යතා හා නිර්දේශයන්ට අනුව එම කාලය වෙනස් විය හැකිය. අඛණ්ඩ ඉංග්‍රීසි පාඨමාලාවන්ගේ කාල පරාසය අවුරුදු 1-3 දක්වා වෙනස් වේ.

පළමු සමාසික දෙක අවසානයේ පවත්වනු ලබන ඉංග්‍රීසි භාෂා පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සිසුන් ඉංග්‍රීසි භාෂා පංතිවලට සහභාගීවීම අනිවාර්ය වන අතර 80% ක පැමිණීමක් තිබිය යුතුය. ඉංග්‍රීසි පංතිවලට නොකඩවා පැමිණීම තුළින් මනා දැනුමක් ලබාගත හැකි අතර එම පංතිවලට සහභාගි වී සිසුන්ගේ ඉංග්‍රීසි භාෂා නිපුණතාව වැඩිදියුණු කර ගැනීමට දිරිගැන්වීම ද කරනු ලබයි. ඉංග්‍රීසි මාධ්‍ය පංතිවලට සහභාගිවීම සඳහා එම භාෂාවට “A” සාමාර්ථයක් ලබා ගැනීම අනිවාර්ය වේ. පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය කාර්ය මණ්ඩලය හා සිසුන් වෙනුවෙන් ඉංග්‍රීසි වැඩමුළු පැවැත්වීම සඳහාත් මෙම ඒකකයේ යටිතල පහසුකම් දියුණු කිරීම සඳහාත් ලෝක බැංකුව විසින් පිරිනමනු ලබන HETC ප්‍රදාන යොදා ගනු ලබයි. ශාස්ත්‍ර පීඨයේ පාඨමාලා ද ඩිප්ලෝමා මට්ටම දක්වා ඉහළනංවා ඇත.

### ජයග්‍රහණ

IRQUE, HETC වැඩසටහන් සියලු පීඨවල ක්‍රියාත්මක කිරීම UTEL නියමු පරීක්ෂණය පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨයේ තෙවන වසර සිසු කණ්ඩායම වෙනුවෙන් පවත්වන ලදී. කලා, විද්‍යා සහ කළමනාකරණ පීඨවල ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකක ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සංවර්ධන කටයුතු සඳහා ලෝක බැංකුවේ AHEAD ව්‍යාපෘතියේ ප්‍රදාන ලබාගැනීමේදී සාර්ථක විය. කලා පීඨය මේ වනවිට අභ්‍යන්තර සිසුන් වෙනුවෙන් ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලා පවත්වනු ලබයි.

### බාධක සහ පිළියම්

මෙම ඒකකයේ කාර්ය මණ්ඩලයේ ආචාර්යවරුන්/උපදේශකයන් ලෙස ස්ථිරව බඳවා නොගන්නා හෙයින් ඔවුන් වෙනත් විශ්වවිද්‍යාලවලට මාරුවීම් ලබා පිටවයෑම මහත් ගැටලුවකි.

### අනාගත සැලසුම්

ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය අධ්‍යයන අංශයක් මට්ටමට ඉහළනැංවෙමින් පවතින අතර ස්ථිර උපදේශකයන් හා පරිවාස කථිකාචාර්යවරුන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කොට ඇත.

## 4.3 වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය

(අධ්‍යක්ෂ - මහාචාර්ය ඩී.ඒ.එන්. ධර්මසේන)

### හැඳින්වීම

වෘත්තිය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය 2001 වසරේදී නිල වශයෙන් ස්ථාපිත කොට 2005 වසරේදී අර්ධ කාලීන අධ්‍යක්ෂ වරයෙකු විසින් මෙහෙවනු ලබයි. සෑම ශිෂ්‍ය ශිෂ්‍යාවකගේම සැඟවී තිබෙන හැකියාවන් ඉස්මතු කොට ඔවුන්ගේ වෘත්තීය ජීවිතය සංවර්ධනය කිරීම මෙන්ම ජීවිතයේ සෑම පැතිකඩක්ම සහ අනාගතය ගොඩනැගීමට දායකවන ඉඩප්‍රස්ථාවන් උදාකරදීම මෙම ඒකකයේ දැක්ම වේ. එබැවින් සමාජයට හා ජාතික වශයෙන් සෙත සැලසෙන්නාවූත්, පුද්ගලික අධ්‍යාපනික, ආර්ථික හා සමාජ ප්‍රගමනයට මංපෙත් විවර කිරීමට දායක වන්නාවූත් සිසුන්ගේ අත්‍යාවශ්‍ය වෘත්තීමය කුසලතා සංවර්ධනය කරගැනීම පිණිස අවශ්‍ය වන නිසි ක්‍රියාමාර්ග සැලසුම් කරගැනීමට සිසුන්ව පුහුණු කිරීම හා ඔවුන්ගේ හැකියාවන් අවබෝධ කරගැනීමට සහායවීම මෙම ඒකකයේ ප්‍රධාන කෘත්‍යයන් වේ. එමෙන්ම මෙම ඒකකය උපකුලපති තුමාගේ සහ නියෝජ්‍ය උපකුලපතිතුමාගේ උපදෙස් මත මේ සඳහාම වෙන් වූ යෝජිත උපදේශන ඒකකය විශ්වවිද්‍යාලය තුළ ස්ථාපිත කරන තෙක් සිසුන්ට මනෝවිද්‍යා උපදේශනය ලබාදීම සඳහා එහි සේවාවන් පුළුල් කොට ඇත. බාහිර වැඩ ලෝකයේ සහයෝගය ඇතිව පීඨ හා අධ්‍යයන දෙපාර්තමේන්තු සමඟ සහයෝගීතාවයෙන් යුතුව අපගේ දැක්ම කරා ළඟාවීම අපගේ වාර්ෂික සැලසුමේ විෂයපථය වේ. සමාලෝචිත වර්ෂයේදී වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකයේ සේවාවන් සඳහා ඉතා ඉහළ ඉල්ලුමක් පැවති අතර ප්‍රථම උපාධි අපේක්ෂකයන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩමුළු 43ක් (මෙය පෙර වසර හා සසඳා බැලීමේදී 59%ක වැඩිවීමකි) කර්මාන්ත සමඟ රැකියා සහ උපාධිධාරී අන්තේවාසික ව්‍යාපෘති, එක් ජාත්‍යන්තර හැකියා සංවර්ධන ක්‍රියාකාරකමක් සහ ප්‍රථම උපාධි අපේක්ෂකයන් 252 දෙනෙකු සඳහා උපදේශනය ද පවත්වන ලදි. මේ අතර සුළු ප්‍රමාණයේ රැකියා පොලක් පවත්වන්නට යෙදුන අතර ඒ සඳහා සහභාගී වූ සිසුන් සංඛ්‍යාව 49ක් තරම් සුළු ප්‍රමාණයකි. මෙම ඒකකය ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සහයෝගය ඇතිව උපාධිධාරීන් සහ ප්‍රථම උපාධි අපේක්ෂකයන් සඳහා ස්වයං රැකියා ව්‍යාපෘති 35ක් ආරම්භ කිරීමට සමත්විය. ඉහත කරුණුවලට අමතරව මෙම ඒකකය චිත්තවේගී කම්පනයන් හේතුවෙන් මනෝවිද්‍යා උපදේශනය අවශ්‍ය කළ බොහෝ සිසුන් පිරිසකට එම සේවාවන් ලබාදීම සහ ඔවුනගේ අධ්‍යයන ක්‍රියාවලියට හා ජීවන අභියෝගයන්ට මුහුණදීම සඳහා අවශ්‍ය කරන නිපුණතාවන් සංවර්ධනය කරදීමට පහසුකම් සැලසීම අතිසාර්ථකව සිදුකරන ලදි.

ශිෂ්‍ය සුබසාධනය උදෙසා සම සහායක නායකත්ව කණ්ඩායමක් ලෙස සේවය කිරීම සඳහා මෙම ඒකකය විසින් ස්ථාපිත කළ "රොබරෝසියා" ශිෂ්‍ය සංගමය හරහා සාමාන්‍ය මහජනතාව වෙනුවෙන් ද මෙහි සේවාවන් දීර්ඝ කරන ලදි. එම සංගමයේ දෙවන සිසු කණ්ඩායම සමාජ සේවකයන් ලෙස සේවය සැලසීම සඳහා මෙම ඒකකයේ සෘජු අධීක්ෂණ යටතේ පුහුණු කරන ලදි. තව ද වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය විශ්වවිද්‍යාලයට සම්බන්ධ මනෝවිද්‍යා උපදේශනය වෙනුවෙන් කැප වූ ඒකකයක් ස්ථාපිත කිරීමට ද මූලිකත්වය ගෙන කටයුතු කළ අතර ඒ සඳහා වන යෝජනාව උපකුලපති වෙත බාරදී එහි කටයුතු මේ වනවිට ක්‍රියාත්මක වේ. 2019 වසර සඳහා මෙම ඒකකයේ වෘත්තීය මාර්ගෝපදේශන කටයුතු සැලසුම් කිරීමට හා විධිමත් කිරීම සඳහා එහි වෘත්තීය මාර්ගෝපදේශන උපදේශක මණ්ඩලයේ ප්‍රථම රැස්වීම පවත්වන ලදි. සිසුන් 25 දෙනෙකු පමණ සාමාජිකත්වය දරණ "Gavel" සමාජයක් පිහිටුවා එහි පුහුණු කිරීම් කටයුතු මේ වනවිට ක්‍රියාත්මකව පවති. එමෙන්ම මෙම ඒකකය හා සිසුන් අතර වඩාත් ඵලදායි සන්නිවේදනය පිණිස ශිෂ්‍ය නියෝජිත කණ්ඩායමක් පිහිටුවන ලදි. විශ්වවිද්‍යාලයේ සෑම අධ්‍යයන අංශයකින්ම එක් ශිෂ්‍යයෙකු මෙම කණ්ඩායම නියෝජනය කරනු ලබයි. මෙම අංශයේ වෙබ්අඩවිය සංවර්ධනය කිරීම ආරම්භ කොට එහි කටයුතු අවසන් වීමට නියමිතව පවතී. වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකයේ මුහුණු පොත සිසුන් අතර ජනප්‍රිය වී එහි සාමාජික සංඛ්‍යාව පස්ගුණයකින් වර්ධනය වී දසදහස (10000) දක්වා ළඟාවෙමින් පවති. මෙම මුහුණු පොත හරහා අන්තේවාසිකත්ව රැකියා පුරප්පාඩු පුහුණු වැඩසටහන් ආදිය පිළිබඳ තොරතුරු සන්නිවේදනය වනහෙයින් එහි ජනප්‍රිය වී ඇත.

### ජයග්‍රහණ

- වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය පුහුණු ක්‍රියාකරකම් 43ක් පවත්වා ඇති අතර කර්මාන්ත සම්බන්ධිත වැඩසටහන් 20ක්, එක් ප්‍රජා සේවා වැඩසටහනක් පවත්වන්නට විය. එම ක්‍රියාකාරකම්වල විස්තර පහතින් දැක්වේ.
- පුද්ගලික අංශයේ සහයෝගය ඇතිව රැකියා පොලක් පවත්වන ලදි. ශිෂ්‍ය නායකයන් වෙනුවෙන් නායකත්ව පුහුණු වැඩසටහනක් පවත්වන ලදි.

- මහ සමාජයට කරනු ලබන සේවාවන් වශයෙන් පාසල් ළමුන් සඳහා වෘත්තීය සංවර්ධන වැඩසටහන් ද පාසල් ගුරුවරුන් සඳහා වෙනත් වැඩසටහන් දෙකක් ද පවත්වන ලදි.
- කෘෂි විද්‍යා පීඨයේ තරුණ තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙනුවෙන් 2018 වසරේ දී හඳුන්වාදීමේ වැඩසටහනක් පවත්වන ලදි.
- ආවරණ ලිපි ලිවීම, ජීව දත්ත සැලසීම, රැකියාවන් සෙවීමේ උපක්‍රම සහ සම්මුඛ පරීක්ෂණවලට මුහුණදීමේ කුසලතා පිළිබඳ වැඩමුළු මාලාවක් පවත්වන ලදි.
- කම්කරු හා වෘත්තීය සංගම් සබඳතා අමාත්‍යාංශයේ සහයෝගීතාවෙන් "ඔබ අසිරිමත්ය" යන තේමාව යටතේ මෘදු කුසලතා සංවර්ධනය පිළිබඳ වැඩමුළු දෙකක් පවත්වන ලදි.
- ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරියේ සහයෝගීතාවෙන් "ඔබේම ව්‍යාපාරයක් අරඹන්න" යන තේමාව යටතේ ප්‍රථම උපාධි අපේක්ෂකයන්ගේ සහ විශ්වවිද්‍යාල උපාධිධාරීන්ගේ ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳ වෘත්තීය පුහුණු වැඩසටහන් පවත්වන ලදි.
- සන්නිවේදනය හා ජනතාව ඇමතීමේ කථිකත්වය දියුණු කිරීම සඳහා නව "Gavel" සමාජයක් ස්ථාපිත කරන ලදි.
- සිසුන් හා වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය අතර සන්නිවේදනය වඩාත් ඵලදායි කිරීමේ වැඩසටහන් පවත්වන ලදි.
- චීනයේ පැවැත්වූ හැකියාවන් සංවර්ධන තරඟයට සහභාගී වීම සඳහා සිසුන් පස්දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් යැවීමට මෙම ඒකකයට හැකි විය.
- අදාළ වර්ෂයේදී මෙම ඒකකය ප්‍රමාණයෙන් කුඩා වූවත් පුද්ගලයන් 3463 දෙනෙකුට සේවාවන් සපයන ලදි.
- වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ මුහුණු පොත හරහා තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා ශිෂ්‍ය සබඳතා සැලකිය යුතු මට්ටමින් දියුණු කරන ලදි.

### බාධක සහ පිළියම්

මෙම ඒකකය විසින් පවත්වන ලද වැඩසටහන්වල බලපෑම මෙතෙක් නියමාකාරයෙන් ඇගයීමට ලක්කොට නොමැත. මෙම ඇගයීම සඳහා උපාධි ලබාගැනීමෙන් පසු සහන කාලයක් අවශ්‍ය වේ. මෙම ඒකකයේ වෙබ් අඩවිය සංවර්ධනය කිරීම ආරම්භ කළ ද වෙනත් සම්බන්ධිත සේවා මධ්‍යස්ථානවලින් සහයෝගය නොලද හෙයින් එය අපේක්ෂිත ආකාරයෙන් අදාළ වසරේදී අවසන් කිරීමට නොහැකි විය. එමෙන්ම උපදේශක මණ්ඩලය හරහා උපාධිධාරීන් රැකියාවන්වල නියුක්ත කරවීම හා විවිධ පීඨවල ඒ සම්බන්ධ ගැටලු පිළිබඳ සොයා බලා පහසුකම් සැපයීමට පියවර ගෙන තිබුණ ද පීඨවලින් ලද අඩු සහයෝගය හේතුවෙන් එය සාර්ථක නොවීය. සිසුන්ට අවශ්‍ය විමර්ශන ද්‍රව්‍ය මිලදී ගැනීමට සැලසුම් කළත් එම ද්‍රව්‍ය මේ වනවිටත් පුස්තකාලයෙන් ලබාගත හැකි හෙයින් එම තීරණය වෙනස් කරන ලදි.

### අනාගත සැලසුම්

විශ්වවිද්‍යාලයට ඇතුළත්වන නවකයන්ට වෘත්තීය සංවර්ධනය හා උපාධිධාරීන් රැකියාවන්හි නියුක්ත කරලීමේ ඉඩප්‍රස්ථා ඉහළ නැංවීම පිණිස ඒ හා සම්බන්ධ වූ රැකියා කුසලතා සංවර්ධනය කරගැනීම පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම සඳහා විධිමත් හා නිත්‍ය වාර්ෂික ක්‍රියාකාරකම් වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය සතුව පවතී. ඊට අමතරව මෙම ඒකකය ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරිය හා බ්‍රිතාන්‍ය සභාව සමග සහයෝගීතාවකින් ස්වයං-රැකියා දිශානුයෝජන ව්‍යාපෘති පුළුල් කිරීමේ ක්‍රියාවලියකද නිරත වේ. තව ද සිසුන්ගේ විවේක කාලවලදී ඔවුන්ගේ මෘදු කුසලතා ස්වයං ඉගෙනුම් ක්‍රමය ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාවලියක ද මෙම ඒකක නිරතව සිටින අතර ඊට අවශ්‍ය පෙළගැස්වීම් මේ වනවිට ක්‍රියාත්මක වේ.
ඉදිරි කාලයේදී මෙම ඒකකයේ වෙබ් අඩවිය වැඩිදියුණු කොට ඒ හරහා වෘත්තීය හා සම්බන්ධ තොරතුරු පිළිබඳ සිසුන් දැනුවත් කිරීමට ද සැලසුම් සකස් කෙරේ. රැකියා අවස්ථා පිළිබඳ තොරතුරු සිසුන් වෙත පීඨ මට්ටමින් ලබාදීමට දිරිගැන්වීම් කරන අතර එම දත්ත පදනම් කොටගෙන වෘත්තීය සිතියම් සකස් කිරීමද කඩිනම් කරනු ඇත. ඉහත කටයුතුවලට අමතරව ශිෂ්‍ය සංගම්/නියෝජිතයන්ගේ අදහස් ලබාගනිමින් ඉදිරි කටයුතු සංවර්ධනය කිරීමටත් වෘත්තීය සංවර්ධන ක්‍රියාකාරකම් සංවිධානය කොට පැවැත්වීමේදී ඔවුන්ගේ ක්‍රියාශීලි සහභාගීත්වය ලබාගැනීමටත් කටයුතු කරනු ඇත. එපමණක් නොව වාත්තීය උපදේශන මණ්ඩලයේ සහ විශ්වවිද්‍යාල පාලක සභාවේ සහයෝගයෙන් ස්වයං ඉගෙනුම් කාමරයක්, හැකියා සංවර්ධනය සඳහා සාකච්ඡා කාමරයක් වැනි අංශ ඇතුළත් පහසුකම් හා සේවාවන් සැපයීම පිණිස මෙම ඒකකයේ සමහර යටිතල පහසුකම් පුළුල් කිරීමට ද සැලසුම් කෙරේ.
උපාධිධාරීන් රැකියාවන්හි නියුක්ත කරලීම පිළිබඳ ජාත්‍යන්තරව පවතින ප්‍රවණතා පිළිබඳ සොයා බැලීම පිණිස වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය සහ විශ්වවිද්‍යාල ව්‍යාපාරික සංසදය සමඟ සමීපව කටයුතු කරනු ඇත.

## 4.4 දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය

(අධ්‍යක්ෂ - මහාචාර්ය එම්. පින්නවල)

### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය රාජ්‍ය විශ්වවිද්‍යාලවල දැඩි තරඟකාරිත්වයකින් යුත් අභ්‍යන්තර උපාධි වැඩසටහන් හදාරන්නට අවස්ථාවක් නොලද සිසුන් වෙනුවෙන් දශක ගණනාවක් පුරා විවෘත හා දූරස්ථ ඉගෙනුම් ක්‍රම මගින් උපාධි ලබා ගැනීමට අවස්ථාව උදාකර දෙනු ලබයි. මෙලෙස සියල්ලන්ටම අධ්‍යාපනය හැදෑරීමේ අවස්ථාව උදාකරනු ලබන්නේ උපාධි වැඩසටහන් මගින් පමණක් නොව සහතික පත්‍ර හා ඩිප්ලෝමා පාඨමාලා කිහිපයක් පැවැත්වීම තුළින් ද ඒ උතුම් කාර්යය ඉටුකරදීමට අපට හැකිවී ඇත.

වර්තමානය වනවිට මෙම මධ්‍යස්ථානය සහතික පත්‍ර හා ඩිප්ලෝමා වැඩසටහන් කිහිපයක් සංවර්ධනය කොට හඳුන්වාදී ඇති අතර එතුළින් දැනුම කුසලතා හා ආකල්පවලින් හෙබි වෘත්තිමය ලෝකයට මනාලෙස යෝග්‍යවන සිසුන් පිරිසක් බිහිකිරීම අරමුණයි. මෙම අරමුණ සාක්ෂාත් කරගනු පිණිස විශ්වවිද්‍යාල විද්වතුන් හා මෙම ආයතනයේ සිසුන් අතර අන්තර් ක්‍රියාකාරිත්වය වැඩිකිරීම සඳහා පියවර ගෙන ඇත. මෙම අන්තර් ක්‍රියාකාරිත්වය ද්විත්ව ආකාරයට එනම් මුහුණට මුහුණ හමුවීම හා මාර්ගගත ක්‍රමයට (online mode) සිදුවේ. ඉදිරි අනාගතයේදී ද මෙවැනි අන්තර් ක්‍රියාකාරිත්වයන් වැඩිකර ගැනීම කෙරෙහි පවතින වෙනත් මංපෙත් විවරකර ගැනීමේ ගවේෂණයක ද නිරත වන්නෙමු.

### ජයග්‍රහණ

2018 වර්ෂයේදී දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය විසින් සිදුකරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් ලැයිස්තුව.

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය පහත ලැයිස්තුගත කොට ඇති ආකාරයට ජයග්‍රහණ රාශියක් අත්කරගෙන ඇත.

- මෙම මධ්‍යස්ථානය නවදිල්ලි නුවර පිහිටි ආසියාව සඳහා වන පොදුරාජ්‍ය මණ්ඩලීය අධ්‍යාපන මාධ්‍ය මධ්‍යස්ථානයේ සහයෝගය ඇතිව ව්‍යාපාර පරිපාලනවේදී උපාධියේ විෂය නිර්දේශය සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදි. මේ අතර හැකියාවන් ගොඩනැගීමේ වැඩමුළුවේ සමාරම්භක උත්සවය මාර්තු 23 දින මහනුවර ඕක් රේ රිජෙන්සි හෝටලයේදී පවත්වන ලදි. මෙහි ප්‍රධාන වැඩමුළුව මාර්තු 24-27 දින දක්වා පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේදී පැවැත්වූ අතර ඉහත සඳහන් කළ අධ්‍යාපන මාධ්‍ය මධ්‍යස්ථානය නියෝජනය කරමින් මහාචාර්ය කරුණේශ් සසේනා එහි එක් සම්පත්දායක පුද්ගලයෙකු විය.

- කළමනාකරණ හා සංවර්ධන ඩිප්ලෝමා වැඩසටහන - 2018 සඳහා ලියාපදිංචි වූ නවක සිසුන්ගේ දිසානුයෝජන වැඩසටහන සංවිධානය කොට මාර්තු 05 දින ශාස්ත්‍ර පීඨ කලාගාරයේදී පවත්වන ලදි.

- කළමනාකරණ හා සංවර්ධන ඩිප්ලෝමා වැඩසටහන 2016/2017 සහතික පත්‍ර ප්‍රදානය කිරීමේ උත්සවය අගෝස්තු 28 දින පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය සනාතන මන්දිර ශාලාවේදී පවත්වන්නට යෙදුන අතර එහිදී සිසුන් 70 දෙනෙකුට ඩිප්ලෝමා ප්‍රදානය කරන ලදි.

- ව්‍යාපාර පරිපාලනවේදී (මාර්ගගත) උපාධි වැඩසටහන-2018 සඳහා ලියාපදිංචි වූ නවක සිසුන්ගේ දිශානුයෝජන වැඩසටහන නොවැම්බර් 25 දින මෙම මධ්‍යස්ථානයේ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදි.

- බාහිර උපාධිධාරීන්ගේ නවවැනි උපාධි ප්‍රදානෝත්සවය-2017 දෙසැම්බර් 06වැනි දින මහනුවර පොල්ගොල්ල සමූපකාර සංවර්ධන ජාතික ආයතනයේ මහින්ද රාජපක්ෂ ශ්‍රවණාගාරයේදී පැවැත්වූ අතර එහිදී උපාධිලාභීන් 1026 දෙනෙකු ශාස්ත්‍රවේදී හා ව්‍යාපාර පරිපාලනවේදී උපාධි ලබාගත්හ.

- දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් එළිමහන් පුහුණු වැඩසටහනක් නොවැම්බර් 16-17 දිනවල මොරටුව ඇක්වා පර්ල් ලේක් රිසෝට්හිදී පවත්වන ලදි.

**ක්‍රියාකාරකම්**

පහත සඳහන් උපාධි හා ඩිප්ලෝමා/සහතික පත්‍ර වැඩසටහන් පිළිබඳව නොවැම්බර් මාසයේදී පුවත්පත් දැන්වීම් පළකරන ලදි.

- ශාස්ත්‍රවේදී බාහිර උපාධි සාමාන්‍ය වැඩසටහන-2018 නව විෂය නිර්දේශය
- කළමනාකරණ හා සංවර්ධන ඩිප්ලෝමාව
- ව්‍යාපෘති කළමනාකරණ ඩිප්ලෝමාව
- ව්‍යවසායකත්වය හා ව්‍යාපාර සංවර්ධන සහතික පත්‍ර පාඨමාලාව

**ලියාපදිංචි කිරීම්**

- ව්‍යාපාර පරිපාලනවේදී (මාර්ගගත) උපාධි වැඩසටහන සඳහා සිසුන් ලියාපදිංචි කිරීම - 2018 ඔක්තෝම්බර්
- කළමනාකරණ හා සංවර්ධන ඩිප්ලෝමාව සඳහා සිසුන් ලියාපදිංචි කිරීම - 2018 මැයි

**විභාග**

- කලා උපාධි ප්‍රථම පරීක්ෂණය - 2018 ජූනි මස පවත්වන ලදි.
- ශාස්ත්‍රවේදී උපාධිය (බාහිර-නව විෂය නිර්දේශය) 100 මට්ටම 2018 අගෝස්තු මස පවත්වන ලදි.
- ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (පැරණි නිර්දේශය) 2018 දෙසැම්බර්
- ශාස්ත්‍රවේදී උපාධි (බාහිර-නව නිර්දේශය) 100 මට්ටම 2018 නොවැම්බර්

**නව පාඨමාලා හඳුන්වාදීම**

- කළමනාකරණ පීඨය විසින් සංවර්ධනය කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව මෙම මධ්‍යස්ථානය විසින් ලබාගෙන ප්‍රදානය කිරීම
- කළමනාකරණ පීඨය විසින් සංවර්ධනය කළ ව්‍යවසායකත්ව හා ව්‍යාපාර සංවර්ධන සහතික පත්‍ර පාඨමාලාව මෙම මධ්‍යස්ථානය මගින් ලබාගෙන ප්‍රදානය කිරීම
- ඊට අමතරව මෙම මධ්‍යස්ථානය මගින් පිරිනැමීමට නියමිත පහත සඳහන් සහතික පත්‍ර පාඨමාලා/ඩිප්ලෝමා පාඨමාලාවලට අදාළ විෂය නිර්දේශ සූදානම් කරන ලදි.
    - සාමාන්‍ය ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව
    - විද්‍යාගාර හැසිරවීම පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව
    - පෙර පාසැල් ඉගැන්වීම් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
    - විද්‍යාවේදී උපාධි වැඩසටහන

**අනාගත සැලසුම්**

- දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය සඳහා පරිපූර්ණ කළමනාකරණ තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන අතර එතුළින් ශිෂ්‍ය ලියාපදිංචිය, පාඨමාලා සඳහා ලියාපදිංචි වීම, සම්මන්ත්‍රණ හා විභාග පැවැත්වීම, උපාධි ප්‍රදානෝත්සවය ආදි කටයුතු කළමනාකරණය කළ හැකිවේ. එම පද්ධතිය තුළින් සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන කාර්යයේ ප්‍රගතිය නිරීක්ෂණය හා මධ්‍යස්ථානය සමග ඵලදායි ලෙස සන්නිවේදනය කරගැනීමට හැකිවේ.
- නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සඳහා නැවුම් යෝජනාවක් සංවර්ධනය කිරීම
- ව්‍යාපාර පරිපාලනවේදී උපාධි වැඩසටහන සඳහා විෂයමාලා සංශෝධනය සිදුවෙමින් පවතී

## 4.5 පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය

(අධ්‍යක්ෂ - මහාචාර්ය එස්.පී. නිස්සංක)

### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාල පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය එය ආරම්භ වූ 1992 වසරේ සිටම මෙරට ජාතික වශයෙන් පවතින දැවෙන පාරිසරික ගැටලුවලට විසඳුම් සෙවීමේ පුරෝගාමියා ලෙස කටයුතු කරන අතර ඒ සඳහා එක් එක් ක්ෂේත්‍රයන්ට අදාළ විශේෂයන්, ඒ පිළිබඳව උනන්දුවන සිසුන්, ප්‍රමුඛ පෙළේ පාර්ශවකරුවන් හා විශ්වවිද්‍යාලයෙන් පරිබාහිර මහා සමාජයේ සහයෝගීතාවද නොමඳව ලබාගනී.

පරිසර අධ්‍යයන මධ්‍යස්ථානයේ ප්‍රධාන අරමුණු හෙවත් පරමාර්ථ වනුයේ (අ) කෙටි පාඨමාලා, පුහුණු වැඩසටහන් වැඩමුළු, සමුළු ආදිය ප්‍රදානය කරමින් සියළුම මට්ටමේ පාර්ශවකරුවන්ගේ හැකියාවන් වර්ධනය සඳහා පුහුණුව ලබාදීම (ආ) දේශීය සහ කලාපීය වශයෙන් පවතින පාරිසරික ගැටලු පිළිබඳ පර්යේෂණ අධ්‍යනයන්ට සහයෝගය ලබාදීම සහ ගෝලීය වැඩසටහනේ කොටස්කරුවෙකු වීම (ඇ) පරිසරය හා සම්බන්ධ ව්‍යාපෘතිවලට උපදේශන සේවා ලබාදීම ආදිය පැවැත්වීම. එමෙන්ම පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය පරිසරය සම්බන්ධව කටයුතු කරන අංශවල ප්‍රතිපත්ති සමාලෝචනය හා ප්‍රතිපත්ති සකස් කිරීමටද සහාය දක්වන අතර මෙම සියළු කාර්යයන් සිදු කිරීමේදී විශ්වවිද්‍යාලයේ සියළු පීඨවල සහයෝගයත් වෙනත් විශ්වවිද්‍යාල, රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන සංවිධානවල හා පුද්ගලික අංශයේ සංවිධානවල සහයෝගීතාවයත් ලබාගනී.

### ජයග්‍රහණ

**උපදේශන වැඩ**

2018 වසරේදී පහත සඳහන් උපදේශන වැඩ අවසන් කරන ලදි.

- අලි ඇතුන්ගේ ගමන්මග පිළිබඳ ඩිජිටල් සිතියම් සකස් කිරීමේ වනජීවී දෙපාර්තමේන්තුව සමඟ සිදුකළ ව්‍යාපෘතිය
- මන්නාරම සිට යාපනය දක්වා වන වෙරළබඩ තීරයේ වෙසෙන ජනයාගේ ජීවන තත්ත්වය දියුණු කිරීමේ උපක්‍රම සංවර්ධනය පිළිබඳ ව්‍යාපෘතිය
- ඉහළ ඇලහැර ඇල ව්‍යාපෘතියේ යෝජිත උමං මාර්ගවල (උමං අංක 3 හා 4) ජල භූ විද්‍යාත්මක හා භූ තාක්‍ෂණික පැතිකඩ පිළිබඳ සමාලෝචන සිදුකිරීම

**කෙරීගෙන යන උපදේශන වැඩ**

- කොස්ගම කුකුළු සත්ව රෝග පරීක්‍ෂණ පිළිබඳ ඩ්‍රෝන සමීක්‍ෂණය
- තෝරාගත් කෘෂි - පාරිසරික පද්ධතිවල භාවිත කෙරෙන පෝෂකවල කාර්යක්‍ෂමතාවය දියුණු කිරීම
- Development and deployment of persistent bio accumulative topic compiunds

**පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය විසින් සංවිධානය කළ පුහුණු/වැඩමුළු/සමුළු**

- "කර්මාන්ත ආරක්‍ෂණය, හදිසි අවස්ථාවන්ට සූදානම්වීම හා පාරිසරික කළමනාකරණය" පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවන් 2017 ඔක්තෝම්බර් මාසයේදී ආරම්භ කොට රසායනික ආයුධ පිළිබඳ සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා වන ජාතික අධිකාරිය සහ වෙළඳ හා වාණිජ අමාත්‍යාංශයේ සහයෝගීතාවයකින් පවත්වන ලදි. (මාස හතරක් සෙනසුරාදා දිනවල පමණි) එහි සහතික පත්‍ර ප්‍රදාන උත්සවය 2018 ජූනි 16 දින පවත්වන ලදි. එම පාඨමාලාවේ ඊළග වටය 2018 ඔක්තෝම්බර් මස ආරම්භ කොට මේ වනවිට ක්‍රියාත්මක වන අතර එය 2019 මැයි මස වනවිට අවසන් කිරීමට අපේක්ෂිතයි.
- "මානව සම්පත් කළමනාකරණය" පිළිබඳ කෙටි පාඨමාලාවක් 2018 ඔක්තෝම්බර් 27-28 දිනවල පේරාදෙණිය විශ්වවිද්‍යාලයේදී පවත්වන්නට වූ අතර ඒ සඳහා 119 දෙනෙකු සහභාගී වූහ.
- "පරිසර කළමනාකරණ පද්ධතිය ISO 14001:2015" පිළිබඳ කෙටි පාඨමාලාවක් නොවැම්බර් 24-25 දිනවල පේරාදෙණිය විශ්වවිද්‍යාලයේදී පැවැත් වූ අතර ඒ සඳහා 89 දෙනෙකු සහභාගී වූහ.

**පර්යේෂණ ක්‍රියාකාරකම්**

- 2017 වසරේදී මූලිකව ආරම්භ කළ නාඩිතලාව කාලගුණික සොඳුරු ගම්මානයේ සංවර්ධන වැඩසටහන අඛණ්ඩව පවත්වන ලදි. ඊට අමතරව චිරස්ථායි පරිසර කළමනාකරණය සමාජ ආර්ථික සමීක්ෂණයක් (මැයි-ජූනි) සහ සෞඛ්‍ය කඳවුරක්ද (සැප්තැම්බර් 16) පවත්වන ලදි. ඒ පිළිබඳ අවශ්‍යතා හඳුනාගැනීම හා ක්‍රියාකාරකම් සැලසුම්කරණය මේ වනවිට සිදුවෙමින් පවතී.

**බාධක සහ පිළියම්**

- පර්යේෂණ යෝජනා හා උපදේශන වැඩ සඳහා යෝජනා කිහිපයක් බාරදී තිබුණ ද පවතින තරඟකාරී තත්ත්වය හේතුවෙන් එය සාර්ථක කරගත නොහැකි වූ අතර මේ සඳහා බලපෑ ප්‍රධාන හේතුවක් වූයේ විශ්වවිද්‍යාල පරිපාලන වෙනස්කම් හේතුකොට ගෙන ඉහළ ගිය අයවැයයි.
- 2018 වසරේ දී විශ්වවිද්‍යාලය වෙනුවෙන් ISO 14001 සහතිකය අත්කර ගැනීමට මෙම මධ්‍යස්ථානය කටයුතු කරමින් සිටින අතර ඒ සඳහා අවශ්‍ය ලිපිලේඛන සම්බන්ධව පවතින අධික වැඩප්‍රමාණය හේතුවෙන් හා පීඨ විශේෂිත අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාමාර්ග අවසන් කරගැනීමේ දුෂ්කරතාවන් හේතුකොට ගෙන (විශේෂයෙන්ම රසායනික අපද්‍රව්‍ය) එම අරමුණ සාක්ෂාත් කරගැනීමට නොහැකි වූවත් ලබන වසරේදී එය ඉටුකර ගැනීමට අපේක්ෂා කෙරේ.

**අනාගත සැලසුම්**

- පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය විසින් නිතිපතා කරගෙන යනු ලබන සියලුම සහතික පත්‍ර පාඨමාලාවන් ඉතා සාර්ථකව පැවැත්වූ අතර නව පාඨමාලා ද සංවර්ධනය කිරීම
- දැනට කරගෙන යන කර්මාන්ත ආරක්ෂණය පිළිබඳ මාස හතරේ සහතික පත්‍ර පාඨමාලාව ඩිප්ලෝමා පාඨමාලාව දක්වා සංවර්ධනය කිරීම
- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සමග EIA පුහුණු වැඩසටහන පැවැත්වීම
- ශ්‍රී ලංකා මධ්‍යම පරිසර අධිකාරිය හා මහනුවර පළාත් සභාව සමඟ හන්තාන සංරක්ෂණ පෙදෙස ආරක්ෂණය හා වනවගා වැඩසටහන පැවැත්වීම
- අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු/ආයතන සමග එක්ව අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර සමුළුවක් සංවිධානය කිරීම
- කාලගුණික සොඳුරු ගම්මාන සංවර්ධනය වෙනුවෙන් සැලසුම් කළ ක්‍රියාකාරකම් අඛණ්ඩව පවත්වාගෙන යෑම
- මේ වනවිට ආරම්භ කළ උපදේශන වැඩ නොනවත්වා පවත්වාගෙන යෑම හා නව උපදේශන වැඩ සඳහා අවස්ථාවන් සොයා බැලීම
- පේරාදෙණිය විශ්වවිද්‍යාලය සඳහා ISO 14001 සහතිකය අත්කර ගැනීම වෙනුවෙන් ආරම්භ කළ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම

## 4.6 අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ඒකකය

(අධ්‍යක්ෂ - මහාචාර්ය ප්‍රසාද් සේතුංග)

### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ඒකකය අලුතින් නිකුත් කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ අංක 2015/04ට දක්වා ඇති මාර්ගෝපදේශයන්ට අනුව 2016 පෙබරවාරි 15 දින ප්‍රතිස්ථාපනය කරන ලදි. එහි අධ්‍යක්ෂවරයා ලෙස ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඊ.ආර්.එන්. ගුණවර්ධන 2016 මාර්තු 21 දින බලපැවැත්වෙන පරිදි පත්කරන්නට වූ අතර ඔහු සප්ත වාර්ෂික නිවාඩු ලබා පිටත්ව යෑමත් සමග මහාචාර්ය කල්‍යානි පෙරේරා වැඩබලන අධ්‍යක්ෂවරිය ලෙස පත්කළ ද ඇගේ විශ්‍රාම යෑමත් සමග මහාචාර්ය ප්‍රසාද් සේතුංග වර්ෂ තුනක කාලපරිච්ඡේදයක් සඳහා අධ්‍යක්ෂ තනතුරට 2017 පෙබරවාරි 01 දින පත්කරන ලදි.

සැලසුම් කිරීම, සංවිධානය, සම්බන්ධීකරණය, පහසුකම් සැපයීම, ක්‍රියාත්මක කිරීම, නිරීක්ෂණය සහ සියළුම අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ක්‍රියාකාරකම් වාර්තා කිරීම තුළින් විශ්වවිද්‍යාලය තුළ තත්ත්ව සංස්කෘතියක් ප්‍රවර්ධනය කොට ආයතනගත කිරීම අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ඒකකයේ පරමාර්ථය වේ. මෙම වාර්තාවේ අරමුණ වනුයේ 2018 වර්ෂය තුළ විශ්වවිද්‍යාලය තුළ තත්ත්ව සංස්කෘතිය ඉහළනැංවීම සඳහා අප විසින් දියත්කරන ලද ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පිළිබිඹු කොට දැක්වීමයි.

### ජයග්‍රහණ

**කාර්ය සාධනය**

01 කොටස **අ. ත. ආ. ඒකකය ස්ථාපිත කිරීම (10%)**

| | නිර්ණායකය | ක්‍රියාකාරකම්/කාර්යය | ලකුණු | |
|---|---|---|---|---|
| | | | ඉලක්කය | අත්කර ගැනීම |
| 01 කොටස | නිර්ණායක අංක 01 | ඒකකය සඳහා අධ්‍යක්ෂකවරයෙකු පත්කිරීම | 01 | 01 |
| | නිර්ණායක අංක 02 | වෙනත් සාමාජිකයින් පත්කිරීම | 01 | 01 |
| | නිර්ණායක අංක 03 | ඒකකය වෙනුවෙන් ස්ථානයක් ලබාගැනීම | 01 | 01 |
| | නිර්ණායක අංක 04 | ලී බඩු ලබා ගැනීම | 01 | 01 |
| | නිර්ණායක අංක 05 | කාර්යාල උපකරණ ලබාගැනීම | 01 | 01 |
| | නිර්ණායක අංක 06 | අන්තර්ජාල හා දුරකථන පහසුකම් ලබාගැනීම | 01 | 01 |
| | නිර්ණායක අංක 07 | ස්ථිර සහාය කාර්ය මණ්ඩලය පත්කිරීම | 01 | 05 |
| | නිර්ණායක අංක 08 | පීඨ මට්ටමින් ත.ආ. ඒකක පිහිටු වීම. | 01 | 05 |
| | නිර්ණායක අංක 09 | අ.ත.ආ. ඒකකවලට සම්බන්ධීකාරකවරුන් පත්කිරීම | 01 | 01 |
| | නිර්ණායක අංක 10 | සම්බන්ධීකාරකවරුන් අධ්‍යක්ෂවරයා සමග කටයුතු කරන ආකාරය නිර්වචනය කිරීම. | 01 | 01 |
| | **එකතුව** | | **10** | **18** |

02. කොටස **අ. ත. ආ. ඒකකය ආයතනගත කිරීම, මෙහෙයුම්ගතකරණය, බලගැන්වීම සහ ප්‍රවර්ධනය (40%)**

| | නිර්ණායකය | ක්‍රියාකාරකම්/කාර්යය | ලකුණු | |
|---|---|---|---|---|
| 02 කොටස | නිර්ණායක අංක 01 | අ.ත.ආ. ඒකකයේ අතුරු ව්‍යවස්ථා | 4 | 1 |
| | නිර්ණායක අංක 02 | මෙම ඒකකයේ මෙහෙයුම් මාර්ගෝපදේශන | 4 | 3 |
| | නිර්ණායක අංක 03 | වර්ෂ 3ක් සඳහා අ.ත.ආ. ක්‍රියාකාරකම් | 8 | 4 |
| | නිර්ණායක අංක 04 | වාර්ෂික වැඩ සැලසුමක් සැකසීම | 4 | 4 |
| | නිර්ණායක අංක 05 | අ.ත.ආ. ඒකකයේ වාර්ෂික අයවැයක් සැකසීම | 4 | 4 |
| | නිර්ණායක අංක 06 | මෙම ඒකකය සඳහා වෙබ් අඩවියක් ස්ථාපිත කොට පවත්වාගෙන යෑම | 4 | 4 |
| | නිර්ණායක අංක 07 | සනාතන සභා රැස්වීම්වල න්‍යාය පත්‍රයේ ස්ථිර ඉදිරිපත් කිරීම | 3 | 3 |
| | නිර්ණායක අංක 08 | අ.ත.ආ. ඒකකය (අධ්‍යක්ෂ/ සම්බන්ධීකාරකවරුන්) සෑම වසරකම එහි තත්ත්වාරක්ෂණ උපක්‍රම සමස්ත විශ්වවිද්‍යාල ප්‍රජාවට ඉදිරිපත් කිරීම | 5 | 4 |
| | නිර්ණායක අංක 09 | විශ්වවිද්‍යාලයේ තත්ත්වාරක්ෂණ ක්‍රියාකාරකම්වල දැන්වීම් සංසරණය කිරීමේ බලය අධ්‍යක්ෂකට පවරා ඇත. | 04 | 03 |
| | **එකතුව** | | **40** | **30** |

## 03 කොටස තත්ත්වාරක්ෂණ යාන්ත්‍රණය විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක කිරීම (ස්වයං ඇගයීම සකස් කිරීම ඇතුළුව (50%)

| | නිර්ණායකය | ක්‍රියාකාරකම්/කාර්යය | ලකුණු | |
|---|---|---|---|---|
| 03 කොටස | නිර්ණායක අංක 01 | අ.ත.ආ. ඒකකය ආයතනික සමාලෝචන සඳහා SER සැකසීම ආරම්භ කිරීම හා සහායවීම | 05 | 00 |
| | නිර්ණායක අංක 02 | වැඩසටහන් සමාලෝචනය සඳහා අධ්‍යයන වැඩසටහන්වලට සහාය වීම | 05 | 4.5 |
| | නිර්ණායක අංක 03 | අවශ්‍ය පුහුණුව හා වැඩමුළු ලබාදීම | 05 | 04 |
| | නිර්ණායක අංක 04 | තත්ත්වාරක්ෂණ කටයුතු මනාලෙස සිදු කෙරෙන බව පෙන්වීමට අධ්‍යයන වැඩසටහන් පෙළඹවීම හා සහායවීම. | 05 | 02 |
| | නිර්ණායක අංක 05 | තත්ත්වාරක්ෂණ ක්‍රියාකාරකම් පිළිබඳව ජාත්‍යන්තර ආයතන හා විශ්වවිද්‍යාල සමග සබඳතා ගොඩනැගීම | 05 | 3.5 |
| | නිර්ණායක අංක 06 | මෙම ඒකකයේ තත්ත්වාරක්ෂණ ප්‍රගතිය මාස තුනෙන් තුනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ථාවර කමිටුවට වාර්තා කිරීම | 05 | 05 |
| | නිර්ණායක අංක 07 | මෙම ඒකකයෙන් වාර්ෂික වාර්තාව වි.ප්‍ර.කො. සභාවේ ත.ආ. හා පැ. සභාව වෙත බාරදීම | 05 | 04 |
| | නිර්ණායක අංක 08 | මෙම ඒකකය විසින් IQAU හා IQUC රැස්වීම් පැවැත්වීම හා පහසුකම් සැපයීම. | 05 | 04 |
| | නිර්ණායක අංක 09 | තත්ත්වාරක්ෂණ අංශ පිළිබඳ අත්පොත සැකසීමට සහායවීම. | 05 | 00 |
| | නිර්ණායක අංක 10 | ශිෂ්‍ය සමීක්ෂණ ඇතුළත් ආයතනික සමාලෝචන වැඩසටහන් සමාලෝචනය, අභ්‍යන්තර සමාලෝචන විශ්වවිද්‍යාලය වෙබ් අඩවිය ඔස්සේ සියළුම කාර්ය මණ්ඩලයට සහ බාහිර පාර්ශවකරුවන්ගේ දැනගැනීමට සැලැස්වීම | 05 | 02 |
| | එකතුව | | 40 | 30 |

## PSC කළමනාකරණ කමිටු රැස්වීම්වල සාර්ථක ජයග්‍රහණ වෙනුවෙන් පවත්වන ලද රැස්වීම්/කාර්යයන්/ක්‍රියාකාරකම්

| දිනය | රැස්වීම | සාමාජික සහභාගිත්වය | | විශේෂ සටහන් |
|---|---|---|---|---|
| | | සහභාගි වූ සංඛ්‍යාව | නොපැමිණි සංඛ්‍යාව | |
| 2018.01.17 | 15වැනි MC රැස්වීම | 15 | 02 | නි.උපකුලපතිතුමාගේ සහභාගීත්වයෙන් |
| 2018.05.16 | 16වැනි MC රැස්වීම | 12 | 05 | අධ්‍යක්ෂකතුමාගේ සහභාගීත්වයෙන් |
| 2018.06.11 | 17වැනි MC රැස්වීම | 12 | 05 | අධ්‍යක්ෂකතුමාගේ සභාපතිත්වයෙන් කර්ට් ලාසන් මහතා හා මහාචාර්ය දීප්ති බණ්ඩාර සහභාගී විය. |
| 2018.08.23 | 18වැනි MC රැස්වීම | 13 | 04 | අධ්‍යක්ෂකතුමාගේ සහභාගීත්වයෙන් |
| 2018.09.12 | 19වැනි MC රැස්වීම | 16 | 01 | උපකුලපතිතුමාගේ සහභාගීත්වයෙන් |
| 2018.10.10 | 20වැනි MC රැස්වීම | 12 | 05 | උපකුලපතිතුමාගේ සහභාගීත්වයෙන් |
| 2018.11.14 | 21වැනි MC රැස්වීම | 09 | 08 | අධ්‍යක්ෂකතුමාගේ සහභාගීත්වයෙන් |
| 2018.12.12 | 22වැනි MC රැස්වීම | 13 | 04 | නි.උපකුලපතිතුමාගේ සහභාගීත්වයෙන් |

මෙම වසරේදී MC රැස්වීම් අටක් පැවැත් වූ අතර එයින් රැස්වීම් දෙකක සභාපතිත්වය උපකුලපතිතුමා විසින් ද රැස්වීම් තුනක සභාපතීත්වය නියෝජ්‍ය උපකුලපතිතුමා විසින් ද දරන ලදි.

## අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ඒකකය විසින් පවත්වන ලද තත්ත්වාරක්ෂණ ක්‍රියාකාරකම්
## ස්වයං - ඇගයීම් වාර්තා ලිවීම පිළිබඳ දෙදින වැඩමුළුව

අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ඒකකය ස්වයං-ඇගයීම් වාර්තා ලිවීම පිළිබඳ දෙදින වැඩමුළුවක් ඔක්තෝම්බර් 25-26 දින දෙක තුළ ශාස්ත්‍ර පීඨයේ අධ්‍යාපන අධ්‍යයන අංශයේ ප්‍රධාන ශාලාවේදී පවත්වන ලදි. ස්වයං ඇගයීම් වාර්තා රචකයන්ට ඒ පිළිබඳ ප්‍රායෝගික දැනුම ලබාදීම මෙම වැඩමුළුවේ අරමුණ විය. මෙය කෘෂි විද්‍යා, සම සෞඛ්‍ය, දන්ත වෛද්‍ය, වෛද්‍ය සහ පශු වෛද්‍ය යන පීඨවලට අදාළ වූ අතර එම ඇගයීම් 2019 වසරේදී සමාලෝචනයට ලක්වනු ඇත. ඉහත සඳහන් කළ පීඨවල අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 55 දෙනෙකු මෙම වැඩමුළුවට සහභාගී විය. මහාචාර්ය හරිස්චන්ද්‍ර අබේගුණවර්ධන සහ මහාචාර්ය කල්‍යාණි පෙරේරා මෙම වැඩමුළුවේ සම්පත්දායක පුද්ගයන් ලෙස සහභාගී වූහ.

**තත්ත්වාරක්ෂණ ක්‍රියාකාරකම් පිළිබඳව සිසුන් දැනුවත් කිරීම සඳහා පැවැත්වූ වැඩමුළුව**

අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ඒකකය තත්ත්වාරක්ෂණ ක්‍රියාකාරකම් පිළිබඳව සිසුන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2018 දෙසැම්බර් 10 දින පෙ.ව. 8.00 සිට පවත්වන්නට විය. පීඨ නවයට අයත් ශිෂ්‍ය නියෝජිතයන්ට මේ සඳහා ආරාධනා කළ අතර එම පීඨ නියෝජනය කරමින් සිසුන් 45 දෙනෙකු ඊට සහභාගී වූහ. තත්ත්වාරක්ෂණ ක්‍රියාකාරකම් සම්බන්ධව සිසුන් දැනුවත් කිරීම මෙම වැඩමුළුවේ ප්‍රධාන අරමුණ විය. තවද, විශ්වවිද්‍යාල තුළ තත්ත්වාරක්ෂණ සංස්කෘතියක් සංවර්ධනය කිරීම සඳහා සිසුන්ගේ කාර්යභාරය පිළිබඳවද මෙහිදී ඔවුන් දැනුවත් කරන ලදි. වැඩමුළුව සැසි දෙකකින් යුක්තව වූ අතර ඒ සඳහා පහසුකම් සපයන ලද්දේ මහාචාර්ය ප්‍රසාද් සේතුංග හා මහාචාර්ය බී.ඒ.එන්. එරන්ද විසිනි. ප්‍රතිපෝෂණ සැසියක් ද මෙම වැඩමුළුවට ඇතුළත් වූ අතර සියළුම සිසුන් ඔවුන්ගේ අදහස් හා යෝජනා ගෙනහැර දක්වමින් ක්‍රියාශීලිව ඊට සහභාගී වූහ. වැඩමුළුව අවසානයේදී ලිඛිත ප්‍රතිපෝෂණ ආකෘති පත්‍ර එක්රැස් කරගන්නා ලදි.

**පීඨ තත්ත්වාරක්ෂණ සංසද විසින් පවත්වන ලද තත්ත්වාරක්ෂණ ක්‍රියාකාරකම්**

| පීඨ ත.ආ. සංසදය | ක්‍රියාකරකම්/කාර්යයන් |
|---|---|
| කෘෂි විද්‍යා | සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන |
| | අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන |
| | අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන |
| සම සෞඛ්‍ය විද්‍යා | අධ්‍යයන කාර්ය මණ්ඩලය තත්ත්වාරක්ෂණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළුව |
| | අධ්‍යයන අංශවල අධ්‍යයන කාර්යමණ්ඩල සඳහා විෂයමාලා සංශෝධනය පිළිබඳ වරුවක වැඩමුළුව |
| | අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ස්වයං ඇගයීම් වාර්තා ලිවීම පිළිබඳ වරුවක වැඩමුළුව |
| | අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ස්වයං ඇගයීම් වාර්තා ලිවීම පිළිබඳ වරුවක වැඩමුළුව |
| | අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා තත්ත්වාරක්ෂණ ක්‍රියාකාරකම් පිළිබඳ වැඩමුළුව |
| | ඖෂධවේද අධ්‍යයන අංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා විෂයමාලා සංශෝධනය පිළිබඳ එක්දින වැඩමුළුව |
| | ඖෂධවේද අධ්‍යයන අංශය විසින් සංවිධානය කළ විෂයමාලා සංශෝධනය පිළිබඳ දෙවන වැඩමුළුව |
| | ඖෂධවේද අධ්‍යයන අංශය විසින් කාර්ය මණ්ඩලය සඳහා සංවිධානය කළ තත්ත්වාරක්ෂණය පිළිබඳ වරුවක වැඩමුළුව |
| | එම අධ්‍යයන අංශය විසින් කාර්ය මණ්ඩලය සඳහා සංවිධානය කළ තත්ත්වාරක්ෂණ ක්‍රියාකාරකම් පිළිබඳ එක්දින වැඩමුළුව |
| කලා | වාණිජවේදී හා නීතිවේදී උපාධි සඳහා ස්වයං ඇගයීම් වාර්තා ලිවීම පිළිබඳ රැස්වීමක් |
| කළමනාකරණ | අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් |
| | ව්‍යාපාර පරිපාලනවේදී උපාධි වැඩසටහන් තෙවන වසර සිසුන් සඳහා එළිමහන් පුහුණු වැඩසටහන |
| වෛද්‍ය | අධ්‍යයන කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ කාර්යමණ්ඩල වැඩසටහන |
| විද්‍යා | අනධ්‍යයන කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ දින භාගයේ වැඩසටහන |
| | අධ්‍යයන කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ කාර්ය මණ්ඩල වැඩසටහන |
| පශු වෛද්‍ය සත්ව හා විද්‍යා | ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන්ගේ කර්මාන්ත පදනම් කරගත් පුහුණුව දියුණු කිරීම පිණිස කර්මාන්ත - පීඨ සම්බන්ධතා විධිමත් කිරීම පිළිබඳ වැඩමුළුව |
| | ඵලදායි ආකාරයෙන් ලේඛන පිරවීම හා දත්ත කළමනාකරණය පිළිබඳ වැඩමුළුව |
| | පශු වෛද්‍ය පීඨයේ ස්වයං ඇගයීම් වාර්තා ලිවීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන |
| | වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂණය පිළිබඳ වැඩමුළුව |
| | ශිෂ්‍ය තක්සේරු ක්‍රියාමාර්ග සංවිධානය කිරීම පිළිබඳ වැඩමුළුව |

**බාධක සහ පිළියම්**

වර්ෂය ආරම්භයේදී දිගින් දිගටම වර්ජන පැවතීම හේතුවෙන් අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ඒකකයට හා පීඨ තත්ත්වාරක්ෂණ සංසදවලට කිසිදු ක්‍රියාකාරකමක් හෝ වැඩසටහනක් වර්ෂාරම්භයේදී පැවැත්වීමට නොහැකි වු අතර එය අපගේ වාර්ෂික කාර්ය සාධනයට බාධකයක් විය. මූල්‍යමය සහයෝගය ලැබීම ප්‍රමාදවීම මුල්කොට ගෙන මෙම වැඩසටහන් වලින් බොහොමයක් පවත්වන ලද්දේ වර්ෂාවසානයේදීය. තවද මෙම ඒකකය සතුව දැනට අර්ධකාලීන කාර්ය මණ්ඩලයක් සිටින හෙයින් සමහර කටයුතු සිදුකිරීමේදී ප්‍රමාදයක් සිදුවේ. එමෙන්ම බොහෝ දෙනෙකු මෙම සංකල්පයට නවක වන හෙයින් වැරදි අවබෝධ ඇතිකරගැනීම් සිදුව ඇත. මෙහිදි විශේෂයෙන්ම වැඩසටහන් සමාලෝචන ක්‍රියාවලිය පිළිබඳ සිසුන්ට නිසි අවබෝධයක් නොමැත. සමහර අවස්ථාවලදී සමාලෝචන කණ්ඩායම් සමග අතිශයෝක්තිය මුල්කරගත් අදහස් දැක්වීමටත් සමහර පුද්ගලයන්ට ගැටලු ඇතිවිය හැකි විසඳුම් ලබාදීමටත් ඉදිරිපත් වේ. මේනිසා මේ තුළින් අත්කර ගන්නේ කුමක් ද යන්න පිළිබඳව සිසුන් තවදුරටත් දැනුවත්කොට මෙම සමාලෝචන ක්‍රියාවලියට අව්‍යාජ අදහස් සහ අදහස් දැක්වීම් පමණක් අවශ්‍ය බව ඔවුන්ට ඒත්තු ගැන්වීම අවශ්‍ය බව මෙම ඒකකයේ වැටහීමයි.

**අනාගත සැලසුම්**

- තත්ත්වාරක්ෂණ ක්‍රියාකාරකම් පිළිබඳව සිසුන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් පැවැත්වීමත් පීඨ මට්ටමින් වැඩසටහන් සමාලෝචනය කිරීමේ වැඩසටහන් පැවැත්වීමත් අවශ්‍ය වේ
- තත්ත්වාරක්ෂණ ක්‍රියාකාරකම් දිවයින පුරා ප්‍රචාරණය කිරීම හා ඒවායේ වැදගත්කම පිළිබඳව අධ්‍යයන කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ඒකක සඳහා අතුරු ව්‍යවස්ථා ඇතුළත් ප්‍රතිපත්ති ලේඛන සැකසීම
- අධ්‍යයන කාර්ය මණ්ඩලය, අනධ්‍යයන කාර්ය මණ්ඩලය සහ සිසුන් සමග පවත්වන විවිධ වැඩමුළුවල ප්‍රතිපෝෂණ සැසිවලින් මතුවන ගැටලුවලට විසඳුම් සෙවීම පිළිබඳව ඉහළ කළමනාකරණය සමග සාකච්ඡා කිරීම

## 4.7 ජාත්‍යන්තර කටයුතු කාර්යාලය

(අධ්‍යක්‍ෂ - ආචාර්ය කේ.බී.එස්.එන්. ජිනදාස (වැ.බ.)

### හැඳින්වීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2011 වසරේදී ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල හයක් ලෝක මට්ටමේ විශ්වවිද්‍යාල බවට පත්කිරීමේ යෝජනාවක් ඉදිරිපත් කොට තෝරාගත් විශ්වවිද්‍යාල හයෙන් යෝජනා කැඳවා මෙම වැඩසටහන යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් එක් එක් විශ්වවිද්‍යාලයට මුදල් ප්‍රතිපාදන වෙන් කරන ලදි. 2011 ජුනි මස 25 දින පැවැත් වූ පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය 397වැනි පාලක සභා රැස්වීමේදී බහු ක්ෂේත්‍ර පර්යේෂණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා යෝජනාවක් ගෙන එන ලදි. ඒ අනුව 2012 වසරේදී ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පිහිටුවීමෙන් අනතුරුව 2017 වසරේ සැප්තැම්බර් මාසයේදී එය ජාත්‍යන්තර කටයුතු පිළිබඳ කාර්යාලය ලෙස පවත්වාගෙන යෑමට පාලක සභාවේ අනුමැතිය ලබාගන්නා ලදි.
පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ගෝලීය දෘෂ්‍යතාව අත්කරගැනීමට හා අධ්‍යයන හා පර්යේෂණයේ විශිෂ්ට මධ්‍යස්ථානයක් ලෙස අනන්‍යතාවය තහවුරු කර ගැනීම පිණිස පහසුකම් සැපයීම මෙම කාර්යාලයේ දැක්ම වේ.
ජාත්‍යන්තර කටයුතු කාර්යාලයේ පාලන අධිකාරිය ලෙස එහි කළමනාකරණ මණ්ඩලය පිහිට වූ අතර එහි ප්‍රථම රැස්වීම 2012 නොවැම්බර් 19 දින පවත්වන ලදි. වර්තමානය වන විට මෙම කාර්යාලයේ කාර්ය මණ්ඩලය වැඩබලන අධ්‍යක්‍ෂවරයෙකු ඇතුළත් සාමාජිකයන් පස් දෙනෙකුගෙන් යුක්ත වන අතර ඒ සියළු දෙනාම ජාත්‍යන්තර කටයුතු පිළිබඳ කාර්යාලයේ දැක්ම සහ මෙහෙවර කරා ළඟාවීමට කැපවී කටයුතු කරනු ලබන අතර එතුළින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සමස්ත සංවර්ධනය වෙනුවෙන් දායකත්වය දක්වයි.
මේ පිළිබඳ වැඩිදුර විස්තර හා තොරතුරු සඳහා https://www/pdn.ac.lk/uop/iao/signmfo.php වෙත පිවිසෙන්න.

### ජයග්‍රහණ

පසුගිය වසර කිහිපය පුරාවට ජාත්‍යන්තර කටයුතු පිළිබඳ කාර්යාලය එහි පරමාර්ථය වන ජාත්‍යන්තරකරණය කරා ළඟාවීම සඳහා විවිධ ක්‍රියාකාරකම්වල නියැළී සිටින අතර පහත සඳහන් කාර්යයන් බාරගෙන ඇත.
ජාත්‍යන්තර කටයුතු පිළිබඳ කාර්යාලය අවබෝධතා ගිවිසුම් හයක් ආරම්භ කොට ඒවා මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. මෙම අවබෝධතා ගිවිසුම් අත්සන් කරන ලද්දේ දකුණු කොරියාවේ ඉන්චියොන් ජාතික විශ්වවිද්‍යාලය, චීනයේ චෙන්ග්ඩු නෝමල් විශ්වවිද්‍යාලය, චීන්යේ සන්ගායි ජියෝ ටොන්ග් විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨය, චීනයේ හුවාකියෝ විශ්වවිද්‍යාලය, ඇමෙරිකාවේ සැම් හොස්ටන් විශ්වවිද්‍යාලය සහ ඇමෙරිකාවේ කෙන්චුකි විශ්වවිද්‍යාලය යන විශ්වවිද්‍යාල සමඟයි.
පෙර වර්ෂය තුළදී ලෝකයේ පිළිගත් විශ්වවිද්‍යාලවලින් ජාත්‍යන්තර දූතමණ්ඩල 20ක් මෙහි පැමිණි අතර එහි අරමුණ වූයේ ERASMUS + International Credit Mobility වැඩසටහන් හා හැකියා සංවර්ධන ව්‍යාපෘති සහ පශ්චාත් උපාධි හා දර්ශනශූරී උපාධි වැඩසටහන් සඳහා වෙනත් අවස්ථාවන් ආරම්භ කිරීමයි. මෙතුළින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය සිසුන් හා කාර්ය මණ්ඩලය යන දෙපාර්ශවයම ප්‍රතිලාභ ලබන අතර ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල හුවමාරු වැඩසටහන් මෙන්ම ජාත්‍යන්තර සහයෝගීතාවන් ද තවදුරටත් ශක්තිමත් කෙරෙනු ඇත.

එහි ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂය පුරා පහත දැක්වෙන පරිදි විවිධ ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවලින් මෙහි පැමිණ ඇත. ස්වීඩනයේ උප්සලා විශ්වවිද්‍යාලය, ජපානයේ ආසියා පැසිෆික් විශ්වවිද්‍යාලය, චීන විද්‍යා ඇකඩමිය, වර්මියා හා මසුරි විශ්වවිද්‍යාලය, ජපානයේ සේක්‍රඩ් හාර්ට් විශ්වවිද්‍යාලය, නැපෝකා ක්ලුජ් තාක්‍ෂණික විශ්වවිද්‍යාලය, බොට්ස්වානා විද්‍යා හා තාක්‍ෂණ විශ්වවිද්‍යාලය, චීනයේ භූ විද්‍යා විශ්වවිද්‍යාලය, චීනයේ සන්ගායි විදුලි බල විශ්වවිද්‍යාලය, ජපානයේ ඔසාකා විශ්වවිද්‍යාලය, T-Pln's inc, ජපානය, චීනය ෆූජියන් කෘෂිකර්ම හා වනවගා විශ්වවිද්‍යාලය, කොරියාවේ ජාතික විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය - ශ්‍රී ලංකා ෆුල්බ්‍රයිට් කොමිෂම සහ තායිවානයේ ජාතික චුං හසිං විශ්වවිද්‍යාලය ඒ අතරට අයත් වේ.
එහි ප්‍රතිඵල වශයෙන් ජාත්‍යන්තර කටයුතු පිළිබඳ කාර්යාලය අභ්‍යන්තර / බාහිර ශිෂ්‍ය හුවමාරු වැඩසටහනේ සම්බන්ධීකරණය කරන ලදි. ඒ අනුව සිසුන් තිදෙනෙකු තුර්කියේ මැද පෙරදිග තාක්‍ෂණික විශ්වවිද්‍යාලයට යැවීමට පේරාදෙණිය විශ්වවිද්‍යාලයට හැකි විය. එමෙන්ම ජනාධිපති සත්‍යෘත්ව වැඩසටහන හරහා චීන විද්‍යා ඇකඩමි විශ්වවිද්‍යාලයට සිසුන් සිව්දෙනෙකුද යැවීමට හැකි විය. තවද එක් ශිෂ්‍යයෙකු බැගින් ජපානයේ සයිතමා විශ්වවිද්‍යාලයට ද ජපානයේ උට්සොනොමියා විශ්වවිද්‍යාලයට ද ජපානයේ සගා විශ්වවිද්‍යාලයට ද

කෙටි කාලීන ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් යටතේ යවන ලදි. වර්තමානය වනවිට තවත් ශිෂ්‍යයෙකු තායිලන්තයේ තමාසාට් විශ්වවිද්‍යාලයට 2019 වසරේදී යැවීමට තෝරාගෙන ඇත.
බාහිර වැඩසටහන යටතේ ජපානයේ සිසුන් දෙදෙනෙකු ජපානයේ නිගාටා විශ්වවිද්‍යාලයෙන්ද එක් ශිෂ්‍යයෙකු බැගින් සෙස් රාජ්‍යයේ මසාක් විශ්වවිද්‍යාලයෙන් හා ලාහෝරයේ කළමනාකරණ අධ්‍යයන විශ්වවිද්‍යාලයෙන්ද මෙහි පැමිණ ඇත.

ERASMUS වැඩසටහන යටතේ ICM වැඩසටහන් සඳහා ජාත්‍යන්තර කටයුතු පිළිබඳ කාර්යාලය පහත සඳහන් විශ්වවිද්‍යාල වෙත යෝජනා බාරදී ඇත. ලිතුවේනියාවේ ඇලෙක්සැන්ඩ්‍රාස් ස්ට්‍රල්ජින්ස්කිස් විශ්වවිද්‍යාලය, ඉතාලියේ බ්‍රේසියා විශ්වවිද්‍යාලය, ඉතාලියේ ෆෙජියා විශ්වවිද්‍යාලය ලැට්වියාහි රිගා තාක්ෂණික විශ්වවිද්‍යාලය, පෘතුගාලයේ ඉවොරා විශ්වවිද්‍යාලය සහ රොමේනියාවේ ඔරාදි විශ්වවිද්‍යාලය ඒ අතරට ඇතුළත් වේ.

මෙම යෝජනා අතරින් ඉතාලියේ බ්‍රේසියා විශ්වවිද්‍යාලයට හා පෘතුගාලයේ ඉවෝරා විශ්වවිද්‍යාලයට බාරදුන් යෝජනා පිළිගෙන ඇති අතර අනෙක් විශ්වවිද්‍යාලවලට බාරදුන් යෝජනාවලට දක්වන ප්‍රතිචාරය අපේක්ෂාවෙන් පසුවේ. ලිතුවේනියාවේ ඇලෙක්සැන්ඩ්‍රා ස්ට්‍රල්ගින්ස්කිස් විශ්වවිද්‍යාලයට හා රොමේනියාවේ ඔරාදි විශ්වවිද්‍යාලයට බාරදුන් යෝජනා පමණක් නැවත බාරදෙන ලෙස දන්වා ඇත.

ජාත්‍යන්තර කටයුතු පිළිබඳ කාර්යාලය 2019 වසර සඳහා වන ප්‍රධාන ජාත්‍යන්තර සමුළුව සාර්ථකව සංවිධානය කොට සම්බන්ධීකරණය කොට අවසන් කරන ලදි. මෙය ශ්‍රී ලංකා-ජපන් සහයෝගිතා පර්යේෂණ පිළිබඳ 6වැනි සමුළුවයි. ඉහත සමුළුවට අමතරව මෙම කාර්යාලය සහාය දක්වා සම්බන්ධීකරණය කළ සමුළු අතරට මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ සමුළුව-2018, ජාත්‍යන්තර පාලි භාෂා සමුළුව-2018, UGIT-2018, PiERS-2018, විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ RESCON-2018, ICHSS-2018 හා AIMS-2018 අයත් වේ.
2018 වසර සඳහා වන "Hanthana Vision" (පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පර්යේෂණ සඟරාව වෙළුම 4,2 වන නිකුතුව 2019 ජනවාරි මස ආරම්භයේදී සාර්ථකව එළිදැක්වීමට නියමිතය.

### බාධක සහ පිළියම්

2018 වසරට සමානව කාර්ය මණ්ඩලය වෙනුවෙන් සේවක තනතුරු ලබාගැනීමට මෙම කාර්යාලයට නොහැකි වූ අතර එම තනතුරු ලබාගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීමට ඉල්ලීම් බාරදී ඇත.

### අනාගත සැලසුම්

ජාත්‍යන්තර කටයුතු පිළිබඳ කාර්යාලය පේරාදෙණිය විශ්වවිද්‍යාලය තුළ ඇමෙරිකා-ශ්‍රී ලංකා ෆුල්බ්‍රයිට් කොමිෂමක් ආරම්භ කරනු ඇත. ඇමෙරිකාවේ විශ්වවිද්‍යාල හා ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර අධ්‍යයන සම්බන්ධතාවක් සඳහා යෝජනාවක් සංවර්ධනය කොට ඇත. මෙම වැඩසටහන පිටුපස පවතින ප්‍රධාන පරමාර්ථය වනුයේ රටවල් දෙක අතර සහයෝගීතා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම තුළින් ආයතන දෙකේම කාර්ය මණ්ඩලය හා සිසුන්ගේ පර්යේෂණ හැකියාවන් ඉහළ නැංවීමයි. එමෙන්ම චීන විද්‍යා ඇකඩමි විශ්වවිද්‍යාලය හා පේරාදෙණිය විශ්විද්‍යාලය ඒකාබද්ධ දර්ශනශූරී උපාධි වැඩසටහනක් සංවර්ධනය කොට ආයතන දෙකේම කාර්ය මණ්ඩලය හා සිසුන්ට වැඩි අවස්ථාවන් ප්‍රමාණයක් සකසා දීමට නියමිතය. මෙම කාර්යය හා ආයතන දෙක අතර සහයෝගීතා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම හා කාර්ය මණ්ඩලයේ/සිසුන්ගේ පර්යේෂණ කුසලතා වැඩිදියුණු කරනු ඇති අතර චීන විද්‍යා ඇකඩමි විශ්වවිද්‍යාලය සමඟ සහයෝගීතා පර්යේෂණ සම්බන්ධතා නිර්මාණය කිරීම තුළින් දර්ශනශූරී උපාධි හදාරන ජාත්‍යන්තර සිසුන් සංඛ්‍යාව වැඩිකිරීම හා ගෝලීය සමාජ කටයුතු වැඩිදියුණු කරනු ඇත.
විශ්වවිද්‍යාලවල සියුලම පීඨ සමඟ කටයුතු කරමින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය සීමාවන් තුළ රැදෙමින් අවබෝධතා ගිවිසුම් ඇතිකර ගැනීම හා ආගන්තුක විද්වතුන් ගෙන්වාගැනීම පහසුකරවීම තවදුරටත් ශක්තිමත් කරනු ඇත.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය එහි පාර්ශවකාර ආයතන සමඟ ජාත්‍යන්තර සහයෝගීතාවන් ඉහළනැංවීම පිණිස ඉදිරි වර්ෂවලදී කාර්ය මණ්ඩල හා ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් සංඛ්‍යාව වැඩිකරනු ඇත.

## 4.8 කාර්ය මණ්ඩල සංවර්ධනය මධ්‍යස්ථානය

(අධ්‍යක්ෂ - මහාචාර්ය ආර්. පල්ලේගම)

**හැඳින්වීම**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය 1999 වසරේ මාර්තු මාසයේදී ස්ථාපිත කරන ලදි. එක් එක් පීඨවල හා මධ්‍යස්ථානවල විවිධ ඒකක සඳහා එක චත්‍ර සංවිධානයක් වෙමින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ හා විශ්වවිද්‍යාල පද්ධතියේ වෙනත් විශ්වවිද්‍යාලවල කාර්ය මණ්ඩල සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම උදෙසා මෙම මධ්‍යස්ථානය ක්‍රියා කරයි.

**ජයග්‍රහණ**

අදාළ වසර තුළදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය පහත සඳහන් වැඩමුළු හා පුහුණු වැඩසටහන් පවත්වන ලදි.

**අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන්**

**1. අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා 15 වැනි ප්‍රේරණ වැඩසටහන**

| කොටස් | The scedule |
|---|---|
| 1 කොටස | පෙබරවාරි 5-9 හා 12-16 දින දක්වා |
| 2 කොටස | මැයි 1-4 හා 8-11 දින දක්වාත් මැයි 14-15 දින |
| 3 කොටස | මැයි 21-25 හා මැයි 28-ජූනි 01 දින දක්වා |
| සහභාගී වූ සංඛ්‍යාව | 25කි (පේරාදෙණිය විශ්වවිද්‍යාලය, කොළඹ, මොරටුව හා ව්‍යාපාර කළමනාකරණ ජාතික ආයතනය) |
| සම්පත්දායක පුද්ගලයන් සංඛ්‍යාව | ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 29 දෙනෙකු සම්පත්දායක පුද්ගලයන් ලෙස සේවය ලබා දෙන්නට විය. |

**2. සම්මන්ත්‍රණ හා කුසලතා සංවර්ධන වැඩමුළු**

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය "Theory and practice of problem based and flipped Learning" යන තේමාව යටතේ සම්මන්ත්‍රණයක් හා කුසලතා සංවර්ධන වැඩමුළුවක් ඔක්තෝම්බර් 12-13 යන දිනවල එම මධ්‍යස්ථානයේදී පවත්වන ලදි. මෙහි සම්පත්දායකයන් ලෙස කීර්තිමත් අධ්‍යාපනඥ මහාචාර්ය ලක්ෂමන් සමරනායක හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මුඛ වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය රුවන් ජයසිංහ සේවය ලබාදෙන්නට විය. මෙම සම්මන්ත්‍රණයට අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෝ 27 දෙනෙකු සහභාගී වූහ.

**අනධ්‍යයන සේවක මණ්ඩලයේ පුහුණු වැඩසටහන**

**1. කාර්මික නිලධාරීන් සහ සම ශ්‍රේණිවල කාර්ය මණ්ඩලය**

| | ඉහත සඳහන් කළ සේවකයින් සඳහා 2වැනි දින හයේ (6) වැඩසටහන | එම සේවකයන් සඳහා තෙවන දින හයේ (6) වැඩසටහන |
|---|---|---|
| දිනයන් | ජනවාරි 10, 16, 26, 29 සහ පෙබරවාරි 20 හා අප්‍රේල් 26 | අගෝස්තු 15, 23, 28 හා සැප්තැම්බර් 3, 11 හා 20 |
| සහභාගි වූ සංඛ්‍යාව | 33 | 37 |
| සම්පත්දායක පුද්ගලයන් | 14 | 15 |

## 2. ලසුලේඛිකාවන් / ලිපිකරුවන් සහ සම ශ්‍රේණිවල සේවකයන් සඳහා දින පහේ (5) ප්‍රේරණ වැඩසටහන

| | ඉහත ශ්‍රේණිවල සේවකයන් සඳහා තෙවැනි දින පහේ (5) ප්‍රේරණ වැඩසටහන | එම සේවකයන් සඳහා තෙවන දින පහේ (5) ප්‍රේරණ වැඩසටහන |
|---|---|---|
| දිනයන් | ජනවාරි 11, 17, 23 සහ පෙබරවාරි 01, 21 දිනයන් | අගෝස්තු 30 සැප්තැම්බර් 01, 13, 18, 21 දිනයන් |
| සහභාගි වූ සංඛ්‍යාව | 30 | 35 |
| සම්පත්දායක පුද්ගලයන් සංඛ්‍යාව | 11 | 12 |

## 3. විශ්වවිද්‍යාලයේ විද්‍යාගාර සහයකයන් සඳහා දින තුනේ (3) ප්‍රේරණ වැඩසටහන

| | ඉහත සේවකයන් සඳහා දෙවැනි දින තුනේ (3) ප්‍රේරණ වැඩසටහන | ඉහත සේවකයන් සඳහා තෙවැනි දින තුනේ (3) ප්‍රේරණ වැඩසටහන |
|---|---|---|
| දිනයන් | ජූනි 26, 28 හා ජූලි 03 යන දිනයන් | නොවැම්බර් 29 දෙසැම්බර් 05, 11 |
| සහභාගි වූ සංඛ්‍යාව | 34 | 32 |
| සම්පත්දායක පුද්ගලයන් සංඛ්‍යාව | 10 | 10 |

**කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ සහතික පත්‍ර පිරිනැමීමේ උත්සවය**

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ දෙවන සහතික පත්‍ර ප්‍රදාන උත්සවය 2018 ඔක්තෝබර් 23 දින පේරාදෙණිය විශ්වවිද්‍යාල සනාතන මන්දිර සම්මන්ත්‍රණ ශාලාවේදී ප.ව. 3.00ට පවත්වන්නට වූ අතර එහිදී තෙදින, දින පහේ හා දින හයේ ප්‍රේරණ වැඩසටහන් සාර්ථකව අවසන් කළ අනධ්‍යයන කාර්ය මණ්ඩල සේවකයන් 108 දෙනෙකු සහතික පත්‍ර ලබාගත්හ.

## 5 සහායක සේවාවන්

### 5.1 සෞඛ්‍ය මධ්‍යස්ථානය හා සෞඛ්‍ය සේවාවන්

(ප්‍රධාන වෛද්‍ය නිලධාරී - වෛද්‍ය පී.එම්.ඒ. සමරක්කොඩි)

**හැඳින්වීම**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය සෞඛ්‍ය මධ්‍යස්ථානය රජය විසින් පවත්වාගෙන යනු ලබන හෝ පුද්ගලික අංශය විසින් පවත්වාගෙන යනු ලබන මධ්‍යම ප්‍රමාණයේ රෝහලක් සමග සන්සන්දනය කිරීමේ දී එය අසමසම වේ. විශ්වවිද්‍යාල ප්‍රජාවට අයත් සිසුන්, සේවකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගෙන් යුක්ත වන 20,000කගේ පමණ සෞඛ්‍යමය අවශ්‍යතාවන් මෙම මධ්‍යස්ථානය මගින් සපුරාලනු ලබයි. එමෙන්ම මෙම සෞඛ්‍ය මධ්‍යස්ථානය ප්‍රජා සෞඛ්‍ය හා පාරිසරික සෞඛ්‍යයට අදාළ ක්‍රියාකාරකම්වල නියැලෙන අතර කසළ බැහැර කිරීමේ ව්‍යාපෘතියක් ද කළමනාකරණය කරනු ලබයි. මෙතරම් විශාල ජනකායකගේ සෞඛ්‍යමය අවශ්‍යතාවන් ඉටුකරනු පිණිස මනාලෙස සංවිධානය කළ වැඩසටහනක් හඳුන්වා දී ඇත. මෙම මධ්‍යස්ථානය කරා පැමිණෙන සෑම පුද්ගලයෙකු සඳහාම වෙන් වෙන් වූ ලිපිගොනුවක් පවත්වාගෙන යනු ලබයි. සේවකයෙකු බඳවා ගැනීමේ යෝග්‍යතා පරීක්ෂණ වෛද්‍ය වාර්තාවෙන් එම ලිපිගොනුව ආරම්භ වන අතර සිසුන්ගේ ලිපි ගොනුව ආරම්භ වනුයේ මූලික වෛද්‍ය වාර්තා ඇතුළත් කිරීමත් සමඟයි. සේවකයෙකු විශ්‍රාම ලබාගන්නා තෙක්ම එම ලිපිගොනුව පවත්වාගෙන යන අතර සිසුන් ඔවුන්ගේ විශ්වවිද්‍යාල අධ්‍යයන කාලය අවසාන වනතෙක් එම ලිපිගොනු ආරක්ෂිතව පවතී. මෙතරම් විශාල පිරිසකගෙන් සමන්විත වෛද්‍ය මධ්‍යස්ථානයක් ඒ සෑම කෙනෙක් වෙනුවෙන්ම වෙනම ලිපිගොනුවක් පවත්වාගෙන යන එකම ආයතනය මෙය බව ඒ පිළිබඳ නිරීක්ෂණය කරන්නෙකුට පැහැදිලි වේ.

**සිසුන් හා සේවකයන්ට අවශ්‍ය සාමාන්‍ය වෛද්‍ය ප්‍රතිකාරවලට අමතරව පහත සඳහන් සේවාවන් ද සපයා දෙනු ලබයි.**

- දැඩි අවධානමකට ලක්වූ සිසුන්ට එන්නත් ලබාදීම (හෙපටයිටිස් බී/ARV/TT)
- ක්‍රීඩා යෝග්‍යතාවය සඳහා වෛද්‍ය පරීක්ෂණ
- රසායනික පරීක්ෂණ
- ප්‍රථමාධාර වැඩසටහන්
- සිසුන් සහ කාර්ය මණ්ඩලය වෙනුවෙන් වෛද්‍ය මණ්ඩල පැවැත්වීම
- විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය සත්කාරය පිළිබඳව නවක සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන්
- සිසුන් සඳහා සෞඛ්‍ය අධ්‍යාපනය
- මානසික සෞඛ්‍ය පිළිබඳ පසුවිපරම් වැඩසටහන්
- අවශ්‍ය අවස්ථාවන්වලදී උපදේශනය ලබාදීම

පිළිගත් රෝහලකින් අපේක්ෂා කරනුයේ ඒ වෙත පැමිණෙන රෝගීන්ට වෛද්‍ය ප්‍රතිකාර ලබාදීමයි. එසේ වුවත් විශ්වවිද්‍යාල සෞඛ්‍ය මධ්‍යස්ථානය විශේෂ ස්ථානයක් හිමිකරගනුයේ පහත සඳහන් ප්‍රජා සේවාවන් ද සලසා දෙන බැවිනි.

- විශ්වවිද්‍යාල අපද්‍රව්‍ය කළමනාකරණය
- පාරිසරික සනීපාරක්ෂාව
- ඩෙංගු රෝග පාලනය
- දඩාවතේ යන සුනඛයන් වඳභාවයට පත්කිරීම/එන්නත් කිරීම හා ජලභීතිකාව පාලනය
- නේවාසිකාගාර පරීක්ෂාව සහ සනීපාරක්ෂාව අධීක්ෂණය කිරීම
- ආපන ශාලා පරීක්ෂාව හා ස්වස්ථතාව පවත්වා ගැනීම
- සියලුම විශ්වවිද්‍යාල ගොඩනැගිලිවල වේයන් පාලනය කිරීම.
- ආහාර හා ජල සනීපාරක්ෂාව
- විවෘත ජලකානු පද්ධතියක් පවත්වාගෙන යෑම

කාර්යක්ෂම ගිලන් රථ සේවාවක් 24 පැය පුරාම ක්‍රියාත්මක වන අතර කිසියම් ස්ථානයකින් දැනුම් දුන්විට ඉතා කෙටි කාලයක් තුළ එතනට පැමිණ රෝගියා රැගෙනවිත් ප්‍රතිකාර සඳහා යොමු කරයි. (විනාඩි පහක් තුළ කි. මී. 6ක් ආවරණය කරමින් මෙය සිදුවේ. මෙම කාර්ය සංවර්ධිත රටවල් සමග සංසන්දනය කළ හැකි වුවත්

ශ්‍රී ලංකාව තුළ වෙන කිසිම ස්ථානයක මෙම ක්‍රමය දැකිය නොහැකිය. සෞඛ්‍ය මධ්‍යස්ථානයේ බාහිර රෝගී අංශයට දිනකට රෝගීන් 120ක් පමණ පැමිණෙන අතර ඒ සියල්ලන්ගේ වෛද්‍ය අවශ්‍යතා ඉටු කරනු ලබයි. මෙහිදී යම් රෝගීයෙකුට අවශ්‍ය ඖෂධයක් එම අවස්ථාවේ නොතිබුනහොත් කෙටි කාලයක් තුළ එය මිලදී ගෙන රෝගියාට ලැබෙන්නට සලස්වයි. මෙම කාර්යය ද රජයේ රෝහල්වල බාහිර රෝගී අංශවලින් ඉටුනොවන සේවාවකි. විශ්වවිද්‍යාල සේවක වෛද්‍ය පරීක්ෂණ වැඩසටහනට අදාළව විශේෂ ක්‍රියාකාරකමක් වත්මන් වර්ෂය තුළදී ආරම්භ කරන ලදී. එම වැඩසටහනට අනුව විශ්වවිද්‍යාලයේ අවුරුදු 40ට වැඩි සියළුම සේවකයන් 900ක් පමණ වාර්ෂිකව හෝ ද්විවාර්ෂිකව පරීක්ෂාවට ලක්කොට අවශ්‍ය විමර්ශන ගාස්තු අයකිරීමකින් තොරව සිදුකරනු ලබයි. සෑම විශ්වවිද්‍යාල සේවකයෙකුම මෙම වැඩසටහනට ඇතුළත් වන අතර ඔවුන්ට ඔවුන්ගේ විශ්‍රාම දිවිය දක්වාම අවශ්‍ය පරිදි වෛද්‍ය පරීක්ෂණවලට භාජනය කෙරේ. නිරෝගී පුද්ගලයෙකු ලෙස ඔවුන්ගේ විශ්‍රාම දිවිය ගත කිරීමේ අවස්ථාව උදාකරදීම මෙම වැඩසටහනේ අරමුණයි. අඩු වියදමකින් සිදුකෙරෙන මෙම වැඩසටහන දිවයින පුරා ක්‍රියාත්මක කිරීම සඳහා ද යෝග්‍ය වේ. එම කාර්යයේදී මෙම විශ්වවිද්‍යාල වැඩසටහන අධ්‍යයන කොට නියමු ව්‍යාපෘතියක් ලෙස සැලකීම යෝග්‍ය වේ. ජාතික සෞඛ්‍ය සංරක්ෂණ වැඩසටහනට අනුව එක් පුද්ගලයෙකු වෙනුවෙන් වර්ෂයකට වැයකරනු ලබන ප්‍රාග්ධනය රු.5500 පමණ වන අතර විශ්වවිද්‍යාලය විසින් ක්‍රියාත්මක කරනු ලබන ඉහත වැඩසටහනට අනුව එක් පුද්ගලයෙකු වෙනුවෙන් වැයකරනුයේ රු.3000 කට අඩු මුදලකි. මේ සියලු ක්‍රියාකාරකම් ඉටුකිරීම සඳහා සෞඛ්‍ය මධ්‍යස්ථානය සතු කාර්ය මණ්ඩලය වෛද්‍ය නිලධාරීන් සිව්දෙනෙකු, හෙදියන් නවදෙනෙකු හා වෙනත් සහය කාර්ය මණ්ඩල සාමාජිකයන් 40 දෙනෙකුගෙන් යුක්ත වේ. ඉහත නියමු කාර්යයන් ක්‍රියාත්මක කරන සෞඛ්‍ය මධ්‍යස්ථානය උද්‍යානමහලක් සහිත පැරණි ගොඩනැගිල්ලකින් හා වර්ග අඩි 2000 කින් යුතු ප්‍රජා හා පරිසර ඒකකයකින් යුක්ත වේ. විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක සංරක්ෂණ වැඩසටහන ඵලදායි ජාතික සෞඛ්‍ය සංරක්ෂණ පුද්ගලයෙකු හෝ සෞඛ්‍ය ආර්ථික විද්‍යා කටයුතුවල නිරතව සිටින විශේෂඥයෙකු විසින් අධ්‍යයනය කරන්නේ නම් එය ඉතා යෝග්‍ය වනු ඇතැයි සඳහන් කළ යුතුවේ.

**ජයග්‍රහණ**

- ලෝක හරිත විශ්වවිද්‍යාල ශ්‍රේණිගතකරණය සඳහා අයදුම් කර එහි ගෝලීය වශයෙන් 412වැනි ස්ථානය හිමිවිය.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ආදී විද්‍යාර්ථීන්ගේ සංගමයේ සහයෝගය ඇතිව බාහිර රෝග අංශයේ රෝගීන් වෙනුවෙන් සෞඛ්‍ය වැඩසටහනක් ස්ථාපිත කරන ලදී.
- විශ්වවිද්‍යාලයීය ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනක් ක්‍රියාත්මක වන අතර එය 75%ක් සාර්ථකව අවසන් කොට ඇත.
- ඩෙංගු පාලන වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කළ අතර විශ්වවිද්‍යාලය තුළ ඩෙංගු රෝගීන් සිව් දෙනෙකු පමණක් වාර්තා විය.
- ශිෂ්‍ය මානසික රෝග පසු විපරම් වැඩසටහනක් ක්‍රියාත්මක වේ.
- වියන් පාලන වැඩසටහන අවසන් කරන ලදී. එයින් විශ්වවිද්‍යාලයට වාර්ෂිකව රුපියල් මිලියන 12ක් ඉතිරි විය.
- විශ්වවිද්‍යාලය තුළ පවතින දඩාවතේ යන සුනඛයන්ගේ ගැටලුවට පිළියමක් ලෙස "වගකීම් සහිත සුරතල් සතුන්ගේ හිමිකාරිත්වය දැරීම" නමින් වැඩසටහනක් ක්‍රියාත්මක වේ.

**අනාගත සැලසුම්**

- ලෝක හරිත විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වල ඉහළ ස්ථානයක් වෙනුවෙන් සූදානම් වීම.
- විශ්වවිද්‍යාල විද්‍යාගාර තුළ අන්තරායකාරී අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා නිසි වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම
- විශ්වවිද්‍යාල ආපනශාලා ප්‍රතිසංවිධානය කොට ඒවා පිළිගත් ප්‍රමිතීන්ට අනකුල නඩත්තුවක් සහතික කිරීම
- නේවාසිකාගාරවල සනීපාරක්ෂක තත්ත්වය දියුණු කිරීම හා ඒ පිළිබඳව සිසුන් දැනුවත් කිරීම සඳහා වැඩමුළු පැවැත්වීම
- විශ්වවිද්‍යාලයට බාධකයක් නොවන පරිදි සෞඛ්‍ය මධ්‍යස්ථානයේ යටිතල සංවර්ධනය දියුණු කිරීම
- සිසුන් වෙනුවෙන් සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් තවදුරටත් ශක්තිමත් කිරීම
- විශ්වවිද්‍යාල සේවකයන් වෙනුවෙන් වෘත්තීමය සෞඛ්‍ය ගැටලු වැළැක්වීමේ වැඩසටහනක් ස්ථාපිත කිරීම

## 5.2 උද්‍යාන අංශය

(උද්‍යාන පාලක - ඩබ්.එම්. ආනන්ද)

### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 700ක් වන අතර එයින් හෙක්ටයාර් 230ක් සංවර්ධනය කොට පීඨ, නේවාසිකාගාර, කාර්ය මණ්ඩල නිවාස හා අනෙකුත් පහසුකම් ස්ථාපිත කොට ඇත. විශ්වවිද්‍යාල උද්‍යානයේ විවිධ මල්ගස් වර්ග, විශාල තෘණ බිම් ප්‍රමාණයක සැලකිය යුතු මට්ටමේ උද්‍යාන අලංකාර සිදුකර ඇත. උද්‍යාන අංශයේ ප්‍රධාන අරමුණ වනුයේ ඉහත සඳහන් කළ උද්‍යාන කටයුතු උද්‍යාන මූලධර්මයන්ට අනුකූලව පවත්වා ගනිමින් තවදුරටත් ඒවා වැඩිදියුණු කිරීමයි.

උද්‍යාන අංශය ප්‍රධාන වශයෙන්ම පහත සඳහන් ක්‍රියාකාරකම් ඉටුකිරීමේ වගකීම උසුලයි.

- විශ්වවිද්‍යාල භූමියේ පවතින උද්‍යාන රටා නඩත්තු කිරීම
- පැල තවාන් නඩත්තු කරමින් විශ්වවිද්‍යාලයේ උත්සව අවස්ථාවන්ට මල් පෝච්චි සැපයීම
- විශ්වවිද්‍යාලයේ දේපලවලට හානිවිය හැකි අනතුරුදායක ගස් සහ ගස්වල අතු ඉවත් කිරීම සහ සාමාන්‍ය සේවා අංශය සහ ආරක්ෂක අංශය සමග එක්ව දැව කඳන් ටෙන්ඩර්ගත කොට අලෙවි කිරීමට සහායවීම
- විශ්වවිද්‍යාල උද්‍යාන රටා ඉහළනංවා වැඩි දියුණු කිරීම
- නව උද්‍යාන සැලසුම් සකස් කිරීම, වියදම් ඇස්තමේන්තු සැකසීම හා නව උද්‍යාන සැලසුම් ක්‍රියාත්මක කිරීම

### ජයග්‍රහණ

**උද්‍යාන අංශය 2017 වසරේදී ඉටුකළ කාර්යයන් සංක්ෂේපයෙන් පහත දැක්වේ.**

- විශ්වවිද්‍යාලයේ උද්‍යාන අලංකරණ කටයුතු සතුටුදායක මට්ටමින් පවත්වාගෙන ගිය අතර දිරාගිය අධිවර්ධිත ගස් ඉවත්කොට අලුතෙන් රුක්රෝපනය කිරීම, හිස්වූ
- ගස්ථානවල නව ගස්වර්ග රෝපණය කිරීම සහ විශ්වවිද්‍යාල දේපලවලට හානිවිය හැකි අනතුරුදායක ගස් සහ ශාක ඉවත් කිරීම වැනි කාර්යයන් එම කටයුතු අතරට ඇතුළත් විය.
- විශ්වවිද්‍යාල භූමියේ පවතින බඩවැටි නිරන්තරව කප්පාදු කොට අඩිපාරවල් සහ පඩිපෙළවල්වල පැලෑටි ගලවා ඉවත්කොට නියමාකාරයෙන් නඩත්තු කරන ලදී.
- ඉහළ හන්තාන පෙදෙසේ මාර්ෂ් කන්ද, මාවලවත්ත හා කඳුගොඩැල්ල යන ප්‍රදේශවල ගිණිගැනීම් වළක්වා විශ්වවිද්‍යාල දේපල ආරක්ෂා කිරීම සඳහා කටයුතු කරන ලදී.
- අදාළ වර්ෂයේදී විශ්වවිද්‍යාලය තුළ පැවැත් වූ සියලුම විශේෂ අවස්ථාවන්ට උපරිම සහයෝගය දැක්වීමට උද්‍යාන අංශයට හැකිවිය. විශ්වවිද්‍යාලයේ උත්සව අවස්ථාවන්ට මල්පෝච්චි සැපයීම, නාට්‍ය උළෙල වෙනුවෙන් සරත්චන්ද්‍ර එළිමහන් රංග පීඨය සකස්කර දීම, වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවයේ හා පේරාදෙණිය පර්යේෂණ සැසියේ කටයුතුවලට සහායවීම සිදුකළ කාර්යයන්වලින් කිහිපයකි.

### විශේෂ වැඩිදියුණු කිරීම් හා ක්‍රියාකාරකම්

- කපන ලද තණකොළ, දිරාගිය අතු, ගොම හා වෙනත් සුදුසු ඉවතලන ද්‍රව්‍ය එක්කොට උද්‍යාන කටයුතු සඳහා කොම්පෝස්ට් පොහොර සකස් කරන ලදී.
- වනරෝපා වැඩසටහන යටතේ රුක්රෝපණ වැඩසටහනක් සංවිධානය කරන ලදී.
- ඉංජිනේරු පීඨයේ මාවත පෙදෙසේ තල්ගස් රෝපණ වැඩසටහනක් සංවිධානය කොට ක්‍රියාත්මක කරන ලදී.

**උද්‍යාන අලංකාරය දියුණු කිරීම හා නව උද්‍යාන සැලසුම් සැකසීම**

- මා ඔය, සනාතන මන්දිර පරිශ්‍රය, පීඨවල පොදු ස්ථාන, නේවාසිකාගාරවල මෙන්ම හිල්ඩා උද්‍යානයේ, උද්‍යාන අංලකාරය දියුණු කරන ලදි
- පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨයේ උද්‍යාන අලංකරණ කටයුතු වැඩිදියුණු කළ අතර පශු ව්‍යාධවේද අධ්‍යයන අංශය ආශ්‍රිත පරිශ්‍රයට උද්‍යාන රටා සැලසුමක් සකස්කරන ලදි
- ඉංජිනේරු පීඨයේ උද්‍යාන අලංකරණ කටයුතු වැඩි දියුණු කරන ලදි
- නව කලා ගොඩනැගිල්ල හා අධ්‍යාපන ගොඩනැගිල්ල අතර ප්‍රදේශයට උද්‍යාන සැලසුමක් හා ඇස්මේනතුවක් සකස් කිරීම හා ඒ සඳහා අනුමැතිය ලබාගෙන එය ක්‍රියාත්මක කිරීම සඳහා මිළගණන් කැඳවීම
- විද්‍යා පීඨයේ උද්භිත විද්‍යා අධ්‍යයන අංශයේ වෙළඳ උද්‍යානය සඳහා උද්‍යාන සැලසුම් සකස්කිරීම

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

- විශ්වවිද්‍යාලයේ ප්‍රධාන තෘණ භූමිවල තුඹස් ඉවත්කොට මට්ටම් කොට සුදුසු පරිදි සැකසීම.
- විශ්වවිද්‍යාලයේ මල්පාත්ති වැඩි දියුණු කොට පවත්වාගෙන යෑම.

**බාධක සහ පිළියම්**

- එදිනෙදා නඩත්තු කටයුතු පිළිගත් මට්ටමින් පවත්වාගෙන යෑමට බලපාන ප්‍රධාන බාධකයක් වනුයේ මෙම අංශයේ පවතින කම්කරු හිඟයයි.
- විශාල ප්‍රදේශයක් පුරා පැතිරුණු අතිවිශාල වැඩ ප්‍රමාණය අධීක්ෂණය සඳහා ප්‍රමාණවත් අධීක්ෂණ බලයක් නොමැතිවීම

**අනාගත සැලසුම්**

**වැඩිදියුණුව සඳහා යෝජනා**

- උද්‍යාන අංශයට වාහනයක් ලබා ගැනීම.
- උද්‍යාන අධීක්ෂකයන් දෙදෙනෙකුවත් බඳවා ගෙන එහි අධීක්ෂණ බලය වැඩි කිරීම.
- මෙම අංශයේ සේවක සංඛ්‍යාව වැඩි කිරීම හා යන්ත්‍ර ක්‍රියාකරු, බඩවැටි කපන්නා සහායක, ගස් කපන්නා, ගස් ශල්‍ය තාක්ෂණිකයන් වැනි නව පුහුණු තනතුරු නිර්මාණය කිරීම.
- සනාතන මන්දිරය අවට ප්‍රදේශය වැනි තෝරාගත් ප්‍රදේශවල උද්‍යාන රටා වැඩිදියුණු කිරීම.

## 5.3 විනයාරක්ෂක අංශය
(ප්‍රධාන විනයාරක්ෂක නිලධාරී - ඩබ්.ඒ.ඒ. වේරහැර)

### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපාධි අපේක්ෂකයන්ගේ, පර්යේෂකයන්ගේ හා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ අධ්‍යාපනය, පර්යේෂණ හා අධ්‍යයන කටයුතු සිදුකිරීමට උචිත නිදහස්, සාමකාමී හා අධ්‍යයන කටයුතුවලට හිතකාමී පරිසරයක් පවත්වාගෙන යෑම වෙනුවෙන් දායකත්වය ලබාදීම පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය විනයාරක්ෂක අංශයේ ප්‍රධාන පරමාර්ථයයි.
පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය විනයාරක්ෂක අංශය ප්‍රධාන විනයාරක්ෂක, එක් ද්වීඩ විනයාරක්ෂකයෙකු හා එක් කාන්තා විනයාරක්ෂකවරියක් ඇතුළුව විනයාරක්ෂකයන් පස්දෙනෙකුගෙන් යුක්ත වන අතර එය නියෝජ්‍ය උපකුලපතිතුමාගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. විනයාරක්ෂක අංශයේ ප්‍රධාන කාර්යය වනුයේ පීඨ මධ්‍යස්ථානය, ගෘහස්ථ ක්‍රීඩාගාරය, ක්‍රීඩාපිටි හා නේවාසිකාගාර තුළ සිසුන්ගේ චර්යාව හා ක්‍රියාකාරකම් පිළිබඳව සුපරික්ෂාකාරී වෙමින් සිසු විනය යහපත් මට්ටමින් පවත්වා ගැනීමයි.

### ජයග්‍රහණ

- විවිධ හේතු කාරණා හේතුවෙන් විශ්වවිද්‍යාල උපාධි පාඨමාලා අතහැර දමා සිටි සිසුන් කිහිපදෙනෙකු නැවත විශ්වවිද්‍යාලයට කැඳවා අධ්‍යාපනයට යොමුකරන ලද්දේ විනයාරක්ෂක අංශයේ සාර්ථක මැදිහත්වීම තුළිනි.
- විවිධ හේතු සාධක හේතුවෙන් තම අධ්‍යාපන කටයුතු අතහැර දමා සිටි සිසුන් ශිෂ්‍ය උපදේශකයන් වෙත යොමු කොට ඔවුන් නැවත නිවැරදි මාවතට යොමුකිරීමට විනයාරක්ෂක අංශයට හැකිවිය.
- විවිධ වාර්ගික, සංස්කෘතික, කුල, ආගමික සහ කණ්ඩායම් අතර හටගත් ගැටලු නිරාකරණය කොට අධ්‍යයන කටයුතු පවත්වාගෙන යාහැකි අධ්‍යයන හිතකාමී සාමකාමී පරිසරයක් නිර්මාණය කළ හැකිවිය.
- 2018 වසරේදී නවක සිසුන් වෙනුවෙන් නීති කඩකිරීම් අවම කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා හා විනය ක්‍රියාමාර්ග පිළිබඳව ඔවුන් දැනුවත් කිරීමේ වැඩසටහන් සාර්ථකව පවත්වන ලදි.
- උපකුලපති, නියෝජ්‍ය උපකුලපති, විනය පාලකයන් හා ශිෂ්‍ය උපදේශකයන්ගේ සහයෝගයෙන් නවක වදය වැළැක්වීමේ විශේෂ වැඩසටහනක් හා සමාජ සහජීවන වැඩසටහනක්ද සංවිධානය කරන ලදි.
- විනයාරක්ෂක අංශය යාපනය විශ්වවිද්‍යාලයේ ආරක්ෂක නිළධාරීන් සඳහා පුහුණු වැඩසටහනක් ඉහළ හන්තාන පුහුණු මධ්‍යස්ථානයේදී සාර්ථකව පවත්වන ලදී.
- විනයාරක්ෂක අංශය ග්‍රාමසේවකවරුන් සමඟ එක්ව බාහිර නිවාසවල ලැගුම්ගෙන සිටින සිසුන් නවකවදය සිද්ධීන්ගෙන් වළක්වාගැනීම පිණිස දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි.
- තවද මෙම අංශය මඩකලපුව නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සියලුම ආරක්ෂක නිලධාරීන් වෙනුවෙන් පුහුණු වැඩසටහන් සාර්ථකව පවත්වන ලදි.
- අදාළ වර්ෂයේදී සිද්ධි 20කට අදාළ කරුණු සෙවීමට මෙහෙයුමක් සාර්ථකව අවසන් කරන ලදි.
- එපමණක් නොව විනයාරක්ෂක අංශය, වයඹ විශ්වවිද්‍යාලයේ අලුතින් බඳවාගත් විනයාරක්ෂකයන් වෙනුවෙන් සතිදෙකේ පුහුණු වැඩසටහනක් සාර්ථකව පවත්වන ලදි.
- විශ්වවිද්‍යාලයේ නවක වදය වැළැක්වීම සඳහා වැදගත් සහයෝගයක් ලබාදුන් අතර කාර්ය මණ්ඩලයට හා සිසුන්ට ආරක්ෂාව ලබාදීම වෙනුවෙන් ආරක්ෂක අංශයට ද සහාය දක්වන්නට විය. විනය කරුණු සම්බන්ධයෙන් පීඨාධිපතීන්, විනයපාලකවරුන් හා ශාලාධිපතීන් සමඟ පැවැත්වූ විනය පරීක්ෂණවලට අදාළ ලේඛන පිළියෙල කිරීම සඳහා පූර්ණ සහයෝගය දක්වන්නට විය.

- එමෙන්ම විනයාරක්ෂක අංශය විශ්වවිද්‍යාලය තුළ පැවැත් වූ උපාධි ප්‍රදානෝත්සවය, ප්‍රදර්ශන හා නාට්‍ය උත්සව මෙන්ම සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය වැනි අවස්ථාවලදී පූර්ණ සහයෝගය දක්වන ලදි.
- හිඳගල, ගලහ හංදිය, දංගොල්ල හංදිය හා පේරාදෙණිය මහකන්ද බස් නැවතුම යන ස්ථානවල ත්‍රීරෝද රථ රියදුරන්ගේ සේවය සිසුන් සමඟ කටයුතු කිරීමේදී විශාල පිටුවහලක් වන බැවින් සම්බන්ධීකරණ වැඩසටහනක් පවත්වන ලදී.

**බාධක සහ පිළියම්**

- සිසුන් 12000ක් තරම් ප්‍රමාණයක විනය කටයුතු විනයාරක්ෂකයන් හය දෙනෙකුගෙන් ඉටුකර ගැනීමට සිදුවීම මෙම අංශය මුහුණපාන ප්‍රධාන අභියෝගයකි. දැනට සිටින විනයාරක්ෂකයන් සංඛ්‍යාව කෙසේවත් ප්‍රමාණවත් නැත.
- විනයාරක්ෂකයන්ගේ දැනුම දියුණු කිරීම, බාහිර පුහුණුව හා පශ්චාත් උපාධි හැදෑරීම, රටේ ක්‍රියාත්මක නීතිය හැදෑරීම, මානව හිමිකම්, කළමනාකරණය හා එදිනෙදා විනය කටයුතු සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස උපදේශනය වැනි අංශ පිළිබඳව පුහුණුව ලබාදීම හා අමතර සුදුසුකම් අත්කර ගැනීමේ අවස්ථා සැලසීම ඉතා වැදගත් වේ.

**අනාගත සැලසුම්**

- ආයතනයේ ඉලක්කයන් ජයගැනීම වෙනුවෙන් කාර්යක්ෂමව කටයුතු කරන සේවකයන්ට සහාය දැක්වීම පිණිස සියලුම විශ්වවිද්‍යාලවල දැනට සිටින හා අලුතින් බඳවාගනු ලබන විනයාරක්ෂක නිලධාරීන්ට හා ආරක්ෂක නිලධාරීන්ට අදාළ පුහුණුව ලබාදීමේ යෝජනාවක් බාරදී ඇත.
- මෙම අංශයේ විනයාරක්ෂක නිලධාරී සංඛ්‍යාව 12 දක්වා වැඩිකිරීම හා නියෝජ්‍ය ප්‍රධාන විනයාරක්ෂක තනතුරක් නිර්මාණය කිරීම. එමෙන්ම උපදේශනය, ගැටලු නිරාකරණය, කළමනාකරණය පිළිබඳ වෘත්තීය පාඨමාලා හැදෑරීමේ අවස්ථා සලසාදීම.
- විනයාරක්ෂක අංශය සඳහා ස්ථිර ලිපිකරුවෙකු හා කාර්යාල සහායකයෙකු බඳවා ගැනීමට කටයුතු කර ඇත.

## 5.4 ශාරීරික අධ්‍යාපන අංශය

(අධ්‍යක්‍ෂ - එම්.ඩී. පාලිත කුමාර මහතා)

### හැඳින්වීම

විශ්වවිද්‍යාලය තුළ ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩාව වෙනුවෙන් වගකිවයුතු අංශය වනුයේ ශාරීරික අධ්‍යාපන අංශයයි. විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රජාවගේ කායික හා මානසික සුවතාවය ඉහළනැංවීම සඳහා මෙම අංශය විශාල වෙහෙසක් දරයි. මෙම අංශයේ ප්‍රධාන කාර්යය වනුයේ ප්‍රථම උපාධි සිසුන් වෙනුවෙන් විශ්වවිද්‍යාලය තුළ ක්‍රීඩා හා විනෝද ජනක අවස්ථාවන් සංවිධානය කොට ක්‍රියාත්මක කිරීම, බාහිර අංශ විසින් සංවිධානය කරනු ලබන තරඟකාරී ක්‍රීඩා ඉසව්වලට සහභාගිවීමේ අවස්ථා උදාකරදීම සහ ක්‍රීඩා ප්‍රවර්ධන වැඩමුළු හා න්‍යායාත්මක පංති කාලානුරූපව ක්‍රියාත්මක කිරීමයි.

### ජයග්‍රහණ

**ක්‍රීඩා පිටියේ නව එළිමහන් ශාරීරික යෝග්‍යතා මධ්‍යස්ථානය**

ශාරීරික අධ්‍යාපන අංශයේ පවතින ක්‍රීඩා වත්කම්වල එකතුවක් ලෙස නව එළිමහන් ශාරීරික යෝග්‍යතා මධ්‍යස්ථානය බාරදෙන ලදි. මෙම පහසුකම පරිත්‍යග කරන ලද්දේ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසිනි. මෙම පහසුකම මී. 20 x 3 ක භූමි ප්‍රදේශයකින් හා එළිමහන් ක්‍රීඩා භාණ්ඩ හයකින් යුක්ත වේ.

**නව ඇවිදයෑමේ මංතීරුව**

නව ඇවිදයෑමේ මංතීරුව පිහිටුවීම පිණිස රුපියල් මිලියන 40ක ප්‍රදානයක් මෙම අංශයට ලැබිණ. ආසන්න වශයෙන් කි.මී

. 1.2ක දුරකින් යුක්ත වන මෙම ව්‍යාපාතියේ වටිනාකම රුපියල් මිලියන හතරකි. දැනට මෙහි කටයුතු අවසන් වෙමින් පවති. ශාරීරික අධ්‍යාපන අංශය, වෛද්‍ය පීඨය සමග එක්ව ව්‍යායාම හා ක්‍රීඩා විද්‍යා පාඨමාලාව සාර්ථකව පවත්වන ලදි. මෙම පාඨමාලාවේ පස්වන ශිෂ්‍ය කණ්ඩායම එය හැදෑරීම ජූලි 10 දින සිට ආරම්භ කරන ලදි.

**අන්තර් විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා ශූරතාව - 2018**

පේරාදෙණිය විශ්වවිද්‍යාලය මෙම ශූරතාවයේදී පිරිමි කාණ්ඩයෙන් බර ඉසිලීමේ ඉසව්වෙන් ශූරතාවය ද පාපන්දු, රග්බි හා චෙස් ඉසව්වල දෙවන ස්ථාන ද අත්කරගත් අතර කාන්තා කාණ්ඩයෙන් චෙස් සහ එල්ලේ ක්‍රීඩාවලින් 2වන ස්ථානය ද අත්කර ගන්නට විය. ඊට අමතරව පැසිපන්දු (පිරිමි) මල්ලවපොර (පිරිමි) බැඩ්මින්ටන් (කාන්තා) කැරම් (කාන්තා) යන අංශවල තෙවන ස්ථානය ද අත්කර ගන්නා ලදී. කෙසේ වෙතත් මෙවර සමස්ත අන්තර් විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා ශූරතාවයේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලය හයවැනි ස්ථානයේ රැඳී සිටියේය.

**විදෙස් සංචාරක/ආරාධිත තරඟාවලි / ප්‍රධාන තරඟාවලි FISU ලෝක විශ්වවිද්‍යාල දැල්පන්දු ශූරතාව - 2018**

ශාස්ත්‍ර පීඨයේ එක් ශිෂ්‍යාවක් (නීතිවේදී උපාධි පාඨමාලාව) ශ්‍රී ලංකා ජාතික විශ්වවිද්‍යාල දැල්පන්දු කණ්ඩායම නියෝජනය කරමින් ඉහත ශූරතාවය සඳහා සහභාගී වූවාය. උගන්ඩා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමය හා මකරාරේ විශ්වවිද්‍යාලය සත්කාරකත්වය දැරූ මෙම ශූරතාවය සැප්තැම්බර් 17-21 දිනවල උගන්ඩාවේදී පවත්වන ලදී. ඇමෙරිකා එක්සත් ජනපදය, දකුණු අප්‍රිකාව, සිංගප්පූරුව, උගන්ඩාව හා කෙන්යාවේ දැල්පන්දු කණ්ඩායම් මෙම ශූරතාවයට සහභාගී වූහ. මෙහිදී ශ්‍රී ලංකා ජාතික විශ්වවිද්‍යාල කණ්ඩායම ඇමෙරිකාව හා සිංගප්පූරු කණ්ඩායම් වලට එරෙහිව සුවිශේෂී දක්‍ෂතා දක්වමින් ඇමෙරිකා කණ්ඩායම 50-48 හා සිංගප්පූරු කණ්ඩායම ලකුණු 15කින් පරාජය විය.

**FISU ලෝක විශ්වවිද්‍යාල රග්බි ශූරතාවය - 2018**

ඉහත සත් සාමාජික රග්බි ශූරතාවය ජූලි 12-14 දින දක්වා නැම්බියාවේදී පැවැත් වූ අතර පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිසුන් සිව්දෙනෙකු (4) ශ්‍රී ලංකා ජාතික විශ්වවිද්‍යාල රග්බි කණ්ඩායම නියෝජනය කළහ.

**13 වැනි UiTm ජාත්‍යන්තර ක්‍රීඩා ෆියස්ටා - 2018 සහභාගීත්වය**

මෙම ක්‍රීඩා ඉසව්ව මැලේසියාවේ මාරා තාක්‍ෂණික විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කළ අතර එය අගෝස්තු 1-5 දින දක්වා විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී පැවැත්විය. මෙම විශ්වවිද්‍යාලයීය බැඩ්මින්ටන් (පිරිමි/කාන්තා) සහ පිරිමි පාපන්දු කණ්ඩායම් මේ සඳහා සහභාගී වූහ.

**ජාතික තරඟාවලි**

**පාපන්දු FA කුසලානය**

ශ්‍රී ලංකා පාපන්දු සංගමය විසින් පවත්වන ලද මෙම තරඟාවලියට සහභාගී වූ පේරාදෙණිය කණ්ඩායම අර්ධ අවසන් වටයේදී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල කණ්ඩායමට පරාජය විය.

**පාපන්දු - ප්‍රීමියර් ලිග් දෙවන කාණ්ඩය**

ශ්‍රී ලංකා පාපන්දු සංගමය විසින් පවත්වන ලද ඉහත තරඟාවලියට පේරාදෙණිය පාපන්දු කණ්ඩායම සුදුසුකම් ලබා පොල්ගහවෙල යං ලයන්ස් ක්‍රීඩා සමාජය සමග තරඟ වැදුනු අතර නොවැළැක්විය හැකි හේතු නිසා ඉතිරි තරඟ දෙකට සහභාගී වීමට නොහැකි විය.

**කැරම්**

50වැනි ජාතික කැරම් ශුරතාවය-2018 පෙබරවාරි 11 දින සිට මාර්තු 05 දින දක්වා පවත්වන ලද අතර පේරාදෙණිය විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් ක්‍රීඩිකාවන් දෙදෙනෙකු සහ ක්‍රීඩකයන් හය දෙනෙකු සහභාගී වූහ. මෙහිදී ශාස්ත්‍ර පීඨයේ ඩී.එම්.යූ.එස් දිසානායක පළමු පෙළ ක්‍රීඩක ලැයිස්තුවේ 08වැනි ස්ථානයේ රැඳී සිටී.

**පේරාදෙණිය විශ්වවිද්‍යාල ක්‍රිකට් කණ්ඩායම දෙවන කාණ්ඩයට සුදුසුකම් ලබයි.**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ක්‍රිකට් කණ්ඩායම ඉහළ දක්ෂතා දක්වමින් දෙවන කාණ්ඩයට සුදුසුකම් ලබාගත් අතර මෙම තරඟාවලියේ බොහෝ තරඟ සංඛ්‍යාවකින් ජයග්‍රහණය කිරීමට ඔවුන් සමත් විය.

**ශාරීරික අධ්‍යාපනික/පුහුණු වැඩසටහන්**

ශාරීරික අධ්‍යාපන අංශය විශ්වවිද්‍යාල මට්ටමේ තරඟ හා වෙනත් බාහිර තරඟාවලි ඉලක්ක කරගනිමින් ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා පුහුණු වැඩසටහන් පවත්වන ලදී. එමෙන්ම ශක්තිවර්ධන පුහුණු හා ශාරීරික සුවතා වැඩසටහන්ද ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට සහ විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පුද්ගලයන් සඳහාත් පවත්වන්නට විය. විශ්වවිද්‍යාලයේ දැනට පවතින සියළුම ක්‍රීඩා ඉසව් සඳහා ජනවාරි මාසයේ සිට වසර පුරාම පුහුණු සැසි හා වැඩමුළු පවත්වන ලදී. ඒ හැරුණු කොට ජලක්‍රීඩා සහ විනෝද ජනක ඉසව්ද විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපාධි අපේක්ෂකයන් සහ කාර්යය මණ්ඩල සාමාජිකයන් ඉලක්කකොට ගෙන වසර පුරාම පැවැත්විය. නව ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රීඩා විද්‍යාව පිළිබඳ කෙටි පාඨමාලා ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් වෙනුවෙන් පැවැත්වූ අතර මීට පෙර මෙම ක්‍රියාකාරකම් මෙහි නොතිබිණි. පාඨමාලා කාලසීමාව මාස තුනකට ද බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව 30කට ද සීමා කළ අතර සිසුන් මේ සඳහා මහත් උනන්දුවෙන් සහභාගී විය.

ශාරීරික අධ්‍යාපන අංශය වෛද්‍ය පීඨය සමඟ එක්ව ව්‍යායාම සහ ක්‍රීඩා විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව පවත්වන ලදී. තවද මෙම අංශය ශාස්ත්‍ර පීඨයේ අධ්‍යාපන අධ්‍යයන අංශය මගින් පවත්වන ලද ශාරීරික අධ්‍යාපන ප්‍රථම උපාධි අපේක්ෂක පාඨමාලාව සඳහා දේශන හා පුහුණු මාලාවක් පවත්වමින් මෙම පාඨමාලාව ජනප්‍රිය කිරීමට සහයෝගය දක්වන ලදි.

**බාධක සහ පිළියම්**

ප්‍රථම උපාධි අපේක්ෂකයන් සඳහා ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය හා සම්බන්ධවූ non-credit විෂයන් පැවැත්වීම සඳහා ශාරීරික අධ්‍යාපන අංශය විසින් ගත් උත්සාහයන් සාර්ථක වූ අතර මෙම ව්‍යාපෘතිය 2019 ක්‍රියාකාරී සැලසුමට ඇතුළත් කොට ඉංජිනේරු, සම සෞඛ්‍ය, විද්‍යා හා කලා යන පීඨ සඳහා ඉදිරි වසරේ සිට ක්‍රියාත්මක කරනු ඇත.

ධාවන පථය අලුත්වැඩියා කිරීම දීර්ඝ කාලයක සිට දැනුණු අවශ්‍යතාවක් වූ අතර එය ක්‍රියාත්මක කිරීමට හැකි විය. එමෙන්ම රග්බි හා පාපන්දු, ක්‍රිකට්, පිහිනුම් තටාක, ක්‍රීඩාගාර සහ ගෘහස්ථ ක්‍රීඩාගාරයට ගොඩනැගිලි දිගුවක් ඉදිකිරීම කඩිනමින් අවශ්‍යව ඇත. මූල්‍යමය සීමාවන් හේතුවෙන් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කළ නොහැකිවිය.

**අනාගත සැලසුම්**

ශාරීරික අධ්‍යාපන අංශය ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපනය සියළුම පීඨ සඳහා non-credit පදනම මත ප්‍රථම උපාධි විෂයමාලාවට ඇතුළත් කිරීමට අදහස් කරයි. තව ද, මෙම අංශය බාහිර පුද්ගලයන් සඳහා ක්‍රීඩා හා ශාරීරික සුවතාවය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හඳුන්වාදීමට ද අපේක්ෂාකරයි. එමෙන්ම අනාගත සංවර්ධනය හා පර්යේෂණ පැවැත්වීම සඳහා විදෙස් ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමට ද මෙම අංශය බලාපොරොත්තු වේ.

## 5.5 ආරක්ෂක සේවාවන්

[ප්‍රධාන ආරක්ෂක නිලධාරී - ආර්.එම්. ඩිනාල් රත්නායක (වැඩ බලන)]

### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය මුළු භූමි ප්‍රමාණය ආසන්න වශයෙන් අක්කර 1795 කින් යුක්තවේ. මෙතරම් විශාල ප්‍රදේශයක් පුරා පැතිර පවතින විශ්වවිද්‍යාලයට අයත් නිශ්චල හා චංචල දේපල ආරක්ෂා කිරීමේ කාර්යභාරය විශ්වවිද්‍යාල ආරක්ෂක අංශය විසින් සිදුකරනු ලබයි. ප්‍රධාන ආරක්ෂක නිලධාරී නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක නිලධාරී, ආරක්ෂක පරීක්ෂකවරු හා ආරක්ෂක නියාමකයන්ගෙන් මෙන්ම කාන්තා ආරක්ෂක නියාමකවරියන්ගෙන් ආරක්ෂක අංශය සමන්විත වේ. මේ වනවිට ප්‍රධාන ආරක්ෂක නිලධාරී තනතුර පුරප්පාඩුව පවතී. මෙම ආරක්ෂක අංශය සතු ආරක්ෂක පරීක්ෂකවරුන් 11ක් හා ආරක්ෂක නියාමකවරුන් 62 දෙනෙකු සිටින අතර එම සංඛ්‍යාව මුළු භූමි ප්‍රමාණය ආවරණය කිරීමට ප්‍රමාණවත් නොවේ. එබැවින් පුද්ගලික ආරක්ෂක සේවාවන්ගේ සේවය ලබාගැනීමට ද සිදුව ඇත.

### ජයග්‍රහණ

- මුරකුටි හා ජංගම මුර සංචාර මගින් සමස්ත විශ්වවිද්‍යාලයේ නිශ්චල චංචල දේපල ආරක්ෂා කිරීම සඳහා ආරක්ෂක පියවර ගැනීම
- විශ්වවිද්‍යාලය තුළ නීති විරෝධි ක්‍රියාවන් වැළැක්වීම හා ඒවා විමර්ශනය කොට ඒ පිළිබඳ පරිපාලනය දැනුවත් කිරීම
- අධ්‍යයන කාර්ය මණ්ඩලය, සිසුන් සහ වෙනත් සේවකයන් විසින් මුහුණ දෙන ගැටලු හඳුනාගෙන ඒ සැමට ආරක්ෂාව සැපයීම, සිසු විනය සම්බන්ධයෙන් පියවර ගැනීම
- සොරකම් වැළැක්වීමට අවශ්‍ය පියවර ගැනීම හා ගිනිගැනීම් වැළැක්වීමට පියවර ගැනීම
- වැඩමුළුවලට හා ශිෂ්‍ය සංගම් විසින් සංවිධානය කරනු ලබන විවිධ ක්‍රියාකාරකම් සඳහා ආරක්ෂාව ලබාදීම
- විශ්වවිද්‍යාල නිවාසවල පදිංචිව සිටින සේවකයන් අතර ඇතිවන අර්බුද විමර්ශනය කිරීම
- විශ්වවිද්‍යාලය තුළ ඇතිවිය හැකි විවිධ ගැටලු හඳුනා ගැනීම හා ඒ සඳහා සුදුසු යෝජනා ඉදිරිපත් කිරීම අවශ්‍ය වුවහොත් පොලිසිය සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව කටයුතු කිරීම
- ආගමික කටයුතු හා සමාජ සුබසාධන කටයුතුවල නියැලීම (ලේ දන්දීමේ කඳවුර)
- එදිනෙදා ලැබෙන පැමිණිලි හා සිද්ධීන් පිළිබඳ විමර්ශනය කොට පරිපාලනයට වාර්තා කිරීම

### බාධක සහ පිළියම්

- ප්‍රමාණවත් මිනිස් බලයක් නොමැතිවීම ආරක්ෂක රාජකාරී ඉටුකිරීමට බාධකයක් වී ඇත
- ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ඉඩ ප්‍රමාණවත් නොවීම
- සේවා ස්ථානවල භෞතික සම්පත් හිඟය
- විශ්වවිද්‍යාල ඉඩම වටා වැටවල් නොමැතිවීම නිසා බාහිර පුද්ගලයන් පහසුවෙන් ඇතුලුවීම
- විශ්වවිද්‍යාලය හරහා දිවෙන ප්‍රධාන මාර්ගය බාධාවකි
- ආරක්ෂක කටයුතු සඳහා නවීනතම තාක්ෂණික උපකරණ භාවිත නොකිරීම

### අනාගත සැලසුම්

- මනා පුහුණුවක් ලද ආරක්ෂක නිළධාරීන් බඳවා ගැනීම
- පිරිමි සහ කාන්තා ආරක්ෂක නියාමකයන් බඳවා ගැනීමේදී අට ශ්‍රේණිය සමතුන් වෙනුවට අ.පො.ස. (සා.පෙ.) සමතුන් බඳවා ගැනීමට ප්‍රමුඛතාවය ලබාදීම
- ආරක්ෂක කාර්ය මණ්ඩලය වෙනුවෙන් ගිනි නිවීම, ප්‍රථමාධාර, මහජන සම්බන්ධතා, අපරාධ නීතිය හා සිවිල් නීතිය පිළිබඳව වැඩමුළු හා පුහුණු සැසි පැවැත්වීම
- විද්‍යාත්මක ක්‍රම යොදාගෙන සොරකම් වැළැක්වීම
- සියලු පීඨවල අනු ආරක්ෂක කාර්යාල පිහිටුවා ඒවා ආරක්ෂක නිලධාරියෙකුගේ වගකීම යටතට පත්කිරීම
- CCTV කැමරා සවිකොට පරිගණක විද්‍යාගාර, විද්‍යාගාර පුස්තකාල හා ගබඩාවලට ආරක්ෂාව සැපයීම
- විශ්වවිද්‍යාලයට පිවිසෙන ප්‍රධාන දොරටුව ඇතුලු අදාළ ස්ථානවල ආරක්ෂක මුරකුටි ඉදිකොට ආරක්ෂාව තහවුරු කිරීම
- දිවා රාත්‍රි ආරක්ෂක සංචාර මගින් තොරතුරු රැස්කිරීම
- විශ්වවිද්‍යාල වාහනවලට පූර්ණ ආරක්ෂාවක් ලබාදීම සඳහා විශේෂ රථගාලක් පිහිටුවීම
- අක්‍රමවත් ලෙස වාහන ගාල්කිරීම හේතුවෙන් විශ්වවිද්‍යාලයේ සුන්දරත්වයට හානි සිදුවීම නිසා ක්‍රමවත් රථගාලක් ඉදිකිරීම අවශ්‍යතාවයක්ව පවතී

## 5.6 ශිෂ්‍ය නේවාසික අංශය
(අධ්‍යක්ෂ - ඒ.එන්. සිරිවර්ධන)

### හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය නේවාසික අංශය විශ්වවිද්‍යාලය තුළ පවතින 21කට අධික නේවාසිකාගාර පරිපාලනය කරමින් ඒවා සිසුන්ට වෙන් කර දෙමින් විශ්වවිද්‍යාලයේ සියළුම සිසුන්ට ඉතා පුළුල් සේවාවන් සලසා දෙනු ලබයි. කාර්යක්ෂම හා ඵලදායී නේවාසික සේවාවන් හා පහසුකම් සපයා දෙමින් සිසුන්ට සහායවීම මෙම අංශයේ ඉලක්කයයි.

ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන්ට නේවාසික පහසුකම් සැපයීම, නේවාසික සිසුන්ගෙන් නේවාසිකාගාර ගාස්තු හා හානි පූර්ණ ගාස්තු අයකර ගැනීම, නේවාසිකාගාරවල අදාළ උපශාලාධිපතීන් විසින් කරන ඉල්ලීම්වලට අනුව එම නේවාසිකාගාරවලට ලී බඩු සපයාදීම මෙම අංශයේ ප්‍රධාන කෘත්‍යයන් වේ.

- නේවාසික අයදුම්පත් /නේවාසික පහසුකම් වෙන් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ නිවැරදි තොරතුරු හා උපදෙස් සැපයීම.
- අවශ්‍යතාවන්ට අනුව අයදුම්කරුවන් හඳුනාගැනීම (උදා-ආබාධිත සිසුන්)
- සියලුම ජාතීන්ට අයත් සිසුන් වෙත සමබරව ඵලදායි ආකාරයෙන් ශිෂ්‍ය නේවාසිකාගාර වෙන් කරදීම
- අඩු ආදායම්ලාභී පවුල්වල සාමාජිකයින්ට නිසි අයුරින් නේවාසික පහසුකම් සැපයීම
- ශිෂ්‍ය ගැටලුවලට හා අවශ්‍යතාවන්ට කාර්යක්ෂමව හා ඵලදායි ආකාරයෙන් ප්‍රතිචාර දැක්වීම
- නේවාසික සිසුන්ට වඩාත් උසස් වූ සහයෝගයක් ලබාදීම සඳහා විශ්වවිද්‍යාලයේ අනෙකුත් දෙපාර්තමේන්තු සමඟ මැදිහත් වී සම්බන්ධීකරණය කිරීම
- සිසුන්ට සපයන පහසුකම් හා සේවාවන් පිළිබඳ පවතින තත්ත්වයන් විශ්ලේෂණය හා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස ශිෂ්‍ය අදහස් ලබාගැනීම
- ශිෂ්‍ය නේවාසිකාගාරවල ආහාර ස්වස්ථතාව හා සනීපාරක්ෂක සේවාවන් අධීක්ෂණය කොට ප්‍රමිතිය පවත්වා ගැනීම

**අපගේ ශිෂ්‍ය නේවාසික ප්‍රතිපත්තිය**

සිසුන්ගේ නිවාසවල සිට විශ්වවිද්‍යාලයට පවතින දුර සැලකිල්ලට ගනිමින් නේවාසික පහසුකම් සපයනු ලබයි.

| | | |
|---|---|---|
| ප්‍රථම වසර සිසුන් | - | කි. මී 30 ට වැඩි |
| දෙවන වසර සිසුන් | - | කි. මී 40 ට වැඩි |

**(අදාළ අධ්‍යයන වසර තුළ නේවාසිකාගාරවල පවතින පුරප්පාඩුවලට අනුව)**

| | | |
|---|---|---|
| තෙවන වසර සිසුන් | - | කි. මී 30 ට වැඩි |
| සිව්වන වසර සිසුන් | - | කි. මී 20 ට වැඩි |
| පස්වන වසර සිසුන් | - | කි. මී 10 ට වැඩි |

එපමණක් නොව මෙම අංශය මගින්,

1. ක්‍රීඩා කණ්ඩායම්වල නායකයන් හා උපනායකයන් සඳහා ද නේවාසිකාගාර පහසුකම් සපයනු ලබයි.
2. විශේෂ අවශ්‍යතා සහිත සිසුන්
3. විශ්වවිද්‍යාලයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී විසින් වෛද්‍ය හේතුන් මත නිර්දේශ කරනු ලබන සිසුන්
4. ග්‍රාමසේවා නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ හා නියෝජ්‍ය උපකුලපති සහ අධ්‍යක්ෂ/නේවාසික යන අයගේ නිර්දේශය මත දැඩි ආර්ථික අපහසුතාවයන්ගෙන් පෙළෙන සිසුන් සඳහා ද නේවාසික පහසුකම් සපයනු ලබයි.

5. ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් වෙත නේවාසික පහසුකම් සැපයීමේ ප්‍රධාන සැලසුමක් විශ්වවිද්‍යාලය සතුව පවතින නමුත් මේ වනවිට එම පහසුකම් සැපයිය හැක්කේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 65% කට පමණි. විශ්වවිද්‍යාලය සතුව නේවාසිකාගාර 21ක් පවතින අතර ඒ එක් එක් ශාලාවට අර්ධ කාලීන අධ්‍යයන ශාලාධිපතිවරයෙකු, ජ්‍යෙෂ්ඨ අධ්‍යයන උපශාලාධිපතිවරයෙකු, අධ්‍යයන උපශාලාධිපති වරයෙකු හා පූර්ණ කාලීන උප ශාලාධිපතිවරයෙකු ද සිටින අතර ඔහු නේවාසිකාගාරවල එදිනෙදා පවතින කටයුතුවලට සහයෝගය දක්වයි.

**ජයග්‍රහණ**

- අංක 5 මහකන්ද හා අංක 6 ඇතුළත්මුදලි නව නේවාසිකාගාර ඉදිකිරීම මේ වනවිටත් අවසන් කොට පේරාදෙණිය විශ්වවිද්‍යාලය වෙත බාරදී අනෙකුත් අවශ්‍ය යටිතල පහසුකම් මේ වනවිට සැපයෙමින් පවතී.
- 2018 වසරේදී සිසුන් 7174 දෙනෙකුට නවාතැන් පහසුකම් සපයා ඇත.
- රාමනාදන් ශාලාව අසල නව නේවාසිකාගාර දෙකට අවශ්‍ය ලී බඩු සැපයීමෙන් අනතුරුව සිසුන් 800කට නවාතැන් සැපයිය හැකිවේ.
- විශ්වවිද්‍යාලයේ පැරණි නේවාසිකාගාර ප්‍රතිසංස්කරණය 2018 වර්ෂයේ ආරම්භයේ සිට ආරම්භ කොට ඇත.

**බාධක සහ පිළියම්**

- නවාතැන් පහසුකම් ඉල්ලා අයදුම් කළ සියළුම සිසුන්ට එම පහසුකම් සැලසීමට නොහැකිවීම.
- අංක 05 හා අංක 06 නේවාසිකාගාරවල මූලික අවශ්‍යතාවන් සපුරාලීමට නොහැකි වී ඇත්තේ සපයන ලද ලී බඩු ඉල්ලුම් කළ නියමයන්ට අනුකූල නොවීම හේතුවෙනි.

**අනාගත සැලසුම්**

- 2019 වසරේදී අංක 05 හා අංක 06 නේවාසිකාගාරවලින් සිසුන් 800 දෙනෙකුට නවාතැන් පහසුකම් ලබාදීමට අපේක්ෂිතයි.
- ගැහැණු සිසුන් 800 දෙනෙකුට නේවාසික පහසුකම් සැපයිය හැකි වෙනත් නව නේවාසිකාගාරයක් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

## 5.7 ශිෂ්‍ය සේවා අංශය

(නියෝජ්‍ය ලේඛකාධිකාරී - පී.එච්. ආරියරත්න මහතා)

### හැඳින්වීම

විශ්වවිද්‍යාල සිසුන්ගේ සමස්ත සුබසාධන කටයුතු සැලසුම් කිරීම ශිෂ්‍ය සේවා අංශයේ ප්‍රධාන වගකීම වේ. මෙම වගකීම ඉටුකිරීමේදී මෙම අංශය විශ්වවිද්‍යාලයේ සියළුම පීඨ හා වෙනත් සේවා අංශ සමග සම්බන්ධීකරණය කරමින් සිසුන්හට සියළු ආකාරයේ සේවාවන් ලබාදීමට වෙහෙස දරයි.
අධ්‍යයන සාර්ථකත්වය හා ශිෂ්‍ය සංවර්ධනය උදාකිරීම සඳහා වැඩසටහන්, සේවාවන් හා පහසුකම් සපයා දෙමින් විශ්වවිද්‍යාලයේ අපේක්ෂිත මෙහෙවර කරා ලඟාවීමට ශිෂ්‍යසේවා අංශය කැපවී ක්‍රියා කරයි. විවිධ වූත් ගතිකත්වයෙන් යුතුවූත් ගෝලීය සමාජයේ ඉදිරි කාර්යයන් බාරගැනීමට පෙළගැසෙන ශිෂ්‍ය ප්‍රජාවට ඒ සඳහා මහත් වූ ප්‍රේරණයක් ශිෂ්‍ය සේවා අංශයේ මෙම උත්සාහයන් තුළින් ලබාදීම අපේක්ෂාවයි.

සිසුන්ගේ සහ සමස්ත විශ්වවිද්‍යාල ප්‍රජාවට අයත් සියලු සාමාජිකයන්ගේ අධ්‍යයන, සමාජමය, සංස්කෘතික හා මූල්‍ය සංවර්ධනයට සහයෝගය දැක්වීම ශිෂ්‍ය කටයුතු සඳහා වන දැක්ම වේ.

- සිසුන්ගේ සමාජ හා සංස්කෘතික පසුබිම ප්‍රවර්ධනය කෙරෙන සම්බන්ධතා සංවර්ධනය
- සිසුන්ට මූල්‍ය පහසුකම් සැපයීම මෙහි ඉලක්කයන්ට ඇතුළත් වේ.

### සේවාවන්

**1. මහපොළ ශිෂ්‍යත්ව**

මහපොළ ශිෂ්‍යත්වලාභීන් තෝරාගනු ලබන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් වන අතර මහපොළ භාරකාර අරමුදලින් මූල්‍ය අවශ්‍යතාවන් ඉටුකරනු පිණිස සෑම මසකම විශ්වවිද්‍යාලය වෙත මුදල් ලබාදෙනු ලබයි. ගෙවීගිය වසරවල සිසුන්ගේ විශාලතම මූල්‍ය සහාය බවට මහපොළ ශිෂ්‍යත්වය පත්ව ඇත. විශාල සිසුන් සංඛ්‍යාවක් ප්‍රතිලාභ ලබන ශිෂ්‍යත්ව ක්‍රමයක් හෙයින් ද ශ්‍රී ලංකා රජය විසින් හඳුන්වා දෙනු ලැබූ ජාතික ව්‍යාපාරයක් වන හෙයින් ද මෙය ඉතා වැදගත්වේ. සමහර මහපොළ ශිෂ්‍යත්ව දක්ෂතාව පදනම් කරගනිමින් ප්‍රදානය කෙරෙන අතර අසරණ සිසුන් විශාල පිරිසකට මූල්‍යමය සහයෝගය මෙතුළින් ලබාදෙනු ලබයි. 2018 වසරේදී මෙම විශ්වවිද්‍යාලයේදී 5643කට මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය කොට ඇති අතර එහි මුළු වටිනාකම රුපියල් 28259500කි.

**2. ශිෂ්‍යාධාර දීමනාව**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අඩු ආදායම්ලාභී පවුල්වල සිසුන්ට ශිෂ්‍යාධාර දීමනාව හිමිවන අතර ඒ සඳහා ඔවුන් විශ්වවිද්‍යාලයට ඇතුළත් වන අවස්ථාවේ ශිෂ්‍යසේවා අංශයෙන් අයදුම්පත් ලබාගත යුතුවේ. ශිෂ්‍යාධාර ප්‍රදානය ශිෂ්‍යසේවා අංශය මගින් සිදුකරනු ලබයි. දෙමාපිය වාර්ෂික ආදායම රුපියල් ලක්ෂ තුනට අඩු සිසුන්ට රුපියල් 3,900/ හා 4000ක් බැගින් විශ්වවිද්‍යාලය මගදින් මුදල් ලබාදෙනු ලබන අතර එලෙස 2018 වසරේදී ශිෂ්‍යාධාරලාභීන් සංඛ්‍යාව 1757ක් පමණ වේ. කෙසේ වෙතත් දෙමාපියන්ගේ වාර්ෂික ආදායම රුපියල් ලක්ෂ පහ දක්වා වියයුතු බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 2018/11 මගින් සඳහන් කොට ඇත. මෙය 2018 ඔක්තෝම්බර් මස සිට බලපැවැත්වේ.

**3. ප්‍රවාහන ප්‍රවේශ පත්‍ර**

නේවාසික නොවන සිසුන්ට රාජ්‍ය ප්‍රවාහන සේවයේ සහනදායි මිලට ගමන් කිරීමේ ප්‍රවාහන ප්‍රවේශ පත්‍ර ලබාගැනීම සඳහා අයදුම් කිරීමේ ලිපි නිකුත් කරනු ලබන්නේ ද ශිෂ්‍යසේවා අංශය මගිනි.

**4. ශිෂ්‍ය උපදේශනය හා විනය**

විශ්වවිද්‍යාලය තුළ සිසුවිනය පවත්වාගැනීම සඳහා පියවර රාශියක් විශ්වවිද්‍යාලය මගින් ගනු ලබයි. සිසු විනය කටයුතු සම්බන්ධයෙන් උපකුලපතිවරයා වෙනුවෙන් ක්‍රියාකිරීම සඳහා ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සමාජිකයෙකු විනයපාලක ලෙස උපකුලපති විසින් පත්කර ඇති අතර පීඨාධිපතින් සමඟ සාකච්ඡා කොට සෑම පීඨයකටම නියෝජ්‍ය විනයපාලකවරයෙකු බැගින් පත්කොට ඇත.

**5. ශිෂ්‍ය සංගම්**

සියළු පීඨවල ශිෂ්‍ය සංගම්වල ඡන්ද පවත්වනු ලබන්නේ ශිෂ්‍ය සේවා අංශය මගින් වන අතර පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය මහා ශිෂ්‍ය සංගමයේ නිලධාරීන් තෝරා ගැනීමේ ඡන්ද කටයුතු භාර නිලධාරියා ලෙස ශිෂ්‍ය

සේවා අංශයේ නියෝජ්‍ය ලේඛකාධිකාරි, උපකුලපතිතුමා විසින් පත්කරනු ලබයි. 2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා පීඨ නවයේ ශිෂ්‍ය සංගම් හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය මහ ශිෂ්‍ය සංගමය අදාළ නීතිරීතිවලට අනුව ස්ථාපිත කරන ලදි.

**6. ශිෂ්‍ය සංගම්, සංස්කෘතික හා සමාජ ක්‍රියාකාරකම්**

වර්තමානය වනවිට පේරාදෙණිය විශ්වවිද්‍යාලය තුළ ශිෂ්‍ය සංගම් 92ක් ලියාපදිංචි කොට ඇත. 2017 වර්ෂයේදී ශිෂ්‍ය සංගම් 84ක් පමණක් පැවතිණි. ශිෂ්‍ය ප්‍රජාව අතර සමාජ අන්තර් සබඳතාවන් දියුණු කරගැනීම පිණිස සිසුන් අතර ක්‍රියාකාරකම් කිහිපයක් පවත්වන ලදී. මෙම ශිෂ්‍ය සංගම් සෑම වසරකම ශිෂ්‍ය සේවා අංශයේ ලියාපදිංචි විය යුතු හෝ ලියාපදිංචිය නැවත අලුත් කරවා ගතයුතු වේ.

ශිෂ්‍යසේවා අංශය ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශකයන්ගේ, විනයපාලක හා නියෝජ්‍ය විනයපාලකවරුන්ගේ ශාලාධිපතීන් හා උප ශාලාධිපතීන්ගේ, කලා සභාවේ, ශිෂ්‍යත්ව අනුකමිටුවේ, නවකවදය වැළැක්වීමේ හා වෘත්තීය මාර්ගෝපදේශන උපදේශක කමිටුවේ රැස්වීම් කැඳවීමට බැඳී සිටී. මෙම අංශයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී ශිෂ්‍යත්ව අනුකමිටුවේ ලේකම් ලෙසද කටයුතු කරයි.
විශ්වවිද්‍යාල කලා සභාව විශ්වවිද්‍යාල ප්‍රජාවගේ යහපත උදෙසා වාර්ෂිකව නාට්‍ය උළෙල, නාට්‍ය, චිත්‍ර, ඡායාරූපකරණය, කාව්‍ය, කෙටි කථා තරඟ සංස්කෘතික කටයුතු රාශියක් සංවිධානය කරනු ලබයි. එමෙන්ම වාර්ෂික කලා උළෙල කලා සභාවේ ඉතා වැදගත් කර්තව්‍යයකි. විශ්වවිද්‍යාලයේ පවතින සම්පත් භාවිතා කරමින් 2017 උපාධි ප්‍රදානෝත්සවයේ ඡායාරූපකරණය සිදුකරන ලද්දේ ද කලා සභාව විසිනි.
ශිෂ්‍යත්ව කමිටුවේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කරන මෙම අංශය රන් පදක්කම්, ත්‍යාග, ශිෂ්‍යත්ව හා ශිෂ්‍යභාවයන් සම්බන්ධ ලිපිගොනු පවත්වාගෙන යෑම ආදි කටයුතු සිදුකරන අතර රන්පදක්කම්, ත්‍යාග හා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ වගකීම් ද උසුලයි.

සිසුන් යම් ක්‍රියාකාරකමක් චාරිකා/විනෝදගමන් ආදිය සංවිධානය කරන විට විශ්වවිද්‍යාලයේ අවසරය ලබාගත යුතු අතර ශිෂ්‍ය සේවා අංශය ඒ සඳහා අවසර ලබාදීමේ ලිපි නිකුත් කරනු ලබයි.
ඉහත කටයුතුවලට අමතරව ශිෂ්‍ය සේවා අංශය විශ්වවිද්‍යාල විනයපාලක, නියෝජ්‍ය විනයපාලක, ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශකයන්, ශාලාධිපතින්, ජ්‍යෙෂ්ඨ අධ්‍යයන උපශාලාධිපතීන් සහ අධ්‍යයන උපශාලාධිපතීන් පත්කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කොට පහසුකම් සැලසීම සිදුකරයි. එමෙන්ම ස්ථිර කාර්ය මණ්ඩලයේ හා තාවකාලික කාර්ය මණ්ඩලවල නේවාසික කටයුතු සම්බන්ධයෙන් කටයුතු කරන්නේ ද ශිෂ්‍ය සේවා අංශයයි.

**ජයග්‍රහණ**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නව චක්‍ර ලේඛනයට අනුව විශාල සිසුන් පිරිසකට ශිෂ්‍යාධාර ශිෂ්‍යත්වය ප්‍රදානය කළහැකි වේ
- මහපොළ ශිෂ්‍යත්ව අයදුම්පත් පීඨ මගින් එකතු කරනු ලබන අතර ඒවා මහපොළ භාරකාර අරමුදල වෙත යවනු ඇත
- නවකවදය වැළැක්වීමේ කමිටු හරහා අදාළ වර්ෂයේ නවකවදය අවම කිරීම

**බාධක සහ පිළියම්**

- මෙම අංශයේ සුමට ගලනය සඳහා කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම
- එමෙන්ම මෙම අංශයේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම

**අනාගත සැලසුම්**

- සමාජ හා සංස්කෘතික වැඩසටහන් සඳහා පහසුකම් පුළුල් කොට ශක්තිමත් කිරීම
- සිසුන්ට අදාළ විනය ක්‍රියාමාර්ග සංවිධානය කිරීම
- ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශකයන්, විනයපාලක හා නියෝජ්‍ය විනයපාලකවරුන් සමග සිසුන් සම්බන්ධ කිරීමේ සංවිධාන ජාලයක් සංවර්ධනය කිරීම
- ශිෂ්‍ය උපදේශන ඒකකය ශක්තිමත් කිරීමට වෙහෙස දැරීම
- සිසුන්ගේ පැමිණිලි/ගැටලු/දුක්ගැනවිලි පිළිබඳව සලකා බැලීම

# 6. පර්යේෂණ, ප්‍රකාශන සහ සම්මාන

## 6.1 විද්‍යා හා තාක්ෂණ සංවර්ධන ප්‍රතිඵල

| විද්‍යා හා තාක්ෂණ භාණ්ඩයේ නම | තත්ත්වය | | |
|---|---|---|---|
| | සංවර්ධනය කළ | වෙනස් කළ | වාණිජකරණය/ ප්‍රකාශයට පත්කළ |
| **1. නව නිෂ්පාදන ක්‍රියාමාර්ගවල සංවර්ධනය** | | | |
| උදා:- පොතු ගැලවීමේ යන්ත්‍රය | ✓ | ✓ | |
| කිරිවල E-coil බැක්ටීරියාව තීරණය කිරීමේ කඩිනම් හා සෘජු පරීක්ෂණ | ✓ | ✓ | |
| අසූචිවල Mycobacterium tuberculosis සංඝටකය සොයා බැලීමේ සංවේදී ක්‍රමය | ✓ | | |
| A nanoparticle liaded with geutaricin to target intracellutar pathogens | ✓ | | |
| **2. පවතින නිෂ්පාදන හා ක්‍රියාමාර්ගවල තත්ත්වය වැඩිදියුණු කිරීම** | | | |
| ආහාරවල ඇෆලධූලකය තීරණය කිරීමේ PHLC-FLD පදනම් කරගත් පරීක්ෂණය | ✓ | ✓ | ✓ |
| Sensim – Load balancing and DEEPS Protocols for moving targets | ✓ | | ✓ |
| **3. නව යන්ත්‍රෝපක රණ වර්ග/දෙමුහුන්/ක්ෂුද්‍ර ජෛන්ද්‍රිකයන් පදනම් කරගත් නිෂ්පාදන සංවර්ධනය** | | | |
| | | | |
| **4. ආනයන ආදේශකයන් සංවර්ධනය** | | | |
| | | | |
| **5. ප්‍රොටොටයිප්ස් සැලසුම් කිරීම** | | | |
| ශරීරයේ උෂ්ණත්වය සිමියුලේට් කිරීමේ ඉන්කියුබේටරය | ✓ | | |
| Sensor network analysis and simulation for moving target variations | ✓ | | ✓ |
| **6. වෙනත්** | | | |
| ශ්‍රී ලාංකික ජලයේ මූලික නිෂ්පාදන ගණනය කිරීම සඳහා මොඩලයක් සංවර්ධනය කිරීම | ✓ | | |

## 6.2 පේටන්ට් බලපත්‍ර

| අධ්‍යයන අංශය | පේටන්ට් බලපත්‍රයේ නම | තත්ත්වය | | | |
|---|---|---|---|---|---|
| | | ක්ෂේත්‍රය | ලැබීම් | මාරු කළ | අලෙවිකල/ බලපත්‍ර ලද |
| **Faculty of Science** | | | | | |
| **1. National** | | | | | |
| විද්‍යා පීඨය | Proto-Type treatment for Zn (ii) in industrial Efflueuts | ✓ | | | |

## 6.3 සාමාන්‍ය ජනයා වෙනුවෙන් දැනුම ව්‍යාප්ත කිරීමේ වැඩසටහන්

| කාණ්ඩය | වැඩසටහනේ නම | සහභාගී වූ සංඛ්‍යාව | ඉලක්ක කණ්ඩායම |
|---|---|---|---|
| **කෘෂි විද්‍යා පීඨය** | | | |
| වැඩමුළු පැවැත්වීම | | | |
| පුහුණු වැඩසටහන් ක්ෂේත්‍ර නිරූපණ පැවැත්වීම | ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන පද්ධතියේ සේවාවන් ඉහළ නැංවීම-2018 | 40 | ජලසම්පාදන මණ්ඩලයේ කාර්ය මණ්ඩලය |
| ප්‍රදර්ශන/මහජන කාර්යයන් සංවිධානය කිරීම | ආහාර හා පෝෂණ වෙළඳාම ජෛව විවිධත්වය පිළිබඳ පාර්ශවකරුවන්ගේ වැඩමුළුව | 30 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් |
| | පාරිසරික කෘෂිකර්මය පිළිබඳ අත්දැකීම් හුවමාරුව | 40 | පුත්තලම් දිස්ත්‍රික්කයේ රජයේ නිලධාරීන් හා රාජ්‍ය නොවන ආයතන |
| **සම සෞඛ්‍ය විද්‍යා පීඨය** | | | |
| වැඩමුළු පැවැත්වීම | වයස පිළිබඳ භෞත චිකිත්සාව | 66 | භෞත චිකිත්සක ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් |
| | පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය භෞත චිකිත්සක සමුළුව-2018 | 91 | භෞත චිකිත්සක ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් |
| | ක්‍රීඩාවල යෙදී සිටීමේදී ඇතිවන තුවාල වැළැක්වීම හා කළමනාකරණය | 200 | මළල ක්‍රීඩක / ක්‍රීඩිකාවන් (පාසල්) |
| | ඉලෙක්ට්‍රෝ-ශාරීරික කාරක (සාක්ෂි පදනම් වූ එළඹුමක්) | 28 | භෞත චිකිත්සක ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් |
| | රෝගී සත්කාරයට ඖෂධවේදීන්ගේ බලපෑම | 30 | රජයේ ඖෂධවේදීන් |
| පුහුණු වැඩසටහන්/ක්ෂේත්‍ර නිරූපණ පැවැත්වීම | වැඩමුළු | 26 | භෞත චිකිත්සක ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් |
| | ක්‍රීඩා භෞතචිකිත්සාව | 50 | භෞත චිකිත්සක ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් |
| | භෞත චිකිත්සක පුනරුත්තාපන වැඩසටහන - වැඩිහිටියන් සඳහා | 40 | පස්බාගේ කොට්ඨාශයේ වැඩිහිටියන් |
| | භෞත චිකිත්සක පුනරුත්තාපන වැඩසටහන - ආබාධිතයන් සඳහා | 25 | උඩපලාත ප්‍රදේශයේ ආබාධිත පුද්ගලයන් |
| | භෞත චිකිත්සක පුනරුත්තාපන වැඩසටහන - ආබාධිතයන් සඳහා | 20 | උඩපලාත ප්‍රදේශයේ ආබාධිත පුද්ගලයන් |
| ප්‍රදර්ශන / මහජන වැඩසටහන් පැවැත්වීම | දැනුවත් කිරීමේ වැඩසටහන් | 40 | පූජාපිටිය පළාත් ලේකම් කාර්යාලයේ නිලධාරීන් |
| **කලා පීඨය** | | | |
| වැඩමුළු පැවැත්වීම | මනෝ විද්‍යා අධ්‍යයන අංශයේ Bio-Danza | 40 | ජ්‍යෙ. ශිෂ්‍ය උපදේශකයන් හා ශිෂ්‍ය උපදේශකයන් |
| | නෘත්‍ය කලා වැඩමුළුව - ඉංග්‍රීසි අධ්‍යයන අංශය | 70 | භාෂා පරිවර්තන හා රංගකලා සිසුන් |
| | නෘත්‍ය කලා වැඩමුළුව - (ජාතික) | 16-26 | ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් හා නාට්‍ය පිළිබඳ උනන්දුවන්නන් |
| | කෙටිකථා රචනය | 25 | විශ්වවිද්‍යාල සිසුන් |

# 6.3 සාමාන්‍ය ජනයා වෙනුවෙන් දැනුම ව්‍යාප්ත කිරීමේ වැඩසටහන් වගුව හා සම්බන්ධ වේ

| කාණ්ඩය | වැඩසටහනේ නම | සහභාගී වූ සංඛ්‍යාව | ඉලක්ක කණ්ඩායම |
|---|---|---|---|
| **කලා පීඨය** | | | |
| පුහුණු වැඩසටහන්/ක්ෂේත්‍ර නිරූපණ පැවැත්වීම | ළමා අපචාර පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන<br>මනෝ විද්‍යා අධ්‍යයන අංශය | 150 | ප්‍රථම උපාධි අපේක්ෂකයන් |
| ප්‍රදර්ශන/මහජන කටයුතු සංවිධානය | ළමා අපචාර පිළිබඳ තෙවන වසර සිසුන්ගේ ප්‍රදර්ශනය | 100 | සාමාන්‍ය ජනතාව / විශ්වවිද්‍යාල ප්‍රජාව |
| ගුවන්විදුලි/රූපවාහිනී/වෙනත් මාධ්‍ය වැඩසටහන්වලට සහභාගී වීම<br>ඉතිහාස අධ්‍යයන අංශය | කැප්පෙටිපොළ නිලමේ වීඩියෝ වැඩසටහන | | සාමාන්‍ය ජනතාව (ආචාර්ය කේ.එම්.ආර්. දසනායක විසින් පවත්වන ලදි) |
| | සංස්කෘතික වැඩසටහන-දෙරණ රූපවාහිනිය | | සාමාන්‍ය ජනතාව (ආචාර්ය කේ.එම්.ආර්. දසනායක විසින් පවත්වන ලදි) |
| වෙනත් | ජාතික දේශන පැවැත්වීම | 500 | දැරණියගල ලේකම් කාර්යාලය |
| | | 250 | රාජ්‍ය පාසල් සිසුන් |
| | | 500 | මහනුවර අධ්‍යාපන කාර්යාලය |
| | | 200 | රාජ්‍ය කාර්ය මණ්ඩල සාමාජිකයන් |
| | ප්‍රධාන දේශන | 200 | රාජ්‍ය කාර්ය මණ්ඩල සාමාජිකයන් |
| | ආගන්තුක දේශන | 500 | රාජ්‍ය පාසල් සිසුන් |
| | නොදුටු ඇස් නාට්‍ය නිෂ්පාදන | 30 | සාමාන්‍ය ප්‍රේක්ෂකයන් |
| **දන්ත වෛද්‍ය පීඨය** | | | |
| වැඩමුළු පැවැත්වීම | දන්ත පල්ප අධ්‍යයනය හා ප්‍රතිචාර | 45 | දන්ත ශල්‍ය වෛද්‍යවරුන් |
| | ඩෙන්ටො-ෆෙෂල් වේදන | 40 | රෙජිස්ට්‍රාර්වරු හා පශ්චාත් උපාධිධාරීන් |
| | දන්ත පල්ප අධ්‍යයනය හා ප්‍රතිකාර | 30 | දන්ත වෛද්‍යවරුන් |
| | දන්ත පල්ප අධ්‍යයනය හා ප්‍රතිකාර | 25 | දන්ත වෛද්‍යවරුන් |
| | මුඛ පිළිකා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 300 | ගම්වැසියන් |
| | මුඛ පිළිකා කලින් හඳුනා ගැනීම | නිලධාරීන් 45 -50 | පවුල් සෞඛ්‍ය නිලධාරීන් හා වතුකරයේ වෛද්‍ය සහායකයන් |
| | පාසල් දැනුවත් කිරීමේ වැඩසටහන | සිසුන් 200-900 | පාසල් සිසුන් |
| | Anterior crossbite කළමනාකරණය | 30 | දන්ත ශල්‍ය වෛද්‍යවරුන් |
| | ළමා කළමනාකරණ උපක්‍රම | 60 | දන්ත චිකිත්සකයන් |
| | ඔබේ දත් පිරිසිදුව තබාගන්නේ කෙසේද? | 100 | පාසල් සිසුන් |
| | දුම්කොළ පිළිබඳ දැනුවත් කිරීම | 300 | කොටගල ගුරු පුහුණුවන්නන් |
| ගුවන් විදුලි/රූපවාහිනී සහ වෙනත් මාධ්‍ය වැඩසටහන් වලට සහභාගී වීම | ළමා දන්ත සෞඛ්‍ය - කඳුරට සේවය | | සමාන්‍ය ජනතාව |
| **ඉංජිනේරු පීඨය** | | | |
| ප්‍රදර්ශන/මහජන කාර්යයන් සංවිධානය | ටෙක්නෝ-2018 | | සිසුන්, වෘත්තිකයන් හා ජනතාව |
| වෙනත් | ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය සංවිධානය කළ “Junior Inventor of the year” තරඟය පිළිබඳ දැන්වත් කිරීමේ වැඩසටහන | 300 | සිසුන් හා ගුරුවරුන් |

## 6.3 සාමාන්‍ය ජනයා වෙනුවෙන් දැනුම ව්‍යාප්ත කිරීමේ වැඩසටහන් වගුව හා සම්බන්ධ වේ

| කාණ්ඩය | වැඩසටහනේ නම | සහභාගී වූ සංඛ්‍යාව | ඉලක්ක කණ්ඩායම |
|---|---|---|---|
| **කළමනාකරණ පීඨය** | | | |
| වැඩමුළු පැවැත්වීම | නායකත්ව වැඩසටහන | 43 | පාසල් ශිෂ්‍ය නායකයන් |
| | මානව සම්පත් සංවර්ධනය | | දියතලාව ස්වෙච්ඡා බලකා පුහුණු පාසල |
| | අභ්‍යන්තර විගණනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 60 | ප්‍රධාන ලේකම් කාර්යාලය ම.ප. පල්ලේකැලේ |
| | මානව සම්පත් සංවර්ධනය | 35 | පූනානි, වැලිකන්ද පළාත් 3ක් |
| ප්‍රදර්ශන/මහජන කාර්යයන් | "වාණිජ දිනය" | 200 | නුගවෙල මධ්‍ය මහා විද්‍යාලයේ වාණිජ සිසුන් |
| වෙනත් | ව්‍යාපාර සැලසුම් තරඟයේ විනිසුරු මඬුල්ල - 2018 මහනුවර (කොට්ඨාශ වටය) | | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් සංවිධානය කරන ලදි. |
| | කළමනාකරණ හා මුදල් පිළිබඳ 13වැනි ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවේ සම්පත් දායකයන් / සාමාජිකයන් | | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් සංවිධානය කරන ලදි. |
| **වෛද්‍ය පීඨය** | | | |
| වැඩමුළු පැවැත්වීම | මිනිස් ව්‍යුහය පිළිබඳ වැඩමුළුව | Around 2000 | අ.පො.ස. (උ.පෙ.) ජීව විද්‍යා සිසුන් හෙදියන් පවුල් සෞඛ්‍ය සේවිකාවන් |
| ප්‍රදර්ශන/මහජන කාර්යයන් | ප්‍රදර්ශනවල නිදර්ශක | පාසල් හා ආයතන 14ක් | පාසල් සිසුන් හා මහජනතාව |
| ගුවන්විදුලි/රූපවාහිනී හා වෙනත් මාධ්‍ය වැඩසටහන් | වාසුලිය වැඩසටහන ශ්‍රී ලංකා රූපවාහිනිය | දිවයිනපුරා | මහජනතාව |
| | පුවත්පත් කායව්‍යවච්ඡේද කෞතුකාගාරය | දිවයිනපුරා | මහජනතාව |
| | රූපවාහිනි වැඩසටහන් | | මහජනතාව (ශ්‍රී ලංකා නිර්වින්දනවේදීන්ගේ විද්‍යායතනය විසින් සංවිධානය) |
| වෙනත් | කායව්‍යවච්ඡේද කෞතුකාගාරය නැරඹීම | පාසල් 31 | පාසල් සිසුන් |
| **විද්‍යා පීඨය** | | | |
| වැඩමුළු පැවැත්වීම | R and R stadio භාවිතයෙන් දත්ත විශ්ලේෂණය | 40 | විද්වතුන් පර්යේෂකයන් හා විද්‍යාඥයන් |
| | සත්ව සංයුතිය හා ක්‍රියාකාරීත්වය පිළිබඳ ආචාර්ය එන්.පී.එස්. කුඹුරේගම දේශනය | 100කට අධික | අ.පො.ස.(උ.පෙළ.) ගුරුභවතුන් |
| | | 20 | උ/පෙළ ලියිසියම් ජාත්‍ය. පාසලේ ගුරුවරුන් |
| | විද්‍යා පුහුණු වැඩසටහන | 1172 | අ.පො.ස.(උ.පෙළ) විද්‍යා/ගණිත සිසුන් |
| | | 70 | ඌව පළාතේ උ.පෙළ ජීව විද්‍යා ගුරුවරුන් |
| | | 70 | ඌව පළාතේ උ.පෙළ රසායන විද්‍යා ගුරුවරුන් |

## 6.3 සාමාන්‍ය ජනයා වෙනුවෙන් දැනුම ව්‍යාප්ත කිරීමේ වැඩසටහන් වගුව හා සම්බන්ධ වේ

| කාණ්ඩය | වැඩසටහනේ නම | සහභාගී වූ සංඛ්‍යාව | ඉලක්ක කණ්ඩායම |
|---|---|---|---|
| පුහුණු වැඩසටහන්/ක්ෂේත්‍ර නිරූපණ පැවැත්වීම | ප්‍රායෝගික නිරූපන | 25 | සබරගමුව විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක සිසුන් |
| | ප්‍රායෝගික නිරූපහන | 70 | උසස් පෙළ ජීව විද්‍යා ගුරුවරුන් |
| ප්‍රදර්ශන/මහජන කාර්යයන් සංවිධානය | ඉදිරි පරපුර ආරක්ෂා කිරීම ශ්‍රී ලංකාවේ නකල්ස් වනාන්තර ආරක්ෂා කිරීම | 200 | නොරිටාකේ ලංකා පෝසිලේන් පුද්ගලික සමාගම, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, නකල්ස් ප්‍රදේශවාසීන් |
| | නකල්ස් වනාන්තරය සංරක්ෂණය පිළිබඳ සම්මන්ත්‍රණය | 57 | IUCN, බයොඩයිවයිට් ශ්‍රී ලංකා බොටනිකල් සොසයිටි, සත්ව විද්‍යා දෙපාර්තමේන්තුව, නොරිටාකේ ලංකා පෝසිලේන් පුදගලික සමාගම, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, නකල්ස් ප්‍රදේශවාසීන් |
| වෙනත් | විද්‍යා කඳවුර | 1850 | අ.පො.ස.(උ.පෙළ) ගණිත හා විද්‍යා සිසුන්, සා.පෙළ සිසුන් |
| වැඩමුළු පැවැත්වීම | R and R stadio භාවිතයෙන් දත්ත විශ්ලේෂණය | 40 | |
| **පශු වෛද්‍ය විද්‍යා පීඨය** | | | |
| වැඩමුළු පැවැත්වීම | ශිෂ්‍ය ඇගයීම් ක්‍රියාමාර්ග සංවිධාන කිරීම | 30 | පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය |
| | සමාලෝචන, දැනුවත් කිරීමේ වැඩසටහන | 36 | පීඨයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
| | වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව | 36 | පීඨයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
| | ඵලදායී ලෙස ලේඛන පිරවීම හා දත්ත කළමනාකරණය | 40 | පීඨයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
| | කර්මාන්ත විධිමත් කිරීම පිළිබඳ වැඩමුළුව | 30 | කුකුළු සත්ව හා පශු සම්පත් අංශයේ පශු වෛද්‍යවරුන්, පශු අධ්‍යක්ෂවරුන්, විමර්ශන නිලධාරීන්, VIC අධ්‍යක්ෂවරුන් කර්මාන්තකරුවන් |
| පුහුණු වැඩසටහන් ක්ෂේත්‍ර නිරූපණ පැවැත්වීම | කිරි සහ කිරි ආශ්‍රිත නිෂ්පාදනවල ගුණාත්මක බව පරීක්ෂා කිරීමේ පුහුණුව | | පර්යේෂණ සහායකයන් |

## 6.4 ජාතික හා ජාත්‍යන්තර සම්මාන

| | සම්මානයේ නම | සම්මානය පිළිබඳ විස්තර | ප්‍රදානය කළ සහ රටේ නම | සම්මානලාභීන්ගේ නම/නම් (ශිෂ්‍ය/ කා.මණ්ඩල/අධ්‍ය.අංශ/පීඨ/විශ්වවිද්‍යාලය |
|---|---|---|---|---|
| **නව නිපැයුම්** | | | | |
| **කෘෂි විද්‍යා පීඨය** | ජලජ සම්පත් කළමනාකරණයේ හොඳම කාර්ය සාධනය සඳහා ජලජ සම්පත් සංවර්ධන ව්‍යාපෘතියේ ශිෂ්‍යත්වය | අවසන් වසර පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා හොඳම ජලජ සම්පත් සංවර්ධන ව්‍යාපෘතියක් කළ උපාධි අපේක්ෂක ශිෂ්‍යාට මෙම සම්මානය පිරිනමන ලදී | පේරාදෙණිය විශ්වවිද්‍යාලය<br>ශ්‍රී ලංකාව | එස්.ජී.වී.බී. වර්ණසූරිය<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| | හොඳම අතුරු වාර්තාව - LTO | දකුණ චිනයේ සාගර විද්‍යා ආයතනයේ දර්ශනශූරී උපාධියට හොඳම පර්යේෂණ අධ්‍යයනය කළ ශිෂ්‍යාට මෙය ප්‍රදානය කරන ලදී | දකුණු චිනයේ සාගර විද්‍යා ආයතනය - චීනය | ටී.එස්.එම්. ඇලපාතගේ මිය<br>සත්ව විද්‍යා අධ්‍යයන අංශය කෘ.වි. පීඨය<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| | CVCD විශිෂ්ටතා සම්මානය - 2018 | ජීව විද්‍යා කෘෂිකර්ම සම සෞඛ්‍ය විද්‍යා යන ක්ෂේත්‍ර තුනේ වඩාත් කැපීපෙනෙන ජ්‍යෙෂ්ඨ පර්යේෂක | උපකුලපතිවරුන්ගේ හා අධ්‍යක්ෂවරුන්ගේ කමිටුව | මහාචාර්ය ඩබ්.ඒ.ජේ.එම්. ද කොස්තා<br>බෝග විද්‍යා අධ්‍යයන අංශය |
| | ජාතික පර්යේෂණ සභාවේ දක්ෂතා සම්මානය | 2015 වසරේ විද්‍යාත්මක ප්‍රකාශන | ජාතික පර්යේෂණ සභාව<br>ශ්‍රී ලංකාව | මහාචාර්ය ජී.එල්.එල්.පී. සිල්වා<br>මහාචාර්ය කේ.එම්.එස්. විමලසිරි<br>ආචාර්ය බී.ඩී.ආර්. ප්‍රසාන්ත<br>ආචාර්ය කේ.එෆ්.එස්.ටී. සිල්වා<br>ආචාර්ය එච්.ඒ.එම්. වික්‍රමසිංහ |
| | SUSRED සම්මානය - 2017 | පශ්චාත් උපාධි පර්යේෂණ උපාධි අධීක්ෂණය | ජාතික විද්‍යා පදනම<br>ශ්‍රී ලංකාව | මහාචාර්ය ඊ.ආර්.එන්. ගුණවර්ධන<br>මහාචාර්ය එම්.අයි.එච්. මව්ජූඩ්<br>ආචාර්ය එන්.ඩී.කේ. දයාවංශ<br>ආචාර්ය ඒ.කේ. කරුණාරත්න<br>කෘෂි ඉංජිනේරු අධ්‍යයන අංශය |
| **සම සෞඛ්‍ය විද්‍යා පීඨය** | ජනාධිපති සම්මාන | විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ප්‍රදානය කෙරේ. | ජාතික පර්යේෂණ සභාව - ශ්‍රී ලංකාව | මහාචාර්ය ඩබ්.ඒ.ඩී.ජේ. ද කොස්තා<br>මහාචාර්ය එල්.ඩී.බී. සූරියගොඩ<br>ආචාර්ය කේ.ඩබ්.එල්.කේ. වීරසිංහ බෝග විද්‍යා අධ්‍යයන අංශය<br>මහාචාර්ය ආර්.එම්.සී.පී. රාජපක්ෂ පාංශු විද්‍යා අධ්‍යයන අංශය<br>මහාචාර්ය බී.සී. ජයවර්ධන හා<br>මහාචාර්ය ජේ.කේ. විදානාරච්චි සත්ව විද්‍යා අධ්‍යයන අංශය |
| **වෛද්‍ය පීඨය** | ජනාධිපති සම්මානය | විද්‍යාත්මක පර්යේෂණ සඳහා ප්‍රදානය කෙරේ. | ජා. ප. සභාව - ශ්‍රී ලංකාව | ඒ.වයි.ආර්. අතුකෝරල මිය<br>වෛද්‍ය ඒ.සී.එම්. ෆහීම්<br>මහාචාර්ය එච්.එම්.ටී.යූ. හේරත්<br>යූ.ඩබ්.එස්. රත්නායක මයා<br>වෛද්‍ය ඩී.ඒ. සතරසිංහ |
| | ජනාධිපති සම්මානය | විද්‍යාත්මක පර්යේෂණ සඳහා ප්‍රදානය කෙරේ. | ජා. ප. සභාව - ශ්‍රී ලංකාව | මහාචාර්ය එස්.ඩී.එස්.එම්. සූරියපතිරණ |
| | කැපීපෙනෙන ආසියානු ළමාරෝග විශේෂඥ සම්මානය - 2018 | | ආසියා පැසිපික් ළමාරෝග සංගමයේ සමුළුවේදී බාලිනුවර | මහාචාර්ය ආසිරි අබේගුණවර්ධන |

## 6.4 ජාතික හා ජාත්‍යන්තර සම්මාන වගුව හා සම්බන්ධ වේ

| | සම්මානයේ නම | සම්මානය පිළිබඳ විස්තර | ප්‍රධානය කළ සහ රටේ නම | සම්මානලාභීන්ගේ නම/නම් (ශිෂ්‍ය/ කා.මණ්ඩල/අධ්‍ය.අංශ/පීඨ/විශ්වවිද්‍යාලය |
|---|---|---|---|---|
| **කළමනාකරණ පීඨය** | 2018 වසර සඳහා කේ.එන්. සෙනෙවිරත්න සම්මානය | | | ආචාර්ය ඒ.ඒ.සී. අලහකෝන් |
| | හොඳම උපුටන දෙවන ස්ථානය | 48වැනි සායනික ස්නායු භෞතික විද්‍යා ජපන් සංගමයේ සමුළුවේදී පර්යේෂණ පත්‍රයක් පළ කිරීම | | මහාචාර්ය වජිර වීරසිංහ ආචාර්ය පද්මිණී දහනායක,ආචාර්ය මනෝජ් පතිරගේ සහ ඔවුන්ගේ කණ්ඩායම |
| | හොඳම වාචික උපුටන සම්මානය | | ශ්‍රී ලංකා ස්නායුරෝග විශේෂඥයන්ගේ සංගමයේ වාර්ෂික සැසිය - 2018 | මහාචාර්ය තාරක දසනායක ආචාර්ය ඩී. විජේසුන්දර ආචාර්ය සී. කහතුඩුව මහාචාර්ය වජිර වීරසිංහ සහ ඔවුන්ගේ කණ්ඩායම |
| | ජනාධිපති සම්මානය | විද්‍යාත්මක ප්‍රකාශන සඳහා | ජා.ප. සභාව | මහාචාර්ය එම්.පී.බී. මීගස්කුඹුර |
| **විද්‍යා පීඨය** | මහා පර්යේෂණ කමිටු ත්‍යාගය 2017 | | ශ්‍රී ලංකාවේ පර්යේෂණවලට සිදුකළ දායකත්වය ඇගයීම සඳහා විද්‍යාවේ අභිවර්ධනය සඳහා වන ශ්‍රී ලංකා සංගමය | මහාචාර්ය එස්.එච්.පී.පී. කරුණාරත්න<br>මහාචාර්ය ඩී. නේද්‍ර කරණාරත්න පිළිවෙලින් සත්ව විද්‍යා හා රසායන විද්‍යා අධ්‍ය. අංශ |
| | දක්ෂතා සම්මානය - 2018 | විද්‍යා හා තාක්ෂණ ජයග්‍රහණ - 2018 | | මහාචාර්ය ආර්.එල්.ආර්. චන්ද්‍රජිත් |
| | ජනාධිපති සම්මානය - 2018 | ඉහළ ශ්‍රේණිගත සම සමාලෝචන | ශ්‍රී ලංකාව | මහාචාර්ය ආර්.එල්.ආර්. චන්ද්‍රජිත්<br>මහාචාර්ය වී. කරුණාරත්න<br>මහාචාර්ය ඩී.ඒ. කරුණාරත්න<br>ආචාර්ය එම්.ඒ.එස්.පී.කේ. මාලවිආරච්චි<br>මහාචාර්ය ඒ.ඩී.එල්.සී. පෙරේරා |
| සාහිත්‍ය | | | | |
| **කලා පීඨය** | රාජ්‍ය සාහිත්‍ය සම්මානය | හොඳම කෙටිකථා එකතුව | සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | ආර්.එම්.එස්. සෙනෙවිරත්න මිය |
| | රජත පුස්තක සම්මානය | හොඳම කෙටිකථා එකතුව | ශ්‍රී ලංකා පොත් ප්‍රකාශන සංගමය | ආර්.එම්.එස්. සෙනෙවිරත්න මිය |
| | හොඳම කෙටි කථා සංග්‍රහය සඳහා ගොඩගේ සම්මානය | හොඳම කෙටිකථා එකතුව | ගොඩගේ ප්‍රකාශන | මහාචාර්ය ඩබ්.ඒ. ලියනගේ |
| | රාජ්‍ය සාහිත්‍ය සම්මානය | හොඳම පරිවර්තන නාට්‍ය “තට්ට ගායිකාව” | ශ්‍රී ලංකාව | ඉංග්‍රීසි භාෂා අධ්‍යයන අංශයේ ජ්‍යෙ. කථිකාචාර්ය ආචාර්ය කේ. ධර්මසිරි |
| | ඉන්දියානු ලෝක චිත්‍රපට උළෙල - 2018 හයිද්‍රබාද් | හොඳම චිත්‍රපට ත්‍යාගය | ඉන්දියාව - 2018 | මහාචාර්ය එස්. සිවමෝහන් |
| | පිහිනුම් ඉසව්වේ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල වර්ණ ප්‍රදානය | ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල වර්ණ ප්‍රදානය | ශ්‍රී ලංකාව | කේ.ඩී.එම්.කේ. වීරතුංග |

## 6.4 ජාතික හා ජාත්‍යන්තර සම්මාන වගුව හා සම්බන්ධ වේ.

| | සම්මානයේ නම | සම්මානය පිළිබඳ විස්තර | ප්‍රධානය කළ සහ රටේ නම | සම්මානලාභීන්ගේ නම/නම් (ශිෂ්‍ය/ කා.මණ්ඩල/අධ්‍ය.අංශ/පීඨ/විශ්වවිද්‍යාලය |
|---|---|---|---|---|
| කලා පීඨය | තාක්ෂණික සහයෝගීතා ව්‍යාපෘතිය | විශ්වාසනීය විද්‍යාත්මක දත්ත නිපදවන අන්තර්කලාපීය ජාලයක් නිර්මාණය කිරීම තුළින් ආහාර ආරක්ෂණ දියුණු කිරීම | ජාත්‍යන්තර ඇටමික් බලශක්ති අධිකාරිය වියානාව | වෛද්‍ය බී.ආර්. ප්‍රනාන්දු - පශු වෛද්‍ය පීඨය |
| | තාක්ෂණික සහයෝගීතා ව්‍යාපෘතිය | ආහාර හා පෝෂණ ආරක්ෂාව සඳහා ජාතික හැකියාව ශක්තිමත් කිරීම - SRL 5048 | ජාත්‍යන්තර ඇටමික් බලශක්ති අධිකාරිය වියානාව | වෛද්‍ය බී.ආර්. ප්‍රනාන්දු - පශු වෛද්‍ය පීඨය |
| | තාක්ෂණික සහයෝගීතා ව්‍යාපෘතිය | පශු වෛද්‍ය ඖෂධ සංඝටක මෙන්ම රසායනික අපවිත්‍රකාරකයන් පාලනය කිරීම සඳහා ආසියාව තුළ ජාලයක් ස්ථාපිත කිරීම තුළින් ආහාර ආරක්ෂණ විද්‍යාගාර හැකියාවන් දියුණු කිරීම - RAS/5/078 | ජාත්‍යන්තර ඇටමික් බලශක්ති අධිකාරිය වියානාව | වෛද්‍ය බී.ආර්. ප්‍රනාන්දු - පශු වෛද්‍ය පීඨය |
| | සිංගප්පූරු දකුණු ආසියානු චිත්‍රපට උළෙලේදී පිය පුතුන් නිල වශයෙන් තෝරාගැනීම | | | මහාචාර්ය එස්. සිවමෝහන් |
| | ජයිපූර් ජාත්‍යන්තර චිත්‍රපට උළෙලේදී පිය පුතුන් නිල වශයෙන් තෝරාගැනීම | | | මහාචාර්ය එස්. සිවමෝහන් |
| | තරඟකාරී ත්‍යාග - 2018 | නිර්මාණශීලි පරිකල්පිත නොවන රචනා “To you I speak” | බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩලීය පදනම | මහාචාර්ය එස්. සිවමෝහන් |
| | ශාස්ත්‍රීය විශිෂ්ටතාව හා සීමාවෙන් එහා විශිෂ්ටතාව වෙනුවෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය රන් පදක්කම | හොඳම අධ්‍යයන හා විෂය පරිබාහිර කාර්යයන් සඳහා ප්‍රදානය කෙරේ. | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | කේ.ඩී.එම්.කේ. වීරතුංග (තාවකාලික කථිකාචාර්ය) |

# මූලධන ව්‍යාපෘති





කෘෂි විද්‍යා පීඨයේ ප්‍රධාන සැලසුමේ පළමු අදියර සංවර්ධනය



ඉංජිනේරු පීඨයේ යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයන අංශයේ යෝජිත ගොඩනැගිලි දිගුව



සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ විද්‍යාගාර හා දේශන ශාලා සහිත පරිපාලන ගොඩනැගිල්ල



විද්‍යා පීඨයේ භූගර්භ විද්‍යා ගොඩනැගිල්ල ඉදිකිරීම



ඉහල හන්තාන කාර්යාල සේවක නිවාස

# 7. යටිතල පහසුකම් පිළිබඳ විස්තර - 2018

## 7.1 කෙරීගෙන යන සියලු මූලධන ව්‍යාපෘති

| ව්‍යාපෘතියේ නම | කොන්ත්‍රාත්කරුගේ නම | ටෙන්ඩර මුදල රු. | 2018.01.01 දිනට අතුරු ගෙවීම් රු. | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|
| සරසවි උයන ශිෂ්‍ය නේවාසිකාගාරය පුළුල් කිරීම | ඒ.එස්.බී. කන්ස්ට්‍රක්ෂන් (පුද්) සමාගම | 77,739,160.97 | 66,727,370.10 | 86% |
| මාකස් ප්‍රනාන්දු ශාලාවට ජලය සැපයීම | එන්.ඩබ්.එස්.ඩී.බී | 7,000,000.00 | 5,600,952.00 | 80% |
| විශ්වවිද්‍යාලයේ විදුලිය බෙදාහැරීමේ පද්ධතිය දියුණු කිරීම | ලංකා විදුලිබල මණ්ඩලය | 54,742,360.70 | 54,742,360.70 | 100% |
| පාරා සායනික ගොඩනැගිල්ල (දෙවන අදියර) ඉදිකිරීම | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | 608,874,537.92 | 241,186,079.95 | 40% |
| **වර්ෂ අවසානයේදී මුදල් හා මුදල් සමාන දේ** | **201,717,015.80** | **203,219,209.43** |

## 8.12 වර්ෂයේ විසර්ජන ගිණුම්

| දෙසැම්බර් 31 දිනට රුපියල් | දු.හා.අ.අ.ම. | විශ්වවිද්‍යාලය | 2018 | 2017 |
|---|---|---|---|---|
| **වර්ෂය සඳහා ශුද්ධ (අතිරික්තය/හිගය)** | 23,392,191.49 | (688,643,220.22) | 665,251,028.73) | (668,666,111.69) |
| **පෙර වසරෙන් ඉදිරියට ගෙන ආ ශේෂය** | 191,694,136.52 | 1,124,691,771.07 | 1,316,385,907.59 | 2,164,245,106.85 |
| | 215,086,328.01 | 436,048,550.85 | 651,134,878.86 | 1,495,578,995.16 |
| **එකතු කිරීම්** | | | | |
| ප්‍රත්‍යාගණන සංචිතයේ හිලව් කිරීම් | - | 1,252,874,999.79 | 1,252,874,999.79 | - |
| පරිත්‍යාග වත්කම්වල හිලව් කිරීම් | | 481,398,592.21 | 481,398,592.21 | |
| පිහිණුම් තටාකය හා ක්‍රිකට් ක්‍රීඩාපිටිය කළමනාකරණ මුදල | - | | | - |
| විදෙස් ශිෂ්‍ය අරමුදල් සඳහා ගැළපුම | - | | | - |
| බැහැරකරණ ස්ථාවර වත්කම්වල ඉවත් කිරීම ගැලපුම | | 3,148,402.89 | 3,148,402.89 | 1,496,779,693.24 |
| | 215,086,328.01 | 2,173,470,545.74 | 2,388,556,873.75 | 1,496,779,693.24 |
| **අඩුකිරීම්** | | | | |
| විදෙස් ශිෂ්‍ය ආදායම හිලව් කිරීම | - | | - | |
| ණය ගෙවීම සඳහා හිලව් කලා | - | | - | (5,743,954.86) |
| මූලධන වත්කම් මිලදී ගැනීම සඳහා ආදායම් යොදා ගැනීම | | | - | (170,704,474.58) |
| ප්‍රත්‍යාගණන සංචිතයේ හිලව් සඳහා ගැළපුම | - | | - | (59,165,448.09) |
| වැටුප් අත්තිකාරම් හා උත්සව අත්තිකාරම් සඳහා ගැළපුම | | | | |
| ණය අරමුදල් ගිණුමට ගැලපුම | | | | 55,220,091.88 |
| ජා.ප. මධ්‍යස්ථානයේ ව්‍යාපෘති සඳහා ආදායම් යොදා ගැනීම | | | | |
| **ශේෂය** | 215,086,328.01 | 2,173,470,545.74 | 2,388,556,873.75 | 1,316,385,907.59 |
| **ඉදිරියට ගෙන ආ ශේෂය** | **215,086,328.01** | **2,173,470,545.74** | **2,388,556,873.75** | **1,316,385,907.59** |

## 8.13 වර්ෂයේ ස්කන්ධ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රුපියල් | මූලධන ප්‍රදාන | සාමාන්‍ය සංචිතය | ප්‍රත්‍යාගණන සංචිතය | අනෙකුත් | එකතුව |
|---|---|---|---|---|---|
| **2018 දෙසැ .31 දිනට ශේෂය** | **8,313,198,306.23** | **2,164,245,106.85** | **10,804,507,068.06** | **1,305,518,248.75** | **22,587,468,729.89** |
| මුදල් / මූලධන ප්‍රදානවල ශුද්ධ මුදල් චලනය | 1,065,015,316.90 | | | (38,032,742.60) | 1,026,982,574.30 |
| විදෙස් මුදල්වලින් ලැබීම් | | | | 1,085,824.05 | 1,085,824.05 |
| ප්‍රත්‍යාගණන සංචිතයේ හිලව් කිරීම් සඳහා ගැලපුම | | (59,165,448.09) | 376,852,943.76 | | 317,687,495.67 |
| පිහිනුම් තටාක හා ක්‍රිකට් ක්‍රීඩාපිටිය කළමනාකරණය සඳහා ගැලපුම | | 1,200,698.08 | | | 1,200,698.08 |
| රජයේ ප්‍රධාන හිලව් කිරීම සඳහා ගැලපුම | (398,344,454.70) | | | | (398,344,454.70) |
| ප්‍රතිගණන අතිරික්ත | | | 1,353,002,646.73 | | 1,353,002,646.73 |
| දූ.හා.අ.අධ්‍ය.ම. ප්‍රතිගණන සංචිතයේ හිලව් කිරීම | | | (4,742,658.36) | | (4,742,658.36) |
| ණය ගෙවීම් සඳහා ගැලපුම | | (5,743,954.86) | | | (5,743,954.86) |
| මූලධන වත්කම් මිලදීගැනීම සඳහා ආදායම යොදාගැනීම | | (170,704,474.58) | | | (170,704,474.58) |
| කාලවකවානුව සඳහා අතිරික්තය / හිඟය | | (668,666,112.00) | | | (668,666,112.00) |
| ණය පොලී මුදල් ගිණුමේ ගැලපුම | | 55,220,092.19 | | | 55,220,092.19 |
| **2018 දෙසැ. 31 දිනට ශේෂය** | **8,979,869,168.43** | **1,316,385,907.59** | **12,529,620,000.19** | **1,268,571,330.20** | **24,094,446,406.41** |
| මුදල්/මූලධන ප්‍රදානවල ශුද්ධ චලනය | 346,897,360.20 | | | 122,258,134.43 | 469,155,494.63 |
| විදෙස් මුදල් වලින් ලැබීම් | | | | 5,381,457.05 | 5,381,457.05 |
| ප්‍රතිගණන සංචිතයේ හිලව් සඳහා ගැලපුම | | 1,252,874,999.79 | (1,252,874,999.79) | | - |
| ප්‍රතිගණන සංචිතයේ ශුද්ධ ගැලපුම | | 3,148,402.89 | (870,002.22) | | 2,278,400.67 |
| පරිත්‍යාග වත්කම් හිලව් සඳහා ගැලපුම | | 481,398,592.21 | | | 481,398,592.21 |
| කාලවකවානුව සඳහා අතිරික්ත/(හිඟය) | | (665,251,028.73) | | | (665,251,028.73) |
| **2018 දෙසැ. 31 දිනට ශේෂය** | **9,326,766,528.63** | **2,388,556,873.75** | **11,275,874,998.18** | **1,396,210,921.68** | **24,387,409,322.24** |

## 8.14 මුදල් ප්‍රකාශනයට අදාළ සටහන්

### 1.1 සංයුක්ත තොරතුරු

### 1.2 සකස් කිරීමේ පදනම

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත හා එහි පසුකාලීන සංශෝධනයන් යටතේ ස්ථාපිත කරන ලද පේරාදෙණිය විශ්වවිද්‍යාලය පූර්ණ වශයෙන් රජයට අයත් උසස් අධ්‍යාපන ආයතනයකි. සිසුන් සංඛ්‍යාව, මුදල් වෙන් කිරීම, පීඨ සහ සේවක සංඛ්‍යාව ආදී කරුණුවලට අනුව ශ්‍රී ලංකාවේ විශාලතම විශ්වවිද්‍යාලය පේරාදෙණිය විශ්වවිද්‍යාලය වන අතර එය මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පේරාදෙණිය ප්‍රදේශයේ පිහිටා ඇත. පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය මුදල් ප්‍රකාශනය උපචිත පදනම මත හා වෙනත් ලෙසකින් සටහන් කරන්නේ නම් පැරණි වියදම් ක්‍රමය යටතේ සකස් කොට ඇත. ශ්‍රී ලංකා රුපියලේ ආසන්නතම අගය මත මෙම මුදල් ප්‍රකාශනය ඉදිරිපත් කෙරේ.
මුදල් තත්ත්ව ප්‍රකාශනය මුදල් කාර්ය සාධන ප්‍රකාශනය මුදලේ සමාන අගය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන්ට හා 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ හා එහි පසුකාලීන සංශෝධනවල අවශ්‍යතාවන්ට අනුකූලවන පරිදි සකසා ඇත.

### 1.3 ගිණුම් ප්‍රතිපත්ති

#### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන් යෙදවීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලය 2018 වසර සඳහා වන මුදල් ප්‍රකාශනය සකස් කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන් අනුගමනය කොට ඇත. වෙනත් ලෙසකින් සටහන් කළහොත් සංස්ථාපිත වාර්තාවේ සඳහන් සියලු (SLPSAS) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන් අනුගමනය කර ඇත.

#### 1.3.2 ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස්වීම

විශ්වවිද්‍යාලයේ මුදල් ප්‍රකාශනය සකස් කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන් යොදාගන්නා ලදි. සමාලෝචිත වර්ෂයේදී ගිණුම් ප්‍රතිපත්තිවල සැලකියයුතු වෙනස්කම් සිදුවී නොමැත.

#### 1.3.3 සැලකිය යුතු ගිණුම්කරණ තීරණ, ඇස්තමේන්තු හා උපකල්පනයන්

විශ්වවිද්‍යාලයේ මුදල් ප්‍රකාශනය සකස් කිරීමේදී මුදල් වර්ෂය අවසාන වනවිට එහි ආදායම, වියදම වත්කම් හා වගකීම්වලට හා අනියම් වත්කම් සහ අනියම් වගකීම් හෙළිදරව් කිරීම්වලට බලපෑම් වියහැකි තීන්දු තීරණ, ඇස්තමේන්තු හා උපකල්පනයන් සිදුකිරීමට කළමනාකරණයට සිදුවේ. ඉදිරි ඇස්තමේන්තු හා වෙනත් අංශ සම්බන්ධයෙන් ගිණුම් ප්‍රතිපත්ති යෙදවීමේදී ගන්නා ලද ප්‍රධාන උපකල්පනයන් පහතින් සාකච්ඡා කෙරේ.

### 1.4 වැදගත් ගිණුම් ප්‍රතිපත්තිවල සාරාංශය

#### 1.4.1 හඳුනාගත් ආදායම්

පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන පර්යේෂණ සඳහා ව්‍යාපෘති හා වෙනත් අධ්‍යයන පැවරුම්වල ආදායම අයභාරය ලෙස හඳුනාගෙන ඇති අතර අනෙකුත් සියලු ආදායම් උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

#### 1.4.2 රජයේ ප්‍රදාන

මූලධන හා පුනරාවර්තන වියදම් සඳහා වන රජයේ ප්‍රදාන හඳුනාගනු ලබන්නේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිති එකෙහි ප්‍රතිපාදනවලට සමගාමීව එම ප්‍රදාන විශ්වවිද්‍යාලයට ලැබීමෙන් පසුව පමණි. අදාළ වසර සඳහා ලද පුනරාවර්තන ප්‍රදාන මුදල් කාර්ය සාධන ප්‍රකාශනයේ ආදායම් ලෙස හඳුනාගෙන ඇති අතර විශ්වවිද්‍යාලයට ලද මූලධන ප්‍රදාන වියදම් කළ මූලධන ප්‍රදාන හා වියදම් නොකළ ගිණුම් ලෙස හඳුනාගෙන මූලධන ගිණුම්වල ගිණුම්ගත කොට ඇති අතරම එහි බලපෑම මුදල් තත්ත්ව ප්‍රකාශනයට සෘජුව ඇතුළත් කෙරේ.

### 1.4.3 දේපල යන්ත්‍ර හා උපකරණ

#### 1.4.3.1 ඉඩම්, ගොඩනැගිලි, රථවාහන සහ දේපල යන්ත්‍ර හා උපකරණවල වෙනත් කාණ්ඩ

කිසියම් දේපලක, යන්ත්‍රයක හා උපකරණයක ප්‍රතිගණන වටිනාකම බින්දුව (0) බවට පත්වන අවස්ථාවක එම ප්‍රතිගණනය සඳහා යොදාගනු ලබන ප්‍රතිගණන මොඩලය විශ්වවිද්‍යාලය විසින් පිළිගනු ලබයි. ඒ අනුව විශ්වවිද්‍යාලයේ සියළුම ඉඩම් ගොඩනැගිලි හා රථවාහන 2016 වසරේදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිගණනය කොට එම වසරේදීම ගිණුම්ගත කරන ලදි. දේපල යන්ත්‍ර හා උපකරණවලට අයත් වෙනත් කාණ්ඩ (පුස්තකාල පොත් හා වාරසඟරා හැර) 2016 ජනවාරි 01 දිනට ප්‍රතිගණනය කොට එය 2017 වසරේ මුදල් ප්‍රකාශනයේ දක්වා ඇත.
මෙම ඉඩම් යන්ත්‍ර හා උපකරණ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිගණනය කළ දිනට පවතින සාධාරණ වටිනාකමින් ප්‍රතිගණනය කරන ලද අතර වෙනත් කාණ්ඩවලට අයත් වත්කම් ප්‍රතිගණනය කිරීමේ කටයුතු සුදුසුකම්ලත් තක්සේරුකරුවෙකුගේ අධීක්ෂණය යටතේ විශ්වවිද්‍යාලය විසින් පත් කරන ලද කමිටුවක් විසින් සිදුකරන ලදි. එක් එක් වත්කම් කාණ්ඩ යටතේ ප්‍රතිගණනය කළ මුදල මුදල් තත්ත්ව ප්‍රකාශනයේ දැක්වේ.
අක්කර 45.95ක වපසරියකින් යුතු මහඉලුප්පල්ලම ඉඩමේ හා අක්කර 17.31 ප්‍රමාණයකින් යුතු වෛද්‍ය පීඨ ඉඩමේ නෛතික හිමිකාරීත්වය විශ්වවිද්‍යාලය වෙත පවරා නොමැති හෙයින් 2018.12.31 දිනට ප්‍රතිගණනය නොකරන ලදි. කෙසේ වෙතත් විශ්වවිද්‍යාලය එම ඉඩම්වල නෛතික හිමිකාරිත්වය අත්කර ගැනීමට කටයුතු කරමින් සිටින අතර එය සාර්ථක වූ පසු මෙම ඉඩම්වල වටිනාකම ඇතුළත් කිරීමට කටයුතු කරනු ඇත.

#### 1.4.3.2 විශ්වවිද්‍යාලයට අනුබද්ධ පශ්චාත් උපාධි ආයතනවල ඉඩම් හා ගොඩනැගිලි

පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ පශ්චාත් උපාධි ආයතන තුන ඉදිකොට තිබෙන භූමි විශ්වවිද්‍යාල මුදල් ප්‍රකාශනයේ දක්වා ඇති අතර මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ගොඩනැගිල්ල ශාස්ත්‍ර පීඨ පශ්චාත් උපාධි අරමුදලෙන් උපයාගත් මුදල් සහ මූලධන මුදල් යොදාගෙන ඉදිකොට ඇති හෙයින් එයද විශ්වවිද්‍යාල මුදල් ප්‍රකාශනයේ දැක්වේ.

#### 1.4.3.3 පුස්තකාල පොත් හා වාරසඟරා

2018 වසර අවසානය වනවිට රුපියල් 7627966141.49ක වටිනාකමින් යුක්ත පොත් හා වාරසඟරා 800000කට අධික සංඛ්‍යාවකින් යුතු ප්‍රධාන පුස්තකාලයේ සහ පීඨ පුස්තකාලවල පොත් හා වාරසඟරා ප්‍රතිගණනය කිරීම පුස්තකාලයාධිපති, මුදල් නිලධාරියෙකු හා සහකාර ලේඛකාධිකාරීගෙන් සමන්විත අභ්‍යන්තරිකව පත්කළ කමිටුවක් විසින් සිදුකෙරෙමින් පවතින අතර මෙම කාර්යය සඳහා අධීක්ෂණය හා මාර්ගෝපදේශකත්වය සපයනු ලබන්නේ පීඨ මට්ටමින් පත්කළ වෘත්තීමය තක්සේරුකරුවකු හා ප්‍රධාන පුස්තකාලය සඳහා වන වෙනම කමිටුවක් විසිනි. පීඨ පුස්තකාල හතරක පොත් හා වාරසඟරා ප්‍රතිගණනය කිරීම අවසන් කොට ඇති අතර ඉතිරි පීඨවල එම කාර්යය සිදුකෙරෙමින් පවති. එලෙස ප්‍රතිගණනය කළ මුදල 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා වන මුදල් ප්‍රකාශනයට ඇතුළත් කිරීමට විශ්වවිද්‍යාලය අපේක්ෂා කරයි.

#### 1.4.3.4 දේපල, යන්ත්‍ර හා උපකරණවල ක්ෂයවීම්

සියලුම දේපල, යන්ත්‍ර හා උපකරණ පොත් සහ වාරසඟරා හා ලෝගුවල වියදම හෝ ප්‍රතිගණන වටිනාකම මත පහත සඳහන් අනුපාතවලින් සරළ රේඛීය ක්‍රමය යොදාගෙන ක්ෂයවීම් ගණනය කෙරේ.

| වත්කම් පංතිය | % |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 10% |
| රථවාහන | 20% |
| ලී බඩු සහ මෙවලම් | 10% |
| කාර්යාල හා වෙනත් උපකරණ | 20% |
| විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ | 20% |
| පුස්තකාල පොත් හා වාරසඟරා | 20% |
| ලෝගු | 20% |

දේපල, යන්ත්‍ර හා උපකරණවල ක්ෂයවීම පිළිබඳ වැඩිදුර විස්තර 19 සටහනේ දැක්වේ.

### 14.3.5 Amortization of PPE

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති අංක 03ට ගැළපෙන පරිදි පරිත්‍යාග කරන ලද වත්කම් ගිණුම් තැබීමේදී හිලව් කිරීමේ ප්‍රතිශතය විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කෙරේ. ඒ අනුව විශ්වවිද්‍යාලයේ පොදු සංචිත ගිණුමේ වූ රු. 48138859221 මුදල පරිත්‍යාග ගිණුමට මාරුකිරීම මගින් 2018 වර්ෂයේ ඉහත ප්‍රතිපත්තිය අනුව හිලව් කර ඇත.

ඒ අනුව වත්කම් ගත්මිල හා ඉදිරියට ගෙන ගොස් ඇති වටිනාකම් සඳහා වූ ක්ෂය වටිනාකමේ වෙනස වත්කම් ප්‍රතිආගණන අතිරික්ත සංචිතයට රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති අංක 07ට අනුව මාරුකර ඇත. කෙසේ වුවද ඓතිහාසික වටිනාකම අනුව වත්කම් හඳුනාගැනීම ප්‍රායෝගිකව කළ නොහැකි බැවින් 2016 වසරේ ඒවා නැවත ආගණනය කරන ලදි. එමනිසා විශ්වවිද්‍යාලයේ වත්කම් හිලව් කිරීමේ ප්‍රතිපත්තිය මත වත්කම් ආගණන සංචිතයේ වටිනාකම මත රු. මිලියන 12528749997.97ක් 2018 වර්ෂයේ විය. කෙසේ වුවද 2016 ජනවාරි 01 දිනෙන් පසුව මිලදීගෙන හඳුනාගත් වත්කම් ආගණන අතිරික්තය ශ්‍රී ලංකා රා. අංශයේ ගිණුම් ප්‍රමිති අංක 03 වත්කම් ප්‍රතිගණනය කිරීමට විශ්ලේෂණයන් සඳහන් කර ඇති පරිදි ඓතිහාසික වටිනාකම හා ඉදිරියට ගෙන ගොස් ඇති වටිනාකම අතර වෙනස පදනම් කරගෙන පොදු සංචිතයට මාරු කරනු ලැබේ.

### 1.4.3.6 දේපල, යන්ත්‍ර හා උපකරණ අහිමිවීම

ඉංජිනේරු පීඨයේ නිෂ්පාදන ඉංජිනේරු පරිශ්‍රයේ ගොඩනැගිල්ලට කාර්යාල උපකරණවලට විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණවලට ලී බඩු හා මෙවලම්වලට 2016 ජූලි 05 දින හටගත් අනපේක්ෂිත ගින්නෙන් හානි සිදුවිය. මේනිසා විශ්වවිද්‍යාලය මේ පිළිබඳව විමර්ශනය කොට එම සිද්ධියෙන් අහිමි වූ දේපලවලට වටිනාකම ඇතුළත් කොට වාර්තාවක් ලබාගැනීම පිණිස මූලික විමර්ශන කමිටුවක් පත්කරන ලදි. කෙසේ වෙතත් මෙම විමර්ශන අවසන් කොට එහි වාර්තාව බාරදෙන තෙක් ගිණුම්වල ගැළපීම් නොකරන ලදි.

### 14.4 ජීව විද්‍යාත්මක වත්කම් හා කෘෂි නිෂ්පාදන

ජීව විද්‍යාත්මක වත්කම් හා කෘෂි නිෂ්පාදන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිති 18ට අනුව කටයුතු කර ඇත. විශ්වවිද්‍යාලයේ ජීව විද්‍යා නිෂ්පාදන හා කෘෂි නිෂ්පාදන ගිණුම් ප්‍රමිති 18ට අනුව මුදල් තත්ත්ව ප්‍රකාශනයේ වෙනම වත්කමක් ලෙස දැක්වේ.

ජීව විද්‍යාත්මක වත්කම් හා කෘෂි නිෂ්පාදන පිළිගනු ලබන්නේ අදාළ වත්කම් අතීත සංසිද්ධියක ප්‍රතිඵලයක් ලෙස ව්‍යවසායකය විසින් පාලනය කරන්නේ නම් හා එහි ආර්ථික ප්‍රතිලාභ ව්‍යවසායකය වෙත ඉදිරි කාලයේදී ලැබෙනු ඇතැයි සහ වත්කමේ සැබෑ වටිනාකම හෝ වියදම විශ්වාසවන්තව මැනිය හැකිනම් පමණි. ආයතනයේ පශු සම්පත් අස්වැන්න ගණනය කරනු ලබන්නේ අස්වැන්න ලබාගන්නා අවස්ථාවේදී සාධාරණ අගයෙන් පිරිවැය අඩුකිරීමෙන් පසුවය.

### 1.4.5 අස්පෘශ්‍ය වත්කම්

විශ්වවිද්‍යාලය වෙනුවෙන් ගිණුම් පැකේජයක් සංවර්ධන කිරීමට අදාළ තාක්ෂණික ශක්‍යතාවය මේවන විට අවසන් කොට එය සංවර්ධනය කිරීමේ අවධියට පැමිණ ඇත. 2018.12.31 දිනට මෘදුකාංග සංවර්ධනය කරන්නාට ගෙවන ලද මුළු මුදල වන රුපියල් 5956162.28ක මුදල SLPSAS 20ට අනුව අස්පෘශ්‍ය වත්කමක් ලෙස විශ්වවිද්‍යාලය විසින් හඳුනාගෙන ඇත. කෙසේ වෙතත් විශ්වවිද්‍යාලය මෙම වත්කම් පරිහරණය සඳහා පිළිවෙළ වූ පසු එම අස්පෘශ්‍ය වත්කමේ වටිනාකම Amortize කිරීම ආරම්භ කරනු ඇත.

### 1.4.6 භාණ්ඩ ලේඛන

විශ්වවිද්‍යාලයේ භාණ්ඩ ලේඛන 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රථම ඇතුලත් කිරීම හා ප්‍රථම පිටකිරීමේ පදනම මත භෞතික වශයෙන් හරිවැරදි බලා ගණනය කොට ඇත. විශ්වවිද්‍යාලයේ භාණ්ඩ ප්‍රධාන වශයෙන් වර්ගීකරණය කරනු ලබන්නේ ලිපිද්‍රව්‍ය, ගොඩනැගිලි ද්‍රව්‍ය, රසායනික හා වීදුරු භාණ්ඩ සහ වෙනත් භාණ්ඩ ලෙසයි.

පර්යේෂණ ප්‍රදානවලින් මිලදීගත් රසායනික ද්‍රව්‍යවල හා වීදුරු භාණ්ඩවල පිරිවැය ඒවා මිලදීගත් අවස්ථාවේ වියදමක් ලෙස අදාළ පර්යේෂණ ප්‍රදානවලට පූර්ණ වශයෙන් යොමු කෙරේ. කෙසේ වෙතත් භෞතික හරිවැරදි බැලීමේ වාර්තාවලට අනුව වර්ෂය අවසාන වනවිට භාණ්ඩ ලේඛනවල පැවති ශේෂයන් අදාළ ගිණුම්වලට ගළපා ඇත. භාණ්ඩ ලේඛන පිළිබඳ වැඩි විස්තර ගිණුම් අංක 08හි හෙළිදරව් කොට ඇත.

### 1.4.7 වෙළඳ හා වෙනත් ලැබීම්

වෙළඳ හා වෙනත් ලැබීම් (SLPSAS) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන්ට අනුව ඇස්තමේන්තුගත මුදලින් එනම් වාර්තා කරන දිනයෙන් පසු මාස 12ක් ඇතුළත ලැබීමට නියමිත ලෙසින් සඳහන් කොට ඇත. නුසුදුසු හා සැකසහිත ලැබීම් සඳහා ප්‍රතිපාදන සකස් වී නොමැත.

### 1.4.8 මුදල් සහ මුදලේ සමාන අගය

මුදල් සහ මුදලේ සමාන අගයන් ජංගම නේවාසික විදෙස් මුදල් ඉතිරිකිරීම් හා කෙටි කාලීන තැන්පතු ගිණුම්වල ශේෂයන්ගෙන් යුක්තවේ.
මුදල් සහ මුදලේ සමාන අගයන් පිළිබඳ වැඩිදුර විස්තර ගිණුම් ප්‍රකාශනයේ සටහන් අංක 02 යටතේ දැක්වේ.

### 1.4.9 කෙටි කාලීන ආයෝජන

පර්යේෂණ ව්‍යාපෘති සහ අනෙකුත් සහායක ක්‍රියාකාරකම් සඳහා විශ්වවිද්‍යාලය වෙත ලද මුදල්වලින් ඌණ උපයොජිත මුදල් තාවකාලිකව වාර තැන්පතු ලෙස රාජ්‍ය බැංකුවල ආයෝජනය කර ඇත. ඒ සඳහා ලද උපචිත පොළිය අදාළ ලෙජර් ගිණුම්වල ගළපා මුදල් කාර්ය සාධන ප්‍රකාශනයේ අදායමක් ලෙස දක්වා ඇත. ශිෂ්‍යත්ව සඳහා ලද මුදල් ද එලෙසම රාජ්‍ය බැංකුවල තැන්පත් කර ඇත. තවද ආයෝජන හා පොළි ආදායම පිළිබඳ විස්තර 15 හා 16 යන සටහන්වල දැක්වේ.

### 1.4.10 වියදම් හඳුනාගැනීම

මුදල් කාර්ය සාධන ප්‍රකාශනයේ වියදම් හඳුනාගනු ලබන්නේ යොදවන ලද වියදම සහ ආදායමේ සුවිශේෂී අංශවල ඉපයීම අතර පවතින සෘජු සහසම්බන්ධය පදනම්කර ගැනීමෙනි. විශ්වවිද්‍යාලයේ කටයුතු කරගෙන යෑමේදී හා එහි දේපල කාර්යක්ෂම ආකාරයෙන් පවත්වාගෙන යෑමේදී යොදවන ලද සියලු වියදම් මුදල් කාර්ය සාධන ප්‍රකාශනයට ආරෝපණය කොට ඇත.

### 1.4.11 පර්යේෂණ ප්‍රදාන

විශ්වවිද්‍යාලයීය අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් පවත්වනු ලබන විවිධ පර්යේෂණ කටයුතු සඳහා මහා භාණ්ඩාගාරයෙන් සහ පරිත්‍යාග ආයතනවලින් ලැබෙන මුදල්වලින් විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රදාන සමන්විත වේ.
මෙම පර්යේෂණ ප්‍රදානවලින් යොදවන සියලු වියදම් ඒ ඒ පර්යේෂණ ප්‍රදානවලට හරකරන අතර එම පර්යේෂණවලින් ලැබෙන ආදායම අදාළ පර්යේෂණ ප්‍රදානවලට බැර කොට අවසන් ශේෂය මුදල් තත්ත්ව ප්‍රකාශනයේ වෙනත් කොටස්වල අගය යටතේ දැක්වේ.

### 1.4.12 විදෙස් මුදල් ගනුදෙනු සහ ශේෂයන්

සියලුම විදෙස් මුදල් ගනුදෙනු අදාළ ගනුදෙනු සිදුවන අවස්ථාවේ පවතින හුවමාරු මිල අනුපාතවලින් මෙරට ක්‍රියාත්මක මුදල්වලින් හඳුනාගනි. විදෙස් මුදල්වලින් හැඳින්වෙන මූල්‍යමය වත්කම් සහ වගකීම් 2018.12.31 දිනට පවතින හුවමාරු මිල අනුපාතවලින් මෙරට ක්‍රියාත්මක රුපියලට සමානවන ආකාරයෙන් පරිවර්තනය කෙරේ. නේවාසික විදෙස් මුදල් ගිණුම්වල ශේෂය වාර්තා කරන දිනට පවතින මිල අනුපාතවලින් ක්‍රියාත්මක මුදල්වලට හරවා හඳුනාගනු ලබයි.

### 1.4.13 බදු

#### 1.4.13.1 ආදායම් බදු

පවතින බදු රෙගුලාසිවලට අනුව විශ්වවිද්‍යාලය අදායම් බදු ගෙවීමට බැඳී නොමැත. කෙසේ වෙතත් ඌණ උපයෝජිත පර්යේෂණ ප්‍රදාන වෙනත් ව්‍යාපෘති හා ශිෂ්‍යත්ව අරමුදල් තැන්පත් කිරීමෙන් ඒවා තුළින් කාලීනව උපයන පොළි ආදායම වෙනුවෙන් කාලානුරූපව ආදායම් බදු ගෙවීම විශ්වවිද්‍යාලය විසින් සිදුකරනු ලබයි. මෙම බදු අදාළ බැංකු විසින් සෘජුවම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවනු ලබන අතර එම තැන්පතුවල පොළිය ගෙවීමෙන් අනතුරුව එම ගනුදෙනු ලෙජර් ගිණුම්වල නියමාකාරයෙන් වාර්තා කොට මුදල් කාර්ය සාධන ප්‍රකාශනයේ ශුද්ධ පොළි ආදායම ලෙස හඳුනාගනී.

#### 1.4.13.2 උපයන විට ගෙවීමේ බදු

වර්තමානය වනවිට විශ්වවිද්‍යාලය විසින් ආදායම් බදු ගෙවීමට බැඳී සිටින විශ්වවිද්‍යාල සේවකයන්ගේ මාසික වැටුපෙන් අඩුකරගනු ලබන උපයනවිට ගෙවීමේ බදු ප්‍රේෂණය කරනු ලබන අතර එය විශ්වවිද්‍යාල වියදමේ කොටසක් නොවේ. එබැවින් මෙම ගෙවීම් විශ්වවිද්‍යාල ගිණුම්වල ගිණුම්ගත නොකෙරේ.

### 1.4.14 විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදල, විශ්‍රාම/වැටුප් අරමුදල හා සේවක භාරකාර අරමුදල

විශ්වවිද්‍යාල සේවකයන් අදාළ නීති හා රෙගුලාසිවලට සමගාමීව විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලේ දායකත්වයන්ට හා සේවක භාරකාර අරමුදලේ දායකත්වයන්ට හා සේවක භාරකාර අරමුදලේ දායකත්වයන්ට හිමිකම් කියනු ලබයි. විශ්වවිද්‍යාලයෙන් 7%ක් හා සේවක මුළු වේතනයෙන් 3% ක් දායකත්වයක් මෙම බාහිරව ක්‍රියාත්මක වන අරමුදල් දෙකකට පිළිවෙළින් දායක වේ.
තවද විශ්වවිද්‍යාල සේවකයන්ගේ විශ්‍රාම ප්‍රතිලාභයක් ලෙස ක්‍රියාත්මක වන සේවක විශ්‍රාම වැටුප් ක්‍රමයට විශ්වවිද්‍යාලය විසින් 8%ක් දායක කරනු ලබයි. මෙම බැඳීම් සේවක හිමිකම් පිළිබඳ ශ්‍රී.ලං.රා.අං.ගි. ප්‍රමිති 19ට අනුව නිර්වචනය කළ දායකත්වය සැලසුමේ විෂයපථය තුළට අයත් වේ. මෙම බැඳීම් මුදල් කාර්යසාධන ප්‍රකාශනයේ සම්බන්ධිත සේවා සැලසීම ලෙස හඳුනාගැනේ.

### 1.4.15 පාරිතෝෂික

### 1.4.16 සැපයීම් සහ වගකීම්

සැපයීම් ලෙස හඳුනාගනු ලබන්නේ අතීත සංසිද්ධියක ප්‍රතිඵලයක් ලෙස විශ්වවිද්‍යාලයට වර්තමානයේ පවතින බැඳීම්ය. ආර්ථික වාසි සලසමින් සම්පත් බාහිරව ගලායෑමක් සිදුවිය හැකි අතර ඒ සඳහා වගකීම් නිරවුල් කිරීම අවශ්‍යවන අතරම එම වගකීම් මුදල පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තුවක් සැකසිය හැකිය. උපචිත වියදම යටතේ දැක්වේ.

### 1.4.17 අනියම් වත්කම්

2018 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලය විසින් පනවා ඇති නඩුවලට අදාළ අනියම් වත්කම්වල මුදල රුපියල් 27439417.64කි. (නඩු හයකි) අනියම් වගකීම්වල විස්තර ඇමුණුම් 03හි දැක්වේ.

### 1.4.18 අනියම් වගකීම්

2018 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයට එරෙහිව ගොනුකර ඇති නඩු 28කට අදාළ අනියම් වත්කම්වල වටිනාකම රු. 1033259223.08ක් වේ. කෙසේ වෙතත් වන්දි මුදල් සම්බන්ධයෙන් විශ්වසනීය ඇස්තමේන්තුවක් සකස්කළ නොහැකි හෙයින් මුදල් ප්‍රකාශනවල විධිවිධාන සකස් කොට නොමැත. අනියම් වගකීම්වල විස්තර ඇමුණුම් 02හි දැක්වේ.

### 1.4.19 ඒකකවල ගිණුම් තොරතුරු අනාවරණය

#### 1.4.19.1 දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ ආදායම, වියදම, වත්කම් හා වගකීම් විශ්වවිද්‍යාලයේ ගිණුම් සමග ඒකාබද්ධ කොට ඇති අතර ඒවායේ විස්තර සටහන් යටතේ වෙනම දැක්වේ. මෙම මධ්‍යස්ථානය හා විශ්වවිද්‍යාලය අතර ගණුදෙනු විශ්වවිද්‍යාලය සහ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය විසින් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමක් හරහා සිදුවේ.

#### 1.4.19.2 තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය

තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ සියලුම භෞතික වත්කම් විශ්වවිද්‍යාලයීය ගිණුම්වල දක්වා ඇති අතර එහි ආදායම් හා වියදම් විශ්වවිද්‍යාලය විසින් මෙම මධ්‍යස්ථානය වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන මුදල් ගිණුමක වෙනම වාර්තා කෙරේ.

### 1.4.20 සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, විද්‍යා පශ්චාත් උපාධි ආයතනය හා මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතන ලෙස ක්‍රියාත්මක වේ. මෙම ආයතනවල අධ්‍යයන මණ්ඩලය ලෙස විශ්වවිද්‍යාලයේ සනාතන සභාව කටයුතු කරයි. විශ්වවිද්‍යාල පාලක සභාවේ සාමාජිකයන් ලෙස කටයුතු කරන කෘෂි විද්‍යා පීඨය, විද්‍යා පීඨය හා ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපතීන් මෙම ආයතනය තුනේ කළමනාකරණ මණ්ඩලයේ නිලලත් සාමාජිකයන් ලෙස ද කටයුතු කරයි.

2018 වසරේදී පහත සඳහන් සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සිදුවිය.

- ඉහත සඳහන් පශ්චාත් උපාධි ආයතන තුන විශ්වවිද්‍යාල භූමියේ ඉදිකොට ඇති හෙයින් කුලී ගෙවීමක් සිදුනොවේ.
- ශාස්ත්‍ර පීඨයේ පශ්චාත් උපාධි අරමුදල හරහා උපයාගත් මුදල් යොදා ගනිමින් මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතන ගොඩනැගිල්ල ඉදිකොට ඇති අතර එහි හිමිකාරිත්වය විශ්වවිද්‍යාලය සතුවේ.

ජලය, විදුලිබලය, ලිපිද්‍රව්‍ය (අත්‍යාවශ්‍ය මුද්‍රණ ද්‍රව්‍ය) පහසුකම් විශ්වවිද්‍යාලය විසින් ගාස්තු අයකිරීමේ පදනම මත සපයනු ලබන අතර එහි ගිණුම් කටයුතු සඳහා වෙනම ජංගම ගිණුමක් පවත්වාගෙන යනු ලබයි. 2018 වසරේදී පශ්චාත් උපාධි ආයතනවලින් පහත දැක්වෙන මුදල් අයකොටගෙන ඇත.

| ආයතනය | 2018.01.01 දිනට ලැබිය යුතු ශේෂය | 2018 වසරේදී ලබාගත් සේවාවන්වල වටිනාකම | 2018 වසරේදී ගෙවන ලද මුදල | 2018.12.31 දිනට ලැබිය යුතු ශේෂය |
|---|---|---|---|---|
| කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 565,307.72 | 743,807.14 | 863,173.33 | 445,941.53 |
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 543,663.65 | 1,027,607.10 | 1,256,299.93 | 314,970.82 |
| විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 4,160.53 | 31, 134.17 | 25,912.91 | 9,381.79 |

### 1.4.21 අයවැය ඉදිරිපත් කිරීම

විශ්වවිද්‍යාලයේ අයවැය ඉදිරිපත් කරනු ලබන්නේ ගිණුම් උපචිත පදනම හා වර්ගීකරණ පදනම මත වන අතර විශ්වවිද්‍යාලයේ මුදල් ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ද මෙම ක්‍රමය අනුගමනය කෙරේ. විශ්වවිද්‍යාලය විසින් ආදායම් හා වියදම් වර්ගීකරණය සිදුකරණ ලද්දේ මහ භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකූලවයි.

විශ්වවිද්‍යාලයේ 2018 වසර සඳහා වන අනුමත අයවැය සකස් කොට ඇත. සමස්ත විශ්වවිද්‍යාලය වෙනුවෙන් මෙහි අයවැය සකස් කොට ඇත.

කෙසේ වුවද ක්‍රියාකාරකම්වල සුමට ක්‍රියාකරිත්වය තහවුරු කරනු පිණිස විශ්වවිද්‍යාලයේ මුළු අයවැය පීඨ 09, මධ්‍යස්ථාන හා ඒකක අතර බෙදා හැරේ.

මෙලෙස අනුමත අයවැය හා මුදල් ප්‍රකාශන ගිණුම්වල උපචිත පදනම මත සකස් කොට ඇති අතර අයවැය සැසඳීම හා සැබෑ මුදල සිදුකර නොමැත.

අයවැය හා සැබෑ මුදල් සංසන්දන ප්‍රකාශන වෙනම ඇමුණුමක දැක්වේ.

### 1.4.22 උසස් අධ්‍යාපනය පුළුල් කිරීම කඩිනම් කිරීමේ හා සංවර්ධන මෙහෙයුම් ව්‍යාපෘතිය (AHEAD ව්‍යාපෘතිය)

ඉහත ව්‍යාපෘතිය විශ්වවිද්‍යාලය විසින් වෙනම ඒකකයක් ලෙස මෙහෙවන අතර ඒ සඳහා මුදල් ලබාදෙනු ලබන්නේ ලෝක බැංකු ආධාර මුදල් යටතේ නගර සැලසුම්, ජල සැපයුම් හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසිනි. මෙම ව්‍යාපෘතිය සඳහා වෙන්කළ මුදල් විශ්වවිද්‍යාලයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට ඇතුළත් කොට නොමැති අතර එම මුදල් අමාත්‍යාංශය විසින් සෘජුවම වියදම් කරනු ලබයි. එබැවින් මෙම ව්‍යාපෘතියේ මුදල් තොරතුරු විශ්වවිද්‍යාලයීය මුදල් ප්‍රකාශන සමඟ සම්බන්ධයක් නොමැත. එමෙන්ම මෙම ව්‍යාපෘතිය යටතේ මිලදීගත් වත්කම් ව්‍යාපෘතිය අවසානයේදී විශ්වවිද්‍යාලයට මාරුකරනු ඇති හෙයින් එවැනි වත්කම්වල වටිනාකම විශ්වවිද්‍යාලයේ ගිණුම් පොත්වලට ඇතුළත් කොට නොමැත.

## 8.15 2018 හා 2019 වසරවලදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ක්‍රියාත්මක කරන ලද චිරස්ථායි සංවර්ධන වැඩසටහන්

1. කාර්යක්ෂම පරිහරණය, ප්‍රතිපරිහරණය හා කරන ප්‍රතිචක්‍රීකරණය ප්‍රවර්ධනය කිරීම තුළින් අපද්‍රව්‍ය උත්පාදනය අවම කිරීම සඳහා විවිධ මට්ටමේ පර්ශවකරුවන් වෙනුවෙන් හැකියාවන් ගොඩනැගීමේ වැඩමුළු කිහිපයක් වාර්ෂිකව පවත්වන ලදි. උදාහරණ ලෙස ප්‍රජාව පදනම්කරගත් කාලගුණික සොඳුරු ගම්මාන සංවර්ධන වැඩසටහන දැක්විය හැක.

2. විශ්වවිද්‍යාල උද්‍යානයෙන් එක්රැස්කළ අපද්‍රව්‍ය භාවිත කොට වාණිජකරණය කළ හැකි ජෛවීය පොහොර නිෂ්පාදනය කිරීම පිණිස කපා ඉවත්කරන ලද තණකොළ ආදිය වියළීමට ලක්කරන කොම්පෝස්ට් ඒකකයක් ස්ථාපිත කිරීමේ යෝජනාව
   - උඩ පේරාදෙණිය ගොවිපලේ කොම්පෝස්ට් පොහොර සැකසීම මේ වනවිටත් ආරම්භ කොට ඇත.

3. කුණු කසළ වෙන්කරන වැඩසටහන යෝජනා කිරීම හා වෙන් වෙන් කසළ හඳුන්වාදීම
   - වෙන්කළ අපද්‍රව්‍ය බලයලත් කසල එක්රැස් කරන්නන්ට බාරදීම
   - අපගේ හරිත කඩදාසි හා පොලිතීන් වෙන්කොට ප්‍රතිචක්‍රීකරණය කිරීම

4. වගකීම් සහිත ප්‍රතිචක්‍රීකරණය කරන්නන්හට කසළ බැහැර කිරීමේ නිසි ක්‍රමයක් නිර්මාණය කිරීම තුළින් විද්‍යුත් අපද්‍රව්‍ය නිසි ආකාරයෙන් බැහැර කිරීමට පහසුකම් සැපයීම
   - ක්‍රමවත් ගිවිසුමක් යටතේ විශ්වවිද්‍යාලයේ විද්‍යුත් අපද්‍රව්‍ය බාරදීම සඳහා එම ද්‍රව්‍ය එක්රැස්කරන (හොල්සිම් ලංකා සමාගම සමඟ සාකච්ඡා පැවැත්වීම)

5. විද්‍යාගාරවලින් ඉවතලන රසායනික ද්‍රව්‍ය ප්‍රමිතිගත ආකාරයෙන් එක්රැස් කිරීම, ගබඩා කිරීමේ හා ලියාපදිංචි සමාගම් වෙත ප්‍රවාහනය කිරීමේ ප්‍රමිතිගත ක්‍රමයක් ස්ථාපිත කිරීම
   - මේ සම්බන්ධයෙන් ක්‍රමවත් ගිවිසුමක් යටතේ හොල්සිම් ලංකා සමාගම සමඟ සාකච්ඡා පැවැත්වීම

6. නව ගොඩනැගිලි ඉදිකිරීමේදී හා ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධයෙන් චිරස්ථායි ඉදිකිරීම් නියමයන් ප්‍රවර්ධනය කිරීම හා නව ඉදිකිරීම්වලදී හරිත ගොඩනැගිලි නියමයන් ක්‍රියාත්මක කිරීම

- විශ්වවිද්‍යාල උද්‍යානයේ උද්‍යාන අලංකරණ කටයුතු සම්බන්ධයෙන් පාලක සභාවට උපදෙස් ලබාදෙන පාලක සභාවේ උද්‍යාන අලංකරණ කමිටුව නමින් වෙනම කමිටුවක් විශ්වවිද්‍යාල පාලක සභාව යටතේ ස්ථාපිත කරන ලද අතරම නව සංවර්ධනයන් සඳහා හරිත ගොඩනැගිලි තාක්ෂණයන් ප්‍රවර්ධනය කිරීමට ද කටයුතු කරන ලදි.

7. අන්තරායකාරී ජෛව අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ක්‍රමයක් හඳුන්වාදීම

8. කාබන් කළමනාකරණ සැලසුම ඇතුළත්ව විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හරහා කාලගුණ විපර්යාසය පිළිබඳ අසුබවාදී බලපෑම අවම කිරීම

9. පරිසර හිතකාමී ප්‍රසම්පාදන සැලසුම් තුළින් පාරිසරික බලපෑම් අවමකිරීම

   - නිසි තෘණ ආවරණ පවත්වාගැනීම හා ජල කාන්දුව හරහා ජලය උරාගැනීම වැඩිකිරීම
   - මෙම ක්‍රමය ප්‍රගුණ කිරීම පිණිස හැකියාව ගොඩනැගීමේ කටයුතු සිදුකරනු ලබයි.

10. වැසි ජලය එක්රැස් කිරීම හඳුන්වාදීම

11. අප ජලය එක්රැස් කිරීම පවිත්‍රකරණය හා එම ජලය ගොවිතැන් කටයුතු සඳහා නැවත යොදාගැනීම ප්‍රවර්ධනය කිරීම

   - විශ්වවිද්‍යාලයේ කැලිකසළ අපද්‍රව්‍ය වලින් අර්ධයක් එක්රැස් කොට වගකීම් සහිත පවිත්‍රකරණය සඳහා මහනුවර මහ නගර සභාව වෙත බාරදීම

12. කාර්යක්ෂම බලශක්ති භාවිතය ප්‍රවර්ධනය
- පවතින විදුලි බුබුළු වෙනුවට LED විදුලි බුබුළු ආදේශ කිරීම
- සංවේදක විදුලි බුබුළු හඳුන්වාදීම
- පිරිසිදු බලශක්ති උත්පාදනය සඳහා සූර්ය බලශක්ති හඳුන්වාදීම
- කාර්යක්ෂම බලශක්ති පරිහරණය ප්‍රවර්ධනය සඳහා හැකියාවන් ගොඩනැගීමේ වැඩසටහන් පැවැත්වීම

13. ජෛව විවිධත්ව ක්‍රියාකාරි සැලසුමක් සකස්කොට වන වාසභූමි නිර්මාණය හා ඉහළදැමීම සඳහා විශ්වවිද්‍යාල කළමනාකරණයක් ඇති කිරීම
- වත්මන් තත්ත්වය හඳුනාගැනීම සඳහා ජෛව විවිධත්ව තක්සේරු සැලසුමක් නිර්මාණය කිරීම
- ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා සැලසුමක් සැකසීම
- දිශානුයෝජන වැඩසටහන්වලදී සිසුන්ට වනජීවී හා ජෛව විවිධත්වය සංරක්ෂණය ඇතුළත් සංරක්ෂණය සඳහා හරිත සංකල්පය පිළිබඳ දැනුවත් කිරීම. පරිසරය හා සම්බන්ධ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය සංගම් මේ සඳහා දැඩිව සහභාගී විය යුතුවේ.

14. පරිසර අධ්‍යාපනය හරහා විශ්වවිද්‍යාල ප්‍රජාව හා සමාජය අතර පරිසරය කෙරෙහි ගෞරවාන්විත ආකල්ප ප්‍රවර්ධනය කිරීම
- විශ්වවිද්‍යාලයේ පාරිසරික සංගම් ඒවායේ ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා බලගැන්වීම, එමෙන්ම විශ්වවිද්‍යාල ප්‍රජාව තුළ පරිසර ආරක්ෂණය පිළිබඳ දැනුම ව්‍යාප්ත කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම
- විශ්වවිද්‍යාලයේ පාරිසරික සංගම් සම්බන්ධයෙන් කටයුතු කරන ප්‍රධාන මධ්‍යස්ථානය ලෙස පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය කටයුතු කරනු ඇත.
- මෙම කරුණු සම්බන්ධයෙන් සහතික පත්‍ර පාඨමාලා පැවැත්වීම (පාරිසරික හා ජෛව විවිධත්ව සංරක්ෂණය)
- කාර්යක්ෂම උපකරණ පරිහරණය සඳහා ශිෂ්‍ය සංගම් පෙළඹවීම

15. කඩදාසි භාවිතයෙන් තොර ඵලදායි සන්නිවේදන පද්ධතියක් හඳුන්වාදීම, ඊ-මේල් හා කෙටි පණිවිඩ ක්‍රමය

16. චිරස්ථායි පර්යේෂණ සඳහා වෙන්කළ මුළු පර්යේෂණ මුදල් (ඇමෙරිකා ඩොලර්වලින්)

| තේමාව | මුදල (ඇ.ඩො.) |
|---|---|
| "කෘෂිකාර්මික හා ආහාර ආරක්ෂණය කෙරෙහි ස්වභාවික විපත් වල බලපෑම" | 3187.50 |
| "සහල්වල ජාන විශ්ලේෂණය පිළිබඳ පර්යේෂණය" | 6250.00 |
| "භූ තාක්ෂණික ශිල්පීය ක්‍රම භාවිත කරමින් කොළඹ නගරයේ නාගරික පරිමාව ඇස්තමේන්තු කිරීම" | 3125.00 |
| "යටත් විජිත නාගරික, සංවර්ධනයේ පාරාමිතිය කොළඹ නගරය" | 3925.00 |
| "හන්තාන ප්‍රදේශය කරා නාගරික ව්‍යාප්ත වීම හා නායයෑමේ අවධානම කෙරෙහි එහි බලපෑම විශ්ලේෂණය" | 3931.25 |
| "ශ්‍රී ලංකාවේ මහනුවර නගරයේ වාතයේ ගුණාත්මක බව නිරීක්ෂණය, විශ්ලේෂණය හා මොඩල්ගත කිරීම" | 3012.50 |
| "එක්ස්ට්‍රෑෂන් තාක්ෂණය යොදාගනිමින් රෙදිපිළිවලින් 3D මුද්‍රිත ෆිලමන්ට් නිෂ්පාදනය" | 3250.00 |
| "චිරස්ථායි නිෂ්පාදන හා ශ්‍රී ලංකාවේ පාරිසරික සළකුණු පද්ධතිය පිළිබඳ විමර්ශනයක්" | 2852.50 |
| "ඓන්ද්‍රීය දූෂණකාරක අවම කිරීමේ පර්යේෂණය" | 3593.75 |
| "ශ්‍රී ලංකාවේ ජනප්‍රියව වගාකරන එළවළු බෝග වර්ග 15ක බීජවල සාරවත් බව තක්සේරු කිරීම" | 2904.38 |
| "ස්වභාවික පරිසර පද්ධතිවල සුචක බෙදීයෑමේ මට්ටම ඇස්තමේන්තු කිරීම සඳහා පාරිසරික වශයෙන් වැදගත් සූචකයන් තීරණය කිරීම" | 1250.00 |
| "ශ්‍රී ලංකාවේ පිළිමතලාව හල්ගොල්ල වනයේ වෘක්ෂලතා අධ්‍යයනය" | 2500.00 |
| "Investigation of the effect of counter ions on removal of toxic captions using plans through phytoremediation" | 3806.25 |
| "ශ්‍රී ලංකාවේ අස්පරගස් වර්ගවල භේද සීමාවන්" | 4337.50 |
| ශ්‍රී ලංකාවේ නිව්කාසල් රෝග වෛරස අනාවරණය කරගැනීම පිණිස කඩිනම් අණුක ක්‍රම සංවර්ධනය" | 2609.25 |
| "ශ්‍රී ලංකාවේ කුකුළු සත්ව කර්මාන්තයට බලපාන වෛරස් රෝග හඳුනාගැනීම" | 2916.57 |
| **එකතුව** | **56665.01** |

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. : සීඑල්පී/කේඩී/ජේ/පියු/2019/12

ඔබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2019 මැයි 27 දින.

උපකුලපති,

පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

Vice - Chancellor
University of Peradeniya
Peradeniya
Sri Lanka.

**පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න

විගණකාධිපති

Acting Registrar
University of Peradeniya
PERADENIYA

INTERNAL AUDIT DIVISION
06 JUN 2019
UNIVERSITY OF PERADENIYA

පිටපත් :-

1. ලේකම්, නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. ලේකම් - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
3. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | සීඑල්පී/කේඩී/ජේ/පීයූ/2019/12 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2019 මැයි 27 දින. |

උපකුලපති,

පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

**පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය කළ මතය

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ මාගේ විධිවිධාන ප්‍රකාර විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.




අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk


196

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති

-----------------------------------------------

පහත නිරීක්ෂණයන් දැක්වේ.

(i) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 99 ඡේදය ප්‍රකාරව, අස්ථිත්වයක ඌනතාවය හා අතිරික්තය හඳුනා ගැනීමේදී සියලු ආදායම් හා වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුළත් කළ යුතු අතර ප්‍රමිතියේ 48 ඡේදය ප්‍රකාරව, ප්‍රමිත මඟින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර ආදායම් වියදම් එකිනෙකට හිලව් නොකළ යුතු වුවත්, විශ්වවිද්‍යාලයේ විවිධ කාර්යයන් වෙනුවෙන් ආරම්භ කර තිබූ අරමුදල් 257 ක රු.853,275,503 ක් වූ මුළු ආදායමින් රු.833,317,158 ක වියදම හිලව් කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණි.

(ii) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 හි 47 ඡේදය ප්‍රකාරව, අස්ථිත්වය විසින් ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේදවලදී සිදුවී ඇති සිදුවීම් අතීතානුයෝගීව නිවැරදි කිරීම් කළ යුතු වුවත්, පේරාදෙණිය විශ්වවිද්‍යාලය වෙත ඉකුත් වර්ෂයන්හි පරිත්‍යාග ලෙස ලබා දී තිබූ රු.4,688,998,047 වූ වත්කම් වර්ෂයකට සියයට 10 බැගින් ක්‍රමක්ෂය කිරීම සඳහා නව ප්‍රතිපත්තියක් ස්ථාපනය කර ඇතත්, අතීතානුයෝගීව නිවැරදි කිරීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් රු.692,530,391 ක් වූ ජංගම නොවන වත්කම් (පුස්තකාල පොත් හා ප්‍රකාශන) සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තව දුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

පහත නිරීක්ෂණයන් දැක්වේ.

(i) සමාලෝචිත වර්ෂයට අදාළ රු.12,499,290 ක ක්‍රමක්ෂය වටිනාකම පොදු සංචිතයට ගැලපීම් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ලද ප්‍රතිපාදන මුදල ඉක්මවා වියදම් කිරීම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම් (Unspent Capital Grant) 14 ක රු.395,314,856 ක හර ශේෂ දක්වා තිබුණි.

(iii) පෙර වර්ෂයට අදාළ පාරිතෝෂික ඌන වෙන් කිරීම රු.84,103,157 ක් වුවත්, එය රු.83,585,810 ක් ලෙස දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.517,347 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(iv) පීය 05 ක විවිධ තොග අයිතම 11 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(v) දිවි නැගුම දෙපාර්තමේන්තුව වෙත බදු පදනම මත ලබා දී ඇති බිම් කැබලි 04 ක් මඟින් 2016 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ රු.6,590,000 ක මුදලක් සහ 2017 හා 2018 වර්ෂයන්ට අදාළ බදු මුදල් සහ දඩ මුදල් ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(vi) විශ්වවිද්‍යාලය විසින් පීය 03 ක් පවත්වාගෙන යන අක්කර 73 හා පර්චස් 53.4 ක් වන ඉඩම් විධිමත් පරිදි විශ්වවිද්‍යාලය වෙත පවරා ගෙන, වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) නොසැසඳූ ශේෂ

-------------------

ගෙවිය යුතු ගිණුම් ශේෂ 06 ක පැවති රු.267,969,987 ක වටිනාකමක් රු.17,112,391 ක මුදලක් අදාළ ශේෂ සනාථ කිරීම් සමග නොසැසඳුණි.

(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම.

---

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු. 30,259,628 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ විගණන සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ජංගම ගිණුම් 07 ට අදාළ ගනුදෙනු | 18,196,804 | මුදල් පොත්, බැංකු සැසඳුම්, බැංකු ප්‍රකාශන ශේෂ සනාථ කිරීම් |
| ජංගම ගිණුම් 15 ට අදාළ තොරතුරු | - | - එම - |
| දේපල කුලි ආදායම් | 12,062,824 | ගිවිසුම්, කුලි දේපල විස්තර ඇතුළත් රෙජිස්ටර් |
| | 30,259,628 | |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම්

නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීති, රීති / විධානයට යොමුව | විස්තරය |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මුදල් රෙගුලාසි 396 | වලංගු කාලය ඉක්මවූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකර, රු.2,307,389 ක් වටිනා චෙක්පත් 79 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආදායමට ගෙන තිබුණි. |
| මුදල් රෙගුලාසි 1646 | සෑම මසකම වාහන දෛනික ධාවන සටහන් ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථමයෙන් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, කෘෂිකර්ම පීඨයේ වාහන 05 ක ධාවන සටහන් මුදල් රෙගුලාසි ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PED/12 සහ 2003 ජුනි 02 දිනැති | විශේෂඥ දැනුම ඇති පුද්ගලයන්ගේ හිඟකම හේතුවෙන් පුරප්පාඩු පිරවීමට අපහසු අවස්ථාවලදී හැරුණු විට අනුමත කාර්ය මණ්ඩලයේ දීර්ඝ කාලයක |

| | | |
|---|---|---|
| | චක්‍රලේඛයේ 9.10 වගන්තිය | සිට දිගින් දිගට පවතින පුරප්පාඩු හැකි ඉක්මණින් පිරවීමට හෝ අහෝසි කර දැමිය යුතු වුවත්, විශ්වවිද්‍යාලයේ අනුමත කාර්ය මණ්ඩලයේ පවතින විශේෂඥ ගණයට අයත් නොවන පුරප්පාඩු 296 ක් පිරවීමට හෝ අහෝසි කර දැමීමට 2019 මාර්තු මස වන විටත් කටයුතු නොකර පුරප්පාඩු වශයෙන් දිගින් දිගටම පවතින බව නිරීක්ෂණය වේ. |
| (ඇ) | 2014 මාර්තු 26 දිනැති අංක 06/2014 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | සියලුම අංශ ප්‍රධානීන් වෙනුවෙන් මූලික වැටුපෙන් සියයට 8 ක මුදලක් සංග්‍රහ දීමනා වශයෙන් ගෙවන නමුත් ඊට අනුකූල නොවන ලෙස සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ අංශ ප්‍රධානී වෙත රු.27,490 ක මුදලක් 2018 වර්ෂය තුළ අවස්ථා 06 කදී ගෙවා තිබුණි. |
| (ඈ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ආචාර ධර්ම හා අධ්‍යයන වගකීම් පිළිබඳ මාර්ගෝපදේශයේ 5 වන වගන්තිය | ආචාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයන් අතර ද්විසම්බන්ධතා (dual relationship with students) නොපැවැත්විය යුතු වුවත්, නියදි විගණන පරීක්ෂාවේදී ඉංජිනේරු හා වෛද්‍ය පීඨය තුළ ආචාර්යවරුන් 12 දෙනෙකුගේ දූ දරුවන් එම පීඨවල අධ්‍යයන කටයුතුවල නිරත වන බව නිරීක්ෂණය විය. නමුත් එම තත්ත්වය අනාවරණය කර ගැනීම හෝ මේ මඟින් තත්ත්ව පාලනයට ඇතිවිය හැකි අහිතකර තත්ත්වයන් වළක්වා ගැනීම සම්බන්ධයෙන් කිසිදු වැඩ පිළිවෙලක් මෙම පීඨ දෙක මඟින් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඉ) | 2008 පෙබරවාරි 01 දිනැති අංක 1534/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළවන කොටස | අපද්‍රව්‍ය විමෝචනය හෝ බැහැර කිරීම සඳහා පරිසර ආරක්ෂක බලපත්‍රයක් ලබා ගෙන ඊට අදාළ කටයුතු සිදු කළ යුතු වුවත්, |

විශ්වවිද්‍යාලයේ විද්‍යාගාරවල භාවිතා කර ඉවත් කරනු ලබන රසායනික ද්‍රව්‍ය හා දිරාපත් නොවන පොලිතින් වැනි ද්‍රව්‍ය විශ්වවිද්‍යාල භූමියේ සකස් කරන ලද වලකට බැහැර කර තිබුණු අතර, විශ්වවිද්‍යාලයේ නේවාසිකාගාර 03 ක මළ අපවහන පද්ධතීන් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් අවිධිමත් ලෙස පරිසරයට මුදා හැර තිබුණි.

2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර විශ්වවිද්‍යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

| | බලතල, කර්තව්‍ය, කාර්යයන් | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ PED/12 චක්‍රලේඛය මගින් දක්වා ඇති "යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යවසායයන්ට මඟපෙන්වීම" නම් අත්පොතෙහි 8.2.2 සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය | සියලුම අතිරික්ත මුදල්, මුදල් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය මත මිස ආයෝජනය කරනු නොලැබිය යුතු වුවද, විශ්වවිද්‍යාලය මගින් සමාලෝචිත වර්ෂයේ රු.263,740,682 ක මුදලක් අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |
| (ආ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 101 (ඈ) වගන්තිය | යම් කාර්යක් හෝ අරමුණක් සඳහා ලද ප්‍රතිපාදන ඒ කාර්යය හෝ අරමුණු නොවන කරුණු සඳහා ඒ ආදායමෙන් කිසිදු ගෙවීමක් නොකළ යුතු වුවත්, මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 1026 ක් වූ වෛද්‍ය පීඨයේ පශ්චාත් වෛද්‍ය විද්‍යා පාසල ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා 2014 සහ 2015 වර්ෂයන්හිදී ලබාදී තිබූ රු.මිලියන 330 ක ප්‍රතිපාදිත මුදලින් රු.285,000,000 ක මුදල 2016 දෙසැම්බර් 25 දිනැති අංක A0040 දරන ජර්නල සටහන් මගින් |

| | | |
|---|---|---|
| | | අනුමැතියක් නොමැතිව පුනරුත්ථාපන වැඩ කටයුතු සඳහා මාරු කර තිබුණි. |
| (ඇ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 (2) (ඇ) උප වගන්තිය, 18 (2) (1) සහ (3) වගන්ති සහ 29 වගන්තිය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි, අභිඥන පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීමේ කාර්ය සඳහා විශ්වවිද්‍යාල අධ්‍යයන තත්ත්වයන් ඇති කිරීම හා පවත්වාගෙන යාම සඳහා නියමාවලි සකස් කර එම නියමාවලි ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු ක්‍රියාත්මක කළ යුතු වුවත්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය 2016/2017 අධ්‍යයන වර්ෂය දක්වා පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ශිෂ්‍යයින් 1064 ක් ලියාපදිංචි කර පශ්චාත් උපාධි පාඨමාලා 04 ක් පවත්වාගෙන ගොස් ඇතත්, ඉහත පරිදි අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර පිරිනමනු ලබන පශ්චාත් උපාධි පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියද ලබා ගෙන නොතිබුණි. |
| (ඈ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් 2015 දෙසැම්බර් මාසයේදී නිකුත් කර ඇති ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි උපාධි අධ්‍යයන පාඨමාලා සමාලෝචනය සම්බන්ධයෙන් වන අත්පොතෙහි 7 වන නිර්නායකය | විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨවල ශිෂ්‍ය ඇගයීම් ක්‍රියාවලිය එනම් විභාග සැලසුම් කිරීම, ප්‍රශ්න පත්‍ර පිළියෙල කිරීම, ඒවා වැඩිදියුණු කිරීම, හරි වැරදි බැලීම, ශ්‍රේණිගත කිරීම සහ සමාලෝචනය කිරීම (Designing, Setting, Moderating, Marking, Grading, Monitoring and Reviewing) සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන නිශ්චිත ක්‍රමවේදයක් සහ ප්‍රමිතියක් සකස් කර විශ්වවිද්‍යාල පාලක සභාවේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගත යුතු වුවද, විශ්වවිද්‍යාලයේ පීඨ 05 ක එවැනි ක්‍රමවේදයක් සකස් කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක වන තත්ත්ව ආරක්ෂක සභාවේ මාර්ගෝපදේශය | විශ්වවිද්‍යාලවල වැඩ තීරණය කිරීමේ විශ්ව සම්මත ක්‍රමය වශයෙන් දේශන පැවැත්වීමේ කාලය සතියකට පැය 35 ක් ලෙසට පදනම් කරගෙන කාල සටහන් පිළියෙල කළ යුතු වුවත්, පරීක්ෂාවට ලක්කළ ඉංජිනේරු සහ වෛද්‍ය පීඨ 02 ක එසේ සම්මත පැය ගණන් අනුගමනය කරමින් කාල සටහන් පිළියෙල කර නොතිබූ අතර අදාළ මහපෙන්වීම්වලට අනුගත වීම සඳහා වෙනත් ක්‍රමවේදයක්ද හඳුන්වාදී නොතිබුණි. |

2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීති, රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) විවිධ පුද්ගලයන් හා ආයතන 44 කින් ලැබිය යුතු රු.1,517,369 ක් වසර 01 සිට වසර 14 ක කාලයක් ගත වී ඇතත් අයකර ගෙන නොතිබුණි.

(ආ) වාර්ෂිකව විගණන වාර්තාවලින් නිරීක්ෂණයට ලක් කරන ලද විශ්වවිද්‍යාලයේ පීඨ 09 ක සිසුන්ගෙන් අයවිය යුතු ශාලා ගාස්තු රු.1,735,950 ක් හා රු.5,320,542 ක් වූ දඩ මුදල් වසර 01 සිට 37 ක් දක්වා කාලයක් ගත වී ඇතත්, අයකර ගැනීමට හෝ කපාහැරීමට විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) විදේශීය ශිෂ්‍ය අරමුදලින් මිලදී ගැනීම් සඳහා ඉකුත් 2017 වර්ෂයේදී වෛද්‍ය පීඨයේ චක්‍රීය අරමුදල (Medical Faculty Revolving Fund) වෙත මාරු කරන ලද රු.15,439,993 ක මුදලක් අය කර ගැනීමට කටයුතු නොකර, ලැබිය යුතු ශේෂයක් ලෙස ඉදිරියට ගෙන යමින් පැවතුණි.

(ඈ) විශ්වවිද්‍යාලය නිලධාරීන් වෙත වර්ග 05 ක් යටතේ නිකුත් කර ඇති ණය අතුරින් 2018 දෙසැම්බර් 31 දින රු.1,221,437 ක ණය මුදලක් ස්ථාන මාරු වීම් මත සහ වැටුප් නතර කිරීම මත අයවීම් නතර වී තිබුණි.

(ඉ) අධ්‍යයන කටයුතු සඳහා විදේශගත වී ඇති අධ්‍යයන කාර්යය මණ්ඩලයේ ආචාර්යවරුන් විශ්වවිද්‍යාලය සමග එළඹි ගිවිසුම උල්ලංඝනය කිරීම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට ආචාර්යවරුන් 110 දෙනෙකුගෙන්, රු.142,596,921 ක් අයවිය යුතුව තිබුණි. මේ තුළ ආචාර්යවරුන් 92 ගෙන් අයවිය යුතු රු.121,078,386 ක ප්‍රමාණයක් අයවීමේ සම්භාවිතාවය අවම මට්ටමක පැවතුණි.

(උ) උසස් අධ්‍යාපන කටයුතු සඳහා භාණ්ඩාගාරය මඟින් වෙන් කරන ලද රු.238,417,183 ක් වටිනා ප්‍රතිපාදන සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් මහනුවර, කුරුණෑගල සහ පේරාදෙණිය යන රෝහල්වල සංවර්ධන කටයුතු සඳහා 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ විශ්වවිද්‍යාලයේ අරමුණට පටහැනිව හා විධිමත් අනුමැතියකින් තොරව යොදාගෙන තිබුණි.

(ඌ) 2009/2010 අධ්‍යයන වර්ෂයේ සිට 2012/2013 අධ්‍යයන වර්ෂය දක්වා අධ්‍යයන වර්ෂ 4 වෙනුවෙන් කෘෂිකර්ම පීඨය සඳහා සිසුන් 1,100 ක් ලියාපදිංචි කළ හැකි වුවත්, ලියාපදිංචි කරගෙන තිබුණේ සිසුන් 876 ක් පමණි. ඒ අනුව සිසුන් 224 ක් ලියාපදිංචි වී නොතිබූ අතර, එය ලියාපදිංචි කළ හැකි සිසුන්ගෙන් සියයට 20 ක ප්‍රතිශතයක් විය.

(එ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික හා සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 3.7 වගන්තිය ප්‍රකාරව, ණය මුදල දුන් මාසයට පසු මාසයේ සිට ණය මුදල වාරික හා පොලී මුදල් අය කළ යුතු වුවත්, පේරාදෙණිය විශ්වවිද්‍යාලය වෙත සමාලෝචිත වර්ෂයේ ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් එම නිලධාරීන්ගෙන් ණය වාරික අඩු කර ගැනීමට නොහැකි වී තිබූ අතර, රු.1,841,805 ක් වූ ණය වාරික හා ඊට අදාළ පොලී මුදල් මාස 01 සිට මාස 14 දක්වා කාලයක් අය නොවී පැවතුණි.

(ඒ) 1976 වර්ෂයට පමණක් අදාළව නිකුත් කර ඇති 1976 මාර්තු 09 දිනැති අංක 61 හා 1976 දෙසැම්බර් 07 දිනැති අංක 70 දරන අභ්‍යන්තර චක්‍රලේඛ මත පදනම්ව විශ්වවිද්‍යාලය සමාලෝචිත වර්ෂය දක්වා සේවක ණය, ආපදා ණය, මෝටර් බයිසිකල් ණය, වාහන ණය සහ පරිගණක ණය මත අප්‍රේල් හා දෙසැම්බර් මාසවලට අදාළ ණය වාරික අය නොකර තිබුණි.

(ඓ) 1980 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වසර 35 ක කාලය තුළ කෘෂිකර්ම තාක්ෂණ හා කළමනාකරණ ක්ෂේත්‍රය සඳහා කෘෂිකර්ම පීඨය තුළ ශිෂ්‍යයන්ගේ වැඩිවීම 17.5 මට්ටමක පැවති අතර භෞතික හා මානව සම්පත්වලට හා කෘෂිකර්ම ක්ෂේත්‍රය සඳහා

පවතින ඉල්ලුමට සාපේක්ෂව ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීම සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඔ) කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ඇති ව්‍යාපෘති කළමනාකරු සහ ව්‍යාපෘති ඉංජිනේරු විසින් 2018 වර්ෂයේදී රු.3,281,369,421 ක් වටිනා ඉදිකිරීම් ව්‍යාපෘති 22 ක් අධීක්ෂණය කර තිබූ අතර ඒ වෙනුවෙන් රු.504,549,057 ක් වටිනා සංචලන අත්තිකාරම් සහ රු.318,158,683 ක් වටිනා අන්තර් බිල්පත් (Interring Payment) මෙම කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබූ නිලධාරීන්ගේ සහතික කිරීම් මත ගෙවා තිබුණි.

(ඕ) පේරාදෙණිය විශ්වවිද්‍යාලය 2018 වර්ෂය සඳහා අනුමත කාර්යය මණ්ඩලය තුළ පුරප්පාඩු වී ඇති තනතුරු 516 ක් සඳහා රු.286,295,486 ක මුදලක් ප්‍රතිපාදන සලසාගෙන තිබුණත්, 2018 දෙසැම්බර් 31 දින වන විටත් අනුමත සේවක සංඛ්‍යාවෙහි තනතුරු 296 ක් පුරප්පාඩු වීම නිසා 2018 වර්ෂයේදී විශ්වවිද්‍යාලය විසින් අනධ්‍යයන කාර්ය මණ්ඩල වැටුප් සහ වේතන සඳහා අධි ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි.

(ඖ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ XIII වන පරිච්ඡේදයේ 101 (ආ) උප වගන්තියට අනුකූල නොවන පරිදි ශාරීරික අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් අවස්ථා 04 කදී බාහිර පාර්ශවයන් විසින් ගෙවන ලද රු. 22,500 ක මුදලක් ආයතන අරමුදලට බැර නොකර අවිධිමත් ලෙස සේවකයන් විසින් ලබා ගෙන තිබුණි.

(ක) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.49,704,134 ක් හා සමාලෝචිත වර්ෂයේ ලද රු.10,000,000 ලෙස එකතුව රු.59,704,104 ක් වූ ඉදිකිරීම් ව්‍යාපෘති 14 ක් සඳහා ලද මුදල් උපයෝජනය කර නොතිබුණි.

(ඛ) ශිෂ්‍ය ප්‍රායෝගික පුහුණුව සහ වාහන අළුත්වැඩියාව සඳහා ඉංජිනේරු පීඨයේ ස්ථාපිත කර තිබූ වාහන නඩත්තු ඒකකය 2017 වර්ෂයේදී එහි කටයුතු නවතා එය නැවත ස්ථාපිත නොකිරීම හේතුවෙන් සිසුන්ගේ ප්‍රායෝගික පුහුණු වීම් සඳහා බාධාවක් වී තිබුණි.

(ග) 2016 ඔක්තෝබර් 17 දින සිට 2018 පෙබරවාරි 08 දින දක්වා ඉදිකිරීම් කටයුතු අවසන් කර විශ්වවිද්‍යාලය වෙත බාරදී තිබුණු රු.875,752,824 ක් වටිනා නේවාසිකාගාර 04 ක් 2019 අප්‍රේල් මස වන විටත් ශිෂ්‍යයන්ට නේවාසික පහසුකම් සඳහා ලබා දී නොතිබූ අතර 2018 දෙසැම්බර් 31 වන විට සිසුන් 5582 ක් සඳහා නේවාසික පහසුකම් ලබා දිය යුතුව තිබුණි.

(ඝ) විශ්වවිද්‍යාලය රුපියල් මිලියන 82.2 ක වියදමින් 2012 වර්ෂයේ ආරම්භ කර 2015 වර්ෂයේ නිම කිරීමට සැලසුම් කර තිබූ කලාගාරය සඳහා රු.6,855,652 ක වැය කර ඉදිකර තිබූ ගොඩනැගිල්ල වසර 04 ක කාලයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ගරා වැටෙමින් පැවතුණි.

(ච) වෛද්‍ය පීඨයේ පශ්චාත් වෛද්‍ය විද්‍යා පාසල ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා 2014 සහ 2015 වර්ෂයන්හිදී රු. මිලියන 330 ක මුදලක් ප්‍රතිපාදන සලසා ගෙන ඉන් රු.39,703,080 ක් උපදේශන සේවා සමාගමකට ගෙවීම් කර තිබුණු නමුත් මේ දක්වා ඉදිකිරීම් සිදු කර නොතිබූ බැවින් ගෙවන ලද එම මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

(ඡ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.10 වගන්තියට පටහැනිව සහ 2018 වර්ෂයේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වැඩ සටහන් අයවැය ලේඛනය මඟින් අනුමැතිය ලබා දී නොමැති තනතුරු 5 කට අයත් නිලධාරීන් 05 දෙනෙකු සේවයේ යොදවා තිබුණු අතර, ඒ වෙනුවෙන් 2018 වර්ෂයේදී වැටුප් සහ වේතන වශයෙන් රු.2,773,215 ක් ගෙවා තිබුණි.

(ට) විශ්වවිද්‍යාලය සතු අක්කර 22 කට අධික බිම් කොටස් ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව, බෝවලවත්ත වජිරාරාම අන්තර්ජාතික බෞද්ධ මධ්‍යස්ථානය සහ දිවි නැඟුම දෙපාර්තමේන්තුව වෙත බදු පදනම මත පවරා දී ඇතත්, නිසි පරිදි බදු මුදල් අයකර ගැනීමට හෝ නැවත අදාළ බිම් කොටස්වල භුක්තිය විශ්වවිද්‍යාලය සතු කර ගැනීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි.

(ඨ) විශ්වවිද්‍යාලයට යම් සේවාවක් බාහිර පාර්ශවයන්ගෙන් ලබා ගැනීමේදී ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නීති රෙගුලාසි යටතේ විශ්වවිද්‍යාලයට උපරිම වාසි ලැබෙන පරිදි තරඟකාරී ක්‍රමයක් යටතේ සැපයුම්කරුවන් තෝරා ගත යුතු වුවත්, ඊට අනුකූල නොවන පරිදි කටයුතු කරමින් විශ්වවිද්‍යායේ අධ්‍යයන පීඨ 04 ක් සහ විවිධ අංශ 03 ක් මඟින් විවිධ සේවාවන් 12 ක් සඳහා තෝරා ගත් සැපයුම්කරුවන් සමග දිගින් දිගටම ගිවිසුම්වලට එළඹ තිබුණි.

ඩබ්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

## 8.17 පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

| | |
|---|---|
| **1.** | **මූල්‍ය ප්‍රකාශන** |
| **1.1** | **තත්වාගණනය කළ මතය** |
| **1.2** | **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම** |
| (අ) | **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති** |
| **(i)** | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 99 වන ඡේදය ප්‍රකාරව හා විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලබන එකී අරමුදල් ගිණුම් අතරින් පර්යේෂණ අරමුදල් ගිණුම් හා නිශ්චිත අරමුදල් ගිණුම් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්ති නිවැරදි බව ප්‍රකාශ කරමි. අනෙකුත් අරමුදල් ගිණුම් හා සම්බන්ධයෙන් ආදායම් හා වියදම් වෙන වෙනම හඳුනාගෙන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ඇතුළත් කිරීමට 2019 වර්ෂයේ සිට කටයුතු කරනු ලැබේ. |
| **(ii)** | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 03 හි 47 ඡේදය ප්‍රකාරව 2019 වර්ෂය සඳහා පිළියෙළ කරනු ලබන අවසන් ගිණුම් වල 2018 වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීම් මගින් අතීතයානුයෝගීව නිවැරදි කිරීම් කරනු ලැබේ. |
| **(iii)** | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 65 ඡේදය ප්‍රකාරව අදාල ප්‍රත්‍යාගණන කාර්යයන් අවසන් වූ වහාම ප්‍රත්‍යාගණන අගයන් ගිණුම් වල ගැලපීමට කටයුතු කරනු ලැබේ. |
| **(ආ)** | **ගිණුම්කරණ අඩුපාඩු** |
| **(i)** | රු. 12,499,290 ක් වූ ක්‍රමක්ෂය වටිනාකම 2019 වර්ෂය සඳහා පිළියෙළ කරනු ලබන අවසන් ගිණුම් වල 2018 වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීම මගින් අතීතයානුයෝගීව නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| **(ii)** | විශ්වවිද්‍යාලය සතු පැරණි ගොඩනැගිලි වල පැවති අත්‍යාවශ්‍ය වූ ප්‍රාග්ධන ස්වරූපයේ නඩත්තු කටයුතු සඳහා වැය දැරීම නිසා මෙවැනි තත්වයක් පෙන්නුම් කරන අතර ඉදිරියේ දී සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම පදනම් කරගනිමින් මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් ප්‍රතිපාදන මත අවශ්‍යතාවයන් පෙළගස්වා ව්‍යාපෘතීන් ආරම්භ කිරීම මගින් මෙම තත්වය මගහරවා ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| **(iii)** | විගණනය පෙන්වා දී ඇති පරිදි වර්ෂයේ ඌණතාවය අඩුවීමක් සිදු වී නොමැත. |
| **(iv)** | 2019 වර්ෂයේ ගිණුම් සමඟ තත්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලැබේ. |
| **(v)** | මෙකී බදු මුදල් හා දඩ මුදල් නැවත විශ්වවිද්‍යාලය වෙත ලැබීම ඉතාම අවිනිශ්චිත බැවින් ලැබිය යුතු බදු මුදල් හා දඩ මුදල් ලෙස ගිණුම් ගත කිරීම සිදු නොකරන ලදි. කෙසේ වෙතත් 2019 වර්ෂය සඳහා පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශනයේ ගිණුම්කරණ සටහනක් ලෙස දැක්වීමට කටයුතු කරනු ලැබේ. |
| **(vi)** | මෙකී ඉඩම් විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනිම සඳහා ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති අතර, එම ඉඩම් විශ්වවිද්‍යාලය වෙත නීතිමය වශයෙන් පවරා ගැනීමෙන් පසුව ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලැබේ. |
| **(ඇ)** | **නොසැසඳූ ශේෂ** |
| | විශ්වවිද්‍යාලය වෙත භාණ්ඩ ලැබී ඇති මුත් භාණ්ඩ ප්‍රතිග්‍රහන කමිටුවෙන් මෙතෙක් අනුමත නොවූ භාණ්ඩ වලට අදාල ණයගැතියන්ගේ ශේෂය, ශේෂ සනාථ කිරීමේ දී වෙනසක් ලෙස පෙන්නුම් කරයි. මේ වන විට නිවැරදි වී ඇත. |
| **(ඈ)** | **විගණනය සඳහා සාක්ෂි නොවීම** |
| | **ජංගම ගිණුම් 07ට අදාල ගනුදෙනු රු.18,196,804.00** |
| | ජංගම ගිණුම් 07 ට අදාල මුදල් පොත්, බැංකු සැසඳුම්, බැංකු ප්‍රකාශන, ශේෂ සනාථ කිරීම් විගණනය වෙත ඉදිරිපත් කර ඇත. |

| | |
|---|---|
| | **<u>ජංගම ගිණුම් 15ට අදාල තොරතුරු</u>**<br>විගණනය පෙන්වා දී ඇති ජංගම ගිණුම් 15 විශ්වවිද්‍යාලය විසින් මේ වන විට භාවිතා නොකරන අතර ඒවායෙහි ශේෂයන් ද නොමැත. එබැවින් මුදල් පොත්, බැංකු සැසඳුම් විගණනය වෙත ඉදිරිපත් කිරීමේ හැකියාවක් නොමැත. |
| | **<u>දේපල කුලී ආදායම් රු.12,062,824.00</u>**<br>දේපල කුලී ආදායම් වලට අදාල ගිවිසුම් කුලී දේපල විස්තර ඇතුළත් රෙජිස්ටර් සාමාන්‍ය පාලන අංශය භාරව තබා ඇත. |
| **2.2** | |
| **(අ)** | **<u>මුදල් රෙගුලාසි -396</u>**<br>වලංගු කාලය ඉක්ම වූ චෙක්පත් සම්බන්ධයෙන් අදාළ පුද්ගලයන් දැනුවත් කිරීමටත්, ඒවා චෙක්පත් අවලංගු කිරීමේ ලේඛනයට ඇතුළත් කිරීමටත්, පසුව එකී චෙක්පත් ආදායමට ගැනීමටත් විශ්වවිද්‍යාලය කටයුතු කරන බැවින් විශ්වවිද්‍යාලය විසින් මූල්‍ය රෙගුලාසි 396 ට අනුව කටයුතු කර ඇත. |
| | **<u>මුදල් රෙගුලාසි -1646</u>**<br>2019 ජූලි මස සිට ධාවන සටහන් විධිමත් පරිදි ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. |
| **(ආ)** | විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා තනතුරු 2585 ක් අනුමතව් තිබුණද "දරන්නාට පමණක් පුද්ගලික වන සේ" (Personal to the Holder) අනුමතව ඇති තනතුරුද මේ අතර වේ. එවැනි තනතුරු දරන්නන්ගේ විශ්‍රාම යෑම්, ඉල්ලා අස්වීම් ආදී හේතූන් නිසා පුරප්පාඩු ඇති වන නමුත් මෙවැනි තනතුරු සඳහා නැවත බඳවා ගැනීම් සිදුකළ නොහැකි අතර එම තනතුරු අහෝසි වී යයි. එම හේතුවෙන් අනධ්‍යන කාර්ය මණ්ඩලයේ අනුමත තනතුරු සංඛ්‍යාව දිනෙන් දින වෙනස්වේ. ඒ අනුව 2019.06.18 වන දින වන විට  විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා අනුමත තනතුරු ගණන වන්නේ 2,519 කි. මෙම දිනට අනධ්‍යයන කාර්ය මණ්ඩල තත්‍ය සේවක සංඛ්‍යාව 2,244ක් වන බැවින් පුරප්පාඩු සංඛ්‍යාව 275 ක් වේ. අනුමත තනතුරු කාණ්ඩ 14ක් සඳහා බඳවා ගැනීමේ පරිපාටි නොමැති හේතුවෙන් හා බඳවා ගැනීමේ පරිපාටිවල වැටුප් කේත වල නොගැලපීම් හේතුවෙන් පුරප්පාඩු 35ක් පමණ පිරවිය නොහැකි වී ඇත. තවද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිරවිය යුතු තනතුරු කාණ්ඩ 03ක් සඳහාද තනතුරු පුරප්පාඩු 04ක් පවතී. තවද තනතුරු කාණ්ඩ 08ක පවතින පුරප්පාඩු 70ක් පිරවීම සඳහා අමාත්‍යාංශ නාමලේඛණ ඉල්ලා තිබුණු නමුත් ඒවා ලැබීම වසරක පමණ කාලයක් ප්‍රමාදවීම හේතුවෙන් හා ලැබුණු සමහරක් නාමලේඛණද අදාල ඇමතිවරුන් මාරු වීම හේතුවෙන් අහෝසි වීම නිසා මෙම තනතුරු පුරප්පාඩු පිරවීම තවදුරටත් ප්‍රමාද විය. ඒ අනුව 2019.06.18 වන විට අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු 236ක් සඳහා බඳවා ගැනීම් පරිපාටි අනුව යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීම, වෘත්තීය පරීක්ෂණ පැවැත්වීම, අභියෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීම, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම හා පාලකසභා අනුමැතිය ලබා ගැනීම ආරම්භකර ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. |
| **(ඇ)** | සිවිල් දෙපාර්තමේන්තුවේ අංශ ප්‍රධානිවරයා හා දෙපාර්තමේන්තු ආචාර්ය මණ්ඩලය සමඟ මාසිකව පවත්වනු ලබන දෙපාර්තමේන්තු රැස්වීම් සඳහා සහභාගිවූවන්ට සංග්‍රහ කිරීම වෙනුවෙන් මෙම මුදල් ප්‍රතිපූර්ණය කර ඇත. මෙවැනි ගෙවීම් මේවන විට නවතා දමා ඇත. |
| **(ඊ)** | **<u>වෛද්‍ය පීඨය</u>**<br><br>විගණනය මගින් පෙන්වා දී ඇති කරුණු අනුව වෛද්‍ය පීඨයේ මෙහි සඳහන් කර ඇති අධ්‍යයන කාර්යය මණ්ඩල සාමාජික/සාමාජිකාවන්ගේ දූ දරුවන් මෙම පීඨයේ ඉගෙනුම ලබයි. විභාගයක් පැවැත්වෙන කාල සීමාවේදී එම  අධ්‍යයන කාර්යය මණ්ඩලය සියළු විභාග කටයුතු වලින් ඉවත් වේ. ඔවුන් විභාග ප්‍රශ්න පත්‍ර සෑදීම, ප්‍රමිත කිරීම (Moderate), ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීම, විභාග පැවැත්වීමේදී විභාග පරීක්ෂක (Examiner)  හෝ විභාග නිරීක්ෂක (Invigilator)  ලෙස කටයුතු කිරීම, ප්‍රශ්න පත්‍ර වල හරි වැරදි බැලීම යනාදි විභාග සම්බන්ධ සියළුම කටයුතු වලින් ඉවත් වන අතර ඒ පිළිබඳව අදාල අංශ ප්‍රධානින්ද දැනුවත් කරයි. එමෙන්ම අදාල අධ්‍යයන කාර්යය මණ්ඩලය ඔවුන්ගේ පවුලේ සාමාජික සාමාජිකාවන් පීඨයේ ඉගෙනුම ලබයි නම් අධ්‍යයන කටයුතු සම්බන්ධීකරණ කටයුතු වලට සම්බන්ධ නොවේ.(Teaching activities)<br><br>දැනට පීඨය වෙත බඳවා ගන්නා සිසුන්ගෙන් Dual relationship with students පිළිබඳව ලියවිල්ලක් ලබා නොගන්නා අතර ඉදිරියේදී එය ලබා ගැනීමට කටයුතු කරණු ඇත. |

| | |
|---|---|
| | **ඉංජිනේරු පීඨය**<br><br>ඇගයීම් කමිටු සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලය පත් කිරීමේදී ද්වි සම්බන්ධතා ඇති ආචාර්යවරුන් පත් නොකෙරෙන අතර මෙවැනි අතපසුවීම් සිදු වී ඇති බවට වාර්තා වී ඇති බැවින් ඉදිරියේදී එවැනි අතපසුවීම් නොවීමට වග බලා ගන්නා ලෙස අධ්‍යයන කාර්ය මණ්ඩලය දැනුවත් කරන ලදී.<br>සියළුම පීඨයන් ආවරණය වන පරිදි ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා මේ වන විට පාලක සභාව විසින් සාකච්ඡා කරමින් පවතී. ඒ අනුව මෙවැනි තත්වයන් ඉදිරියේදී ඇති නොවේ. |
| (උ) | විශ්වවිද්‍යාලයේ විද්‍යාගාරවල භාවිතා කර ඉවත් කරනු ලබන රසායනික ද්‍රව්‍ය පිළිබඳව විශ්වවිද්‍යාල ආරක්ෂණ කමිටුව වෙත (University Safety Committee) කරුණු ඉදිරිපත් කරන ලද අතර එහිදී මෙම රසායනික ද්‍රව්‍ය පරිසරයට බැහැර නොකර විධිමත් හා නීත්‍යානුකූල ලෙස බාහිර පාර්ශ්වයකට ලබා දීමට තීරණය කරන ලදි. ඒ අනුව දැනට ශ්‍රී ලංකාව තුළ මෙම සේවාව සපයන එකම ආයතනය වන Insee Ecocycle සමාගම සමඟ සාකච්ඡා කොට පාලක සභාවේ සහ විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුවේ ද අනුමැතිය ලබාගෙන විශ්වවිද්‍යාලයීය නීති හා ලේඛණ අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී විසින් සකස් කළ විධිමත් ගිවිසුමකට දෙපාර්ශ්වය විසින් එළැඹ මෙම කොන්ත්‍රාත්තුව Insee Ecocycle සමාගම වෙත පවරන ලදි. එම සමාගම විසින් 2019 මාර්තු 05, 06, 07 සහ 08 වන දිනයන්හි විශ්වවිද්‍යාලයේ සියළුම පීඨවල විද්‍යාගාරවලින් බැහැර කරනු ලැබූ රසායනික ද්‍රව්‍ය රැගෙන යන ලදි. එම සමාගම විසින් එසේ රැගෙන යනු ලැබූ රසායනික ද්‍රව්‍ය තාප විනාශය කර ඒ සඳහා සහතික පත්‍රයක්ද (Certificate of Thermal Destruction) විශ්වවිද්‍යාලය වෙත නිකුත් කර ඇත. මෙසේ බැහැර කරනු ලබන රසායනික ද්‍රව්‍ය නිසි පරිදි ගබඩා කොට වාර්ෂිකව මෙම ආයතනය වෙත ලබා දීමට අපේක්ෂා කෙරේ.<br><br>විශ්වවිද්‍යාලයෙන් බැහැර කරනු ලබන අපද්‍රව්‍ය වෙන් වෙන් වශයෙන් ගබඩා කොට ඇති අතර, (විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය මධ්‍යස්ථානයට අයත් අපද්‍රව්‍ය කළමණාකරන අංශයේ) එම කසළ ප්‍රසම්පාදන පටිපාටීන්ට අනුව බාහිර පාර්ශ්වයක් වෙත විකිණීමට මේ වන විට මිල ගණන් කැඳවා ඇත. ඉදිරියේදී එම මිල ගණන් ඉදිරිපත් කළ ගැනුම්කරුවන්ගෙන් සුදුසු ගැනුම්කරුවෙකු තෝරා මෙම අපද්‍රව්‍ය විකිණීමට හැකිය. ඒ තුළින් අවිධිමත්ව කසළ පරිසරය වෙත මුදා හැරීම සිදු නොවනු ඇත.<br><br>විශ්වවිද්‍යාලයේ නේවාසිකාගාර 3 ක මළ අපවහන පද්ධතීන් ක්‍රියාත්මක නොවීම පිළිබඳව විශ්වවිද්‍යාලයීය වැඩ දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණය කර එම මළ අපවහන පද්ධතීන් විශ්වවිද්‍යාල සේවකයින් සහ පුද්ගලික කම්කරුවන් යොදා ගනිමින් දැනට පිළිසකර කරමින් සිටියි. එම කටයුත්ත මඟින් ඉදිරියේ දී එම නේවාසිකාගාරවල මළ අපවහන පද්ධතීන් විධිමත්ව ක්‍රියා කිරීම හේතුවෙන් මළ අපද්‍රව්‍ය පරිසරය වෙත අවිධිමත්ව බැහැර නොවනු ඇත. |
| **2.3** | |
| **(අ)** | සියළුම අතිරික්ත මුදල් මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව ආයෝජනය කිරීමට විශ්වවිද්‍යාලය විසින් කටයුතු කර ඇත. |
| **(ආ)** | ඉදිරියේදී මෙකී ව්‍යාපෘතිය නැවත ආරම්භ කරන අවස්ථාවේදී මෙම මුදල් මාරු කිරීමට හැකි වන පරිදි මුදල් කමිටුවේ හා පාලක සභාවේ අනුමැතියට යටත්ව විශ්වවිද්‍යාලයේ අත්‍යවශ්‍යව සිදු කළ යුතු ප්‍රාග්ධන ස්වරූපයේ පුණරුත්තාපන වැය දැරීම සඳහා මෙම මුදල් භාවිතා කර ඇති අතර ඉදිරියේදී මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන විට මෙම මුදල් එකී ව්‍යාපෘතිය සඳහා මාරු කිරීමට හැකි වන නිසා මෙමඟින් මෙම ව්‍යාපෘතියට බාධාවක් නොවනු ඇත. |
| **(ඇ)** | ඉංජිනේරු පීඨය මඟින් පශ්චාත් උපාධි පාඨමාලා ලබා දීම පාලක සභා අනුමැතිය යටතේ ආරම්භ කොට ඇති අතර 2016 වසරේ සිට ආරම්භ කරනු ලැබූ පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගන්නා ලදී. තවද ඉදිරියේදී ආරම්භ කිරීමට නියමිත පාඨමාලා සඳහාද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරුණු ඇත. |
| **(ඈ)** | **ශාස්ත්‍ර පීඨය**<br><br>ශාස්ත්‍ර පීඨයේ විභාග සැලසුම් කිරීම, ප්‍රශ්න පත්‍ර පිළියෙළ කිරීම, වැඩි දියුණු කිරීම, හරිවැරදි බැලීම, ශ්‍රේණිගත කිරීම හා සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් නිශ්චිත ප්‍රමිතිගත ක්‍රමවේදයක් (Standard Operating Procedures) අනුමැතිය ලබාගැනීම සඳහා සකස් කරමින් පවතී.<br><br>**වෛද්‍ය පීඨය**<br>මේ සම්බන්ධව ක්‍රමවේදයක් පීඨය තුල පවත්වාගෙන යන අතර ඒ සඳහා පාලක සභාවේ හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන නොමැත. ඒ සඳහා දැනට කටයුතු |

කරගෙන යයි.

**ඉංජිනේරු පීඨය**

විභාග සැලසුම් කිරීම, ප්‍රශ්න පත්‍ර පිළියෙල කිරීම, ඒවා වැඩිදියුණු කිරීම, හරි වැරදි බැලීම, ශ්‍රේණිගත කිරීම සහ  සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන නිශ්චිත ක්‍රමවේදයක් සකස් කරමින් පවතී

**සම සෞඛ්‍යය විද්‍යා පීඨය**

විශ්වවිද්‍යාලය මඟින් ලබා දී ඇති නිර්ණායකයන් (Guideline) වලට අනුකූලව අදාළ දෙපාර්තමේන්තු මඟින් විභාග සැලසුම් කිරීම, ප්‍රශ්න පත්‍ර පිළියෙළ කිරීම, ඒවා වැඩිදියුණු කිරීම, හරි වැරදි බැලීම, ශ්‍රේණිගත කිරීම සහ සමාලෝචනය කිරිම (Designing, Setting, Moderating, Marking, Grading, Monitoring and Reviewing) සිදු කරන ආකාරය සම්බන්ධයෙන් සියලු දත්ත ඒ කටයුතු සඳහා සහභාගී වන ආචාර්‍යයවරුන්ගේ පීඨයේ විභාග අංශය වෙත යොමු කරනු ලබන අතර එම තොරතුරු පීඨ මණ්ඩලය වෙත යොමු කිරිමෙන් ලබා ගන්නා අනුමැතියෙන් පසු පාලක සභාව වෙත යොමු කර අනුමැතිය ලබා ගැනීම විභාග කටයුතු ආරම්භ කිරීමට පෙර සිදු කරනු ලබයි.

පිළිතුරු පත්‍ර ඇගයීම අනුමැතිය ලැබූ ආචාර්‍ය මණ්ඩලය විසින් සිදු කරනු ලබන අතර දෙපාර්තමේන්තු මට්ටමින් පවත්වනු ලබන Pre Results Board මඟින් ශ්‍රේණිගත කිරීම සිදු කර විභාග අංශය වෙත යොමු කරනු ලබයි.  පසුව මෙම ප්‍රතිඵල පීඨය විසින් කලින් නියමු කර ගනු ලබන Results Board මඟින් තව දුරටත් ශ්‍රේණිගත කිරීම සහ සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් විමසා බලනු ලබයි. Results Board සඳහා පීඨයේ විභාග කටයුතු සඳහා සහභාගි වන සියලුම ආචාර්‍යයවරුන් සහභාගී විම සිදු වේ.

**කෘෂි  විද්‍යා පීඨය**

විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ උපාධි පාඨමාලා සඳහා සෑම සාමාසිකයකම ඉදිරිපත් කරනු ලබන විෂයන් වෙනුවෙන් සිදු කරන ලබන විභාග කටයුතු (ප්‍රශ්න පත්‍ර සැකසීම,ඒවා තත්වකරණය කිරීම සහ ඒවා නිවැරදිදැයි බැලීම මෙන්ම ශ්‍රේණිගත කිරීම)සිදුකරනු ලබන්නේ පාලක සභාවේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය අනුව සිදුකරන ක්‍රියාපිළිවෙලක් මඟිනි. මෙහිදී පීඨයේ විශේෂ අවධානය යොමුකර ඇත්තේ පීඨයට සිටින ප්‍රවීන ආචාර්ය මණ්ඩලය මඟින් පිළිතුරුපත් පරීක්ෂා කිරීම සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍ර ලේඛන අනුව ප්‍රතිඵල නිකුත් කරන්නේ සිසුන්ගේ ගුණාත්මය පවත්වා ගැනීමත් සමඟින් සිසුන් වසර 4 ක් ඇතුලත උපාධිධාරීන් බවට පත්කිරීමයි. එහෙත් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි උපාධි අධ්‍යයන පාඨමාලා සමාලෝචනය සම්බන්ධයෙන් වන අත්පොතෙහි 7 වන ක්‍රමවේදය අනුව දෙවනිවර හරිවැරදි බැලීම සහ බාහිර ආචාර්ය මණ්ඩලය මඟින් හරිවැරදි බැලීම සඳහා කල්ගත නොවන ක්‍රමවේදයක් සකසා ගැනීමට පීඨය කටයුතු සලසමින් සිටින අතර ඉදිරියේදී හඳුන්වාදීමට බලාපොරොත්තු වෙමි. මීට මුල් පියවර ලෙස පීඨය දැනටමත් මුළු විභාග ක්‍රියාවලියම සහ ප්‍රතිඵල නිකුත් කිරිම දක්වා සියලු ක්‍රියා ඇතුළත් අත්පොතක් (manual) පීඨ මණ්ඩලයට ඉදිරිපත්කර අනුමත කරගෙන ඇත. (2019 ජූලි මස 17 වන දින පැවති 279 වන පීඨ මණ්ඩල රැස්වීමේදී අනුමත වී ඇත)

(ඉ) **වෛද්‍ය පීඨය**

වෛද්‍ය පීඨයේ ඉගැන්වීමේ කටයුතු අංශ 3 ක් යටතේ පවත්වනු ලබයි. එය දේශන ලෙස, සායනික පුහුණුව (Clinical Training) ලෙස සහ ප්‍රායෝගික පුහුණුව (Practical Training) ලෙස පවත්වා ගෙන යයි.

සායනික දෙපාර්තමේන්තුවල (වෛද්‍ය දෙපාර්තමේන්තුව, ළමා රෝග දෙපාර්තමේන්තුව, ප්‍රසව හා නාරිවේද දෙපාර්මේන්තුව, ශල්‍ය වෛද්‍ය දෙපාර්තමේන්තුව, මනෝ වෛද්‍ය දෙපාර්තමේන්තුව) අධ්‍යයන කාර්යය මණ්ඩලය  ජ්‍යෙෂ්ඨ මහාචාර්යය/ මහාචාර්යයවරු ඇතුළුව දේශන සායනික පුහුණුව සමඟ On call duty සතියකට එක් දිනක් අනිවාර්යයෙන්ම සිදු කරයි. අනිකුත් දින වලදී උදේ සිට සායනවල සේවය කරයි.

අනිකුත් දෙපාර්තමේන්තු වල (න්‍යෂ්ඨික වෛද්‍ය අංශය, ප්‍රජා වෛද්‍ය දෙපාර්තමේන්තුව, ක්ෂුද්‍ර ජීව විද්‍යා දෙපාර්තමේන්තුව, පරපෝෂවේද දෙපාර්තමේන්තුව, නිර්වින්දනවේද දෙපාර්තමේන්තුව, ජෛව

රසායන දෙපාර්තමේන්තුව, භෞතවේද දෙපාර්තමේන්තුව, කායවාවච්ඡේද දෙපාර්තමේන්තුව, අධිකරණ වෛද්‍ය දෙපාර්තමේන්තුව, භිෂග්වේද දෙපාර්තමේන්තුව, ව්‍යාධිවේද දෙපාර්තමේන්තුව, විකිරණවේද දෙපාර්තමේන්තුව) දේශන සහ ප්‍රායෝගික පුහුණුව පවත්වයි.

**ඉංජිනේරු පීඨය**

අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් ඉටු කරනු ලබන සියළු කාර්යයන් ඇතුලත් කරමින් වැඩ ගණනය කිරීමේ ක්‍රමවේදයක් (work calculator) සකස් කිරීම සඳහා පීඨාධිපති කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුවේ කටයුතු ක්‍රියාකාරී ලෙස සිදු වෙමින් පවතී. ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබනු ඇත.

**2.4**

**(අ)** විගණනය විසින් පෙන්වා දී ඇති විවිධ පුද්ගලයන් හා ආයතන 44 න් ලැබිය යුතු රු. 1,517.369 න් වසර 01 සිට වසර 05 දක්වා කාලයකදී අයනොවී පවතින ආයතන 42 කින් ලැබිය යුතු ජල ගාස්තු හා විදුලිය ගාස්තු රු. 798,477 න් රු. 74,545 ක මුදලක් මේ වන විට අය කරගෙන ඇත. තවදුරටත් ගෙවිය යුතු එකී ජල හා විදුලිය ගාස්තු වලින් රු. 682,402ක් විශ්වවිද්‍යාලය වෙත විවිධ ඉදිකිරීම් සඳහා සම්බන්ධ වූ කොන්ත්‍රාත්කරුවන් වෙත සැපයු ජල හා විදුලිය වෙනුවෙන් ලැබිය යුතු ගාස්තු වන අතර ඔවුන් වෙත ගෙවිය යුතු ආසන්නතම බිල්පතකින් අඩුකර ගැනීමට දැනටමත් මූලධන අංශය මඟින් කටයුතු කරගෙන යනු ඇත. අනෙකුත් ලැබිය යුතු ජල හා විදුලිය ගාස්තු ඉදිරියේ දී අයකර ගැනීමට ආදායම් අංශය මඟින් කටයුතු කරනු ඇත. විගණනය විසින් පෙන්වා දී ඇති Madhu freighters ආයතනයෙන් වසර 14කට අධික කාලයක් අයවියයුතුයැයි පවතින රු. 318,892.15 ක මුදලට අදාලව පහත ගැළපීම් සිදු කළ පසු තවදුරටත් ලැබිය යුතු මුදල රු. 145,000 ක් වේ.

| | රු. | රු. |
|---|---|---|
| 2018.12.31 දිනට ***Madhu freighters*** ණයගැති ගිණුමේ ශේෂය | | 318,892.15 |
| **එකතු කළා** | | |
| ලැබිය යුතු ශේෂය අඩුවෙන් ගණනය කිරීම | | |
| (රු.9,120.11 - රු. 219.22) | | 8,900.89 |
| | | 327,793.04 |
| **අඩු කළා** | | |
| සමාගම විසින් ඉදිරිපත් නොකළ බිල්පත් වල වටිනාකම | 132,793.04 | |
| ඇප තැන්පතුව හිලව් කිරීම | 50,000.00 | |
| | | (182,793.04) |
| ***Madhu freighters*** ආයතනයෙන් තවදුරටත් ලැබිය යුතු මුදල | | **145,000.00** |

ඒ අනුව ***Madhu freighters*** ආයතනයෙන් තවදුරටත් විශ්වවිද්‍යාලයට ලැබිය යුතු රු. 145,000 ක මුදල අය කරගැනිම සඳහා සමථ මණ්ඩලයට යොමු කල ද, අදාල ආයතනය ඒ සඳහා ඉදිරිපත් නොවූ බැවින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලදි. කෙසේ වෙතත් අප සතුව ඇති ලිපිනයට සිතාසි භාරගැනීමට පුද්ගලයෙකු නොවූ හෙයින් අධිකරණයේ නඩුව ඉදිරියට ගෙනයාමේ හැකියාවක් නොපවතින බව දන්වා සිටිමි.

එබැවින් මෙම රු. 145,000 ක මුදල, මුදල් රෙගුලාසි ප්‍රකාරව ගිණුම් වලින් කපාහැරීමට කටයුතු කිරීමට සැප්තැම්බර් මස පැවැත්වෙන මුදල් කමිටුවට වාර්ථා කිරිමට කටයුතු කරනු ලැබේ.

2007 වසරේ සිට ඉදිරියට ගෙනා රු.400,000.00 ක ශේෂයක් ලෙස සනාථන මන්දිරයේ බිම් මහලේ දී ගිනි ගත් වෑන් රථය වෙනුවෙන් ලැබිය යුතු රක්ෂණ වන්දියක් ලෙස සඳහන් වේ. අදාල මුදල් රක්ෂණ සමාගමෙන් අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව කාරුණිකව දන්වමි.

**(ආ)** 2018-12-31 දිනට රු.7,056,492/- ක් වූ ලැබිය යුතු ශාලා ගාස්තු හා දඩ මුදල් වලින් 2019-01-01 සිට 2019-06-17 දින දක්වා රු.1,470,895/- ක මුදලක් මෙම වසරේ අධ්‍යයන පාඨමාලා සම්පූර්ණ කර අදාළ

සහතික ලබා ගත් සිසුන්ගෙන් ලැබී ඇත.

ඉතිරි ලැබිය යුතු ශාලා ගාස්තු හා දඩ මුදල් වන රු.5,585,597 න් 1980-2008 ට අදාළ ලැබිය යුතු ශාලා ගාස්තු හා දඩ මුදල් වන රු. 2,434,179/- අය කර ගැනීම සම්බන්ධයෙන් පත් කරන ලද ත්‍රිපුද්ගල කමිටුවේ උපදෙස් පරිදි අදාළ පීඨ වලින් යොමු කරන ලද තොරතුරු තහවුරු කර ගැනීමේ කටයුතු අවසන් අදියරෙහි පවතින අතර එම කමිටුවේ නිර්දේශ මත ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ.

තව දුරටත් ඉතිරි වූ ලැබිය යුතු මුදල් වන රු.3,151,418 න් වර්ෂ 2009 සිට 2013 දක්වා කාලසීමාව තුළ විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වූ සිසුන්ගෙන් අයවිය යුතු ශාලා ගාස්තු හා දඩ මුදල් වන රු.1,671,858/- අය කර ගැනීම සඳහා අදාළ සිසුන්ව දැනුවත් කර ඇත.

තවද විශ්වවිද්‍යාලය තුල දැනට අධ්‍යයන කටයුතු වල නිරත නේවාසිකාගාර පහසුකම් හිමි සිසුන්ගෙන් අයවිය යුතු ශාලා ගාස්තු හා දඩ මුදල් ප්‍රමාණය රු. 1,479,560/- ක් වන අතර එය අය කර ගැනීම, පවතින ක්‍රමවේදය යටතේ ඔවුන් විසින් උපාධි පාඨමාලාව සම්පූර්ණ කර අදාළ සහතික පත් ලබා ගැනීමේ දී සිදුකරනු ලබයි.

සිසුන්ගෙන් අයවිය යුතු මුදලක් වේ නම්, එය අයකර ගැනීමකින් තොරව කිසිඳු සහතික පතක් සිසුන් වෙත නිකුත් කරනු නොලැබේ.

**(ඇ)** ඉදිරියේ දී විදේශ ශිෂ්‍ය ආදායමින් මෙම මුදල පීඨය වෙත පියවා දැමීමට කටයුතු කරනු ඇත,

**(ඈ)** විගණනය විසින් පෙන්වා දී ඇති සේවකයන් හා සම්බන්ධයෙන් ණය වාරික අය නොවීමට හේතු පහත පරිදි වන අතර එකී ණය වාරික හැකි ඉක්මණින් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම පහත පරිදි සිදු කෙරේ.

| ණය වර්ගය | පෞද්ගලික ලිපිගොනු අංකය | නම | වටිනාකම | විස්තරය |
|---|---|---|---|---|
| මෝටර් බයිසිකල් | P03899 | එම් කුමාරසිංහ | 35,822.00 | 2017.09.28 දින මිය ගොස් ඇත. අර්ථසාධක අරමුදල් නිදහස් කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම වෙත යවා ඇත. |
| | P07117 | එච් ජී ටී පියසේන | 4,130.00 | 2017.03.17 දින මිය ගොස් ඇත. අර්ථසාධක අරමුදල් නිදහස් කර නැත. අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී අය කරණු ඇත. |
| | P08209 | එම් ජී එස් නිස්සංක | 794.00 | 2017.11.19 දින වැඩ තහනම් කර ඇත. අර්ථසාධක අරමුදල් නිදහස් කර නැත. අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී අය කරණු ඇත. |
| | P14544 | ආර් එස් ප්‍රේමතිලක | 2,462.00 | 2017.11.10 දින සේවයෙන් ඉල්ලා අස්වී ඇත. අර්ථසාධක අරමුදල් නිදහස් කර නැත. අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී අය කරණු ඇත. |
| | P16570 | එම් ජී පී පී කුමාරි | 6,642.00 | ණය පවරා ගැනීමට ඉල්ලීම් කර යවා ඇත. |
| වාහන ණය | P14197 | එන් කේ සූරිය බණ්ඩාර | 92,000.00 | 2015.11.28 දින වැඩ තහනම් කර ඇත. අර්ථසාධක අරමුදල් නිදහස් කර නැත. අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී අය කරණු ඇත. |
| සේවක ණය | P14197 | එන් කේ සූරිය බණ්ඩාර | 7,480.00 | 2015.11.28 දින වැඩ තහනම් කර ඇත. අර්ථසාධක අරමුදල් නිදහස් කර නැත. අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී අය කරණු ඇත. |
| පරිගණක ණය | P01761 | ඩබ් ජී ආරියදාස | 7,500.00 | 2017.07.25 දින සේවයෙන් විශ්‍රාම ගොස් ඇත. අර්ථසාධක අරමුදල් |

| | | | |
|---|---|---|---|
| | | | නිදහස් කර ඇත. අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී අය කරණු ඇත. |
| P06974 | ඊ චන්ද්‍රාවතී | 7,000.00 | 2017.02.18 දින සේවයෙන් විශ්‍රාම ගොස් ඇත. අර්ථසාධක අරමුදල් නිදහස් කර නැත. අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී අය කරණු ඇත. |
| P07117 | එච් ජී ටී පියසේන | 17,000.00 | 2017.03.17 දින මිය ගොස් ඇත. අර්ථසාධක අරමුදල් නිදහස් කර නැත. අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී අය කරණු ඇත. |
| P08209 | එම් ජී එස් නිස්සංක | 24,000.00 | 2017.11.19 දින වැඩ තහනම් කර ඇත. අර්ථසාධක අරමුදල් නිදහස් කර නැත. අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී අය කරණු ඇත. |
| P09389 | පී ඩී සුමනවීර | 6,000.00 | ණය අයකිරීම් 2017/2018 වර්ෂ වල නොකඩවා කෙරී ඇත. |
| P09571 | එම් කේ ඩී පී වීරකෝන් | 30,000.00 | ඇය පරිගණක ණය ලබාගෙන ඇත්තේ 2007 වර්ෂයේදීය. එම ණය වාරික අයකර ගැනීමෙන් පසු දෙවනුව පරිගණක ණය ලබාගෙන ඇත්තේ 2018 දෙසැම්බර් මසදීය. ඒ අනුව 2019 ජනවාරි මස සිට ණය වාරික අයකර ගැනීමට කටයුතු කර ඇත. |
| P14197 | එන් කේ සූරිය බණ්ඩාර | 7,000.00 | 2015.11.28 දින වැඩ තහනම් කර ඇත. අර්ථසාධක අරමුදල් නිදහස් කර නැත. අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී අය කරණු ඇත. |
| P16570 | එම් ජී පී පී කුමාරි | 4,000.00 | ණය පවරා ගැනීමට ඉල්ලීම් කර යවා ඇත. |

**(ඉ)** විගණන ජේදයේ දක්වා ඇති ගිවිසුම් කඩකල ආචාර්යවරුන් 110 දෙනාගෙන් ආචාර්යවරු 73ක් ඉතා පැරණි (වසර 25කට අධික කාලයක්) ගිවිසුම් කඩකල ආචාර්යවරුන් වන අතර ඔවුන්ගේ බැඳුම්කර වටිනාකම් අයකර ගැනීම සම්බන්ධයෙන් ඇති හැකියාව සොයා බැලීම සඳහා පත් කරන ලද පාලක සභා අනුකමිටුවේ නිර්දේශය මත අවසන් වරට එම ආචාර්යවරුන්ගේ ලිපිනයන් පවතීද සොයා බැලීමට එක් එක් පීඨයන් වෙත එම ආචාර්යවරුන්ගේ නම් ලැයිස්තු යවන ලදි . ඒ අනුව අදාල පීඨයේ ප්‍රතිචාර මත අනුකමිටුවේ නිර්දේශ මත ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

විගණන ජේදයේ සඳහන් බැඳුම්කර වටිනාකම් අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට ප්‍රමාණවත් වන ආචාර්යවරු 18 දෙනාගෙන් ආචාර්යවරු 12 දෙනෙකුගේ ලිපිගොනු අර්ථසාධක අරමුදල් අයකර ගැනීම සඳහා දැනටමත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කොට ඇත. ඉතිරි ආචාර්යවරුන් 06 දෙනෙකුට අදාළ ලිපිගොනු වල අඩුපාඩු පවතින බැවින් ඒවා නිවැරදි කිරීමට කටයුතු කරමින් සිටින අතර ඒවා නිවැරදි කිරීමෙන් පසුව විශ්වවිද්‍යාල කොමිෂන් සභාව වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

විගණන ජේදයේ සඳහන් ඉතිරි ආචාර්යවරු 19 දෙනාගෙන් ආචාර්යවරු 8 දෙනෙකුගේ බැඳුම්කර වටිනාකම් අයකර ගැනීමේ කටයුතු අධ්‍යයන ආයතන අංශය විසින් සිදු කරනු ලැබේ. තවත් ආචාර්යවරු 4 දෙනෙකුගේ බැඳුම්කර වටිනාකම් අයකර ගැනීම සඳහා අධිකරණයේ නඩු පවරා ඇත. ආචාර්යවරු දෙදෙනෙකුගේ ලිපිගොනු නීති ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපතිතුමා වෙත යොමු කොට ඇත. ඉතිරි ආචාර්යවරුන් පස්දෙනාගේ වර්තමාන ලිපිනයන් නොමැති වීම්, ගෙවීම පැහැරහැරීම හා ගිවිසුම් කල් ඉකුත්වීම වැනි හේතුන් මත නීති ක්‍රියාමාර්ග ගැනීමට හෝ බැඳුම්කර වටිනාකම් අයකර ගැනීමට නොහැකි තත්වයක් පවතින බැවින් සුදුසු තීරණයක් සඳහා මීලඟ බැඳුම්කර කමිටුව වෙත වාර්තා කිරීමට නියමිතය.

**වර්තමාන තත්ත්වය**

**ලැබීමට ඇති බැඳුම්කර වටිනාකම්**

2018 දෙසැම්බර් 31 වන දිනට ගිවිසුම් කඩකල ආචාර්යවරුන් 124 ක් වූ අතර, 2019 වර්ෂය තුළ තවත් දෙදෙනෙක් බැඳුම්කර කඩකරන ලදී. එම අයවලුන්ගෙන් 2019 මාර්තු 31 දින වන විට ගිවිසුම් කඩකල ආචාර්යවරු 06 දෙනෙකු බැඳුම්කර වටිනාකම් සම්පූර්ණයෙන් ගෙවා නිම කර ඇත. ඉතිරි ආචාර්යවරු 120 දෙනෙකුගෙන් අයකර ගැනීමට ඇති මුල් බැඳුම්කර වටිනාකම සවිස්තරාත්මකව පහතින් දක්වා ඇත.

| | අයකර ගන්නා ක්‍රමවේදය | ආචාර්යවරුන්ගේ සංඛ්‍යාව | 2019.03.31 දිනට අයකර ගැනීමට ඇති ශේෂය (රු:) |
|---|---|---|---|
| **ක්‍රියාකාරී ගිවිසුම් කඩකල ආචාර්යවරුන්** | අර්ථසාධක අරමුදල් ප්‍රමාණවත් | 18 | 16,034,247.26 |
| | වාරික වශයෙන් ගෙවන | 8 | 8,274,188.72 |
| | නීති ක්‍රියාමාර්ග | 8 | 23,540,678.18 |
| | බැඳුම්කර වටිනාකම් නිරවුල් කරගැනීමට පවතින | 2 | 9,323,500.28 |
| | තීරණයන් සඳහා බැඳුම්කර කමිටුව වෙත යොමු කිරීමට පවතින | 4 | 3,522,223.68 |
| | අධ්‍යයන ආයතන අංශය මගින් කටයුතු කරන ලිපිගොනු | 8 | 65,895,705.05 |
| | | 72 | 33,236,988.85 |
| **පැරණි ගිවිසුම් කඩකල ආචාර්යවරුන්** | **මුළු එකතුව** | 120 | 159,827,532.02 |

**බැඳුම්කර අයකිරීම්**

2018 වර්ෂය තුල රුපියල් 18,825,146.06 ක් බැඳුම්කර කඩකල අයවලුන්ගෙන් විශ්වවිද්‍යාලය වෙත අයකර ගෙන ඇත.

**(උ)** අදාල අමාත්‍යාංශ සමඟ සාකච්ඡා කොට ගිණුම්වල අවශ්‍ය ගැලපීම් කරණු ලැබේ. එසේම මේ වන විට මේ පිළිබඳව සෞඛ්‍ය හා පෝෂණ අමාත්‍යාංශ ලේඛම් වෙත දන්වා ඇත.

**(ඌ)** මෙලෙස අධ්‍යයන කටයුතු ආරම්භ කළ පසු විටින් විට ශිෂ්‍යයන් ඇතුලත් කර ගැනීමට සිදුවීමෙන් එම ශිෂ්‍යයන්ට නිසි දැනුමක් නොලැබීයාම ප්‍රායෝගික පුහුණුවීම් වලට බාධාවීම, පැමිණීම 80% නොමැතිවීම, නායකත්ව පුහුණුව වැඩ සටහන නොමැතිවීම, සිසුනට ද්‍රවිඩ සහ සිංහල භාෂා පාඨමාලාව අතපසුවීම වැනි ගැටළුවලට මුහුණ පෑමට සිදුවේ.
කෘෂිකර්ම පීඨයට ඇතුලත් කර ගන්නා සිසුන් ප්‍රථම සමාසිකයේදී මහඉලුප්පල්ලම විශ්වවිද්‍යාල ඒකකය වෙත යොමු කරනු ලැබේ. සමාසික ක්‍රමයේදී අතර මඟින් ශිෂ්‍යන් ලියාපදිංචිකර ගැනීමෙන් හා බඳවා ගැනීමෙන් ශිෂ්‍ය අධ්‍යයන කටයුතු මගහැරීම පරිපාලන හා ඉගැන්වීම් සඳහා බාධා ඇතිවීම හා ශිෂ්‍යයන්ගේ මානසික ගැටළුද ඇතිවේ.
මෙය විශ්වවිද්‍යාල මට්ටමින් විසඳිය නොහැකි කරුණක් වන අතර මෙය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් විසඳියයුතු ජාතික මට්ටමේ කරුණක් වේ.

**(එ)** ස්ථාන මාරු වීම් ලද පැමිණි නිලධාරීන්ගේ ණය මුදල් පවාරණය නොකිරීම (අනෙකුත් විශ්වවිද්‍යාල වෙත ගෙවීම සඳහා භාණ්ඩාගාරයේ ප්‍රමාණවත් මුදල් නොමැති වීම) නිසා මෙම තත්වය පැන නැගී ඇති අතර අය කර ගැනීමට නොහැකි වූ ණය වාරික මුදල් ඉදිරියේ දී ඔවුන් විසින් ගෙවිය යුතු ණය

| | |
|---|---|
| | වාරික ප්‍රමාණය මත සමානුපාතිකව අය කර ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කර ඇත. |
| (ඒ) | විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍රලේඛ 70 පදනම් කර ගනිමින් විශ්වවිද්‍යාලය කටයුතු කර ඇත. |
| (ඓ) | කෘෂිකර්ම ක්ෂේත්‍රය සඳහා පවතින ඉල්ලුමට සාපේක්ෂව ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිවීමට ප්‍රමාණවත් පරිදි මුදල් ප්‍රතිපාදන පැවතීම, නේවාසිකාගාර පහසුකම් පැවතීම, අනෙකුත් මානව හා භෞතික සම්පත් පැවතීමද අවශ්‍යවේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මේ පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් සකසා භෞතික හා මානව සම්පත් වලට සරිලන පරිදි ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කල යුතුවේ. මේ පිළිබඳව සාකච්ඡා දැනට කෘෂිකර්මය සඳහා වන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ස්ථාවර කමිටුවලද දීර්ඝ වශයෙන් සාකච්ඡා වලට බඳුන්වෙමින් පවතී. |
| (ඔ) | විශ්වවිද්‍යාලය මඟින් ආරම්භ කරනු ලබන ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා සකස් කරනු ලබන ගිවිසුමෙහි කොන්ත්‍රාත් දත්ත "(*Contract Data)* යටතෙ අංක 1.1 අනුව අදාල ප්‍රාග්ධන ව්‍යාපෘතියේ ඉංජිනේරුවරයා වශයෙන් ව්‍යාපෘති කළමණාකරු ඇතුලත් කර ඇති ඒ අනුව අදාල ප්‍රාග්ධන ව්‍යාපෘතියේ ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත් කාර්යයට අදාල සියළුම වැඩ අධීක්ෂණය, ගෙවීම් නිර්දේශ කිරීම, ප්‍රමාණ විචලනයයන් හා අතිරේක වැඩ සඳහා නිර්දේශ ලබා දීම, කොන්ත්‍රාත් කාලසීමාව දීර්ඝ කිරීම ආදී සියළුම කටයුතු සඳහා ආයතන ප්‍රධානියාගේ අනුමැතියට ඉදිරිපත් කිරීම පිණිස ව්‍යාපෘති කළමණාකරු නිර්දේශ ලබාදිය යුතු වේ.<br><br>ඒ අනුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වර්තමානයේ ව්‍යාපෘති කළමණාකරු වශයෙන් පත්කර කර ඇති වරලත් ඉංජිනේරුවරයාගේ නිරීක්ෂණ හා නිර්දේශ මත මූලධන අංශය මඟින් ප්‍රාග්ධන ව්‍යාපෘතිවලට අදාල අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරනු ලැබේ.<br><br>තවද, කොන්ත්‍රාත් කාර්යය ප්‍රදානය කිරීමෙන් පසු එම කාර්යය වැඩ ඉංජිනේරු හෝ ව්‍යාපෘති කළමණාකරු විසින් අධීක්ෂණය කරනු ලබයි. ඒ අනුව වැඩ ඉංජිනේරු විසින් අධීක්ෂණය කරනු ලබන කාර්යයන් වැඩ ඉංජිනේරු නිර්දේශ කරනු ලබන අතර ව්‍යාපෘති කළමණාකරු විසින් අධීක්ෂණය කරනු ලබන කාර්යයන් ව්‍යාපෘති කළමණාකරු විසින් නිර්දේශ කරනු ලබයි.<br><br>එසේම වැඩ ඉංජිනේරුවරයා විසින් අධීක්ෂණය කරනු ලබන කාර්යයන්වල වැඩ සහතික කිරීම වැඩ අධිකාරී හෝ වැඩ සුපරීක්ෂකවරුන් විසින් සිදුකරනු ලබන අතර ව්‍යාපෘති කළමණාකරු විසින් අධීක්ෂණය කරනු ලබන කාර්යයන්වල වැඩ සහතික කිරීම ව්‍යාපෘති ඉංජිනේරු විසින් සිදු කරනු ලබයි.<br><br>ඒ අනුව සංචලන අත්තිකාරම් හෝ අන්තර් බිල්පත් ගෙවීමේදී ඊට අදාල සහතික කිරීම් හා නිර්දේශ කිරීම් සිදුවනු ලබන්නේ ඉහත සඳහන් සංයුතිය සහ ව්‍යුහය ඇතුළත වේ. |
| (ඕ) | 2018 දෙසැම්බර් මස 31 වනදිනට අනුමත තනතුරු පුරප්පාඩු 296ක් පැවති බව නිවැරදි වේ. ඒ අනුව "දරන්නාට පමණක් පුද්ගලිකවන සේ " අනුමත කර ඇති තනතුරු කාණ්ඩ 10ක ප්‍රමාණයක් එම පුද්ගලයා විශ්‍රාම ගැනීමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් එම තනතුර නැවත පිරවිය නොහැකි අහෝසිවූ තනතුරක් ලෙස සැළකිය යුතුය. ඒ අනුව එසේ පුරප්පාඩු වූ තනතුරු 66ක ප්‍රමාණයක් 2017 අනුමත කාර්ය මණ්ඩල තනතුරු ලේඛණයේ පවතී. තවද අලුතින් අනුමත වූ තනතුරු 14ක් සඳහා බඳවා ගැනීමේ පරිපාටි ලැබී නොමැති අතර ඒවා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇති අතර ඒවා ලැබෙනතෙක් බඳවා ගැනීම් ඇණහිටුවා ඇත. එසේම තනතුරු 04ක ප්‍රමාණයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් බඳවා ගෙන මෙම විශ්වවිද්‍යාලයට අනුයුක්ත කිරීමට නියමිත වේ. තවත් තනතුරු පුරප්පාඩු 36ක නාමලේඛණ අමාත්‍යාංශය මඟින් ලැබීමට නියමිත කාලයක් බඳවා ගැනීම් ඇණහිට ඇත.<br><br>මේ අනුව ඉහත තත්ව යටතේ අත්‍යාවශ්‍ය තනතුරු සඳහා, එම පුරප්පාඩු වූ තනතුරුවල ප්‍රතිපාදනවලින් තාවකාලික ලෙෂ කොන්තාත්/පැවරුම් පදනම මත විශ්වවිද්‍යාලයේ අත්‍යාවශ්‍ය සේවා පවත්වා ගැනීමට පුද්ගලයින් බඳවා ගෙන ඇති බැවින් පුරප්පාඩු තනතුරු සඳහාද ප්‍රතිපාදන සලසාගෙන ඇති අතර අදාල බඳවා ගැනීම් සම්බන්ධව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙතින් නිරන්තර විමසීම් කරමින් පවතී. |
| (ඖ) | විගණනය පෙන්වා දී ඇති රු. 22,500.00 ක මුදල එකී සේවකයන්ගෙන් නැවත අය කර ගැනීමට කටයුතු කරණු ඇත. |

| (ක) | විගණන ඡේදයේ ඉදිරිපත් කර ඇති රු: 59,704,104ක මුදල් උපයෝජනයට නොගත් ව්‍යාපෘති 14 හි ලැයිස්තුව අනුව තොරතුරු පහත ඉදිරිපත් කර ඇත. |
|---|---|

| | | |
|---|---|---|
| 1 | Extension to Faculty of Arts | මෙම නමින් ව්‍යාපෘතියක් ශාස්ත්‍ර පීඨයේ ක්‍රියාත්මක නොවේ, නමුත් Extension to the Existing Transformer House, Faculty of Arts නමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන අතර එහි අවසන් බිල්පත සහ රැඳවුම් මුදල ගෙවීමට ඇති කොන්ත්‍රාත් වටිනාකම රු: 927,470.15 වන අතර රු: 628,875.00ක බිල්පත් 03 ක් ගෙවා ඇත. |
| 2 | Building for Department of Management Studies, Faculty of Arts | මෙම ව්‍යාපෘතිය 2016. 05. 15 දින අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇති අතර 2019. 04. 10 දින වන විට මිලියන 10 ක අවසන් බිල්පත සහ රැඳවුම් මුදල් නිදහස් කර ඇත. |
| 3 | Accessibility Facilities for Disable | මෙම නමින් ව්‍යාපෘතියක් හඳුනාගත නොහැක. |
| 4 | Proposed Geography Building, Faculty of Arts | මේ වන විට මෙම ව්‍යාපෘතිය සඳහා ටෙන්ඩර් කැඳවා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයට යොමු කර ඇත. |
| 5 | Expansion to the Engineering Building | මෙම නමින් ව්‍යාපෘතියක් ඉංජිනේරු පීඨයේ ක්‍රියාත්මක නොවේ. නමුත් Extension to the Existing Transformer House, Faculty of Engineering නමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වූ අතර 2019.06.12 දින අවසන් බිල්පත ගෙවීම සඳහා මූල්‍යාධිකාරී වෙත ඉදිරිපත් කර ඇත. |
| 6 | Design & Construction of Chemical Engineering Building | මෙම ව්‍යාපෘතිය 2015.07.10 දින අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇති අතර අවසන් බිල්පත විගණන නිර්දේශ සඳහා අභ්‍යන්තර විගණන අංශය වෙත ඉදිරිපත් කර ඇත. අඩුපාඩුකම් ඇති බවද දන්වා ඇත. අවසන් බිල්පත සඳහා මිලියන 3.54 ක් සහ රැඳවුම් මුදල් රු: මිලියන 3.9 නිදහස් කිරීමට ඇත |
| 7 | Balance Work of the Drawing Office II (DO II), Faculty of Engineering | මෙම ව්‍යාපෘතියේ වැඩ අවසන් කර ඇති නමුත් අවසන් බිල්පත ඉදිරිපත් කර නොමැත. කොන්ත්‍රාත් වටිනාකම රු: 13,454,325.28 වන අතර රු: 11,341,055.58 ක බිල්පත් 03 ක් ගෙවා ඇත. |
| 8 | Water Supply System for Marcus Fernando Hall | මෙම ව්‍යාපෘතිය 2014. 03. 30 දින අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇති අතර අවසන් බිල්පත විගණන නිර්දේශ සඳහා අභ්‍යන්තර විගණන අංශය වෙත ඉදිරිපත් කර ඇත. අඩුපාඩුකම් ඇති බවද දන්වා ඇත. අවසන් බිල්පත සඳහා මිලියන 1.5 නිදහස් කිරීමට ඇත. |
| 9 | Design & Consultancy of Postgraduate School of Medicine | මුළු කොන්ත්‍රාත් වටිනාකම ආසන්න වශයෙන් බිලියන 02 ක් වූ වෛද්‍ය පීඨයේ පශ්චාත් වෛද්‍ය විද්‍යා පාසල ඉදිකිරීම ව්‍යාපෘතියේ උපදේශන ආයතනය සඳහා කොන්ත්‍රාත් වටිනාකමින් 2.65% වූ ප්‍රතිශතයක් ගෙවීම සඳහා ප්‍රදානය කොට ඇති අතර එම උපදේශන සේවා 07 න් 05 ක් සඳහා සඳහා බිල් පත් 04 ක් මගින් රු: 39,703,081.96 *(with Nbt + Vat)* ක් පමණක් ගෙවා ඇත. |
| 10 | Extension to Animal House, Faculty of Science | මෙම කාර්යය අවසන් කර 2014. 07. 02 දින රැඳවුම් මුදල්ද නිදහස් කර ඇත. |
| 11 | Vet. Teaching Hospital Complex – Stage II | මෙම නමින් ව්‍යාපෘතියක් හඳුනාගත නොහැක. |

| | | | |
|---|---|---|---|
| | 12 | Construction of Lecturer Theater for Faculty of dental Science | මෙම ව්‍යාපෘතිය 2014. 06. 10 දින අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දී ඇති අතර 2014. 10. 29 දින ගෙවා අවසන් කර ඇත. මෙතෙක් රු: 398,339.20 ක රඳවුම් මුදල් නිදහස් කර නොමැත. |
| | 13 | Knowledge Enhancement & Institutional Development | මෙම නමින් ව්‍යාපෘතියක් හඳුනාගත නොහැක. |
| | 14 | Development of Student Skills | මෙම නමින් ව්‍යාපෘතියක් හඳුනාගත නොහැක. |
| (ඛ) | ශිෂ්‍ය ප්‍රායෝගික පුහුණුව සහ වාහන අළුත්වැඩියාව සඳහා ඉංජිනේරු පීඨයේ ස්ථාපිත කර තිබූ වාහන නඩත්තු ඒකකය 2017 වර්ෂයේදි එහි කටයුතු නවතා දැමීම හා එය නැවත ස්ථාපිත නොකිරීම හේතුවෙන් ඉංජිනේරු පීඨ සිසුන්ගේ ප්‍රායෝගික පුහුණුවීම් කටයුතුවලට බාධාවක් වී නොමැති බව එම දෙපාර්තමේන්තුවල අංශ ප්‍රධානීන් විසින් දන්වා ඇත. | | |
| (ග) | <u>**මහකන්ද නේවාසිකාගාරය සහ ලලිත් ඇතුළත් මුදලි නේවාසිකාගාරය**</u><br><br>මහකන්ද නේවාසිකාගාරය සහ ලලිත් ඇතුළත් මුදලි නේවාසිකාගාරය පිළිවෙළින් 2016 වර්ෂයේ අවසාන භාගය සහ 2017 වර්ෂයේ මුල් වකවානුවේ අදාල කොන්ත්‍රාත් සමාගම විසින් ගොඩනැගිලිවල කටයුතු පමණක් අවසන් කර විශ්වවිද්‍යාලය වෙත භාරදුන්නද එහි යටිතල පහසුකම් කිසිවක් සම්පූර්ණ කර නොතිබීම හේතුවෙන් ගොඩනැගිලි භාරගත් දින සිට එම නේවාසිකාගාර සඳහා අවශ්‍ය මළ අපවහන පද්ධතිය සහ ආපනශාලාව සකස් කිරීමටත් අවශ්‍ය ගෘහ භාණ්ඩ සැපයීමටත් අවශ්‍ය කාර්ය මණ්ඩලය අනුයුක්ත කර ගැනීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.<br><br>මේ වනවිට අවශ්‍ය කාර්ය මණ්ඩලය අනුයුක්ත කිරීම, මළ අපවහන පද්ධතිය හා ආපනශාලාවේ වැඩ අවසන් කර ඇතත් ශාලාවට සැපයුම් කරන ලද ගෘහ භාණ්ඩ වලින් සිංගර් ශ්‍රී ලංකා සමාගම සහ විලාන් ඉන්ටර්නැෂනල් ආයතනයෙන් සැපයුම් කරන ලද ගෘහ භාණ්ඩවල අඩුපාඩු තිබූ බැවින් එම භාණ්ඩ ප්‍රතික්ශේප කරන ලදි. ප්‍රතික්ශේප කරන ලද තට්ටු ඇඳන් සහ කබඩ් මිළදී ගැනීම සඳහා මේ වනවිටත් ටෙන්ඩර් කැඳවා අවශ්‍ය කටයුතු සිදුවෙමින් පවතී. ප්‍රතික්ෂේප කරන ලද තට්ටු ඇඳන් සහ කබඩ් ලද විගස ශාලාවට සිසුන් ඇතුලත් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි.<br><br><u>**සරසවි මැදුර නේවාසිකාගාරය (ශාලා අංක 07 සහ 08)**</u><br><br>අංක 7,8 සරසවි මැදුර ශාලාව අදාල කොන්ත්‍රාත් සමාගම විසින් ගොඩනැගිලිවල කටයුතු පමණක් අවසන් කර 2018 වර්ෂයේ මුල් කාර්තුවේ විශ්වවිද්‍යාලය වෙත භාර දුන්නද එහි යටිතල පහසුකම් කිසිවක් සම්පූර්ණ කර නොතිබීම හේතුවෙන් ගොඩනැගිලි භාරගත් දින සිට එම නේවාසිකාගාර සඳහා මළ අපවහන පද්ධතිය සකස් කිරීමටත්, ආපනශාලා පහසුකම් සකස් කිරීමටත් අවශ්‍ය ගෘහ භාණ්ඩ සැපයීමටත්, අවශ්‍ය කාර්ය මණ්ඩලය ලබා ගැනීමටත් අවශ්‍ය කටයුතු කරමින් පවති. මළ අපවහන පද්ධතියේ වැඩ කටයුතු 2019-07-09 දින වන විට අවසන්වීමට නියමිත අතර අනෙකුත් සියලු යටිතල පහසුකම්වල වැඩ කටයුතු අවසන් වූ වහාම ශිෂ්‍යාවන් 800 ක් සඳහා නේවාසික පහසුකම් ලබා දීමට කටයුතු කරනු ලැබේ. | | |
| (ඝ) | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ රුපියල් මිලියන 82.2 ක ඇස්තමේන්තුව මත පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආදි විද්‍යාර්ථයිගේ භාරකාර අරමුදල් මණ්ඩලය මගින් මෙම විශ්වවිද්‍යාලය සඳහා අරමුදල් සම්මාදම් කිරීම මත ක්‍රියාත්මක කිරීමට 2012 වර්ෂයේ සැලසුම් කළ පරිදි ඉන් කොටසක් සම්මාදම් වූ ආධාර මත ක්‍රියාත්මක කර 2014.10.24 දින නිම කර තිබුණි. නමුත් සම්පූර්ණ ව්‍යාපෘතිය නිමකර නොතිබීම මත අවසන් කාර්ය සඳහා භාවිතා කිරීමට නොහැකි තත්ත්වයක පවති. කෙසේ වුවද පේරාදෙණිය විශ්වවිද්‍යාල ආදි විද්‍යාර්ථයිගේ භාරකාර අරමුදල් මණ්ඩලය මගින් සම්පාදිත ප්‍රතිපාදන මත වසර කිහිපයක් ක්‍රමානුකූලව ඉදිකිරීමට සැලසුම් කර ඇති අතර සම්පූර්ණ ව්‍යාපෘතිය අවසන් වූ පසුව අදාල කාර්ය සඳහා යොදා ගැනීමට සැලසුම් කර ඇත. | | |
| (ච) | වෛද්‍ය පීඨයේ පශ්චාත් වෛද්‍ය විද්‍යා පාසල ඉදිකිරීම ව්‍යාපෘතියේ කටයුතු කිසිදු ප්‍රමාදයකින් තොරව සිදු කරන ලෙස ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ 2014. 05. 16 දිනැති ලිපිය මගින් දන්වා ඇත. ඒ අනුව නිසි ක්‍රමවේදය අනුගමනය කරමින් උපදේශන ආයතනයක් තෝරා ගෙන මෙම කොන්ත්‍රාත් වටිනාකමින් 2.65% වූ ප්‍රතිශතයක් සඳහා උපදේශන සේවා සඳහා ගෙවීම් සිදු කර ඇත. ගිවිසුම්ගත දිනය වන විට මුළු පිරිවැය ඇස්තමේන්තුව පිළිබඳව අවසන් නිගමනයකට එලඹ නොතිබූ අතර ඒ වන විටත් රජය සමග මේ පිළිබඳව සාකච්ඡා පවත්වමින් පැවති බැවින් උපදේශන සේවාව සඳහා කොන්ත්‍රාත් කාර්යය පිරිනමන ලද 2014.05.21 දිනැති ලිපියෙහිද ඒ බව සඳහන් කර ඇත.<br>ඒ අනුව පහත සඳහන් උපදේශන සේවා සැපයිය යුතු වූ අතර ඉන් අංක 01 සිට 05 දක්වා (*)ලබාදෙන | | |

| | |
|---|---|
| | ලද උපදේශන සේවා සඳහා පමණක් අන්තර් බිල්පත් 04 මගින් රු: 39,703,081.96 *(with Nbt + Vat)* ක් ගෙවා ඇත.<br><br><table><tr><th>No</th><th>ITEM</th><th></th></tr><tr><td>01</td><td>Topographical Survey</td><td>*</td></tr><tr><td>02</td><td>Soil Investigation</td><td>*</td></tr><tr><td>03</td><td>Conceptual Plan</td><td>*</td></tr><tr><td>04</td><td>Detailed Architectural Plans</td><td>*</td></tr><tr><td>05</td><td>Structural Design &Plans</td><td>*</td></tr><tr><td>06</td><td>BOQ and Specifications</td><td>-</td></tr><tr><td>07</td><td>Tender Documents</td><td>-</td></tr></table><br>ව්‍යාපෘතියට ඇතුලත් කාර්යයන් පිළිබඳ තීරණය කිරීම විවිධ අවස්ථාවලදී වෙනස් වූ අතර ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව හා අමාත්‍ය මණ්ඩල නිර්දේශ අනුව අවස්ථා කීපයකදී ව්‍යාපෘතියට අදාල යම් යම් වෙනස්කම් සිදු කල අතර අවසාන වශයෙන් 2014 දෙසැම්බර් මස 24 දින පැවති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව එවකට සිටි මුදල් හා ක්‍රම සම්පාදන ඇමතිතුමාගේ නිරීක්ෂණ වලට අවධානය යොමු කරමින් නැවත සකස් කරන ලද ව්‍යාපෘති ඇස්තමේන්තු සටහන් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දීමට කටයුතු කර ඇත.<br><br>ඒ සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය විමසමින් මේ වන විට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර ඇත. |
| **(ඍ)** | අදාල බඳවා ගැනීම් සිදු කොට ඇත්තේ ෂඃර12 රාජ්‍ය චක්‍රලේඛනය පරිදි නොවේ. කෙසේ නමුත් මේ වන විට ජාත්‍යන්තර පර්යේෂණ කාර්යාලයේ අවශ්‍යතාව පදනම් කරගෙන අවශ්‍ය සේවක සංඛ්‍යාව කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා 2017 වසරේදී ඉදිරිපත් කර ඇත. එම ඉල්ලීම පිළිබඳව කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරගෙන යනු ලබන අතර එමගින් 2019 අප්‍රේල් මස 4 වන දිනැති ලිපිය මගින් ඉල්ලා ඇති තොරතුරු එම ආයතනයට මේ වන විට යොමු කිරීමට ද කටයුතු යොදා ඇත. |
| (ට) | • <u>ගඟවට කෝරළය ප්‍රදේශීය සභාවට ලබා දී ඇති බවට සඳහන් ඉඩම් කොටස</u><br><br>1997 වර්ෂයේ සිට මේ දක්වා ගඟවට කෝරළය ප්‍රාදේශීය සභාව වලංගු ගිවිසුමකින් රත්මලේ පොල භූමිය බදු පදනම මත ලබාගෙන නොමැති අතර පරිහරණය කිරීමක් ද සිදු කරනු නොලැබේ. එම ඉඩමේ සම්පූර්ණ අයිතිය විශ්වවිද්‍යාලය සතුවේ. එබැවින් විමසුම් වාර්තාවේ පෙන්වා දෙන පරිදි ගඟවට කෝරළය ප්‍රාදේශීය සභාව මගින් විශ්වවිද්‍යාලය වෙත බදු මුදල් අයවිය යුතු නොවන අතර එම ඉඩම විශ්වවිද්‍යාලය භාරයේ පවතී. ඒ අනුව ලිපිගොනු නිවැරදි ලෙස යාවත්කාලීන විය යුතුය.<br><br>• <u>බෝවලවත්ත වජිරාරාම අන්තර් ජාතික බෞද්ධ මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන ඉඩම</u><br><br>බෝවලවත්ත වජිරාරාම අන්තර් ජාතික බෞද්ධ මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන ඉඩම 99 අවුරුදු බදු පදනම මත නිදහස් කර ඇත. එහි පාලන අධිකාරිය 2016 වර්ෂය දක්වා ගිවිසුමේ පරිදි විශ්වවිද්‍යාලය වෙත බදු මුදල් ගෙවා ඇත. ගිවිසුම්ගත දින සිට වර්ෂ 10කින් පසුව බදු මුදල් අයකිරීමේ ක්‍රමවේදයක් සකස් කර නොමැති අතර විශ්වවිද්‍යාල තීරණය පරිදි සාධාරණ බදු මුදලක් අය කළ යුතුව ඇත.ඒ අනුව එම ඉඩම රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් තක්සේරු කර අදාළ බදු මුදල් ගෙවීමට ආරණ්‍ය සේනාසනය දැනුවත් කර ඇත. එම මුදල දැරිය නොහැකි මුදලක් බැවින් ඔවුන්ට වාර්ෂිකව රුපියල් 6,000.00 ක මුදලක් ගෙවිය හැකි බව විශ්වවිද්‍යාල පාලන අධිකාරිය දැනුවත් කර ඇත. මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට විශ්වවිද්‍යාල ඉඩම්, ගොඩනැගිලි හා නඩත්තු කමිටුව වෙත යොමු කරන ලදී. එහිදී බෝවලවත්ත වජිරාරාම අන්තර් ජාතික බෞද්ධ මධ්‍යස්ථානය වෙතින් වාර්ෂිකව රුපියල් 12,000.00 ක් අයකිරීමට තීරණය කර උපදෙස් ලබා දී ඇත. ඒ අනුව 2017 වර්ෂයේ සිට ඉදිරියට වර්ෂයකට 12,00.00 බැගින් අයකිරීමට කටයුතු කරනු ලැබේ. එම බදු මුදල ගෙවීම පැහැර හැරීමක් සිදු කළහොත් බදු ගිවිසුමේ 7.1 ඡේදය පරිදි මාස තුනක පූර්ව දැනුම් දීමකින් පසුව නීත්‍යානුකූලව අදාල ඉඩමේ භක්තිය නැවත විශ්වවිද්‍යාලය වෙත භාරගැනීමට කටයුතු කරනු ලැබේ. |

| | |
|---|---|
| | • <u>දිවිනැගුම දෙපාර්තමේන්තුව පවත්වාගෙන යනු ලබන ඉඩම</u><br><br>දිවිනැගුම දෙපාර්තමේන්තුවේ බදු ගිවිසුම් කාලය 2017 වර්ෂයෙන් අවසන් වී ඇත. ඒ අනුව 2018 වර්ෂයට බදු මුදල් හෝ දඩ මුදල් ගණනය කිරීමට හැකියාවක් නොමැත. එම ගොඩනැගිලි පරිශ්‍රය ඉදිකිරීමට ඔවුන්ට රුපියල් මිලියන 11.5 පමණ වැය වී ඇති බැවින් එම මුදලින් විශ්වවිද්‍යාලයට අයවිය යුතු හිඟ බදු මුදල අඩුකර ඉතිරි මුදල සඳහා ගිවිසුමට යටත්ව තවත් ඉදිරි කාල සීමාවකට එම භූමියේ ඔවුන්ගේ කාර්යාල පවත්වා ගැනීමට ඉල්ලීම් කර ඇත. ඒ සඳහා විශ්වවිද්‍යාල පාලන අධිකාරිය අනුමැතිය ලබා දී නොහැක. මේ වන විට එම ගොඩනැගිලි පරිශ්‍රයෙන් භාගයක ප්‍රමාණයක් විශ්වවිද්‍යාලය වෙත පවරාගෙන ඇත. ඉතිරි ගොඩනැගිලි ප්‍රමාණයද පවරා ගැනීමේ කටයුතු සිදුවෙමින් පවතී. |
| (ය) | මෙම ගැටළුකාරි තත්ත්වය පැනනැගී ඇති සුභ සාධක සංගම් මඟින් පවත්වා ගෙන යනු ලබන ඡායා පිටපත් මධ්‍යස්ථාන, ආපන ශාලා ඇතුළු සියළු සේවා ස්ථාන 2019.12.31 දිනෙන් අත්හිටුවන අතර 2020 වර්ෂයේ සිට එම සියළු සේවා ස්ථාන සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව සුදුසු සැපයුම්කරුවන් තෝරා ගැනීම සඳහා කටයුතු සිදුකරමින් පවතී. |

**උපකුලපති**

**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**